Enid Blyton's

Five go off to camp

# භූත කෝච්චි අබිරහස



දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න

dileep

dileep

# භූත කෝච්චි අබිරහස

Enid Blyton

FIVE GO OFF TO CAMP

# භූත කෝච්චි අබිරහස

dileep

පරිවර්තනය

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න

# වචනයක්

එනිඩ් බ්ලයිටන් විසින් ලියන ලද ෆේමස් ෆයිව් කතා මාලාවේ කෘති කිහිපයක් පාසල් කාලයේ මා අතින් සිංහලට පරිවර්තනය වූවේ බැරි බැරි ගාතේ ය.සියල්ලේ අත් පිටපත් මා සතු ව නැතත්සොයා ගත හැකි සම්පූර්ණ පිටපත් කිහිපයක් මා සතුව අදටත් තිබෙන්නේ ය.ඒ සියල්ල අතට ගන්නා විට යළුත් අවුරුදු දහයකින් පමණ අතීතයට ගොස් චාරිකාවක යෙදීමේ හැකියවක් ලැබෙන්නේ ය.

dileep

කොරෝනා කාලය තුළ මෙම පොතසොයා ගත් මම ජීවිතයේ ප්‍රතම වතාවට දීර්ග ටයිප් කිරීමේ කටයුත්තක් ඇරබීමි. උදාසීන ගතිය සියල්ල ඩිලීට් කිරීමට පෙළැබෙන සිත යටපත් කරමින් මා ලියූ කුඩා රචනා කියවීමෙන් සතුටට පත් සුදත් රොහාන් මහතා , පී බී සේනානායක මහතා , චිරංජී මිස් , මේනක තරංග සර් , සුනේත්‍රා අක්කා , මානෙල් ජයන්ති මිස් . අපේ පොලිටිකල් මිස් , ඉසුරු අයියා , තරිඳු අයියා ආදී බොහෝ දෙනා කී කතා මනසට දයියී මුසුකළේ ය.

කෙසේ වෙතත් ව්‍යාකරණ දෝශ නිවැරදි කිරීමට යළිත් වරක් පොත කියැවීමට සිදුවෙන බැවින් සියල් දොස් ද සමගින් මා මේ පොත අප්ලෝඩ් කර්මි. කිව යුත්තක් වේ නම් හෝ මා මේ ලේඛනය ඉවත් කොට ගත යුතු වන්නේ නම් 0703315404 අංකනය කරන මෙන් ද , මගේ වෙහෙස සම්බන්දයෙන් පසු

තැවිලි වීමට සිදුවන ආකාරයෙන් වංචනික කටයුත්තක් මේ තුළින් සිදු නො කරන මෙන් ද ඔබෙන් ඉල්ලා සිටිමි.

දිලීප් ප්‍රසන්න

dileep

ප.ලි. ඒ ද්වසවල මං මේක් ලිව්වෙ මගේ සිංහල ටීචර්ට දෙන්න .අදටත් සංද්‍යා ටීචර් ගැන මතකය ඒ විදිහට ම "

dileep

## 01 දැන් නිවාඩුකාලෙ හින්ද නෑ ඉස්කෝලේ

" කූඩාරම් ගහන ටෙන්ට් රෙදි දෙකයි , බිමට එලන සීට් හතරයි , නිදන බෑග් හතරයි ... අහා මට කියපල්ලා .. අපි ටිමීටටත් නිදන බෑග් එකක් අරන් යනව ද ?" එක් වර ම ඩික් සෙස්සන් දෙසට හැරුණේ උපහාසාත්මක සිනාවක් ද සමඟ ය.

සෙසු ළමුන් තිදෙනා ද ඔහු හා හවුල් වැ සිනාසෙන්නට වූ අතර කතා කරන්නේ තමා ගැන බැව් අවබෝධ කොට ගත් බැවින්දෝ ඔවුන්ගේ ආදරණීය බල්ලා , ටිමී වේගයෙන් වල්ගය වනන්නට පටන් ගත්තේ ළමුන්ගේ අවධානය වඩ වඩාත් දිනා ගනිමිනි.එය පොලොවේ වැදීම හේතු කොටගෙන නැගෙන

බොල් හඬ හේතු කොටගෙන ජෝර්ගේ අවදානය වඩ වඩාත් ඌෟ දෙසට ඇදී ගියේ ය.

" ලුකැට් හිම්... " බල්ලාගේ අයිතිකාරිය වූ ජෝර්ජ් කියන්නට පටන් ගත්තා ය. " ඌෟත් හිනා එනවා වගේ ඔයාලට පේන් නැද්ද? කට සම්පූර්ණෙන් ම ඇරිලා. කට වටේට තියෙන මවිල් දෙපැත්තට විහිදිලා තියෙන හැටි බලන්ටකෝ. නිකන් හිනාවෙනවා වගේ ම යි නේද ?

ළමුන් සියල්ලෝ ම වහා බලු හිනා නැරඹීමේ අපේක්ෂාවෙන් ටිමිය දෙස හැරී බැලූහ. ඒ අතර ඈන් ටිමී තුරුලු කොට ගත්තේ උතුරා යන තරම් වූ සෙනෙහසිනි. ආදරයෙණි.

" මේ ලෝකෙ ඉන්න හොඳ ම බල්ලා උඹ ටිමී.. උඹ ම තම යි.. කෝ ඔව් කියපන් ... ලෝකෙ හොඳ ම බල්ලා උඹ නේ ද ?

" වුෆ් ..." ටිමී එකඟත්වය පාන්නට මෙන් හඬක් නැගුවේ ඈන්ගේ නාසය ලෙව කා ආදර ගෞරව ද පාමිනි.

ළමුන් සිව් දෙනා මේ වන විට සිටියේ ඔවුන්ගේ නිවාඩු කාලය ගත කිරීම සම්බන්දයෙන් සැලසුම් කිරීම නම් වූ බාරධූර කායීයේ එල්බගෙන ය. නිවාඩුව නිවසින් බැහැරට ගොස් බොහෝ ඈත පළාතක කඳවුරක් ඉදි කොටගෙන ගත කිරීම ඔවුන්ගේ අරමුණවූ තිබෙන මොහොතක සැලසුම් සකස් කිරීම ලෙහෙසි පහසු කටයුත්තෙක් නොවන බව නම් අවිවාදයෙන් පිළිගත යුතු වූ ඇති සත්‍යයකි. ළමුන් සිව් දෙනා මේ වනවිට වෙන දා අපට හමු වන පුංචි පැංචි කොලු කෙල්ලන් සිව් දෙනා නම් නො වේ. ඔවුහු වයසින් වැඩී සිටිය හ. සිරුරින් ද එසේ ම යැ. අද්දැකීම් වලින් ද වෙනදට වඩා ලොකු මහත් වූවෝ වූහ. ජුලියන් වයසට වඩා උස ගොසිනි. ඩික් ද හිටියාට වඩා උස

ය. කිසිදු විටෙක තම සැබෑ නමින් අමතන්නෙකුට පිළිතුරු නොදුන් ජෝර්ජිනා තාමත් කොලු වෙස් ගැනීමේ බලාපොරොත්තුවෙන් ජෝර්ජ් යන නම ම භාවිතා කරමින් සිටින්නී ය. ළප කැළැල් පිරී ගිය මුහුණත් ,  ඉතා ම කොටට කපන ලද හිස කෙසුත් හේතු කොටගෙන ඈ පිරිමි ළමයෙක් ද ගැහැණු ලමයෙක්දැ යි හඳුනා ගත නො හැකි ව ඔබ වුවත් රැවටෙනු ඇත.

" එක අතකට බලපුවා ම නිවාඩුවට ගෙදරින් පිට වෙලා ගිහින් කාත් කවුරුත් නැති , නනාදුනන පලාතක අපේ ම කියලා කෑම්ප් එකක් ගහගෙන පාඩුවේ නිවාඩුවක් ගත කරන්ට ලැබෙන එක නිකන් මැජික් එකකින් ලැබිච්ච චාන්ස් එකක් වගේ " ඩික් යළිත් වරක් ඔවුන් අතර පැවති නිහඬියාව බිඳ දැම්මේ ය. නිකන් හිතන්ටකෝ ගිය ගිම්හාන නිවාඩුවෙදි අපි කරවෑන් එකක් අරන් ගිහිල්ලා කරපු සූර වීර වීර වික්‍රම වැඩ කිඩ වලින් පස්සෙත් අම්මලා තාතලා මේ වගේ වැඩකට අවසර දීපු එක ම පුදුම හිතෙන දෙයක් නෙවෙයි ද කියලා ?[ කැරවෑනයකින් ගිය පන් පසිඳුවෝ කියවන්න - පරිවර්තනය මානෙල් ජයන්ති ගුණසේකර ]

" ඒක ඇත්ත." යි ඈන් එකඟ වූවා ය. " ඒත් ඉතින් , ඒත් ඉතින් ඔය කියන විදිහේ අපේ ම කියලා නිවාඩුවක් , පාඩුවේ නිවාඩුවක් ගත කරන්ට ලැබෙයි ද කියලා මට නම් සැකයි. අමතක කරන්ට එපා මිස්ට ලූෆීත් අපිත් එක්ක නිවාඩුව ගත කරන්ට යනවා කියලා. එයා අපිව නිකන් ඇහේ දාල වගේ බලා ගනීවි. එයත් අපේ කෑම්ප් එක කිට්ටුව ම කඳවුරක් අටෝ ගත්ත ම ඔය කියන විදිහේ අපේ ම කියලා පාඩුවේ නිවාඩුවක් නම් ගත කරන්ට ලැබෙන එකක් නෑ සහෝදරයා..."

" පු...හ්. නාකි ලූෆී ලොක්කා... ඔය ඉතින් ඔයා එයා ගැන දන්න තරම තමා සහෝදරී " ඩික් මහ හඬින් සිනා එමින් කියන්නට විය. " එහාට ගියාට පස්සේ ටික වෙලාවකින් මිනිහා දන්නෙවත් නැති වෙයි එයත් එක්ක අපිත් ආවා කියලා. එයාගෙ මුලු ලෝකෙ ම කදුකර කෘමී සතුන් විසින් ආක්‍රමනය කරාට පස්සෙ මිනිහට පි ගැන කරදර වෙන්ට නිනව්වක් නැති වෙයි."

" එහෙම ම කියන්ටත් එපා. අපි ව ගෙවල් වලින් මේ ගමන යවන්නෙත් එයා නිසානෙ. ඉතින් අපි ව බලා කියා ගන්නා එක එයාගෙ වගකීම. එයා කඳවුරක් ගහගෙන කඳුකර කෘමින් ගැන පර්යේක්ෂන පවත්වන වැඩේ පටන් ගත්තෙ නැත්තම් අපිට මේ වගේ නිවාඩුවක් හීන තමා ඉතින්."

ඈන් කී ලෙසම ළමුන්ට නිවාඩුව කඳවුරක ගත කිරීමේ අවස්ථාව උදා වූවේ ලූෆී මහතා නිසා ය. පිරිමි ළමුන්ගේ පාසලේ ගුරුවර්යෙකු වූ හෙතෙම වයස්ගත කෘමී විශේෂඥයෙකි. වෙනත් අයුරකින් කියන්නේ න්ම් ලෝකයේ ඕනෑ ම කෘමී සතෙකු සම්බන්දයෙන් ඔහුට තිබුණේ උන්මාදයෙකි. කෘමී වර්ගයාගේ හැසිරීම රටා නිරීක්ෂනය කිරීමත් , උන් පිළිබඳ අධ්‍යනය කිරීමත් ජීවිතය කොට ගත් මේ අපූරු ප්‍රාණි විද්‍යාඥයා දකින විට ළමුන්ට නිතර ම සිතුනේ මහ පොළොවේ පය ගසන්නට ඔහුට අමතක වී ඇති බවකි. ඔහු සිහින ලොවක ජීවත් වෙන අයෙකු ලෙසිනි. කෘමී නිදර්ශක නිතර අත රැඳි ඔහු දකින විට කුඩා ඈන් නම් තරමක බියකින් චකිතයිකින් පසු වූ බව නම් නො කියා ම බැරි ය. මන්ද යත් ඔහු රැගෙන එන සමහරක් පෙට්ටි තුළින් ඉවතට පනින කෘමී සතුන් ඇගේ සිත තුළ පිළිකුලක් , ගත තුළ ලොමු දැහැ ගන්වන ස්වභාවයක් ඇති කරන බැවිනි. ඈන් කෙසේ සිතුවත් සිත කරදර කොට ගත්තත් පිරිමි ළමුන් නම් දැරුවේ ලූෆී මහතා සම්බන්දයෙන් වෙනත් ආකල්පයෙකි. ඔහු විනෝදකාමී අයෙකැයි ඔවුහු සිතුවෝ ය.

dileep

කෘමි සතුන් දසත හැසිරෙන තැනක මහලු ලුෆී ගුරුතුමා ළමුන් බලා ගැනීමේ නියැලේ යැයි අනිවාරතේ බිය සංකා උපදවා ගන්නට තරම් ඔවුන් ඉක්මන් වූවේ නැත.

" අපි ව බලා ගන්න එක කෙසේ වෙතත් අපිට නම් මිනිහා ව බලා ගන්ට වෙයි ' ජුලියන් කියා දෙන්නට පටන් ගත්තේ ය. '' සාමාන්යෙන් කෘමී සත්තු ඇරුණා ම කිසිම දෙයක් ගැන එයාට ගානක් නෑ. හරියට කූඩාරමක් වත් අටව ගන්න එයාට බෑ. ගොඩක් එලාවට කූඩාරම එයාගෙ ඔලුවට කඩාගෙන වැටෙනවා. එයාට මේ ලොකෙ සිහියක් නෑ වෙලාවකට. තමන් ම එකතු කරගෙන ආව බිත්තර බෑග් එකේ වුනත් ඉඳගන්න චරිතයක්. නාකි ලුෆී ජීවත් වෙන්නෙ මේ ලෝකෙ නෙමෙයි. කෘමින්ගෙ ලෝකෙ."

" හරි හරි ඉතිං. අපිට අපේ පාඩුවේ වැඩක් පොලක් කරගන්න දීලා , අපේ දේවල් වලට ඇඟිලි ගහන් නැතුව එයා කෘමී ලෝකෙ ම ජීවත් වුනා වේ" ජෝර්ජ් ද ඒ තර කියා දැන්මා ය. ඇගේ ජීවිතයට අම්මා තාත්තා වුව ඇගිලි ගසනවාට ඈ ඒ තර්ම් කැමති නැත." කොහොම වුනත් අපීට ගොඩාක් අපූරු නිවාඩුවක් ගත කරන්ට ලැබෙන බව නම් සිකුරු යි
කඳුකරයට ගිහින්ලා , මුලු ලෝකෙන් ම ඈත් වෙලා , කූඩාරම් දෙකක් එහෙම ගහගෙන ජීවත් වෙන්ට හම්බෙන එක නියම යි. ඇත්තට ම අපි ආසත් ඒ වගේ ජීවත් වෙන්නනේ.අරක කරන්න එපා , මේක කරන්න එපා කියල කියන්නත් කවුරුවත් නෑ. අපිට ඕනි දේවල් අපිට ඕනි වෙලාවට , අපිට ඕනි තාලෙට කරන්න හම්බෙන එක ම මදිද ? සම්පූර්ණෙන් ම නිදහස්කාමී ජීවිතයක් .."

" ඔව් අනිවාරෙන් ම " යි කියන්නට මෙන් ටිමී ද වූෆ් පාරක් දැම්මේ ය.

" දැක්කනේ. ඒ ටිමී කීවෙ එයත් කැමතියි එයා කැමති දේවල් කරන්න කියලා " බලු බස මානව භාෂාවට පෙරලා සෙස්සන්ට තේරූ බේරුම් කොට දුන්නේ ඈන් ය." හාවො සීයක් විතර පස්සෙ එලවන්ටයි , ළඟ පාතට එන ඕන ම කෙනෙක්ට බුරාගෙන පනින්ටයි මිනිහගෙ කල්පනාව. "

" හරි හරි ඒන් පොඩියකට උබේ හැකර කට වහ ගනින්කෝ " ඩික් කීවේ යළිත් වරක් බඩු භාණ්ඩ ලැයිස්තුව සාක්කුවෙන් පිතටට අදිමිනි. " අපි ආපහු ලිස්ට් එක බලන්න ඕනි. ගෙනියන්න තියෙන හැම දේම ගත්තද කියලා හරියට චෙක් කරලා බලන්ට ඕන. මම කොතන ද නැවැත්තුවෙ ? ආ .... නිදන බෑග් තුනක් ද හතරක් ද අරන් යන්නේ කියලා නේද ?

" ඔව් ඔව් .. උබට ඕනි වුනානෙ ටිමීට නිදන බෑග් එකක් ඕනි ද කියලා දැන ගන්ට " ඈන් යළිත් වරක් හක හක ගෑවා ය.

dileep

" එයාට මොකට ද අනේ නිදන බෑග් " ජෝර්ජ් ද යළිත් වතාවක් බාදා කළා ය. " ටිමී දන්නවා කොහෙද හරියට ම නිදා ගන්නෙ කියලා . නැද්ද ටිමී ? හරියට ම මගේ කකුල් දෙක උඩ . නේ ද ?"

" අනේ අනේ ජෝර්ජ්. අපි කොයිකටත් පොඩි ස්ලීපින්ග් බෑග් එකක් උගටත් අරන් යමු.. මට හරි අසයි උග නිදන බෑග් එකක් ඇතුළට බැහැලා ඔලුව විතරක් උඩින් එලියට දාලා ඉන්න හැටි බලන්ට . එයා හරි ශෝක් එකට අහිංසක තාලෙට ඉදී "

" අහිංසක තාලෙට හුහ්.. ටිමී කියන්නේ දැං හොද හැඩි දැඩි බල්ලෙක් හරි ද ? ඔය ගෑණු ලමයි වගේ ස්වීට් තාලෙට අහිංසක පාටට ඉන්න උග කැමති නෑ " ජෝර්ජ් විස්තර කෙරුවේ සතුටිනි. " හරි හරි ඩික්. උඹ ලිස්ට් එක චෙක් කරපංකෝ... ආයෙත් ඈන්

මැද්දෙන් පැනලා ඇඬ ගහන්න පටන් ගත්තොත් මං මගේ ලේංසුවෙන් එයාගෙ හැකර කට බැඳලා දාන්නම් "

ඩික් යළිත් වරක් ඔහුගේ බාරදූර කටයුත්ත පටන් ගත්තේ ය. සැබැවින් ම නිවාඩුවකට වුවමනා කළමනා සූදානම් කිරීමේ කටයුත්ත ළමුන් තුළ ඇතිකළේ උද්යෝගී බවකි. ආහාර පිසීම සඳහා ලිප් , කැන්වෙස් බාස්කට් , නො බිඳෙන පිඟන් කෝප්ප වැනි බොහොමයක් දේ බඩු ලැයිස්තුවට ඇතුලත් කොට තිබුණි. සෑම කුඩා මෙවලමක් සම්බන්දයෙන් ම බොහෝ කොට කතා බහ කරන්නට ඔවුනට සිදු විය. නිවාඩු චාරිකාව සැලසුම් කිරීමේ සෑම අංගයක් ම ළමුන්ට ඇතිකළේ වචනයෙන් විස්තර කර නොහැකි තරමේ උද්දාමයකි.

" ඇත්තට ම හැමදාම මේ අගේ නිවාඩු ගමනක් ප්ලෑන් කරන කොට මාර සතුටක් දැනෙන්නේ " ඩික් කියන්නට විය. " අපිට තව මොනවා හරි අමතක වුනා ද ආ ?"

" නෑ. අපි ඕනෑවටත් වඩා දේවල් අරගෙන ." ජුලියන් අයියා වශයෙන් දැනමුතුකම් දුන්නේ ය. " වෙලාවට මිස්ටර් ලූෆී එයාගෙ කාර් එකේ ටේලර් එකෙන් ම අපේ බඩුත් අරන් යන්න පුලුවන් කියලා කීවෙ. අපිට ම මේවා අරන් යන්ඩ එහෙම වුනා නම් පිස්සුත් හැදිලා ආයෙත් පිස්සු හැදිලයි නවතින්නේ "

" ඉක්මනට ලබන සතිය උදා වේවා ... මට තේරෙන් නැත්තෙ මොකක් හරි හොඳ දෙයක් වෙන්න තියෙන කොට අපිට ඕනි දිනය උදා වෙන්නේ හරී ම හෙමීට. ඉබි ගමනින්. ඒත් මොනව හරි හොද දෙයික් වෙවී තියෙන කොට දවස් යන්නෙ නිකන් සීඝ්‍රගාමී කෝච්චියක්වාගෙ. "

පුංචි පැංචි ඈන් ඉවක් බවක් නැතිව ප්‍රීතියෙන් දොඩවන්නට වූවා ය.



" කා ගාවද සිතියම ?" යි  අසමින් ඩික් කතාව වෙනතකට පෙරලා ගත්තේ ය." මට ආසයි ආයෙත් පාරක් මැප් එක බලලා අපි යන්නෙ කොහෙද කියලා බලන්න "

dileep

ජූලියන් වහා සාක්කුවට අත දමා සිතියමක් එළියට ගත්තේ ය. ඔහු එය බිම ඇතිරුවේ , කාට කාටත් දැක බලා ගත හැකි වෙන අයුරිනි. ළමෝ ඒ වටා දිගා වී සිතියම පිරික්ෂන්නට වූවෝ ය. බැලූ බැල්මට ම මුලු කඳුකර ප්‍රදේශය ම පාලුවට ගිය එකක් මෙන් පෙනෙන්න්ට වූ අතර  තන් තන් හි වූ නිවෙස් කිහිපයක් පමණක් ඔවුනට දකනට ලැබිණි.

" මේ තියෙන්නේ කඳුකරයේ තියෙන පුංචි ගොවිපොලවල් ' සිතියමේ තැන් දෙකක තුනක අත තබමින් ජුල්ලියන් නංගිලාටත් මල්ලීටත් තේරුම් බේරුම් කොට දුන්නේ ය. " මෙන්න මෙතනට තමයි අපි යන්නේ. මෙන්න මෙතන තමයි අපි කූඩාරම් ගහන්නේ. මෙන්න මේ කඳු ගැටය පාමුල තියෙන මෙන්න මේ පුංචි ගොවිපලෙන් තමයි අපි අපිට වුවමනා

කලමනා ගන්නෙ. කිරි බිත්තර බටර් වගේ දේවල් . ලූෆි මහත්තයා මීට කලින් වතාවක් මේ ප්‍රදේශේ කූඩාරම් ගහගෙන ඉදලා තියෙනව. එයා කීව ගොවිපල පොඩි එකක් වුනාට කෑම්ප් ගහන අයට ඕනි කරන ගොඩක් දේවල් එයාලගෙන් ගන්ට පුලුවන් කියලා ."

" යකෝ.. මං හිතුවට වඩා කදුකරය ගොඩාක් උසයි නොවැ. අනිවාරෙන් ම සීත කාලෙට හිම වැටෙනවා ඇති ?"

" ඔයා හරි ජෝර්ජ්. සීත කාලෙට හිම වැටෙනවා වගේ ම තමයි ගිම්හාන කාලෙට සීත සුළං , පාන්දරට මිහිදුම වගේ දේවල් වලිනුත් අඩුවක් නෑ. මිස්ටර් ලූෆි මතක් කරල ම ස්වීටර්ස් වගේ සීතලට අදින ඇදුම් මොනව හරිත් අරන් එන්ට ය කීවා. ලූෆි කීව තව කතාවක් කියන්ට ද ? සීත කාලෙටමාස ගානක් යනකන් මේ පළාත හිමෙන් වැහිලා එකම හිම යායක් බවට පත් වෙනවා ලු. එහෙම හිමෙ අතුරු දන් වෙන බැටලුවො හොයාගන්න අඩි ගානක් හිම යටට හාරන්න පවා සිද්ද වෙනවා ලු "

ජුලියන් විස්තර කියමින් සිටින අතරතුර සිතියමේ වන ගත කලාපයට ඔබ්බෙන් විහිදි වක ගැහුණු වීදි රේඛවක් ඔස්සේ ඉදිරියට රැගෙන ගියේ ය.

" මේ තියෙන්නේ අපිට යන්ට තියෙන පාර නේද ? " ඔහු ඇසුවේ ය. " අපිට මෙන්න මෙතනින් තමයි හැරෙන්ට තියෙන්නෙ. ආ මේ බලන්ට. මෙතනින් තියෙනවා පොඩි කරත්ත පාරක්. එකත් එකට ම ඒක සම්බන්ද වෙනවා ඇත්තේ අර කියපු පුංචි ගොවිපොළට මේන්න මේ හරියෙදි ලූෆීට කාර් එකපාර්ක් කරන්න වෙන නිසා මෙතනින් එහාට අපේ බඩු මලු උස්සන් යන්න වෙන්නේ අපිට ම යි. බැරි බර කරේ තියන් දෙපයට වාරු අරන් කෑම්පින්ග් ප්ලේස් එකට යන්ට වෙනවා."

dileep

" අපි ලූෆීගේ කූඩාරම ගාවම කූඩාරම් ගහන්නේ නැනේ ?"

" නෑ නෑ. අපි ව ඇහේ දාල වගේ බලාගන්ට ලූෆී එකඟ වුනා තමයි. ඒත් ඉතින් එයා එයාගෙ ටෙන්ට් එක ගහගෙන ඒක ඇතුලට ගිහින් කෑමීන්ට සම වැදුනට පස්සෙ අහස කඩා වැටුණත් දන්න එකක් යැ. ඇත්තට ම එයා එහෙමයි. මං ඔයාලට පුංචි කතාවක් කියන්නම්. මං දන්න කොල්ලො දෙන්නෙක් ලූෆී සර් එක්ක දවස් දෙකක නිවාඩුවක් ගත කරන්ට ගියා.කට්ටිය ගිහින් තියෙන්නෙත් ලූෆී සර්ගෙ කාර් එකෙන්. දවස් දෙකක නිවාඩුව කෙසේ වෙතත් එදා ම හවස ලූෆී සර් කාර් එක හරවන් ආපහු ඇවිත් අරුන් දෙන්න ගැන හාංකවිසියක් වත් නැතුව. ඇත්තට ම ලූෆී ලොක්කට එයත් එක්ක ගිය ළමයි දෙන්න ව අමතක වෙලා. හැතැම්ම ගානක් ඈත උන් දෙන්න ව දාල ඇවිල්ලා . ඉතිං ඔයාල හිතා ගන්නකෝ ලූෆී සර් ගේ තර ම "

dileep

ජුලියන් ඇද පැද කීවේ කවුරු කවුරුත් සිනහ සයුරේ ගිල්වමිනි. ටිමී පවා බලු කට දෙපැත්තට කොට අසා සිටියේ " අනේ අනේ මෙහෙව් ලූෆියෙක් " යැයි කියන්නට මෙන් හිස ද වනමිනි. යළිත් වරක් ළමුන් සිව් දෙනා තමා අසල ගැවසෙමින් නිවාඩු ගමනක් සූදානම කරමින් සිටීම බල්ලාට පවා සතුටක් දැන වූ බව කිව යුතුව තිබෙන්නේ ය. ඈන් සහ ජෝර්ජ් සමගින් පාසල් වාරය ඇරඹි විට ගැහැණු ළමුන්ගේ නේවාසික පාසලට යැමට උෟට අවසර ලැබුණ ද නිතර ම පිරිමි ළමුන් දෙදෙනා උෟට මග හැරෙන්නේ ය. ඔවුන් දෙදෙනා උෟට මුණ ගැසෙන්නේ නිවාඩු කාලවලදී පමණකි. ටිමියාගේ අයිතිකාරිය ජෝර්ජ් ය. සිහිනුනුදු ඈ හැර දමා ඈගෙන් ඉවත් වී තත්පරයක් හෝ ගත කිරීමේ බලාපොරොත්තුවක් උෟට නැත. ජෝර්ජ්ටද එසේ ම ය. මොකක්දෝ වාසනා මහිමයකට ගැහැණු ළමුන්ගෙ පාසල සුරතල් සතුන් ළඟ තබා ගැනීමේ වරම සිසු සිසුවියන්ට දී

තිබුනි. එසේ නොවන්නට ටිමියා නැති තැනක තත්පරයක් හෝ ජීවත් වීමට නොහැකි ජොර්ජ් හැරෙන තැපෑලෙන් පාසල හැර දමා ගෙදර දිව එන බව නම් අමුතුවෙන් කිව යුතු නොවේ.

" අපි ඇණවුම් කරපු දේවල් වෙලාවට ලැබුනොත් හොඳයි." යි කියමින් ජුලියන් සිතියම අකුලන්නට පටන් ගත්තේ ය. " තව දවස් හයක් ම තියෙනවනෙ. කොයිකටත් මං විටි විට ලුෆීට අපිත් එයා එක්ක එන බව මතක් කරන්නම්. නැත්තම් මිනිහා එක පාරට ම අපිව මෙහේ දාලා යන්න යයි තනිව ම "

දැන් සියල්ල සැලසුම් කොට අවසන් ය. දින හයක් තබා එක් දිනක් වත් දැන් නම් බකන් නිලා සිටීමේ හැකියාවක් ඉවසා වැදෑරීමේ පුලුවන්කමක් ළමුන් සිව් දෙනාට නම් ඇත්තේ ම නැති ලෙසකි. ළමුන් ඇනැවුම් කල සියල්ල නියමිත වෙලාවටත් කලින් ලැබුණි. ඔවුහු වහා ඒවා විවර කොට නිදන බෑග් තුන එලියට ඇද ගත්හ.

dileep

" සුපිරිනේ " ඈන් ඒවා දෙස බලා සතුටින් බෙරිහන් දුන්නා ය.

" ආව් නියමයිනේ " යි කියමින් ජෝර්ජ් එක නිදන බෑගයක් ඇතුලට එවේලේ ම රිංගා ගත්තා ය . " බලන්ට. මට ඒක බෙල්ල ගාවින් ගැට ගහ ගන්නත් පුලුවන්. මෙතනින් මගේ ඔලුව එලියට දාන්න පුලුවන් . නියමයි නේ. ඇතුල හරි ම උණුසුමයි. මේකෙ ඇතුළෙ ඉන්න කොට නම් රෑට කිසි ම සීතලක් දැනෙන එකක් නෑ. අද රෑත් මට මේක ඇතුලට ම වෙලා නිදා ගන්ට හිතෙනවා."

" මොකක් ? අපේ නිදන කාමරවලදි ම ?'

"යෙස්. වයි නොට් ?. මේව තියෙන්නේ නිදා ගන්ට තමයි "

සැබැවින් ම නිදන ඇදට වඩා දහස් ගුනයකින් නිදන බෑග් අපූරු යැයි ඈට සිතෙයි. එබැවින් එදින රාතියේ ළමුන් සිව් දෙනා ම නින්දට ගියේ ඔවු ගේ හුරු පුරුදු ඇඳන් තුල නම් නොවේ. ගෙබිම මත නිදන බෑග් හතරක් තුළ උණුසුම් කුටීර වල ය.

"ප්‍රශ්නෙකට තියෙන්නේ මගේ නිදන බෑග් එකට විමීත් එන්ට හදන එක විතරයි " යි ජෝර්ජ් කීවා ය.' මේක එතුළෙ ඉඩ මදි මොට්ටයෝ..උබත් ආවොත් දෙන්න ම තැම්බිලා රහ කෑමක් වෙලයි නවතින්නෙ."

" කොහොම වුනත් මිනිහා මගේ බඩ උඩත් රෑ දෙගොඩහරියේ ඉඳලා තියෙනවා." ජුලියන් කීවේ අමනාපී මුහුණක් මවාගෙන ය. එසේ වුවත් ඒ වූ කලී බොරු අමනාපයක් විනා සත්‍ය ලෙස ඇති කර ගත් සිත් තැවුලක් නො කැමැත්තක් නො වන බව නම් කිව යුතු වැ තිබේ

" අඟහරුවාදා ඉක්මනට එනව නම්' යි ඈන් නො ඉවසිල්ලෙන් කීවේ දෙවෙනි වතාවට ය මට දැන් බලන් ඉදලා ඉඳලා ඇති ම වෙලා තියෙන්නේ "

" අගහරුවාදා එන්නේ අගහරුවාදාටනෙ ළමයෝ " ජුලියන් කියා දුන්නේ ය

ජුලියන් කීවා හරියට ම හරි ය. අගහරුවාදා දවස අන්තිමේදි ඔවුන්සොයා පැමිණියේ ය. එය හිරු රැස් හොදින් පතිත වන අහස නිල්පෑ ගැන්වුනු සොඳුරු දවසක් ම වී ය. තන් තන් හි විසිර පැවැති සුදු වලා ගුලි ඒ මත නව රටා අඳිමින් පැවැත්තේ ය.

dileep

" කාලගුණේ නම් නියමයි ." යි ජුලියන් ප්‍රීතියෙන් කීවේ සෙස්සන් තව තවත් ප්‍රබෝදමත් කරමිනි. " දැං තියෙන ප්‍රශ්නේ අද අපි යනවද කියලා ලූෆී සර්ට මතක ද කියන එකයි. මතක තිබ්බොත් හරියට ම දහය වෙන කොට එයා එන්ට ඕනි. අපි එයාටත් එක්ක සැන්ඩ්විචස් අරන් යමු. අම්මත් කිව්ව එයාටත් එක්ක අරන් යන්ට කියලා. මොකද සාමාන්න්යෙන් කෑම බීම වගේ දේවල් එයාට අමතක වෙනවා. ඉතිරි වුනොත් ඉතිං අපිට වැඩි වෙන් නෑනේ. අනික ටිමීත් ඉන්නවානේ."

ළමුන් සේ ම ටිමී හ සිටියේ උද්යෝගයෙන් අමන්දානන්දයෙන් මෙන් ම ප්‍රීතියෙනි. "මොකක් හරි අපූරු දෙයක් සිද්ද වෙන්ට යනවා " උගේ හිත නිරතුරුව ම උගට කීවේ ය. බල්ලාගේ වල්ගය නො නැවතී වැනෙන්නට වූවේ ය. දිව පහලට එල්ලී තිබේ. ඔලිම්පික් දිව ආවාක් මෙන් හති හෙළීම ද එක තත්පරයකට වත් උගට මගැරෙන්නේ නැත. කාගෙ කාගේත් දෙපා යට බලලෙකු මෙන් ඇතිල්ලීම ද නො නවත්වා ටිමියා අතින් සිදු එමින් තිබෙන්නේ ය. එහෙත් හිත මිතුරු බල්ලාගේ ඇගෑලුම් පෑම නම් ළමුන් කවුරුත් ගණන් ගත්තේ නැත.

ලූෆී මහතා ඔවුන් වෙත පැමිණියේ පොරොන්දු වූ වේලාවට වඩා පැයක් ප්‍රමාද වූවාට පසු ය. "ලූෆීට ගමන අමතක වෙලා... අයියෝ මෙහෙම සමයමක්, දැන් ඉතින් සේර ම බලාපොරොත්තු ඉවරයිනේ " වැනි නේක විද හැඟීම් අටෝරාශියක් නොයිවසිලිමත් ළමුන් තුළ මෝදු වෙමින් පවත්නා මොහොතක උන්නැහේ හදිසියේ ම නිවස කරා පැමිණියේ ය. ලූෆී මහතා පැමිණ සිටියේ ඔහුගේ විශාල කලු පැහැති පැරණි පන්නයේ මෝටර් රථයෙනි. පිරිමි ළමුන් දෙදෙනා පමණක් නොව ගැහැණු ළමුන් දෙදෙනා ද කලෙක සිට ලූෆී මහතා බොහෝම හොදින් දැන හදුනාගෙන සිටියෝ

dileep

ය.ළමුන්ගේ දෙමාපියන්ගේ නිජාත මිතුරෙකු වූ ඔහු බොහෝ අවස්ථාවල ඔවුන් හා එක් ව බ්‍රිජ් ක්‍රීඩා කරනු වස් එහි පැමිණ තිබූ බැවිනි. ඊටත් ලූෆී මහතා ජීවත් වූයේ ද ඔවුන්ගේ නිවසට ඒ තරම් දුරකින් නො වේ.

" හලෝ හලෝ ..." ඔහුද කෑ ගැවේ ළමුන් සේ ම ප්‍රීතියෙනි. " කොහොමද ළමයි. සේරම ලෑස්ති ද ? මගේ කාර් එකේ ට්‍රේලර් එකට බඩු ටික ඉක්මනට පටවන්න.. මගේ ඒවත් ටිකක් ඇතී... ආඅ මං ඔය ළමයින්ට සැන්ඩ්විචස් ගෙනාවා. මගේ නෝනා බලෙන් ම වගේ මහා ගොඩාක් සැන්ඩ්විච් පැටෙව්වා."

"අම්මෝ අද එහෙනම් අපිට රජ කෑමක් කන්ට පුලුවනී "

ඩික් ද පෙරලා කෑ ගැවේ ජූලියන්ට බඩු මුට්ටු මෝටර් රථයේ ට්‍රේලරයේ අඩුක් කරන්නට උපකාරී වෙමිනි. කූඩාරම් රෙදි, නිදන බෑග් වැනි බරපතල දෑ නිවසින් පිතටට ගෙනාවේ කොල්ලන් දෙදෙනා ය. කුඩා බඩු මුට්ටු ගෙන ආවේ ගැහැණු ළමුන් දෙදෙනා ය. බඩු මුට්ටු කන්දක් පරිද්දෙන් ට්‍රේලරය මත ගොඩ ගැසූ පසු කඹයක් බ්භාවිතා කොට එය බැඳ දමන්නට ද ජූලියන් අමතකකළේ නැත.

අම්මාටත් තාත්තාටත් සුබ පැතූ ඔවුහු වහ වහා කාරයට නැග ගත්තෝ ය. ලූෆී මහතා අවසානයේ වාහනය පණ ගැන් වූ අතර එතුළින් නැගුනේ එසේ මෙසේ පුද්ගලයෙකුට දරා ඉවසා ගත හැකි ගෝෂාවක් නම් නො වේ.

" ගුඩ් බායි ළමා යි " වැඩි හිටියෝ දෑත් වනමින් කෑ ගැවෝ ය. ඒ අතර ජූලියන්ලාගේ මව තවත් යමක් ද කියා කෑ ගැවා ය.

" මේ පාර නම් වෙනදා වගේ වීර වික්‍රම වැඩ වලට අහු වෙන්ට එපෝ.."

" ඇත්තට ම එයාලට මේ පාර වීරක්‍රියා කරන්ට ලැබෙන්නේ නෑ..." ලුෆී උන්නැහේ ප්‍රීතිමත් හඬින් පෙරලා කෑ ගෑවේ ය. " ගහ කොල සතා සීපාවා විතරක් ඉන්න පාලු කඳුකරයේ කොයින් ද වීර ක්‍රියා. එහෙනම් අපි යනෝ. සේරට ම ගුඩ් බායි "

කාරය සෙමින් සෙමින් ගමන් අරඹන්නට වූ අතර ළමෝ තම දෙමාපියන් නො පෙනී යන තුරු ම අත් වනමින් බෙරිහන් දුන්නෝ ය.


" ගුඩ් බායි... ගුඩ් බායියියියියියියී .....හුරේ.... හිප් හිප් හුරේ.... අන්තිමේ අපි යනෝ...."

dileep

කාරය වේගයෙන් මාවත පහළට ගමන් කරන්නට වූ අතර ට්‍රේලය උමතු වූවාක් මෙන් නොකඩවා ගැස්සෙන්නට පැද්දෙන්නට වෙමින් කාරය පසු පස්සේ ඇදී ආවේ ය. කෙසේ වෙතත් අවසානයේ ඔවුන් කප්පරක් කල් සිහින දුටු නිවාඩු චාරිකාව ඔවුන් මේ මොහොතේ යමින් සිටින්නේ ය.

# 02 එන්න කඳුකරේ එන්න මා ප්‍රියේ .....

dileep



ලූෆී නම් වූ හිත මිතුරු කෘමී විද්‍යාඥයා වචනයේ පරිසමාප්තියෙන් ම දක්ෂ රියදුරෙකු වූවේ නැත. ගුරු ගුරු හඬ නගා දෙසවන් බිහිරි කරවන පැරණි කාරය ඔහු පදවාගෙන ගියේ නීල් ආම්ස්ට්‍රෝන් හදට යන්නාක් මෙන් වේගයෙනි.කදු පල්ලම් තැනිතලා ලදු දෙනි කැලෑ ,වල ගොඩලි  මේ ඈ කිසිත් හේ  දොයිතුවකට මායිම් නොකළේ ය.මාවතේ වූ වංගු කිහිපයක් ම ඔහු ආ පිම්මේ ම ඉගිල්ලී යද්දී ජූලියන් විටින් විට

හැරී බඩු බාහිරාදිය පටවා තුබූ ට්‍රේලරය දෙස බැලුවේ එහි වූ ලට්ට ලොට්ට සියල්ල මග වැටී යාවිදැයි සැකයෙනි. එක්වර ම බෑවුමක් වටා වන නැම්මක් පසු කරන විට නිදන බෑග් අහසට විසිවී ගොස් අනු නවයෙන් රැඳී තිබෙනු දුටු විට නම් තව දුරටත් දත කට පියාගෙන බලා සිටීමේ හැකියාවක් ජුලියන්ට තිබුණේ නැත. ඔහු ලූෆී මහතාගේ උරහිසට තට්ටුවක් දැම්මේ ය.

" සර් අපි ටිකක් හෙමින් යමුද ? මේ ගානට ගියොත් බඩු ටික එළියට විසික් වෙයි. ට්‍රේලරය විතරක් ඉතුරු වෙයි අන්තිමට "

" මගෙ අප්පච්චියේ කොල්ලෝ.. ට්‍රේලරයක් තියෙන විත්තිය මට හාං කවිසියක් මතක තිබුන් නෑ නොවැ " යි කියමින් ලූෆී මහතා වහා ගමන් ගත් වේගය බාල කළේ ය.' මං පැයකට හැතැම්ම තිහකට වඩා වේගෙන් යනව නම් මට ටක් ගාලා මතක් කරන්ට ඕනෑ. මම අන්තිමට ට්‍රේලර් එකේ බඩු පටවන් ගිය පාර ගමන ගිහින් බලන කොට ඉතුරු වුනේ අරන් ගියබඩු වලින් බාගය යි. ආයෙත් ඒක කර ගන්ට ඕන නෑ ඉතිං "

ලූෆී මහතා ඇගට පතට නොදැනෙන ලෙසින් කියද්දී අද එසේ නො වේච්ච් යි ජුලියන් සිය දාස් වාරයක් ප්‍රාර්ථනාකළේ ය. ඔහු වේග මාපකයෙන් ඇස ඉවතට ගත්තේ ම නැත. ලූෆී උන්නැහේ තිස් පහපන්නා හතළිහ දෙසට බර වෙන සෑම මොහොතක ම ඔහු දෙවරක් නොසිතා ම එතුමාගේ අතට තට්ටු කරමින් වේග මීටරය දෙසට අවදානය යොමු කෙරෙව්වේ ය.

ලූෆී මහතා ද ප්‍රීතිමත් අයෙකු විය. බොහෝ වැඩිහිටියන් මෙන් බැරෑරුම් සහ ගත මුහුණින් බුකවා ගත් මුහුණින් සිටින මිනිසෙකු නම් නො වී ය. ළමුන්ට ම ගැලපෙන විදිහේ ජාඩියට මූඩිය ජාතියේ අයෙකු විය. ළමුන් සේ ම ඔහුද පාසල් පවත්වන

කාලයන්ට වැඩි කැමැත්තක් වාරාවසාන නිවාඩු කාලයන්ට දැක්වූවේ ය. පාසල් පවත්වන වාර තුළදී මෙන් නිවාඩු කාල තුළදී ඔහු ආසා කළ කෘමී ලෝකයේ සැරි සැරීමට කාගෙන්වත් බාදාවක් හිරි හැරයක් ඇඟිලි ගැසීමක් සිදු වන්නේ නැත. දැන් ඔහු ආසා කළ ආදරය කළ ළමුන් සිව් දෙනාද සමග කඳුකරයේ නිවාඩුවක් ගත කිරීමට යමින් සිටින්නේ ය. කඳුකරයේ ජීවත් වෙන මී මැස්සන් , කුරුමිණියන් , සමනලයින් මේ ඈ නේක විද කෘමී මිතුරු මිතුරියින් අටෝරාශියක් මුන ගැසී අල්ලාප සල්ලාපයේ නියැලීමේ වරම තවත් ස්වල්ප මොහොතකින් එතුමාට උදා වෙන්නේ ය. එ පමණක් ද නොව ඔහු ආසා කළ පුංචි පැංචි කොලු කෙලි රංචුව වට කර ගෙන දහසකුත් එකක් කෘමී සතුන් ගැන දැන කියා දීමේ , ඉගැන්වීමේ බලාපොරොත්තුවක් ද උන්නැහේ තුළ තිබෙන්නේ ය. කෙසේ වෙතත් ළමුන් ඔහුගේ එකී බලාපොරොත්තුව සම්බන්දයෙන් නම් යන්තමින් වත් අනුමාන කළේ නැත. ලූෆී මහතා කෘමී සතුන් පිළිබද දේශන පැවැත්වීමේ බලාපොරොත්තුවකින් සිටී යැයි යන්තමින් හෝ ඔවුන් අනුමාන කොට තිබුණේ නම් ඔවුන්ගේ මුහුණු මේ තරම් ප්‍රීතියෙන් පවතී දැයි පැවසීම සැක සහිත ය.

dileep

ගති ස්වභාවයන්ගෙන් සේ ම පෙණුමෙන් ද ලූෆී මහතා අමුතු විදිහේ මනුස්සයෙකි.කරුණාවන්ත දුඹුරු දෑසට ඉහලින් පිහිටා ඇති අපිරිසිදු පෙනුමැති පඳුරු ඇහි බැමි දෙකක් ලූෆී මහතාට තිබෙයි. එය දකින සෑම විටක ම ඩික්ට සිහියට නැගෙන්නේ වඳුරෙකි. ඔහුගේ නාසය විසල් එකකි. ඒ නාසයෙන් එළියට පනින රෝම වනාන්තරයක් ද ලූෆී මහතාගේ අමුතු පෙණුම තව දුරටත් වැඩි කලා මිස අඩුකළේ නැත. ගණව වැවී ඇති ඔහුගේ රැවුලමාස ගණනාවකින් හෝ අවුරුදු ගණනාවකින් හෝ නො කපන ලද අපිරිසිදු එකකි. වෘර්තාකාර ඔහුගේ

නිකටේ ඇති ඉන්නෙක්ද ඒ මත වැඩුනු දිගු කෙස් ගසක් ද තව දුරටත් ළමුන්ට දැකිය හැකි ය.

ඈන් නම් වැඩියෙන් ම කැමැත්තක් දැක් වූවේ ඔහුගේ අමුතු පෙනුමක් තිබූ කන් දෙකට ය. සාමාන්‍ය කන් දෙකකට වඩා විශාලත්වයෙන් යුතු ඔහුගේ කන් ඉහලින් ඉදිරියට නැවී තුබුණේ හා කන් දෙකක ස්වරූපයෙනි. වුවමනා ඕනෑ ම මොහොතක කිසිදු ආයාසයක් නො ගෙන දකුණු කන සොලවා ලීමේ හැකියාවක් ලූෆී සර්ට තිබෙන්නේ ය. එහෙත් ඈන් වඩාත් පුදුමයට පත් වූවේ අතින් අල්ලා හැරුණු විට වම් කන සෙලවීමේ හැකියාවක් ඔහුට නැති බැව් අවබෝධ කොට ගත් විටෙ ය. කොණ්ඩය කුනාටුවකට අහු වූවාක් පරිද්දෙන් අපිළිවෙල ය. ඔහු ඇන්දේ පැලැන්දේ ඔහු වැනි දෙදෙනෙකුට වුව සෑහේ යැයි සිතෙන විදිහේ මහත විශාල ඇඳුම් ය. එතරම් ආකර්ශනීය පෙනුමක් නො තිබුණ ද , අපිරිසිදු අපිළිවෙල අයෙකු වූව ද කරුනාවන්ත වන්නාක් සේ ම ඉදහිට පුප්පන අඩිය හප්පන ස්වභාවයක් පැවතිය ද සියල්ල සැණින් අමතක වන කල්පනා ශක්තියෙන් අඩු අයෙකු වූව ද ළමුන් තුල ලූෆී උන්නැහේ ගැන කැමැත්තක් , ප්‍රිය මනාප භාවයක් හට ගත්තේ ඔවුනට ද රහසේ ය.

dileep

දහවල් දොලහයි තිහ පමණ වන විට ඔවුන් විසින් දිවා ආහාරය සඳහා ටික වේලාවකට ගමන නතර කරන ලදී. මුලින් ම තමා ගෙන ආ සැන්ඩ්විච්ස් මල්ල පිතටට ගත් ලූෆී මහතා කාට කාටත් සැන්ඩ්විච්ස් බෙදා දුන්නේ ය. ලූෆී මැතිණිය විසින් කලින් දා සවස සකසන ලද සැන්ඩ්විච්ස් ළමෝ ඉතා සතුටින් ඒවා අනුභව කරන්නට වූවෝ ය.

" විනාකිරිවල පොඟවපු කැකිරි , හැම් සලාද කොල , බිත්තර , සාර්ඩින් ... ඔහෝ ලූෆී සර් .. ඔයාගෙ සැන්ඩ්විච්ස් නම් නියමයි

. අපේ ඒවාටත් වඩා ගොඩාක් හොඳයි ..." කොහොමත් ලූෆී මහතාට දැඩි ආදරයක් දැක් වූ ඈන් කීවේ දෙවෙනි සැන්ඩ්විච් එක ද අතට ගනිමිනි.

සැබැවින් ම ළමුන් සියල්ලන් ම දැඩි කුස ගින්නේ පෙලුණෙන් ඔවුහු ඉතා වේගයෙන් ආහාර අතුරුදන් කරන්නට පටන් ගත්තෝ ය. සෑම සැන්ඩ්විචස් එකක ම අවසාන හරිය සුපුරුදු ලෙස ටිමීට ලැබුණෙන් ඌ සෑම සැන්ඩ්විචස් එකක් ම අවසන් වෙන තුරු ඇඟිලි ගනිමින් බලා සිටියේ ය. එහෙත් සෑම සැන්ඩ්විච් එකක ම අවසන් කොටසේ අයිතිකාරයා ටිමී බව ලූෆී උන්නැහේ නම් දැන සිටියේ නැත. එබැවින් ඔහුටත් හොරා ඔහුගේ සැන්ඩ්විචස්වල අවසාන කොටස අතුරු දන් වී යන විට ලූෆී මහතා අන්තෝ ජටා බහි ජටා

ගැටළුවකට මැදි වූවේ ය.



" හරි දක්ෂ බල්ලෙක්නේ." ඔහු කීවේ ටිමීගේ හිස අත ගාමිනි.
" හරි ම දක්ෂයි "

මේ කියමනෙන් ජෝර්ජ් තරමට සතුටට පත් අයෙක් ඒ මොහොතේ මේ ලෝකයේ කොහේවත් සිටියේ නැත. ඇයත් සිතුවේ ලෝකයේ සිටින දක්ෂතම බල්ලා ටිමී ලෙසට ය. ඇය කියන සෑම වචනයක් ම අකුරක් නෑර තේරුම් ගැනීමේ හැකියාවක් උඟ සතුව පවත්නා බවක් ඈ විශ්වාස කලා ය. එමෙන් ම ළමුන් සිව් දෙනා සේ ම අමතක වන සුළු ලූෆී උන්නැහේ ද ඇහැක් මෙන් බලා කියා ගැනීමේ ද කිසිදු අදි මදි කිරීමකින් තොරව බලා කියා ගැනීමේ වගකීම උඟ බාරගන්නා බවද ඈ දැන සිටියා ය.

ඉදුනු පළතුරු කිහිපයකට ද ඉඩ ගෙන දුන් ඔවුහු ජින්ජර් බියර් පනය කරමින් සප්පායම් වීමේ කටයුත්ත අවසන් කලහ. ටිමීට නම් පළතුරු ලැබුණේ නැත. එහෙත් ජින්ජර් බියර් බිදු කිහිපයක් නම් ටිමියාටත් දීමට උහු අමතක නො කළෝ ය.

dileep

තවත් නො බෝ වේලාවකින් ඔවුන් යළි ගමන් ඇරඹූ අතර එක්වරම ඈන්ට තද නිදිමතක් දැනෙන්නට පටන් ගත්තේ ය. ඩික් ද විශාල ඈනුමක් යවා අනතුරු හැගවීමක් පළ කොට ඉතා ඉක්මණින් ම තද නින්දකට වැටුණේ ය. එහෙත් ජෝර්ජ් ටිමී දෙන්නාට නම් නිදිමතක් අහලකවත් තිබුණේ නැත. එමෙන් ම වේග මාපකය නිරීක්ෂනයෙ යෙදී හුන් ජූලියන් ද නින්දට වැටුණේ නැත.

" අපි එහෙට යනකම් ම ආයෙ නවත්වන් නැතුව ඉමු නේද ළමයි. තේ වලට වත් ? " ලූෆී මහතා එක්වර ම ඇහුවේ මහ හඬිනි. ඩික් එක්වර ම උඩ ගොස් බිම වැටුණේ අදහා ගත නො හැකිව ය. " මොකද අපි හැන්දෑවෙ පහ හමාර වෙන කොටවත්

ගිහින් ඉන්න ඕනිනේ. රෑ බෝ වෙන්ට කලින් නොගියොත් කූඩාරම් ගහගන්ට අමාරුයි. අහා ඒක නෙවේ. අර බලන්ට. අර ඈතින් පේන තැනට තමයි අපි යන්නේ. අර බලන්ට ළමයි. ඉර එළිය වැටිලා හෙදර් පඳුරු පේන අපුරුව "

ළමෝ වහ වහා ලූෆී උන්නැහේ දැක් වූ දෙසට නෙත් හෙලන්නට වූවෝ ය. එහෙත් ගැඹුරු සුව නින්දක වැටී හුන් ඈන් නම් තවත් සිහිනයකට පුල පිරුවා මිස මේ ඈ කිසිත් දුටුවේ නැත. සැතපුම් ගණනාවක් ඈතින් , ඔවුන්ගේ වම් පසින් වන සුවිසල් කඳුකරය  සූර්යාලෝකයෙන් මනා සේ නැහැවෙමින් තිබෙන්නේ ය. කඳුයාය පුරාවට දක්නට ලැබෙන්නේ උස්ව වැවී ඇති හෙදර් පඳුරු ය. දුඹුරු පැහැයෙන් වර්ණ ගැන්වී ඇති ඒවා නිර්මාණය කරන්නේ දකින්නට ආසා සිතෙන පාලු හුදෙකලා සොඳුරු සිතුවමකි.

dileep

' අපි මෙතනින් වමට හැරෙන්ට ඕනි. එහෙමයි ක්දුකරයට යන්නේ " ලූෆී උන්නැහේ එසේ කියමින් ම වේගයෙන් වම් පසට විහිද ගිය කුඩා පාරකට වාහන්හය නැඹුරු කළෙන් ටේලරය වේගයෙන් ඉහල පහල ගියේ එහි වූ බඩු මුට්ටු සියල්ල යළිත් නිමේසයකට අහසට විසි කොට අල්ලා ගනිමිනි. " මෙන්න අපි යනෝ"

එතැන් සිට ඔවුන් ගමන් ගත්තේ උස්ව නැගෙන්නා වූ භූමි බාගයක් ඔස්සේ ය. අතරින් පතර වන කුඩා නිවෙස් දෙකක් ද ඈතින් වන කුඩා ගොවිපලක සේයාවක් ද ළමුන්ට දක්නට ලැබුණි. කුඩා තිත් සමූහයක් මෙන් ප්‍රථමයෙන් දර්ශනය වූ බැටලුවන් සමූහයක් ඔවුන් ආසන්නට වූ විට ආගන්තුක කාරය දෙස විශ්මයෙන් බලා සිටියෝ ය.

" මම හිතන්නෙ අපි තවත් හැතැම්ම විස්සක් විතර යන්ට ඕනි " යි හදිසියේ ම පාර මාරුවෙන්නට ආ බැටලුවකු හේතු කොටගෙන තිරිංග පාගමින් ළමුන් ගස්සා පද්දා උස්සා පොලොවේ ගසා යළිත් කිසිවක් නො වූ පරිද්දෙන් රථය ඉදිරියට පදවමින් ලූෆී මහතා කීවේ ය. " මම හිතන්නේ මේ සත්තු ඕප දූප කතා කරන්නෙත් පාර මැද්දට ඇවිත් කියලයි. ඒයි බැටලු කොල්ලා. අපිට යන්ට දීලා පොඩ්ඩක් එහාට වුනොත් හොදා "

ටිමී මද බිරුම් හඬ'ක් පිටකළේ " මට පොඩ්ඩක් යන්ට දෙන්න මංපාරෙ ඉඩ හදල දෙන්නම්" යි කියන්නට මෙනි. කෙසේ වෙතත් මේ සියල්ල ම හේතු කොට ගෙන ඈන් මේ වන විටත් නින්දෙන් අවදි වී සිටියා ය.

" අයියෝ හරි ම කනගාටුයි ඔයාගෙ නින්දට බාදා කරන්නට සිද්ද වුනාට " මාවත දෙසත් පෙරලා පසුපස අසුන දෙසත් බැලුම් හුවමාරු කරමින් ලූෆී උන්නැහේ කියා සිටියේ ඉතා ම කරුණාවන්ත හඬකිනි." අපි දැන් ළඟයි ඈන්..."

dileep

නැග්ම එන්න එන්න ම සීඝ්‍ර වූ අතර ඔවුන් සිප ගනිමින් හමා ගිය සුළන් රැල්ලක පවා වූයේ ගත සිත නිවා සනසාලන සීත බවකි. නෙත් යොමා අවට බලන සෑම විටක ම කදු පංතීන් දක්නට ලැබුණු අතර තන් තන්හි වන කුඩා දිය පාරවල් සමුදායක් ද ළමුන්ට දක්නට ලැබිණි. ඇතැම් විටෙක ඔවුන්ගමන් ගත් මාවත හරස් කරමින් ද කුඩා දිය පාරවල් ගමන් කර්මින් තිබුණි.

" අපිට මේ ජේන ඕන දිය ඇල්ලකින් වතුර බොන්ට පුලුවන් " යි යළි කතා කරමින් ලූෆී මහතා දැන් වී ය." මැණිකක් වගේ තියෙන වතුර ටික. සීතල යි පිරිසිදුයි. නගරයේ තියෙන පයිප්ප වතුර වලට වඩා බොහෝ ම හොඳයි. උල්පත් වතුරනේ. අපි

කඳවුරු ගහන්ට ඉන්න තැනිනුත් මේ වගේ දිය පහරක් ගලාගෙන යනවා”

එය ඉතාමත් ම සුබ ආර්ංචියක් විය. තමා රැගෙන ආ කැන්වස් බාල්දි කිහිපය මොන තරම් ප්‍රයෝජනවත් විය හැකි දැයි ජූලියන්ට කල්පනා වූවේ ය. ඔහු සිතාගෙන සිටියේ හැතැම්ම ගණන් දුර වතුර ඇදීමට සිදුවේ යැයි කියා ය. එහෙත් කඳවුර වටින් ගලා යන දිය පාරක් වේ නම් දත කට පූට්ටු කොට ගනිමින් බොහෝ දුර සිට වත්‍ර අදින්නට වුවමනා වන්නේ නැත.

හදිසියේ ම මාවත දෙපසට බෙදී විහිදෙනු දක්නට ලැබුණු අතර  දකුනු දෙසට වන මාවත මෑතකදී සංවර්දනය කළතරමක හොද මට්ටමේ එකක් වී ය. එසේ වුව ද වම් පසට විහිද තුබූ මාවත නම් වල ගොඩැලිවලින් යුතු ගන්න ම දෙයක් නැති විදිහේ මාවතක් බව නම් සඳහන් කළ යුතු ම ය. සැබැවින් ම කුඩා කරත්තයකට හැරුණු කොට වෙනත් වාහනයකට නම් එය එතරම් යෝග්‍ය එකක් නොවනු ඇත .

dileep

“ අපි මෙතනින් වම් පැත්තෙන් තියෙන එකෙයි යන්ට ඕන “ යි කියමින් ලූෆී මහතා පටු මාවතට වාහනය හැර වූ අතර එය ගැස්සෙමින් පැද්දෙමින් ඇතුල සිටි උන් සාවුන් මෙන් උඩ පන්නවමින් මද දුරක් ගමනේ යෙදුනේ ය. වේගයෙන් ගමන් කිරීම උගහට වූ අතර තමා පසු කරමින් යන සෑම පුංචි දෙයක් ම දැක බලා ගැනීමේ වරම ද ළමුන්ට හිමි වූවේ ඔවුන්ට ඉතා සෙමෙන් ගොලුබෙලි ගමනින් ගමන් ගන්නට සිදු වූ නිසා ය .

“ මේ හරියෙන් කාර් එක දාල යමු “  එතැන් සිට විසිර පැවතියා වූ ගල් කුලු අතරින් කාරය පැදවිය නො හැකි බැව් වටහා ගත් ලූෆී මහතා කීවේ ය . “ මෙන්න මේ ගල් කුළ ගාව අපි කාර් ක ම්නවත්තලා යමු. ගල් කුල නිසා වැස්සෙනුයි

හුලගෙනුයි කාර් එකට හානියක් වෙන එකක් නෑ . අපි න්න අර අතනට ගිහින් කෑම්ප් ගහමු"

කදු පල්ලමේ වන කුඩා තැනි තලා භූමි බාගයක් ලූෆ් මහතා විසින් දක්වන ලද්දෙන් ළමෝ අහ වහා එ දෙසට නෙත් යොමු කළහ. කටු සහිත ගෝර්ශ් පදුරින් ද යෝද හෙදර් පදුරින් ද මුලුවනින් ම වැසී ඇති එකී භූමි බාගය කූඩාරමක් ඉදි කිරීමට අයෝග්‍ය නොවන බැවු දනවන්නට ජුලියන් හිස වනා එකගත්වය පල කර සිටියේ ය. ගන ගෝර්ස් පදුරුත්, විශල් හෙදර් පදුරුත් සීත සුළගින් ඔවුන් රැක ගැනීම සදහා සැදි පැහැදී සිටිනු ඇතැයි ද ඔහු වැඩි දුරටත් සිතා ගත්තේ ය.

' හරි හර් " යි ඔහු කීයන්නට විය." අපි මුලින් ම තේ බීලා ගමන පටන් ගන්නව ද ? නැත්තම් මුලින් ම එතනට ගිහින් තේ බොනව ද ?"

dileep

" මුලින් ම තේ ඩිංගිත්තක් කාරිය බීලා කූඩාරම් ගහන්න පටන් ගමු " ලූෆ් යෝජනාකළේ ළමුන්ගෙ සිත් සතන් කියවීමේ හැකියාව ලත් ඉන්ද්‍රජාලිකයෙකයෙකු මෙනි. " මම ගෙනාවා අපූරු පුංචි ලිපක් ළමයි. දර ලිපකට වඩා ඒක හොදයි. ලේසියි. අනික් එක දර ලිපකින් වගේ කේතල් සාස්පාන් කලු වෙන් නෑ ,මේකෙන් "

" අපිත් ලිපක් නම් අරන් ආවා සර් " යි කියමින් කාරයෙන් බැස ගත් ඈන් ලිප සොයා ගනු වස් විපරම් කරන්නට වූවා ය. " මෙතන හරි ලස්සනයි සර්. හෙදර් පදුරුයි , හුළඟයි , හිරු එලිය යි , ඈතතට ම හරි ම අපූරුයි සර්.. අපි කිරි බිත්තර වගේ දේවල් ගන්න ගොවිපල ද අර ඈතින් ඈතින් පෙනෙන්නේ ?

කුඩා කදු ගැටය ඉහත්තාවේ තිතක් වන් ව පෙනෙන යමක් දෙස ඈන් අත දිගු කලා ය.කුඩාවට පෙනුන ද ඒ කුඩා ගොවිපලක් බව ඒ දෙස බලන්නෙකුට පැහැදිලි ව කිව හැකි ය. ගොවිපලට නුදුරින් වන තණකින් වැසුණු බිම් කඩෙහි නිදැල්ලේ උලා කන එළ දෙනුන් සි දෙනෙකුදස් අශ්වයෙකුද වැඩි දුරටත් ඔවුනට දක්නට ලැබුණි. ගොවිපොලට අයත් භූමි සීමාවේ ම පසෙකින් වන පළතුරු වත්තක් ද එලවලු වගා කරන ලද බිම් කඩක් ද ඔවුනට මවා පෑවේ දර්ශනීය සිතුවමකි.

" ඔය තමයි ඔලීගේ ගොවිපල. මට පේනේ දේවල් වෙනස් වෙලා. අයිතිකාරයෝ මාරු වෙලා. මම අවුරුදු තුනකට කලින් මෙහෙ එනකොට ඕක ඔලීගෙ ගොවිපල. දැං අයිතිකාරයෝ කවුද කියන්ට නම් මං දන් නෑ. ඒත් හොද මිනිස්සු වගේ. ඉතිං කතාව නවත්තලා අපි මොනවා හරි කාලා ඉමු නේද ළමයි "

dileep

ඈන් වහා සැන්ඩ්විච් කිහිපයක් ද තේ පානය වෙනුවෙන් ම රැගෙන ආ කේක් ගෙඩියක් ද පිතටට ගත්තා ය. මැස්සන්ගේ ගුමු ගුමු නාදයෙන් යුතු වූ විසල් හෙදර් පදුරක වාඩි ගත් ළමෝ සප්පායම් වීමේ කායීය පටන් ගත්තෝ ය. මී මැස්සන් දෙස බලමින් , විටෙක උන් පස්සේ එලවමින් ටිමී තම ආහාර කොටස ලැබෙන තෙක් නො ඉවසිල්ලෙන් බලා සිටියෙ ය.

" ඉතින් දැන් අපි කූඩාරම් ගහන වැඩේ පටන් ගත්තොත් නරක ද ?" තේ පානයෙන් අනතුරුව ජුලියන් කීවේ ය." ඩික් එන්න මා එක්ක. අපි මුලින් ම ටේලරය අන් පැක් කරලා බඩු මුට්ටු ටික එලියට අදිමු . ලූෆී සර්. අපි ඔයාගෙ කූඩාරමට කර්දරයක් වෙන විදිහට කූඩාරම් හදන්න හිතන්නේ නෑ. අපි ගොඩාක් ළගින් හිටියොත් අපේ සද්ද බද්ද නිසා ඔයාගෙ වැඩ වලට කරදර වෙන්ට පුලුවනි. සර් කියන්න මුලින් ම සර්ගෙ කූඩාරම ගහන්න හිතන් ඉන්නේ කොතන ද කියලා ?"

ලුෆී මහතා මදක් කල්පනාකළේ ය. ජුලියන් නිවැරදි බවක් ඔහුට දැනෙනේ ය. ළමුන්ගේ කූඩාරම තමන්ගේ කූඩාරමට ම අල්ලා ඉදිකලත් ඔහුගේ කිසි ම අකමැත්තක් නම් නැත. ඒ තරමට ම ඔහු මේ අපූර්ව කොලු කෙලි රැනට ආදරය කළේ ය. එහෙත් එහෙත් ..... ඔහු ළමුන්ගේ ගති ස්වභාවයන් මනා සේ හඳුනයි. විකාර ක්‍රීඩා කරමින් හඬ නගා කෑ කොස්සන් ගසමින් පැත්ත පලාත දෙවනක් කිරීමට ළමුන් තුළ ඇති කැමැත්ත ඔහුට අමුතුවෙන් අවබෝධ කරවිය යුතු නො වේ. එවිට තමාගේ අද්‍යන වැඩ කටයුතුවලට බාදා පැමිණෙයි. එම නිසා ඔවුන් නිහඬ කිරීම ද අපරාදයකි. යහපත් වැඩි හිටියෙකු විසින් නො කල යුත්තෙකි. උන්ගේ නිවාඩුව ඔවුන්ට විදින්නට දිය යුතු ය. අවසානයේකාට කාටත් සෙතක් සැලසෙන ලෙසින් තමාගේ කූඩාරම ළමුන්ගේ කූඩරමට තරමක් ඈතින් ඉදි කර ගන්නට එතුමා තීරණය කළේ ය.

dileep

" අන්න අර ලොකු ගෝර්ජ් පදුර ඔයාලට පේනවා නේද ? මම මගේ කූඩාරම එතන අටවා ගන්නම්. ඔය ළමයිට කැමති නම් මෙතනින් කූඩාරම් ගහ ගන්න. මේ බලන්න. මෙන්න මේ ගෝර්ජ් පදුරු නිසා හුළගෙන් ඔයාලාට හානියක් වෙන එකක් නෑ. අනිත් එක අපි කාටවත් අපෙන් බාදාවක් වෙන එකකුත් නෑ. මගේ සද්ද බද්ද ඔයාලට ඇහෙන එකකුත් නෑ. ඔයාලගේ සද්ද බද්ද මට ඇහෙන එකකුත් නෑ."

" ඒක හරි සර් " ජුලියන් කියා දැම්මේ, ලුෆී උන්නැහේ මොන තරම් අපූරු අයෙක්දැයි යලි යලිත් සිතමිනි. එයි පසුව ඔහු ඩික්ද කැඳවා ගෙන කූඩාරම් සවි කිරීමේ කටයුත්තේ නියැලෙන්නට පටන් ගත්තේ ය. වෙහෙසකර කටයුත්තක් වුව ද එයින්කාට කාටත් දැණුනේ දැඩි විනෝදයකි. ටිමියා සිරිත් පරිදි කාගෙ කාගේත් දෙපා අස්සේ දැවටෙමින් කඹයක් එහාට මෙහාට

අදිමින් කූඩාරම් සෑදීමේ කටයුත්තට දායක වූවත් ළමුන් සුරතල් බල්ලාගේ හිරි හැරය යන්තමින් හෝ මායිම්කළේ නැත.

පරිසරය වසා අඳුර පැතිරෙන විට කූඩාරම් ත්‍රිත් ව ය සවි කොට බිමට එලීමට ගෙනා රෙදි ද අතුරා නිදන බෑග් ද සුදුසු පරිදි තැම්පත් කොට අවසාන වී තිබිනි. කූඩාරම් තුනෙන් දෙකක් ළමුන් සඳහා වූ අතර අනිත් කූඩාරම ලූෆී උන්නැහේගේ කූඩාරම විය.

" මම නිදාගන්ඩ යනවා ළමයි . මගේ ඇස් දැනටමත් පිය වෙන නො පිය වෙන ගානයි. ගුඩ් නයිට් හැමෝට ම . හොඳින් නිදාගන්න."

එසේ පවසා ලූෆී උන්නැහේ සමු ගන්නවාත් සමග ම ඈත් ද විසල් ඈණුමක් හැරියා ය.

dileep

" එන්න. අපිත් නිදා ගමු " ඈ දෙස බලමින් ජූලියන් කීවේ ය. ' අපි ගාව චොක්ලට් වගේකුයි, බිස්කට් වගේකුයි තියෙනවා නේද ? අපි නිදන බෑග් වලට වෙලා ඒවකකා නිදා ගමු. ගුඩ් නයිට් කෙල්ලනේ ... හෙට උදේ ම නැගිටිමු "

ජූලියන් සහ ඩික් දෙදෙනා ඔවුන්ගේ කූඩාරමටත් ගැහැණු ලමුන් දෙදෙනා ජෝර්ගේ පසුපස ඉදිකටුවට ඇදෙන නූලක් සෙයින් ඇදෙන ටිමියා ද කැටුව ඔවුන්ගේ කූඩාරමටත් ඇතුළු වූ හ.ඇඳුම් උනා දමා නිදන බෑග් තුලට ඇතුලු වූ පසුව ඔවුනට දැණුනේ මෙතෙකැයි කියා වචනයෙන් කිව නො හැකි තරමේ සුව පහසු ගතියකි.

" මේක නම් නියමයි " ටිමී පසෙකට කරමින් ජෝර්ජ් කෙර්ඳිරුවා ය. "" මගේ කකුල් දෙක උඩට වරෙන් ටිමී "

" ගුඩ් නයිට් ජෝ ර් ජ් " ඈන් නිදි මතේ කොදුරන්නට වූවා ය. ' බලන්න ජෝර්ජ්. ටෙන්ට් එකේ ඇරුනු තැනින් අහසේ තරු ජේනවා. ඒව වෙනදට වඩා ලොකුයි කියලා ඔයාට හිතෙන් නැද්ද ?"

තරු ලොකු ද පොඩි දැයි කියා වගේ වගක් ජෝර්ජ්ට නම් නො වී ය. දවස මුලුල්ලේ ම දැඩි ඒ වෙහෙස වී සිටියෙන් ඈ වැටුණු පමාවෙන් නින්දට වැටුණා ය. ටිමී සිරිත් පරිදි එක් කනක් විවර කොට විමසිල්ලෙන් පසු වූවේ ය. සැබැවින් ම උග සෙස්සන්ට සුබ රාත්‍රියක් පතන්නේ මේ ආකාරයෙනි. තවත් නොබෝ වේලාවක් මෙ පරිද්දෙන් මුර කිරීමේ කටයුත්තෙහි නියැලුනු ටිමී ජේන තෙක් මානයක අණතුරක් නැති බව ඉන්තේරුවෙන් ම අවබෝද කොට ගත්තෙන් දෝ ගැඹුරු නින්දකට වැටුණේ ය.

dileep

" කදවුරු ජීවිතේ අපේ පළමු රාත්‍රිය." ඈන් සතුටින් සිතුවා ය. " අද නම් මට නින්ද යන එකක් නෑ වගේ. මම මෙහෙම වැතිරිලා ම ඈහැරගෙන අර ඈත තියෙන තරුදිහා බලාගෙන ඉන්නවා. "

ඒත් ... ඒත් කියා කට ගන්නට ද මත්තෙන් ඈන් ද නින්දට වැටුණු බව නම් සදහන් කල යුතුවැ තිබේ.

dileep

## 03. ඈන්ගේ ගිනි කන්ද

'' කූර් ලී.... කූයි ලී ...'' යි හඬක් ඇසිමෙන් පසුදා උදෑසන ප්‍රතමයෙන් අවදි වූවේ ජූලියන් ය.

" ඒ මොකක් ද ?" යි තමාට ම කියා ගත් හේ මොහොතකට තමා සිටින්නේ කොහේ දැයි වටහා ගත නො හැකිව තක්කු මුක්කු වී ගියේ ය.

ඒ හාත් සමග ම තමා මේ සිටින්නේ කදුකරයේ බවත් නිවාඩුව ගත කිරීම පිණිස වන ගත වී කූඩාරමක් ඉදි කොටගෙන බවත් තමා අසළින් ගැඹු'රු නින්දක ගැලී සිටින්නේ ඩික් බවත් ඔහුට අවබෝද වී ගියේ ය. කූයී ලී වශයෙන් මුනු මුනු හඬ නගන්නේ කදුකරය වාස භූමිය කොට ගත් කුරුල්ලන් මිස අන් කිසිවෙකුත් නො වන බව තේරුම් බේරුම් කොට ගැනීමට ඔහුට ගත වූවේ තවත් තත්පර කිහිපයක් පමණෛකි.

අනිවාරතේ කල් වේලා ඇතිව අවදි වීම සම්බන්දයෙන් වූ නො පහන් හැඟීමක් ද සමගින් හේ කළින්දා නිදා සිටි ස්ථානයට ම ගොස් යළිත්වරක් බිම වැතිර ගත්තේ නිදි ලොවේ තවත් එක සවාරියක් ගැසීමට ම නො වේ. රාත්‍රියේ පොඩි බඩගින්න නිවා

dileep

ලනු වස් උපකාරී වූ චොක්ලට් බාර් එකෙන් ස්වල්පයක් ද ජූලියන් කටේ දා ගත්තේ ය. මේ වන විට මුලින් ඇසුනු කුරුලු මුණු මුණුව ක්‍රමයෙන් උච්ච ස්වරයෙන් ඇසෙයි. කූඩාරමේ විවරයන් අතුරින් යන්තමින් පමණක් පායා ඇති සූර්යයාගේ උදා හිරු කිරණ කූඩාරම තුලට සේන්දු වෙනු ද ඔහුට පෙනෙයි.

එක් වර ම ටිමීගේ ලෙව කෑමක් , ආදර සමාචාර දැක් වීමක් , නාවා පිරිසිදු කිරීමක් දිවෙන් කරන ලද සම්බාහනයක් හේතු කොටගෙන ජූලියන් අවදි වන විට ගැහැණු ළමුන් පවා අවදි වී තිබිණි. '' පොඩි නින්දක් ගිය දුරක්" යැයි තමාට ම කියා ගනිමින් ඔහුද දනි පනි ගා නැගී සිටියේ ය.



" නැගිටිනව කම්මැලියා '' ඈන් උච්චස්වරයෙන් කෑ ගැවා ය. " දැනටමත් වෙලාව හත හමාරයි. ඔයා තාම නිදි නිසා තමයි

ටිමීට කුකුලාගේ වැඩේ බාර දෙන්ට සිද්ද වුනේඅපපි නම් නැගිටලා සෑහෙන වෙලා "

" දිව්‍ය ලෝකයේ පලවෙනි උදෑසන . ගුඩ් මෝර්නින්ග් වේවා '" ජෝර්ජ් ද කීවා ය.

" අපි හිතුවේ උදේ පාන්දරම දිය පාර හොයා ගන්ට යන්ට. දිය පාරක් ළඟ තියෙන එකේ වලන් පිගන් එහෙම එතනට අරන් යන්ට පුලුවන්. ආයෙ මොකට ද නිකන් වතුර බාල්දි උස්සන් එන්න තරම් කරදර වෙන්නේ."

ඩික් ද ඒ වන විට අවදි වැ සිටියෙන් උදේ පාන්දරින් ම නා කියා ගත යුතු යැයි කොල්ලෝ දෙදෙන තීරණය කළහ. උදෑසන සිතූ තරමට ම සීතල නො වූ අතර ඔවුන් සියලු දෙනාට ම ඒ වන විටත් උදා ආහාරයේ අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට පටන් ගෙන තිබුණි. දිය නෑමට අවශ්‍ය කරනා ඇඳුම් අයිත්තම් කලමණා සියල්ල සූදානම් කොටගෙන ඩික් සහ ජූලියන් කූඩාරමෙන් පිතටට බසින විටත් ගැහැණු ළමුන් දෙදෙනා දියැල්ලේ සිට පෙරලා කූඩාරම් බලා පැමිණෙමින් සිටියෝ ය.

dileep

" ඒක මේ කිට්ටුව තියෙන්නේ. අන්න අර අතන ' ' අගිල්ලක් දිගු කොට කුඩා දිය උල්පත පවත්නා ඉසව්ව පෙන්වා සිටියේ ඈන් ය. " ටිමී. උඹත් ගිහින් මුං දෙන්නට පෙන්නපං .ඒක හරි ශෝක් අනේ. හරිම පිරිසිදුයි. සීතල ම සීතල යි. දැකුම් කලු යි. ආ කියන්ට අමතක වුනානෙ.අපි එතන බාල්දි දෙකක් තියලා ඇති. පුරවන් එන්ඩ ඈ ..."

" මොනවා මොනවා.. කපටි කෙල්ලො. උබලා හදන්නේ අපි ලව්වා වතුරත් අද්දවන්ට ද ? හොදයි දැනට ම මූන අත පය

සෝදගෙන ඉන්න එකේ මොන එහෙකට ද වතුර අරන් එන්නේ ?"

" අයියෝ ඩික්. පිගන් දීසි එහෙම හෝදන්ට කියලා තේරෙන් නැද්ද ? " ඈන් සිනා රැල්ලක් ද සමගින් ඇගට පතට නො දැනෙන අයුරින් කියා දැම්මා ය. " මට එක පාරට ම මතක් වුනා අපිට ඒ වගේ වැඩ වලට වතුර ඕනි කරනවා නේද කියලා. ඉතින් ඔන්න බාල්දි දෙකක් පුරෝල ම තිබ්බා. ආ ඒක නෙමේ ජෝර්ජ්. අපි යමුද ලූෆී සර් ඇහැරල ද බලන්න. තාම නම් මං ඇහැටවත් දැක්කෙ නෑ එයා ව ."

" මං නම් කියන්නේ ඒ මනුස්සයට තව ටිකක් නිදා ගන්න දෙන්න කියල යි. " ජුලියන් කියා සිටියේ ය. " දවස තිස්සෙ ම අර වගේ ඉබි ගමනෙන් කාර් එක එලෝලා එයාට හොදට ම මහන්සි ඇති නොවැ. අපිට ඉතින් එයාටත් එක්ක ම බ්‍රේක්ෆස්ට් හදන්ට බැරි කමක් නෑනේ. මොනවද අද උදේට දෙන්ට යන්නෙ ?

" තක්කලියි ලුණු දාපු උෆරු මසුයි " කෑම පිසීමේ ක්‍රියාවලියේ වගකීම කරට ගැනීමට කවදත් කැමැත්තක් දක්වන ඈන් කීවා ය. " ඒක නෙමේ ජුලියන් ඔයා කොහොමද ලිප පත්තු කරන්ට හිතන් ඉන්නේ "

" ජෝර්ජ් දන්නවා ඒක පත්තු කරන විදිහ. ඒක නෙමේ . අපි තාච්චියක් පැක් කරාගත්ත ද ? මට හරියට ම මතක නෑ."

" අනේ අනේ උඹලා . කන්න කෑම හම්බෙනව නම් හම්බෙන විදිහේ කිසි ම වැදගත්කමක් නැති හැටි. හරි හරි. බොරුවට බය වෙන්ට එපා. මම ම යි තාච්චියක් දා ගත්තේ. " ඈන් අමනාප මුහුණක් මවා ගනිමින් කියා සිටියා ය. " හරි හරි. දවස ම

dileep

මෙතන කියව කියවා ඉන්න ද කල්පනාව. නාන්න ආවනං ගිහින් නාගෙන එන්ට. උඹලා එන්ටත් කලින් අපි බ්‍රෙක්ෆස්ට් ලැහැස්ති කරලා තියේවි "

මග පෙන්වීමේ කාර්යය මනාව ඉෂ්ඨ සිද්ද කරමින් ටිමී පෙරමුන ගත්තේ ය. උදා සූර්යාලෝකය වැද දිලෙන දුඹුරු පැහැති විචිත්‍රවත් දිය පාර දක්නට ලැබුණු විට , දුර ගමනක යෙදී වෙහෙසත් තෙහෙට්ටුවත් හේතු කොටගෙන ගෙදරට ගොඩ වූ සැණින් ඇදට පනින්නාක් මෙන් දිය පහරට නො පැන ඉන්නට කොලුවන් දෙදෙනාට හැකි වූවේ නැත.ටිමී ද ගුවනේ පාවී දියට පැන්නේ ය. එතෙන් සිට දිය බිදෙන හඩත් , ප්‍රීතියෙන් කෑ කොස්සන් ගසන හඩත් විසින් මෙතුවක් පරිසරයේ පැවැත්තා වූ නිහඬ නිසසල බව මුලුවනින් ම බිද දමන ලද

" හරි. දැං ගිහින් ලූෆී ලොක්ක ඇහැරවමු " තුවායක් ගෙන වේගයෙන් තම සිරුර පිස දමමින් ඩික් යෝජනා කළෙ ය. "වතුර ටික නම් කදිමයි. සීතලත් ගානට. කරදරේකට තියෙන්නේ බඩගින්න ඩබල් වුනු එක විතරයි .

" බේකම් බැදෙන සුවද එනවා දැනෙනවද ?" වාතයට ඉව අල්ලමින් කියා සිටියේ ටිමී නොව ජුලියන් ය.

වහා බඩු බාහිරාදිය අකුලා ගත් ඔවුහු පෙරළා ගැහැණු ළමුන් සිටි දෙසට පිය නැගූහ. ඒ වන විටත් ලූෆී උන්නැහේගේ සේයාවකුදු දක්නට ලැබුණේ නැත.

හෙදර් පදුරු මත වාඩිගත් ඔවුහු උදා ආහාරය අනුභව කිරීමට පටන් ගත්තෝ ය. "මේ තුන් ලෝකෙට ම ඉන්න හොද ම කෝකියා උඹ තමයි ඈනෝ..." කවුරු කවුරුත් කීවේ ඈන් මුරුංගා අත්තේ තබමිනි.

" හරි හරි ඉතිං මං ඔයාලගෙ කෑම බීම ගැන සැලකිල්ලක් දක්වනවා තමයි." පුංචි පැංචි ලෝකයේ හොඳ ම කෝකිවරිය වැඩි දුරටත් කියා සිටියා ය." ඒත් ඉතිං ජෝර්ජ් තමයි හෝදන වැඩ කටයුතුවල බර කරට ගත්තේ. නේද ජෝර්ජ්...'

ඒත් ඇත්තට ම ජෝර්ජ් නම් ඉවුම් පිහුම් කටයුතු සම්බන්දයෙන් ඒ තරම් කැමැත්තක් දැක් වූවෙ නැත. ඇඳන් පිළිවෙල කිරීම ගෙවල් අස් පස් කිරීම, වලං පිගන් සේදීම වැනි දෑ වලින් ඈන් පුදුමාකාර සතුටක් වින්දනයක් ලැබුවත් , එවැනි දෑ වලට කොලු වෙස් ගත් ජෝර්ජ් නම් බුම්මා බුකවා ගත් මුහුණක් පළ කළා මිස කිසිදු කැමැත්තක් නොදැක් ඌ බව නම් කිව යුතු ව තිබේ.

" අනේ අනේ ජෝර්ජ්. උඹ ඔහොම බුම්මාගෙන බුකෝගෙන ඉන්ට ඕනි නෑ. හෝදන වැඩ කටයුතු ටික ටිමීට බාර දීපන්කෝ. ඌ උගේ දිවෙන් ලස්සනට වැඩේ කරලා දෙයි " යි ඩික් කියා දැම්මේ කවුරු කවුරුත් සිනහ ගන්වා ජෝර්ජ්ගේ ද මුහුණේ සිනා රැල්ලක් තවරාලමිනි.

" තවකාට හරි රෝස්ට් කරපු පාන් එහෙම ඕන ද ? "

" නෑ. ඒත් බිස්කට් ටින් එකක් කඩමු ' ඈන් යෝජනා කොට සිටියා ය. " ඒක නෙවෙයි කොල්ලනේ. උබල' දෙන්නට පුලුවන් ද අද ෆාම් එකට ගිහින් කිරියි තව ඉවුම් පිහුම් වැඩ වලට වුවමනා කලමනා ටිකකු යි අරන් එන්ට. අපිට පළතුරු ටිකකුයි පාන් ටිකකුයිත් එහෙන් ගන්ට පුලුවන් වෙයි "

හරි හරි.. අපෙන් කෙනෙක් හරි අපි සේරට ම හරි ගිහින් ඒ දේවල් අරන් එන්ට බැරියැ. ඒක නෙමේ ඈන් ඔයාට බැරිද ලුෆී උන්නැහේටත් ඔය පාන් ටිකක් එහෙම රෝස්ට් කරලා ගන්ට ?

dileep

මම ගිහින් මනුස්සයා ඇහැරවන් එන්නම් . නැත්තම් අද දවල් දොලහ එක වෙනකනුත් එයා නිදා ගනීවි."

" ඒක හැබැව ඩික්. උබ ගිහින් කන්වැයෙක් හරි මොකෙක් හරි සතෙක් වගේ සද්දයක් දාපං. අපි සේර ම ගිහින් බෙරිහන් දුන්නටත් නො ඇහැරෙන තරමට නිදාගෙන හිටියත් ලූෆී සර් ඒ අගේ සද්දෙකට ඇහැරෙන්ට පුලුවන් "

ජුලියන් එසේ කීවත් ලූෆී උන්නැහේ ඇහැරවීමේ කට යුත්ත කරා පිට ව ගියේ ඩික් නොව ඔහු ම ය. ඔහු ඉතා ආචාර්ශීලී අයුරෙන් කූඩාරම අසලට ගොස් කතා කරන්නට පටන් ගත්තේ ය.

" සර් ඔයා නැගිටල ද ?"

dileep

කෙසේ වෙතත් ලූෆී මහතා පිළිතුරක් දුන්නේ නැත. ජුලියන් යළිත් කිහිප විටක් ම මොර දුන්නද ප්‍රතිඵලයක් නො ලද්දෙන් අවසානයේ ඔහු කූඩාරම් රෙද්ද මෑත් කොට ඇතුලට හිස පොවා බැලුවේ ය. එහෙත් ඔහුට නිදි කුමාරයා දක්නට ලැබුනේ නැත. සැබැවින් ම කූඩාරම සිස් ය. ලූෆී උන්නැහේ අතුරුදන් වී තිබේ.

" මොකෝ තත්වෙ ජු ....' ඩික් කෑ ගැවේ ජුලියන්ට ඇසෙන ලෙසිනි.

" එයා නෑනේ . කොහේ ගිහින් ද මන්දා'

ඔවුන් අතර හටගත්තේ ලූෆී උන්නැහේගේ කූඩාරමේ පවත්නාක් බදු නිහැඩියවකි. නිහඩියාව තුළ ම ළමුන්ගෙ මනස්

තුළ නේක සිතිවිලි පහළ වෙමින් තුබුණේ ය. සැබැවින් ම ලූෆී මහතා කොහි ද ? මෙ පරිද්දෙන්කාට කාටත් නො කියා ඔහු අතුරු දන් වූවේ කෙසේ ද ? වික්‍රමක්‍රියා ඔවුන් පසු පස හබා එයි. එකත් එකට ම මේ ඔවුන්ගේ තවත් එක් වීර ක්‍රියාවක ආරම්භය දැයි ඈන්ට සිතේ. ඒ අතර ඩික් එක්වර ම නිහැඩියාව බින්දේ ඈන්ට වඩා සහමුලින් ම වෙනස් වූ අදහසක් ඔහුට පහළ ව තුබූ බැවිනි.

" එයාගෙ මකුණු ටින් එකත් නැද්ද බලන්ට. ඔයා දන්නවනෙ අර කෘමී සත්තු අල්ලන ටින් එක? ඒක නැත්තම් එයා ගිහින් තියෙන්නෙ පාන්දර ම කෘමී සතුන් දඩයමේ. ආ... ඇඳුම් පැලඳුම් ගැනත් පොඩියක් බලපං "

ජූලියන් කූඩාරමට ඇතුළු වී ශර්ලොක් හෝම්ස් කටයුත්තේ නිරත වෙන්නට පටන් ගත්තේ ය.

dileep

" බය වෙන්ට දෙයක් නෑ " යි ඔහු කියන්නට විය." මකුනු ටින් එක අතුරු දන් වෙලා . අපි ඇහැරින්ටත් කලින් එයා කෘමී සත්ව දඩයමේ ගිහින් වගෙ යි. මොනවද ඔට්ටු. උන්නැහේට උදේ කෑම වගේ දේවල් ගැන මෙලැහැටත් වගේ වගක් නතුවැති "

" අන්න එහෙමයි අපේ ලූෆී ස්ර් " ඩික් ද කීවේ ය. " හරි. අපි ආවේ එයාව බලා කියා ගන්ට නෙවේනේ.. එයාට පුලුවන් එයා කැමති දෙයක් කරන්ට. ඒක එයාගෙ අයිතිය. එයාට බ්‍රෙක්ෆස්ට් ඕන නැත්තම් උදේට බඩගින්නෙ ඉන්න සම්පූර්ණ අයිතියක් එයාට තියෙනවා. බය වෙන්ඩ දෙයක් නෑ. දඩයම් කටයුතු ඉවර වුනා ම එයා ආපහු එයි."

" ඈන් ඩිකුයි මායි ෆාර්ම් එකට ගිහින් අපට අවශ්‍ය දේවල් අරන් එන්නම්. තවත් මෙ ගැන හිත හිතාකාලෙ නාස්ති කරන

එකේ තේරුමක් නෑ. දැනටමත් අපි ගොඩක් වෙලා බකන් නිලාගෙන හිටියා නොවැ "

" හරි ජුලියන්. ආ ඔයත් යන්ට ජෝර්ජ්. මට උයන පිහන වැඩ කටයුතු ටිකයි අපේ කෑම්ප් සුද්ද පවිත්‍ර කරන වැඩ කටයුතු ටිකයි තනියෙන් බලා කියා ගන්ට පුලුවන්. කොල්ලො දෙන්නා අරන් ආව වතුර බාල්දි දෙකත් තියෙනවානේ. ටිමීවත් එක්ක යන්න ජෝර්ජ්. උඹටත් ටිකක් ඇවිදලා කරලා කකුල් දෙකේ හිරි ඇර ගන්ට අවස්ථාවක් දෙන්ට ඕන "

ඉවුම් පිහුම් වඩකටයුතු , වලන් පිගන් සෝදන කටයුතු වලින් ඉවත් වීමට ලැබීම පිළිබද උපන් දැඩි සතුටෙන් ජෝර්ද පිරිමි ළමුන් දෙදෙනා හා එක් වූවා ය. ඔවුන් තිදෙනාට ඉදිරියෙන් ගමන් ගනිමින් ගොවි පල දක්වා ගමන් ගන්නා මාවත තුළ වන අතුරු ආන්තරායක් වන සතෙකුගේ තර්ජනයක් වී නම් ළමුන් ගලවා ගැනීමේ රාජකරියේ නියැලීමේ වගකීම ටිමියා ද කරට ගත්තේ ය . ඈන් ඇගේ දෛනික රාජකාරීන් පටන් ගත්තේ ඔවුන් නො පෙනී යනවාත් සමග ම ය. රාජකාරීන් යැයි කීවාට මේ සියල්ලක් ම පුංචි ගැහැණු ළමයාකළේ හද පිරි ප්‍රීතියෙන් ස්ව කැමැත්තෙන් කිවා යුතු ය. උදා සූර්‍ය හිරු කිරණයෙන් ඇයට දැනෙන්නේ සුව දායක උණුසුමකි. ඇය තමන්ට ම ඇසෙන් සේ ගීයක් ද මුණු මුණුගාමින් සිටියි. වැඩ කටයුතු සියල්ල නිමා කරන්නට ඇයට වැඩි වේලාවක් ගත වූයේ ද නැත. කටයුතු සියල්ල නිමවා අයියලා තිදෙනා _ අයියා වෙස් ගත් අක්කාද ඇතුළුව _ අපසු ඒ දැයි ඈ පෙර මග බලා සිටියා ය . එහෙත් ඔවුන් තිදෙනාගේ හෝ ලුෆී උන්නැහේගේ සලකුණකුදු ඈන්ට දක්නට ලැබුණේ නැත.

" කට්ටිය එන්ට පරක්කු නම් මාත් ඔන්න ඔහෙ පොඩ්ඩක් ඇවිදලා එන්ට ඕනි " ඈ කියා ගත්තේ තමාට ම ඇහෙන හඬිනි. " අර පුංචි දිය පාර දිගේ කන්ද උඩට ගියොත් මට පුලුවන් වෙයි

උල්පත හොයා ගන්න. දියැල්ල පටන් ගන්න තැන හොයා ගන්න. නියමයි. අනික දියැල්ල දිගේ උඩට යන නිසා ආපහු කෑම්ප් එකට එන පාර මට වරදින්න විදිහකුත් නෑනේ ...."

උදා සූර්ය තාපයේ සුමුදු සිහිලේ නැහැවෙමින් , ඈත නිමනයේ සිට හමන මන්ද මාරුතයේ නැලවෙමින් කඳු කරයේ සිට ගලා හැලෙන දුඹුරු පෑ දියැල්ල අසළට පුංචි ඈන් හෙමි හෙමින් සැපත් වූවා ය. දිය පහර අද්දරින් වැවී ඇති ගණ හෙදර් පදුරක් දෑතින් ම අල්ලා ගත් ඕ ඉතා අපහසුවෙන් හතර ගාතයෙන් මෙන් ඉහළට නැග ගත්තා ය. කන්ද ඉහළට ඉහළට ම යන

dileep



නොක් විහිද තිබෙන්නේ සරුව වැවී ඇති මීවන ශාක යි. ඒවා අතරින් ඇ හක්කලම්කළේ පුංචි ගීයක් ද හෙමි හෙමින් මුමුණමිනි. ඉතා මත් සිනිදු පාසි වර්ගයක් ද මීමන ශාක අද්දරින් වැවී මැදෑ සම්බන්දකම් පවත්වමින් තිබෙන්නේ ය. ඇය බිමට නැඹුරුවැ දිය බිදක් අතට ගෙන තොල ගා බැලුවා ය. ඉතාමත් ම සීතල මෙන් ම පිරිසිදු බවක් ද ඒ තුළ පවත්නා බව ඇ සැනෙකින් ම නිගමනය කළා ය.

තමා සම්බන්ද ව ම ප්‍රීති සිතින් ඈ දිගින් දිගට ම ඇවිද යන්නට වූ වා ය.තවත් මිනිත්තු කිහිපයක් ඉදිරියට ඉදිරියට ඉදිරියට ම ඇවිද ආ ඈ අවසානයේ දිය දහරාව ඇරඹෙන කන්ද මුදුනේ පිහිටි කුඩා ගොඩැල්ලක් අසලට පැමිණියා ය. මුලුවනින් ම හෙදර් පඳුරින් වැසී ගත් බිම් කඩකින් ඇරඹී ගුරු ගුරු රාව නංවමින් කුඩා දිය පහර ගලා යනු ඈන් බලා සිටියේ සතුටත් සැහැල්ලුවත් පිරී ඉතිරී යන හදවතිනි.

" ආ... ඔයා එහෙනම් මෙතනිනුයි ගමන පටන් ගන්නේ " තරමක් හඬින් තමාට ම මුමුණා ගත් පුංචි ගැහැණු ළමයා හෙදර් පඳුරු ගොල්ලේ වැතිර ගත්තා ය. දැං ගලා යන දිය පහරේ සංගීත රාවය ඈට නිවී හැනහිල්ලේ අසා සිටිය හැකි ය. කුඩා කෘමීන්ගේ මුණු මුණුව ද අසා සිටින්නට හිත දෙන තරම් ය. එහෙත් ....එහෙත් .... දිය පහරේ ගොර ගොර හඬත් කෘමින්ගේ මුනු මුණු හඬත් හැරුණු කොට තවත් වටහා ගත නො හැකි හඬක් ද දැන් දැං ඈට ඇසෙයි. මුලදී ඒ තරම් ගණන් නො ගත්තත් දැන් දැන් දියැලි මියසියට බාදා කරමින් ඇසෙන ඒ හඬ ඈන් දැහැන් ගත සිතිවිලි දහර බිද හෙලන්නට තරම් වර්දනය වී තිබෙයි.

" දෙයි හාමුදුරුවනේ ... ඒක නම් ඇහෙන්නේ මහ පොලොව යටින් " එක් වරම පහල වූ දහසක් හේතු කොටගෙන බියෙන් තිගැස්සී ගිය ඈ හුනස්නෙන් නැගී සිටියා ය. " මොනවද මේ වෙන්ට යන්නේ.. භූමි කම්පාවක් වත් ඇති වෙන්ට යනවාද ?"

පාරිසරක සංගීතයට බාදා පමුණුවා ලූ ගිගුරුම් හඬ ක්‍රමයෙන් තීව්‍ර වෙයි. වහා පැන නැගී දිව යන්නට ඇගේ සිත මොරගා කිය යි. ව්හෙත් ඊටත් බියපත් ගැහැණු ළමයාට ඇගේ

දෙපා අවසර දුන්නේ නැත. දෙපා වාරු නො මැති වී ගියෙන් ඈ හිටිපියෙන් ගැහෙන සිරුරින් බකන් නිල සිටියා ය.

"ශ්ර්රීක්ක්ක්ක් ' හඬක් ඊ ළගට ඇට ඇසුනේ ය. කුමක් වුනත් මේ සියල්ලක් ම ඇසෙන්නේ ඉතා නුදුරින් මහ පොලොව යටින් බව ඈට කිව හැකි ය. ඒ හාත් සමග ම ඇගේ සිත බීතියෙන් බීතියට පත් කළ තවත් යමක් සිදු විය. විශල සුදු පැහි දුමාරයක් පොලොව දෙබෑ කරමින් ඉහළ නැගෙන්නට වූ අතර හමා ආ මන්ද මාරුතයේ පා වී ඒ මැකී ගියේ ය. මේ නිහඬ නිසසල පාලු කදුකරයේ මෙවන් යමක් සිදුවිය හැකි යැයි ඈන් නම් සිහිනයෙනුදු නො සිතුවා ය. සිත සසල කර වමින් ඇසුනු බිහිසුනු ගිගුරුම් හඬ දුමක් වැ පොලොවෙන් උඩට මතු වී සුළගේ තැවරී යාමේ අබිරහස ඈන්ගේ සකල ශරීරය කිලි පොලා ලොමු දැහගන්වා සියොලග දාහයෙන් තෙමා ලන්නට සමත් වී තිබේ.

dileep

වහා ඈ දෙපා වාරු ගත්තා ය. මහ හඬින් මොරගාමින් හැකි උපරිම වේගයෙන් ඒ දුවන්නට තබා ගත්තා ය. " ගිනි කන්දක්.... උදව් කරන්න.... උදව් කරන්න... මම හිටගෙන හිටියේ ගිනි කන්දක් උඩින්... හෙල්ප්... හෙල්ප්.... ගිනි කන්දක් තියෙනෝ......"

හඬමින් කෑගාමින් මෙන් ම හෙදර් පදුරුවලට පින් සිදු වෙන්නට අත පය කඩා නොගන්නා ලෙස පෙරලෙමින් ඈ පහලට පහලට දිව අවා ය. අවසාන්නයේ ඇයට කවුදෝ කතා කරනු ඇසුණි.

" කවුද කෑ ගහන්නේ.. මොකද වුනේ ..."

ඒ වූ කලී ලුෆී මහතාගේ කටහඬ මිස අන් කිසිදු හඬක් නො වේ. ඈන් වහා ඔහු ඇළද ගෙන කෑ මොර දුන්නා ය.

" අනේ ලූෆී සර් මාව බේරගන්න... අරහෙ ගිනි කන්දක් තියෙනවා ..."

" ඇයි දරුවෝ.. මොකද වුනේ කියලා කියන්නකෝ. මම ඉන්නවානේ " ආදර බු හඬින් කරුනාවන්ත ස්වරයෙන් ලූෆී උන්නැහේ කියා සිටියේ ය.

ඇන් සියල්ල අකුරක් නෑර කියන්නට පටන් ගත්තා ය.

" අරහෙ උඩින් දුමක් නගිනවා ඔයාට මෙතනට පේනව ද ? ඒ ගිනි කන්දක් ලූෆී සර්.. මුලින් ගුරු ගුරුගාල සද්දෙ ඇහුනා . එන්න එන්න ම එන්න එන්න ම ඒ සද්දෙ වැඩි වුනා. ඊට පස්සෙ දුම් දාන්න පටන් ගත්තා. සර් ඉක්මන් කර්න්න. තව චුට්ට වෙලාවකින් ගිනි පුලිගුයි ලාව යි ගලන්ට පටන් ගනී "

dileep

" සංසුන් වෙලා ඉන්නකෝ ළමයෝ.. " ඇන්ගේ කතා ව අසා හුන් ලූෆී උන්නැහේ කියන්නට පටන් ගත්තේ ඒ තරම් කලබලයකින් නම් නොවේ. ඔහු සිටින්නේ සියිල්ල අවබෝද කර ගත්තාක් මෙන් නිවී සැනසිල්ලේ ය. නැව ගිලුනත් බෑන්ඩ් චූන් සෙයියාවෙනි. මේ සා අනතුරක් අත ළග තියැද්දීත් කිසිදු කලබලයක් නො මැති ව , කිසිත් සිදු නොවන ගානට සිනහ පිරි මුහුණින් යුතුව මේ මිනිසා කතා කරන්නේ ඇන් පුදුමයට පත් කරමිනි.

" ඉතිං ඔයා හරියට ම දන් නෑ නේ ද පුතේ ඒක ගිනි කන්දක් ද නැද්ද කියල ?"

" නෑ ඉතිං"

" හරි.. ඉතිං අහන්නකෝ දැං. මේ කඳු යටින් උමං මාර්ග වගයක් තියෙනවා. ඒ උමන් යටින් කෝච්චි යනවා. ඒ කියන්නේ පුතේ මේ තැන්නේ ඉඳන් වෙනත් තැන්නකට විහිදුනු උමං දුම්රිය මර්ග දෙක තුනක් මේ කඳුකරයේ තියෙනවා. ඉතිං ඒවගෙන් කෝච්චි යන කොට ඔයාට ඔය ඇහුනා වගේ සද්ද බද්ද ඇහෙන්න ගන්නවා. ඔයා ඔය දැක්ක වගේ දුම් පාරකුත් පොලොවෙන් උඩට එනව. "

ඇන් තිගැස්සී ගියා ය. ඇයට දැන්නේ එසේ මෙසේ ලජ්ජාවක් නො වේ. ඉවක් බවක් නැතිව ඔලිම්පික් දුවන්නක් මෙන් දිව ගිය හැටි ගිනි කන්දකැයි බෙරිහන් දුන් හැටි ඇගේ සිහියට නැගෙද්දී නම් මහ පොලොව පලාගෙන යන්නට තරම් ඈට සිතෙන බව නො රහසකි.

" දෙවියනේ. මම දැනන් හිටියෙ නැනේ මේ හරියේ උමං දුම්රිය පාරවල් තියෙන බව. මාරයි. හරි ම අමුතුයි. අයියෝ අයියෝ මං හිතුවේ ම මම කකුල් දෙක තියාගෙන ඉන්නේ මහ ම මහ ගිනි කන්දක් උඩ කියල යි. අනේ ලුෆී සර්.. ඔයා මේක අනික් අයට කියන්නේ නෑ නේ ද ? උන් මට හිනා වෙයි බඩවල් අල්ලගෙන .."

" හරි හරි දරුවෝ. මේක අපි දෙන්නගෙ රහසක්. මම කෙල පොදක් හෙලන් නෑ අනික් අය එක්ක " ලුෆී මහතා පෙර පැවති මුදු මොලොක් හඬින් ම බයෙන් සහ ලැජ්ජාවෙන් බිරංතට්ටු වී හුන් ඇන් ගේ හිත හදමින් කීවේ ය. " අපි දැන් ආපහු කූඩාරමට යමු. ඔයා ගාව උදේට කන්න දෙයක් තියෙනව ද ?මට දැං හුගක් බඩගිනියි. යක්කු සීයක් වුනත් කන්න පුලුවන්. මම උදේ පාන්දර ම දැක්කා මගේ කූඩාරම ගාව ඉන්න දුර්ලබ ගන්යේ සමනලයෙක්. ඉතිං මං පාන්දරින් ම උගේ පස්සෙන් එලවන්ට පටන් ගත්තා."

dileep

" අපි උදේ කෑම කාලා ගොඩාක් වෙලා ... ඒත් සර් මා එක්ක එන්නකෝ. මං ඉක්මනට මොනව හරි රත් කරලා දෙන්නම්. ආ මං ඔයාට බේකන් හදලා දෙන්නම්. කර කරපු පානුයි තක්කලියිත් හදලා දෙන්නම්කො."

" අහා.. අති විශිස්ටයි " ලුෆී මහතා සිනා රැල්ලක් මුහුණේ තවරා ගනිමින් කියා සිටියා ය. " ඔන්න එහෙනම් ආයෙ ගිනි කදු ගැන අපි වචනයක් වත් කතා කරන් නෑ..."

ඔවුහු යළිත් වරක් කදවුරු භූමියට සම්ප්‍රාප්ත වූවෝය. ගොවි පොලසොයා ගිය සෙස්සෝ ඒ වන විටත් පැමිණ සියෙන් ඈන් මොන ලෝකේ ගියා දැයි ඔවුහු බිය පත්ව සිටියෝ ය. එහෙත් ඒ කිසිවෙකුදු කිසිදාක ඈන් ගිනි කන්දක් මත සිටගෙන සිටි අන්දමත් , ඈ ගිනි කදු විශේෂඥවරියක බවට පත්ව හුන් ආකාරයත් පිළිබඳ අබ මල් රේණුවක ප්‍රමාණයක් වත් දැන ගත්තේ නැත.

dileep

# 04 භූත කෝච්චි

පිරිමි ළමුන් දෙදෙනා හා ජෝර්ජ් සිටියේ ගොවිපළ සම්බන්දයෙන් බර සාකච්ඡාවක නියැලීගෙන ය.

" ඒක හරි ම ලස්සන පුංචි තැනක් . ලුෆී සර්. හරි ම සුරුවම් ගොවි පොල. පුංචි කිරි හලකුත් තියෙනවා.. ගබඩා කාමර වගේ ම පියානෝවක් පවා එහේ තියෙනවා."

dileep

ජුලියන් විස්තරකලේ ඇත් යලිත් වරක් ලුෆී උන්නැහේ වෙනුවෙන් උදෑසන ආහාරය පිළිවෙල කිරීමේ නියැලී සිටින අතර ය.

" මාරයිනේ. මට හිතාගන්න බෑ. මේ වගේ පාලු ඉසව්වක තියෙන ගොවිපලකින් ඒ වගේ දේවල් ගන්න තරම් එයාලට ආදායමක් ලැබෙනව කියලත්" තාච්චිය මත තිබෙන බේකන් ඉතා දක්ෂ හා පලපුරුදු අන්දමින් පැත්තෙන් පැත්ත පෙරලමින් ඇත් ද කතාවට එක් වූවා ය.

" අපෝ එහෙම පාඩුයි කියල නම් හිතන්ට වත් බෑ. ගොවිපොලේ අයිති කාරයට කාර් එකක් පවා තියෙනවා. අලුත් ම වර්ගයේ බ්‍රෑන්ඩ් නිව් කාර් එකක් . ඒ විතරක් යෑ ඒ ගොල්ලන්ට අලුත් ම මැෂින් එහෙමත් තියෙනවා. මාර සල්ලි

කාරයො. අපිට මේ හැම දෙයක් ම පෙන්නුවෙ අයිතිකාරයගෙ පුතා "

" පුදුමයි මටත්. " මෙතුවක් වේලා සංවාදය නිහඬව අසා හුන් ලුෆී මහතා ද කී වේ දෑස් උඩ ඉන්දා ගෙන ය. " අර වගේ පුංචි ඉඩමක පුංචි ගොවිපලක් පවත්වාගෙන යන ඒ මිනිස්සුන්ට එච්චර සල්ලියක් කොහොම ලැබුන ද මන්දා. මම දන්නවා ඔය ගොවිපළේ අන්තිම වතාවට පදිංචි වෙලා හිටපු හාදයින් ව. ඒ ගොල්ලොත් සෑහෙන්න මහන්සි වෙලා වැඩ කරා. ඒත් කවම කවදවත් එයාලට ඔය කියන විදිහේ කාර් එකක් වත් පියානෝවක් වත් ගන්න තරම් වත්කමක් නම් ලැබු නෑ."

" අහා එහෙනම් සර් දකින්ඩ තිබ්බෙ එයාලට තිබ්බ ලොරි ටිකත් " ඩික් ද කී ය. " මාර ලස්සමයි. පරණ හමුදා වාහන. ගොවිපලේ කොල්ලා කීවෙ එයාල ඒවයින් ලු වෙළදපොලට භාණ්ඩ ප්‍රවාහනය කරන්නෙ."

dileep

" මොන භාණ්ඩ ද ? මම හිතන්නේ නෑ හමුදා ලොරිවල ගෙනියන්ඩ තරම් නිශ්පාදනයක් ඔය පුංචි ගොවිපොළෙන් ලැබෙනව කියලා. පරණ වැගන් එකක් ඇති ඕකෙ හැදෙන ස්බ්බ සකල මනාව ම වුනත් ප්‍රවාහනය කරන්ට"

නලල මත අත තබා හිරු එලිය ආවරණය කරමින් ගොවිපොල දෙසට බැල්මක් හෙලමින් ලුෆී උන්නැහේ තව දුරටත් කීවේ ය.

" අපිට ඉතිං එයාල කීවෙ නම් එහෙමයි . හැම දේ ම අලුත් දේවල්. ඒ වගේ ම ගොවිපලත් හරී ම සාර්තක පාටයි. අනික් එක ගොවිපොලේ අයිති කාරයා වුනත් හරි ම හොද මනුස්සයෙක් කියල යි මට හිතෙන්නේ."

" අපි බිත්තරයි බටරුයි බේකන් වගයකුයි ගත්තා. " යි කියමින් ජෝර්ජ් ද කතාවට හවුල් වූවා ය. " ගොවිපලේ කොල්ලගෙ අම්ම අපිට හැම දෙයක් ම දුන්නේ හරි ම ලාභෙට . කොහොම වුනත් පිට අයිතිකාරයා නම් දකින්ඩ හම්බ වුනේ නෑ."

කෙසේ වෙතත් කතාව අතරේ ම ලූෆී උන්නැහේ අහාර ගනිමින් සිටියේ ය. හිගන්නෙකු බඩේ ජීවත් වෙන්නාක් මෙන් , සති ගනනාවක් නිරාහාරව සිටියාක් මෙන් හේ අසුරු සැණින් ආහාර අතුරුදන් කරන්ට පටන් ගත්තේ කුස ගින්නේ තර ම ළමුන්ට කියා පාමිණි. හිස වටේ කැරකෙන මැස්සන් හා කෑම බදුන් වටා ගවේශන චාරිකාවන්හි යෙදෙන කුඩා කෘමී සතුන් අතින් පලවා හැරි ලූෆී මහතා දකුණු කණ ගුවන් තොටුපොලක් කර ගත් මැස්සා පලවා හැරියේ කන පමනක් සොලවා මැස්සා ද මවිතයට පත් කරමිනි.

dileep

" අනේ අයෙ පාරක් ඒක කරල පෙන්වන්නකෝ " කවදත් ලූෆී මහතාගේ දකුණු කන පිළිබඳ උනන්දුවක් දැක් වූ ඈන් අයැද සිටියා ය. " ඔයා කොහොමද ඒක කරන්නේ. මං හරි ආසයි. ඔයා හිතන්නේමාත් සතියක් දෙකක් පුරුදු පුහුණු වුනොත් මටත් ඒ වගේ කණ හොල්ලන්න පුලුවන් වෙයි ද ?"

" මම නම් හිතන් ඈ ඉතින් '' ලූෆී මහතා අවසන් කටටත් කට විවර කරමින් කී ය. " හරි දැං ඉතිං බඩත් පිරුණනේ. මට ලියන කියන් වැඩ කටයුතු ටිකක් තියෙනවා කරන්න. ඉතිං අද ඔයාලා මොකද කරන්න හිතං ඉන්නේ.. ඇවිදින්න යනව ද ?"

" අපි දවල් කෑමත් අරං පික්නික් යන්නත් පුලුවන් " ජුලියන් කී ය." ඔයාල මොකද කියන්නේ. යමුද ?"

“ ඔව් යමු.” යි ඩික් එකග වී ය. “ ඇන් ඔයාට පුලුවන්ද තේ වලටත් එක්ක මොනව හරි ලැහැස්ති කර ගන්න. අපිත් උදව් කරන්නම්. බාගෙට තම්බපු බිත්තර ටිකක් අරන් යමු “

තවත් වැඩි වේලාවක් යන්නට මත්තෙන් ඔවුහු පික්නික් යෑම සදහා ආහාර අසුරා ගනිමින් සිටියහ.

“ ඔයාලා අතරමං වෙන එකක් එහෙම නෑ නේද ?”

මේ පුංචි පැංචි කොල්ලො කුරුට්ටියන්ගේ වගකීම තමා සතුව පවත්නා බව සිහිවීමෙන්දෝ ලුෆී මහතා එක්වර ම විචාලේ ය. ජුලියන් විශාල සිනාවක් මුහුනට නගා ගත්තේ ය.

“අම්මෝ.. ඒ ගැන නම් සර් කිසි දේකට බය වෙන්ට එපා . මට යන්නෙ එන්නෙ කොහෙද කියලා හොද අවබෝදයක් වගේ ම මාලිමාවකුත් තියෙනවා. අපි හවස හම්බෙමු සර්..”

dileep

“ ලුෆී සර් ඔයත් අතර මං නො වී ඉන්ට ඕනි. හොද ද ?” ඒ ඇන් ය.

“ අඩේ විකාර කියවන්ඩ එපා ඇන් ...” ඩික් රහස් හඬෙන් ඇන්ට කියා සිටියේ වැඩි හිටියන්ට නො කිව යුතු කතාවක් ඒ කී බවක් හැගුණු බැවින් විය යුතු ය. එසේ වුව ද කෘමී අනෙකු පසුපස දිව ගොස් ලුෆී උන්නැහේ මග වරද්දා ගනීවී යැයි ඈ සැබැවින් ම සිතුවා ය. වනයේ හසරක් නො දැන අතර මං වී පාර හොයා ගත නො හැකිව ඉබා ගාතේ හක්කලම් කොට උන්නැහේ ලොකු තඩමාරුවක වැටේ යැයි ඈ සැබෑ ලෙස ම බිය වූවා ය.

ඩික් තර්ජනාත්මක හඬින් කුමක් කීවත් ලුෆී මහතා නම් කුඩා දැරියගේ ප්‍රකාශය ඈ විසින් තමාට කරන ලද මදිකමක් හැල්ලුවක් ලෙසින් මායිම්කළේ නැත. උන්නැහේ සුපුරුදු සිනාවෙන් ම මුහුණ සරසා ගනිමින් ඈ දෙස බැලුවේ ය. " නෑ දරුවෝ. මට මේ කැලේ අල්ලෙ රේකා වගේ හොඳට පුරුදු යි. හැම ගහක් කොලක් ම  සතා සීපාවෙක් ම දියැල්ලක් ම හැම පුංචි ගිනි කන්දක් ම මම හොඳට දන්නවා "

ඈන් තිගැස්සී ගියා ය. ගිනි කන්දක් යැයි කියන විට අදටත් ඇගේ මුහුණේ මෝඩ සිනාවක් පළවෙනු ඔබට දැකිය හැකි ය. ලුෆී මහතාගේ ගිනි කඳු කතාව වැටහුනේ ද ඈට පමණි. උන්නැහේ මේ කියන්නේ මොන බහු බූතයක් දැයි සෙස්සන්ට සිතුනත් ඈන් හෝ ලුෆී මහතා ඒ සම්බන්දයෙන් කිසිදු විස්තර කිරීමක්කළේ නැත. එකිනෙකාට සුබ පතා ගත් ඔවුහු තවත් කල් වේලා ගත නො කොට ගමන පිටත් වූ හ.

dileep

" අපි අඩි පාරක් එහෙම හම්බුනොත් ඒක දිගේ යනව ද ?" ඈන් විමසා සිටියේ ඔවුන් වනයේ ගමන් අරඹා මද වේලාවක් ගත වූ ඉක්බිතිව ය.

" වෙන්නත් පුලුවන් ඉතින්. ඒත් ඉතින් මේ සාරෙට වැවිලා තියෙන හෙදර් පදුරුත් එක්ක අඩිපාරක් හොයා ගන්නවා කියන්නේ නිකන් පිදුරු ගොඩේ ඉදිකට්ට හොයනව වගේ වැඩක් "

ජුලියන් විස්තර කර දුන්නේ ය. මද වේලාවක් හෙදර් පදුරු තරින් ඉදිරියට ගමන් ගත් ඔවුහු අනපේක්ෂිතව අඩිපාරක් හොයා ගත්තෙන් ඒ ඔස්සේ ඉදිරියට ඇදෙන්නට වූහ. අඩිපාර සම්බන්දයෙන් ඩික් අදහසක් ඉදිරිපත් කරන්නට පටන් ගත්තේ ඒ අතර ය.

" මම හිතන්නේ මේක බැටලුවන්ගේ අඩි පාරක්. මේ පාලු හෙදර් කන්දේ බැටලුවෝ දක්කගෙන තට්ට තනියම යන එක නම් මහ එපා කරපු වැඩක් වෙන්ට ඇති. "

ළමුන්ගේ පිය ගැටෙන හඩ හේතුකොටගෙන විවිද වන ජීවීහු ඈතට මෑතට ඇවිදගෙන පැනගෙන ඉගිල්ලීගෙන ගියහ. කටුස්සන් සේ ම විවිද සමනලු වර්ගයෝද මේ ඉසව්වේ සුලබ වූහ. ලූෆී උන්නහේ ඔවුන් හා පැමිණියේ නම් ඒ ඒ සමනලයන්ගේ නම ගම වත ගොත අසා ගැනීමට තිබුනා නේදැයි ඈන්ට සිතේ

අති විශාල හෙදර් යායක පත බැවී ගත් ළමෝ නොබෝ වේලාවකින් ම දිවා ආහාරයට ඉඩ ගෙන දුන්නෝ ය. එහි ම හිද ඈත දුර කදු යායත් ඈත මෑතත් පිරික්ශන ඔවුනට අලු සහ සුදු ත්ත් වැටුනු බැටළුවෙකු පවා දක්නට ලැබුණි.

dileep

එක් වර ම ගිනි කන්දෙන් එසුණු ගිගුරුම් හඩ යළිත් වරක් ඇසී ඈන් තිගැස්සී ගියේ ඔවුන් මෙපරිද්දෙන් සප්පායම් වීමේ කටයුත්තේ ඇලී ගැලී සිටින අතර ය. ඒ හාත් සමග ම පෙර දුටු සුදු පැහැ දුමාරය ද ඈට දක්නට ලැබුනෙන් ඈ යළිත් වරක් බිරංතට්ටු වී ගියා ය. ලූෆී උන්නැහේ කීවාක් මෙන් මෙය ගිනි කන්දක් නොවිය හැකි නමුදු උමං දුම්රියක් ද නො විය හැකි ය. මම යන යන තැන එන මගේ පස්සෙන් එන භූත බලවේගයක් ද විය හැකී ය. මේ ආදී අනවරත සිතුවිලි තුන් හාරසීයක් ම සිත තුල මෝදු වෙන්නට ඈන්ට ගත වූවේ එක් නිමේශයක් පමණි. ඈ ජෝර්ජ් දෙස බැලුවා ය. ඇය ද තක්කු මුක්කු වී ගොසිනි. බිය වීමෙන් මුහුණ ම සුදුමැලි වී ගොසිනි. ඈ ටිමී හෙවත් ආරක්ෂක නිළධාරියා දෙස බැලුවා ය. වල්ගය දෙකකුල් අස්සේ ගන්වාගෙන බුරමින් ඉදිරියට පනිමින් උඟ හැසිරෙන්නේ

සතුරෙකු දුටුවාක් පරිද්දෙන්. ඈ පිරිමි ළමුන් දෙදෙනා දෙස බැලුවා ය. වගේ වගක් නැති ගාණට උන් දෙන්නා සිනා සෙමින් සිටියි.

" බය වෙන්ට කාරියක් නෑ කෙල්ලනේ . ඔය මේ පොලොව යටින් යන කෝච්චිවලින් නැගෙන සද්ද බද්ද . අපි දැනගන්න කලින් මේ උමං දුම්රිය මාර්ග ගැන මුල් වතාවට ඔය සද්දෙ ඇහිලා දුම දැක්ක ම අපිටත් ඔහොම වුනා.. කොහොම වුනත් අපි වැඩිය ඔය ගැන කියන්ට ගියේ නැත්තේ කෝච්චි යන සද්දෙ ඇහිලා වාෂ්ප දුම පිටතට එන හැටි දැකලා උඹලා දෙන්නා බයෙන් බිරංතට්ටු වෙලා ඉන්න හැටි බලා කියා ගන්නත් එක්ක ම තමයි '"

" උඹලා මොනවා කීවත් මං නම් වැඩිය බය වුනේ නෑ " ඈන් ඇගට පතට නො දැනී කියා දමද්දී පිරිමි ළමුන් දෙදෙනා ඒ දෙසට හෙලුවේ පුදුමයෙන් උඩ ගොස් බිම වැටුණාක් වැනි බැල්මකි.කෙසේ වෙතත් ජෝර්ජ් ද වැඩි වේලාවක් ගත වෙන්නට ප්‍රතම පරණ කොලු වෙස් ගත් කොල්ලා ම බවට පත් විය. ඇය සිනා මුවින් ලැජ්ජාව වසා ගනිමින් ටිමීට කතා කරන්නට පටන් ගත්තේ කිසිවක් සිදු නොවුනු ගානට ය.

" ඔක්කොම හරි ටිම්.. මෙහෙ එන්න.. ඒ උඹ හිතන විදිහේ අතුරු ආන්තරාවක් උපද්‍රවයක් නෙමේ. ඒ කෝච්චි. තේරුණා ද ?"

එතැන් සිට ළමුන්ගේ කතාවට බදුන් වූවේ උමං දුම්රීන් පිළිබද ව ය. කාත් කවුරුවත් නැති හුදෙකලා පළාතක , උස් කදුකරයක කදු යටින් දිවෙන දුම්රීන් පවත්වාගෙන යන්නේ කවර රාජකාරියකට ද ? ඉහ මොළ දෙදරවන තරමට කල්පනා

dileep


කළ ද එය නම්කාට කාත් විසදා ගත නො හැකි වූ අන්තෝ ජටා බහි ජටා විදිහේ ගැටළුවක් විය.

" එන්න " ජුලියන් අවසානයෙ කියා හිටියේ කවර හේතුවකට ඉදි කළත් පත්තරයක් කාරිය කියවමින් උමන් දුම්රිය තුළ ගමන් කරන්නන් ලබන්නා අද්දැකීම මොන වගේ වේදැයි සිතමිනි. " " අපි යමු. අපි ඊ ලග කන්දත් නැගලා ආපහු කූඩාරම්වලට යමු "

ඊ ළගට ඉතාමත් ම පටු කූඩා අඩිපාරක් ඔවුනට හමු විය. එය කොතරම් පටු එකක් වී ද යත් ජුලියන් නම් කියා සිටියේ එය හාවුන්විසින් උන්ගේරාජ කාරි කටයුතු සදහා ඉදි කොට ගන්නට ඇති එකක් බව ය. ඔවුහු ඒ ඔස්සේ සිනසෙමින් එකිනෙකාට කවට කම් කරමින් ගමන් ගත් අතර නිහඬියාව සහමුලින් ම බිඳ දැමීමට ද අමතක නො කලහ. හෙදර් පදුරු අතරින් ගමන් ගත් ළමෝ කූඩා කදු ගැටයක් තරණය කොට ඒ ඔස්සේ පහළට බසින්නට වූ හ. එක්වර ම ඔවුන් පුදුමයට පත් වන යමක් කන්ද පාමුල දී ඔවුන්ගේ නෙත ගැටිණි.

කදු ගැටය පාවුලින් වන පටු බිම් තීරුවක් මත ඈතට විහිදි පැරණි රේල් පීලි කිහිපයක් මේ මොහොතේ ළමුන්ට දර්ශනය වෙමින් තිබෙන්නේ ය. සිල්පර කොටන් අතුරින් වැවී

dileep



dileep

නැගී හුන් තණ පදුරු පැවතිය ද සැතැපුම් බාගයක් පමන දුරකින් වන කලු පැහැති බිම් ගෙයක් දක්වා රේල් පීලි විහිද තිබෙන අන්දම ද ළමුන්ට පෙනේ.

“ ඒයි අර බලන්ට ” යි ජූලියන් කෑ ගෑවේ ය. “ එකත් එකට ම අතෑරල දාපු රේල් පාරක්. දැන් නම් පාවිච්චි කරන්නේ නැතුව ඇති. බිම් ගේ වුනත් ගන්ට දෙයක් නැතිව ඇති කියල යි මට හිතෙන්නේ.”

“ අපිට වෙලාව තියෙන එකේ පොඩ්ඩක් පහළට බැහැලා විපරම් කරලා බලමුද ’ යි ඩික් යෝජනාකලේ උද්දාමයෙනි.

දෙවෙනි ආරාදනාවක් කාටවත් අවශ්‍ය වූවේ නැත. වහා දුම්රිය පීලී ඇරඹෙන නිම්නය දෙසට ළමෝ පිය නගන්නට පටන් ගත්තෝ ය. දුම්රිය පාර මතට පැමිනි ඔවුහු එතැන් සිට

ඈතින් පිහිටි බිම් ගේ දෙසට ඇවිද යන්නට වූවෝ ය. බිගෙය දුම්රිය ංගනයක් වැ කළකට ඉහත පැවතෙන්නට ඇති නමුත් මේ වන විට නම් මුලුවනින්න් ම පාලුවට ගොස් තිබෙන බව ඔවුනට පෙනෙ යි. හාවක් හූවක් හෝ මිනිස් පුලුටකුදු ඔවුනට දක්නට ලැබුණේ නැත.

" අර බලන්ට බිම් ගේ කිට්ටුවෙන් දුම්රිය පෙට්ටි කිහිපයක් පේන්ට තියෙනවා " ඩික් එක් වර ම කීවේ ය." හැබැයි අවෘදු ගානකට කලින් පාවිච්චි කරලා දැන් නම් අතෑරල දාල වගෙයි පේන්නේ. අපි පොඩි තල්ලුවක් දාලා බලමුකෝ..."

" ඒයි පිස්සු නටන්න එපා "

කොහොමත් බිය සුලු පුංචි ඈන් විරෝදය පෑවත් කොල්ලන් දෙදෙනා හෝ කොලු වෙස් ගත් කෙල්ල හෝ ඒ දොයිතුවකට වත් මායිම්කලේ නැත. ඩික් සහ ජූලියන් අයියලා වෙර යොදා බැරි බැරි ගාතේ එක් දුම්රිය පෙට්ටියක් ඉදිරියට තල්ලු කර දැම්මෝ ය. කිරි කිරි හඬක් නගමින් මල බැඳුනු රෝද කලෙකට පසු චලනය වෙමින් ඉදිරියට ගමන් ගත් එය එක් වර ම එයට ඉදිරියෙන් තිබූ තවත් පෙට්ටියක පසුපසින් හාද්දක් දිඹඉ නැවතී ගත්තේ දුම්රිය අංගනය තුළ මෙතුවක් පැවෙත්තා වූ නිහඬියාව මුලුවනින් බිද හෙලමිණි.

සැබැවින් ම ඒ නම් එසේ මෙසේ ගෝෂාවක් නො වේ. අහස කඩා බිම වැටුනාක් වැනි හැඟීමක් කාගෙ කාගේත් සිත් සතන් තුළ ඇති කලා ච්වූ හඬකි ඒ. ඒහාත් සමග ම දුම්රියපොලේ පසෙක පිහිටි කුඩා මඩුවක දොර විවර වූවේ ය. එතුළින් පිතට බැස්සේ ළමුන්ගේ දෑස් නලල් මත හිදුවන පෙනුමකින් යුතු වූ මිනිසෙකි. මිනිසාට වූවේ එක් කකුලක් පමනි. අනික් කකුල කපා දමා තිබූ අතර ලීයෙන් සදන ලද බොරු කකුලක් ඊට සවි


කොට තිබුණි. තක්කාලි ගෙඩියක් මෙන් රතු වූ මුහුනින් ඔහු ළමුන් දෙස බැලුවේ ය. මිනිසාගේ දැත් මිනිසෙකුට යිති වූ ඒවා නොවේ යැයි ළමුන්ට සිතෙන්නේ ය. ඒවා ගොරිල්ල්ලෙකුගේ දැත් තරම ම විශාල ය. දෙකම්මුල්හි පැතිර පැවැත්තේ ද ගෝරිල්ලා රැවුලකි.

දැන් මේකා මහ පොලොව ගුගුරන්නාක් මෙන් බැණ වදිනු ඇතැයි ළමුන්ට සිතුණි. ගෝරිල්ලා වහා කට ඇරියේ අහසත් පොලොවත් එකිට එක ගැටෙන්නාක් බඳු ගර්ජනාවක් කරන්නට ය. එහෙත් එහෙත් එයින් පිට වූවේ බැරැණ්ඩි හුලං පිරී ගිය හඬකි.

" තමුසෙලා මක්කෙයි කොරන්නේ " හේ ඇසී ය. " මෙතුවක් කාලෙකට තිබ්බෙ මහ රෑට එන භූත කෝච්චි විතරයි . දැන් එව්වා මහ දවලුත් යනව ද ? උඹලා කවුද භූත පැටවු ද ?

dileep

මිනිසා කියන හරුපයක අන්දො සන්සාරයක් ළමයින්ට තේරෙන්නේ නැත. මේ මිනිහාට පිස්සු හැදිලද " වැනි බැල්මක් ඔවුන් ඔහි දෙස හෙලුවේ ඒ නිසා ය. අමුතු මිනිසා ළමුන් දෙසට ගාට ගාටා එන්නට වූ අතර කෘති ම පාදයෙන් " ටිප් ටොප් " අනුකරනයෙන් යුතු හඬක් නැගෙන්නට වූවේ ළමුන් සිව් දෙනාට හීන් දහඩිය දමවා ලොමු දැහැ ගන්වාලමිනි. එපමනක් ද නොවේ. මහල්ලාගේ ගොරිලි දෑත දෙපැත්තට වැනෙන්නට පටන් ගත්තේ සටනකට පිය මනින දසමහ යෝදයින් එකෙකුගේ සෙයියාවෙනි. හරියට දෑස නො පෙනෙන නිසා දෝ ඔහු ළමුන්ගේ මුහුණුවලට ම එබී බැලුවේ විශාල හාද්දක් දෙන්නට සූදානම් වන්නාක් මෙනි.



" මම මගේ කණ්ණාඩි කුට්ටමත් නැති කර ගත්තානේ " මිනිසා කියා දැම්මේ ය. මලානික මුහුණෙන් යුත්ව හේ එසේ කියන විට දෑසින් ගිලිහුණු කඳුලු රැල් දහරාවක් මිනිසාගේ කොපුල දක්වා ඇද හැලුණේ ය. " දුප්පත් සරණ ලී කකුල් සෑම්. කාටවත් දැන් ලී කකුල් සෑම් ගැන නිච්චියක් නෑ "

කුමක් කිව යුතු දැයි සිතා ගත නොහැකිව ළමයි සිව් දෙනා මුණිවත රකිමින් බලා සිටියෝ ය. අසරන වයස්ගත මිනිසා සම්බන්දයෙන් ඇන්ට නම් කණ ගාටුවක් ළය හුණු කෙරෙන

ගතියක් දැනෙමින් තිබේ. එසේ උව හ ගොරිල්ල ස්වරූපය ඈ තුළ බියක් නන්වන්නට වූවෙන් සූදානම් සරීරයෙන් යුතුව ඕ ජූලියන් අයියා පසුපස සැඟවුම් ගත්ත ය.ලී කකුල් සෑම් හෙවත්ගොරිල්ලා යළිත් කතාව පටන් ගත්තේ පෙර පැවති ගොරහැඩි ස්වරයෙනි.

" උඹලාගෙ ඔලු ගෙඩි විතර ද තියෙන්නේ ? ඒවට දිවවල් නැද්ද . මම උඹල්ව දැක්කා. දැං ඉතින් ගොලු වෙලා ඉන්ට ඕන නෑ. කතා කරපල්ලා. උඹලාත් භූත කෝච්චි වල ආපු එවුන් ද ?"

" අපි ඇත්ත ම ඇත්ත මිනිස්සු " ඉවසීම අන්තයට ම සිදී ගිය තැන ජූලියන් උත්තර දුන්නේ ය." අපි පරණ කෝච්චි පාර දැක්කා .ඉතිං ඒක බලන්ට ආවා . ඔහේ කවුද ?"

"ඇයි යකෝ මං වතාවක් කීවේ මම ලී කකුල් සෑම් විත්තිය " මහල්ලා කීවේ කලබලයෙනි." මෙතන මුර කාරයා . උන් හිතන් ඉන්නේ දැං මං ඉන්නේ භූත කෝච්චි බලා ගන්ඩ කියලා වෙන්ට ඇති. ඊට වැඩි යමක් මේ උලව් ස්ටේසස්මේ බලා කියා ගන්ට නෑ. මම මගෙ ජීවිතේට ම ඇති වෙන්ර්ට අරුම පුදුම දේවල් දැකලා තියෙනවා . ඔව්. ඇතිවෙන්ට බය වෙලත් තියෙනවා . මට තව දුරටත් මේ හොල්මන් කෝච්චි බලා කියා ගන්න මල උලව් රස්සාව කරන්ට බෑ ."

ළමුන් තැති ගැන් මෙන් මෙන් ම කුතුහලයෙන් ද යුතුව සැර පරුශ මිනිසාගේ කියවිල්ල අසා සිටියෝය .

" මොනව ද ඔය කියන භූත කෝච්චි ?" අන්තිමේ ජූලියන් ඇසුවේ ය.

dileep

ලී කකුල් සෑම් ජුලියන් කිට්ටුවට කිට්ටුවට කිට්ටුවට ම ආවේ ය. ඔවුන්ගේ කතාව කවුරුන් හෝ අසා සිට්ට් දැයි දැන ගන්නට මෙන් හේ වටා පිටාව නිරීක්ෂනයකළේ ය. ඊ ළගට ගොර හැඩි කට හඩින් රහසක් කියන්නාක් මෙන් කතා කරන්නට පටන් ගත්තේ භූත කෝච්චි කෙසේ වත් මේකා නම් භූතයෙකු යැයි ළමුන්ට සිතෙන අයුරිනි.

" හොල්මන් කෝච්චි.. ඒවා උමගෙන් එලියට එන්නෙත් උමග ඇතුළට යන්නෙත් මහ රෑට විතර යි. ඒවා යන්නෙ එන්නෙත් තනියම. එලවන්ට කවුරුවත් වුවමනා නෑ . සේරම දේවල් සිද්ද වෙන්නෙ භූත බලවේගෙකින්. කවුරුත් ඇතුළෙ නෑ. එක දවසක් රෑ භූත කෝච්චි ආවෙ ලී කකුල් සෑම් කුදලන් යන්න. කොහාට ද ? භූත ලෝකෙට. ඒත් මේ බලපල්ලා. මම හිත හොද මිනිහෙක්. මට කල් වේලා ඇතිව හැම දෙයක් ම තේරුණා . මම මඩුව ලොක් කර ගත්තා. මගෙ ඉටි පන්දම නිවලා දැම්මා. හනික ඇද යටට රිංග ගත්තා. ඉතිං හොල්මන් ලෝකෙන් ආවත් මොන බලයක් තිබ්බත් භූති කෝච්චිවලට මාව අල්ල ගන්ඩ හොයා ගන්ඩ බැරි වුනා. "

ඈන්ගේ සියොලඟ සීතල වී ගියේ ය. ඇත්තට ම ඈ වෙව්ලන්නට පටන් ගත්තා ය. තිස් දෙකක් වූ දත් කට කට ගා ගැහෙන්නට පටන් ගත්තේ ය. ඕ වහා ජුලියන් අයියා ගේ අතින් අල්ලා ගත්තා ය. ඕනෑ ම මාදිලියේ තඩ මාරුවකින් ඈ ගලව ගත හැකි අයෙක් වේ නම් ඒ ජුලියන් අයියා ය. " අනේ ජුලියන් . අපි ඉක්මනට මෙතනින් යමු. මම මේකට කැමති නෑ. එයා කියන කතා අමුතුයි. ඒවට ගොඩක් බය හිතෙනවා. මොනව ද මෙයා මේ කියවන්නෙ ?"

මහල්ලා එක්වර ම තමන්ගේ ගති ස්වභාව වෙනස් කොට ගත්තේ ය. කටුස්සෙක් පාට මාරු කරන්නාක් මෙන් ඔහුගේ

ස්වරූපය වෙනස් වී ගියේ ය. එක් වරම විසල් ගල් අගුරු කැල්ලක් අතට ගත් හේ වේගයෙන් ඩික් දෙසට දමා ගැසුවේ ය. එය ඩික්ගේ නලලේ වැදුනේ ය.

" තොපි සේරම මෙතනින් පලයල්ලා . මමයි මෙතන ඉන්න මුර කාරයා. මිනිස්සු මට කියන්නේ එහෙම . ඔව් යක් පැටවුනේ මමයි මෙතන බලා කියා ගන්න මිනිහා . මෙතනට කාටවත් එන්න දෙන්න එපා කියලා උන් මට කියනවා. පලයල්ලා. මම උඹලට කලිනුත් කීවා "

ඇන් තවත් එක් මොහොතක් හෝ තැක් ගැහී සිටියේ නැත. ගැහෙන දෙපයට වෙර වීරිය දුන් ඈ වහා දුවන්නට තබා ගත්තා ය. ගොරවමින් ගුගුරමින් ටිමී අටනට සැරසී ගත්තේ ය. " ඉස්සර වෙලා ළමයෙක්ට සලකන්ට ඉගන ගනින් ගොරිල්ලෝ " යි කියන්නට මෙන් ගුගුරමින් උඟ මුරකාරයාට කඩා පැන පාඩමක් දෙකක් කියා දෙන්නට දැරූ උත්සාහය ව්‍යර්ථව ගියේ ජෝර්ජ් ටිමියාගේ කර පටිය වැඅරයේ අල්ලා ගෙන සිටි බැවි ඉ. එසේ නො අන්නට භූත කෝච්චි අමතක කොට දමා ගෝරිල්ලා මහතා ඇද යට සැඟවුම් ගනු ලබන්නේ බල්ලෙකු දකින විඔට බව අවිවාදයෙන් කිව හැකි ව තිබෙන කරුණෙකි.ගල් අගුරු කැබැල්ල වැදුනු තැන රිදුම් දෙන්නට වූවෙන් ඩික් නලල් තලය නොකඩවා පිස දමන්නට වූවේ ය.

" අපි මෙතන පැල වෙන්ට ආව නෙවේ . අනික අපි ඔහේගෙ බූදලේකට ආවෙත් නෑ. තහනම් කරපු තැනකට ආවෙත් නෑ. ඔහේ ඔහේගෙ භූත කෝච්චි බලාගෙන ඉන්නවා එහෙනම්. මෙන්න මාමෙ අපි ගියා. අපිට ඕනි නෑ ඔහේගෙ කෙහෙම්මල් වලට ඇගිලි ගහන්න "

dileep

පිරිමි ළමුන් දෙදෙනා සහ ජෝර්ජ් ඈන් අල්ලා ගැනීම සඳහා දිව ගියෝ ය. තවමත් ඈන් සිටින්නේ තැති ගත් වන ම ය. " මොනවද ඒ මනුස්සයා ඒ කීවෙ. මොනවද ඒ භූත කෝච්චි කියල කියන්නේ ?ඇත්ත ම කෝච්චි නෙවෙයි ද ? ඇත්තට ම එයා රෑට ඒව දකිනව ඇති ද ?"

" ඒ මනුස්සයා නිකන් මවා ගත්ත බහුබූත මිසක් ඕවයේ ඇත්තක් නෑ නංගී. මේ බලන්නකෝ. භූත කෝච්චි කියන්නේ හොල්මන් කෝච්චිනේ. හොල් කියන්නේ හෙල්ලෙන කියන එකට . මන් කියන්නේ මනස කියන එකට . ඒ කියන්නේ හෙල්ලෙන මනස. කාත් කවුරුවත් නැතිව තට්ට තනියම ඉන්න කොට ඔය වගේ මල විකාර හිතෙන්න ගන්නවා . ඉතිං ඔය කියන විදිහේ භූත කෝච්චියක් ඔතන තියා මේ මුලු ලෝකෙවත් නෑ "

dileep

" ඒත් එයා කියන්නේ තියෙනවා කියලනේ "

" මොන බොරුද ළමයෝ . නිකන් බොරුවට බය නො වී ඉන්නකෝ " ජුලියන් තව දුරටත් තේරුම් බේරුම් කර දෙන්නේ කුඩා ඈන්ගේ අත අල්ලා ගත් වන ම ය. " එහෙම නේ ද ඩික්? මම නම් කැමතියි ඔය කියන මහ ලොකු භූත කෝච්චියක් ඇස් දෙකෙන් බලා ගන්න තියෙනවා නම්. ඩික් . උබ මොකද කියන්නේ. අපි රෑක ඇවිල්ල භූත කෝච්චිය අතට ම අල්ලා ගමුද ? "

## 05 ආපහු කඳවුරට

පාලු දුම් රිය පොළ හැර දා ළමෝ වහ වහා කූඩාරම් කරා යනු රිසින් කඳු ගැටය නැග පැමිණි අඩිපාර ඔස්සේ පෙරළා ගමන් කරන්නට වූවෝ ය. ඈන් ඒ තරම් කැමති නො වූවත් බියෙන් බිරන් තට්ටුව සිටියත් පිරිමි ළමුන් දෙදෙනාට නම් භූත කෝච්චි හා සම්බන්ද කතාවත් බොරු කකුල් සෑම් ගෝරිල්ලා සම්බන්දවත් කතා නො කර සිටිය නො හැකිව තිබිණි.

" කොහොම වුනත් මට මතක් වෙද්දි දැන් නම් හිනත් යනවා " ජුලියන් කීවේ ය. " මම කල්පනා කරේ ඇයි ඒ දුම්රිය පොල අතර දාල තියෙන්නේ කියල. අනික ඒ උමං දුම්රිය මාර්ගය කොහෙටද යන්නෙ කියලත් හිතා ගන්ට බැ. තාමත් කෝච්චි යන එන එකේ ඕක ඔය තරම් පාලුවට ගියේ කොහොම ද ?"

dileep

" බොරු කකුල් සෑම්ගෙ අල්ලෙ පැළවෙන බොරුයි මනස් ගාතයි නිසා ගම්මු කවුරුවත් ඔය ඉසව්වට යන්නෙ එන්නෙ නැතුව ඇති " යි ඩික් පිළිතුරු දිනි. " හරි හමං විදිහේ මුර කාරයෙක් ඔතන හිටිය නම් ඔච්ච ඔය විදිහට වෙන් නෑ නොවැ."

" සමහර විට ගොවිපොලේ කොල්ලා මොනව හරි දන්නව ඇති ඔය ගැන. අඩේ මං හරි ආසයි භූත කෝච්චියක් මොනවගේද කියල බලා ගන්ඩ. කොච්චර කෝච්චි දැකල තිබ්බත් එහෙව් එකක් මීට කළින් දැකල නෑ නොවැ."

" අනේ ජූලියන්. ඔයාලා ඔය කතාව නවත්වා ගන්නව ද ? මට හිතෙන්නේ උඹලා කට්ටිය තවත් වීර ක්‍රියාවකට කච්චු මූච්චු වෙන්ට යනවා වගේ. දන්නව්නේ. මම ඔය මල උලව් වීර ක්‍රියා වලට කැමැත්තක් නැති බව."

බියෙන් තැතිගැන්මෙන් දැඩි හඬෙන් ඈන් එසේ කියා සිටියත් කොල්ලන්ට නම් වගේ වගක් නැති ලෙසකි. ඩික් තවත් යමක් කියන්නට පටන් ගත්තේ ය.

" නිකන් බොරුවට බය සංකා තියා ගන් නැතුව ඉඳිං නංගී. ඇරත් ඔයකියන විදිහේ වීර ක්‍රියා මොකක්වත් ඔතන ඇති කියල මං නම් හිතන් නෑ. අනික එහෙම ඇග කිලි පොලා යන ත්‍රාස ජනක මොනව හරි දෙයක් තියෙනව නම් උඹට පුලුවන් ලූෆී උන්නැහේගේ අතේ එල්ලිලා ඒවායින් මග ඇරලා පාඩුවෙ ඉන්න. මිනිහත් උඹ වගේ මනේ. නහය යටින් අබිරහසක් තිබ්බත් නො දැක්කගානට ඉඳීව් දත කට පියාගෙන.ඔයාට පුලුවන් උන්නැහේ එක්ක පරිස්සමට ඉන්න"

එක් වර ම ටිමී ගෙරෑවුමක් පිට කළේ ය. කන් දෙක ම උස්සා ගනිමින් කුමක්දෝ යමක් ඇස ගැසුනු විලාශයක් පෑවේ ය. " අතන කවුරු හරි ඉන්නවා " යි ජෝර්ජ් කීවේ එහෙයිනි.

" බැටලුවෙක් හරි මොකෙක් හරි වෙන්ටැති. ඉන්ට පොඩ්ඩක්" යි කියූ ජූලියන් දෑත මුවගට තබා " ගුඩාෆ්ටර්නූන්... හැව් අ නයිස් ඩේ... " යි බෙරිහන් දුන්නේ ය.

dileep



කෙසේ වෙතත් අඩි පාරේ සිටියේ මිනිසෙකි. වයස් ගත මහල්ලෙකු වූ හේ ළමුන් දුටු බවට සන් කරමින් හිස වැනුවේ ය. එකත් එකට ම බැටලුවන් බලා ගන්නා අයෙකු හෝගොවිපළේ සේවකයෙකු විය හැකියැයි ඔහු දුටු විට ළමුන්ට සිතුණේ ය. ළමුන් ඔහු කරා පැමිණෙන තෙක් මදකට නැවතී බලා හුන් හේ ළමුන් දුටු වහා ඔවුන්ගෙන් ප්‍රශ්නයක් ඇසුවේ ය.

" ඔය ගොල්ලෝ දැක්කද බැටලුවෙක් එහෙම මේ හරියෙදි. ? රතු පාට කතිර තියෙන එකෙක් ව ?"

" නෑ. කන්ද පල්ලෙහා නම් මොකෙක්වත් හිටියෙ නෑ. ඒත් අන්න අර හරියට ගියාද කියල නම් කියන්ට බෑ. අපි එන්නේ කෝච්චි පොල ළඟ ඉදන්. ඒත් අපි ඒ හරියෙ නම් බැටලුවෙක් දැක්කෙ නෑ "

ජුලියන් පිළිතුරු දුන්නේ ය.

" ඈ.. ඔය ළමයි කෝච්චි පොලටත් ගියා ද ?"  මලානික නිල් පැහැති දෑස් විසල් කොට මවිතයෙන් විශ්මයෙන් ඇලලී යමින් මිනිසා ප්‍රශ්න කළේ ජුලියන්ගේ මුහුණට ම එබී බලමිනි. " ඒක ඔය ළමයින්ට හක්කලම් කරන්ට හොඳ තැනක් නෙවේ"

ජුලියන් සිනාවක් පෑවේ ය.බොරු කකුල් සෑම් මෙන්ම මේ මිනිසා ද භූත කෝච්චි පිළිබඳ විස්වාසයෙන් බොරු බියකින් සැසැලෙන්නෙකු බව ඔහුට පැහැදිලි ය."  අහා අපටත් බූත කෝච්චි ගැන අහන්ට ලැබුණා " වැඩිදුරටත් ඔහු කීවේ ය." ඔයා දන්නව ද ඒ කතාවල තේරුම ?"

" ඇයි ඔය ළමයි ඒ ගැන දන් නැද්ද. ඔතන කෝච්චි තියෙනවා. කවුරුත් දන් නෑ යන්නෙ කොහාට ද කවුද පදවන්නෙ කියලා. මටත් බොහොමයක් වෙලාවට ඕව යන සද්දෙ ඇහෙනව. මම රෑට මගේ බැටලුවොත් එක්ක තව්ට තනිය ම ඉන්න වෙලාවට. ඔය උමං දුම්රිය මාර්ගය පාවිච්චි කළේ මීට අවුරුදු තිහකටත් වඩා කළිං.මේ පළාත සශ්‍රීක වෙලා තිබ්බ කාලෙ. ඒත් ඊට පස්සෙ මේ ඉසව්ව පාලුවට ගියා. කවුරුවත් ඔය කෝච්චිපොල දිහා ඇහැක් ඇරලා බැලුවෙ නෑ. ඒත් මේ මෑතකදි ඉදන් ඕකෙ කෝච්චි එනවා යනවා. කවුද එන්නෙ , කවුද යන්නෙ කවුරුවත් දන්නෙ නෑ. "

" ඔයා කෝච්චි දැක්ක ද ? ඔයා කොහොමද මේ ගැන දන්නෙ ?" එවර නම් බියට පත් හඬකින් ජුලියන් අසා සිටියේ ය.අමුතුම විදිහේ සීතලක් , හිරියක් දෙකණින් ඇරඹී ගෙළ පෙදෙසේ පැතිරී යනු ඔහුට දැණුනේ ය.

" භූත කෝච්චි දකින්ඩ හම්බුන් නෑ මට. ඒත් ඒවායනවඑනවා ඇහෙනවා. හෝ ගාගෙන යනව ඇහෙනවා. ඩකු ඩුකු හඬ ඇහෙනවා. හැබැයි හැබැයි නලා ශබ්ද කරන හඬක් හූ හඬක් ඇහෙන්නෙ නෑ. නාකි බොරු කකුල් සෑම් කියන විදිහට ඒව

dileep

ඇත්තට ම හොල්මන් කෝච්චි. පදවන කෙනෙක් නෑ. ඩ්‍රයිවර් කෙනෙක් නෑ.ඉබේට ම යන්නෙ. කොයික වෙතත් ඔය ළමයි ඔය පැත්ත පළාතට වත් නොයා ඉන්න එක ඇඟට ගුණයි. මොකද හොල්මන් කෝච්චි බොහොම බයානකයි. අණතුරුදායකයි."

තිගැස්සී ගියද ජූලියන්ගේ දෑස් එක් වර ම යොමු වූයේ කුඩානැගණිය ඈන් දෙසට ය. ඇගේ මුහුණ මේ වනවිටත් බියෙනඇළලී මලානික වී තිබෙන අයුරු ඔහුට පෙනේඈන්ගේ බිය දුරලන්නට දෝ ජූලියෙන් ආයාසකර විසල් සිනාවාක් පෑවේ ය.

" හරිම අපූරු කතන්දරයක්. මම ඔය භූත කෝච්චි කතන්දරේ සත පහකට විශ්වාසකරන්නේ නෑ. ඔයාලා මොනවා කීවත්. ඩික්. උඹේ බෑග් එකේ තේ වලට ගෙනාව කෑම මොනව හරි තියෙනම් ගනින්කෝ. අපි මොනව හරි කාල බීල ඉමු. පොඩියක් ඇහැ ඇරලා වට පිට බලන්ඩ සැන්ඩ්විචස් එකක් කාලා කේක් කෑල්ලක් හපලා තේ ටිකක් බොන්ඩ පුලුවන් ප්ලේස් එකක් තියෙද කියලා. ඔයත් අපිත් එක්ක තේ වලට එන්ඩ මාමා "

" නෑ.ඔයාගෙ කරුණාවන්ත කමට ස්තූතියි" මහලු ගොපල්ලා කීවේ පල්ලම් බසින්නට සැරසෙමිණි. " මම මගේ බැටලුවො ටික හොයා ගන්ට ඕනි රෑ බෝ වෙන්ඩ කලින්. මුං මාව පිස්සු වට්ටනව. සුබ දවසක් ළමයි.කොයික වෙතත් ඉතිං කෝච්චි පොළ පැත්තේ නොයා ඉන්නව නම් තමා හොඳ "

ජූලියන් එක් වර ම තේ පානය සදහා ගැලපෙන බූමි භාගයක්සොයා ගත්තේ ය.

" මේ මිනිස්සු ඔක්කොට ම පිස්සු " යි ඔහු කියන්නට ගත්තේ තේ පානය සදහා හරි බරි ගැසී වාඩි ගන්නා අතර ය. හැරත් ඈන්ගේ බිය පහ කොට ඈසතුටෙන් තැබීමේ වගකීමක්ද ඔහුට වන බවෙක් ක්ල්පනා වූ බැවිනි. " අපි හෙට මේ කතා වල ඇත්ත

නැත්ත ගොවිපලේ කොල්ලගෙන් අහල දැන ගමු. එතකන් නිකන් නිස්කාරණේබය වෙන්ට වුවමනා නෑ. මට එකක් සිකුරට ම කියන්ඩ පුලුවන්. මේ භූත කතා සේරගේ ම පිටිපස්සෙඉන්නෙඅර පිස්සු මනුස්සයා. බොරු කකුල් සෑම්."

" අනිවාරෙන්ම " ඩික් ද එකඟත්වය පෑවේ ය. "ඔයාට මතකනේ. අරබැටළුවොබලා ගන්න මිනිහ කීව කතාව. ඇහින් දැක්ක වගේ බහු භූත ගොඩාක් කීවට මිනිහත් භූත කෝච්චියක් ඇහැට දැකල නෑ. රෑට කෝච්චි යන කොට පොලොව යටින් පොලව දෙදුරුම් කන එක ස්වභාවිකයි. ඉතින් මිනිහටත් ඇහෙන්න ඇත්තෙ ඔය සද්දෙ ම තමයි. මේ දැනුත් කෝච්චියක් යනව ද කොහෙද. මට පොලොව දෙදරනව වගේ දැනෙනවා."

ඩික්ට සේ ම අනික් ළමුන් තිදෙනාටත් පොලොව දෙදුරුම් දෙනු ඇසුණේ ය.එහෙත් ඒ දෙදුරුම් හඬ , ගැස්සෙන සෙලවෙන ගතිය , භූමි කම්පාවක්ගිනි කන්දක් මතුවන විට පවත්නා හඬ පැවතියේ ස්වල්ප වේලාවකට පමණි සියල්ල යළිත් වරක් පෙර පැවති තත්වයට පත් වූවෙන් ඔවුහු තේ පානය කිරීමේ රාජකාරිය වහා ඇරඹූහ.ඒඅතර හා ගුලක් හොයා ගත් ටිමී විය සිදුරින් හිස රිංග වීමට කරන තැතැනීමක්ද බලාකියා ගැනීමේ අවස්ථාව ඔවුනට උදා වූවේ ය. සිදුර ලොකු කර ගැනීමේ බලා පොරොත්තුවෙන් උඑක්වර ම පොලොව හාරන්ට පටන් ගත්තේ ය. වැලි වළින් නා කියා ගනිමින් හුන් ළමුන් මොන තරම් බෙරිහන් දුන්නත් සක්කරයා ආවත් වැඩේ නවත්වන බවක් නම් උගෙන් පෙනෙන්නට තිබුණේ නැත. අවශ්‍ය මොහොතක කුඩා ශද්දයක් වුව ඇසීමට තරම් තියුණු උගේ කන අවශ්‍ය මොහොතක සහ මුලින් ම බීරි කර ගැනීමේ හැකියාවක් ද ටිමී සතුව පැවැත්තේ ය.

dileep

" මේ යන විදිහට නම් මූ එහා ලෝකෙට ම හාරයි වගේ. ඉක්මනට ඕක ව එළියට නො ගත්තොත් හා ගුල අස්සට ම ගිහින් අපිට නැට්ටෙන් ඇදල එළියට ගන්ඩත්වැඩ සලස්වලයි මෙදා පොටේ නම් මූපස්ස බලන්නෙ " ජුලියන් කීවේ ය. "ටිමී.... ඔය ඇතියකෝ. දැනට මතෝක ඇතුළෙ ඉදපු හාවාවෙන රටකට ම ගිහින් ඇති"

එසේ පවසමින් ම ජූලියන් ටිමී උඩට ඇද ගන්නට උත්සාහ කළේ ය. ජෝර්ජ් ද වහා ඔහුට හවුල් වූවා ය. ටිමී ළමුන් දෙස බැලුවේ කිරි ඇඹුල් යැයි කියන්නාක් මෙනි. " මෝඩයෝ  මම උගෙව අල්ල ගන්ඩ ඔන්නමෙන්න තියැද්දිමාව ඇද්දනෙ. අපරාදෙ"

" මූ ඔය හොයන්නෙ හොල්මන් කෝච්චි තියෙද කියල" ඩික්කීවේ බියෙන් මුසපත් ව හුන් ඈන්පවාසිනා ගන්වාලමිනි.

dileep

තවත් සුලු වේලාවකින් පසුළමෝකදවුර කරා පැමිණියෝ ය.ඒ වන විටත් ලූෆී උන්නැහේ සිටියේ කඳවුරෙන් පිතටට  පැමින ඔවුන් පැමිණේදැයි විපරම් කරමිනි. දල්වාගත් පයිප්පයෙන් නැගුණු දුමක් උඩු හුළගේ නො පෙනී ගියේ ය.

" හලෝ හලෝ. උඹලා මේ තරම් පරක්කු වෙයිකියලා මංහිතුවේ නෑ. මට බයත් හිතුණා කට්ටිය  කැලේ අතර මංවෙලා ද කියලත්. " දුම් වලලු යවමින් ගොරෝසු ඇහි බැම් යට වූ දෑස්පිසදා ළමුන් එළිනෙකා දෙස විමසිල්ලෙන් බලමින් ලූෆී මහතා කීවේ ය
" අනික් අතට හැබැයි මට හිතුනා බල්ලා ඔයාල ව කූඩාරමට එක්ක එයි කියලා. "

" ඔව්.. මං අනිවාරෙන් ම ඒ කටයුත්ත ගානට කරනවා" යි කියන්නට මෙන් ටිමීආචාර සම්පන්න ලෙස වුෆ් හඩක් නගා

කියා දැම්මේ ය. ඊ ළඟට ළමුන් ගෙනැවිත් තුබූ දිය බඳුනට කට දමා වතුර ස්වල්පයක් පානය කිරීමට සැරසී ගත්තේ ය.

" එපා ටිමී.. ඕකෙන් බොන්ඩ එපා. මේවා ගෙනාවෙ වලං පිගන් හෝදන වැඩ කටයුතුවලට. උඹට වතුර එහෙම ඕනි නම් මෙන්න මේ දීසියෙන් බීපං."

ඈන් වෙනම දිය බඳුනක් තබමින් කීවෙන් ටිමී ඒ කරා ගොස් දිය බීමට පටන් ගත්තේ ය. නිකන් බොරුවට කලබල නො වී ඉන්නවා ගෑණු ළමයෝ යි කියන්නට මෙන් උං වරින් වර හැරී ඈ දෙස බලන්නටත් අමතක කළේ නැත. අරකෙන් බීවත් එකයි. මේකෙන් බීවත් එකයි. වතුර නම් වතුර. " ටිමී සිතුවා විය හැකි ය.ඒ අතර ඈන් ඈ වඩාත් කැමතු ලිෆී සර් දෙස බැලුවා ය.

dileep

" සර් අපි නම් මේ තේ බීවා විතරයි. ඒ නිසා රෑට කනකොට ගොඩාක් රෑ වෙන්න පුලුවන්. මං ඔයාට  කල් වේලා ඇතුව මොනව හරි හදල දෙන්න ද ඒ නිසා ?"

ලුෆී මහතා ආදරණීය බැල්මකින් ඈන්ට සංග්‍රහ කළේ ය.

" ඔයා හරි ම හොදයි පුතේ. ඒත් ඉතින් මාත් මේ තේ බීල කට ගත්තා විතරයි. මගෙ බඩත් සෑහෙන්ට පිරිලා. ඇගිල්ලල් ගහන්නවතිඩක් නෑ. ම්.. රෑට මොකවත් හදන්ට කරදර වෙන්ට ඕනි නෑ. මං ගාව තිබිල ලොකු පළතුරු කේක් ගෙඩියක් මං ගෙනාව. අපි ඒක කමු රෑට. ආ තව මං ගාවලොකු දෙහි බීම බෝතලේකුත් තියෙනවා.තව අර දිය ඇල්ලෙ පිරිසිදු වතුර ටිකකුත් එක්ක අපිට හොඳ රෑ කෑමක් ගන්ට පුලුවන් නොවැ"

එය අනගි යෝජනාවක්බැව් පෙනී ගියෙන් පිරිමි ළමෝ දෙදෙන වහ වහා දිය පහර වෙත ගොස් වතුර ගෙන ඒමට

සූදානම් වූවෝ ය. විශාල පළතුරුගෙඩිය කපාපිඟන් වලට දමා කෑමට සූදානම් කළේ ඈන් ය.

" ඉතිං.. කොහොමද ගමන ?" ලූෆී මහතා කතාව පටන් ගත්තේ ය.

" ඔව්.. ඒක නම් හරිම අපූරුයි. ඒත් මහ පුදුම හිතෙන දෙයක් වුනා. අපිට හම්බුනා බොරු කකුලකින් ඇවිදින මනුස්සයෙක්. එයා කීව අමුතු කතා ගොඩක්. මේ භූත කෝච්චි කියල ජාතියක් ගැන"

ලූෆී මහතාගේ මුහුණෙ සිනා රැල්ලක් ඇදී ගියේ ය. ඔහු කුඩා දැරියදෙස බැලුවේආදරයෙනි. " හරි හරි එහෙනම් එකත් එකට ම මනුස්සයා අර ගිනි කන්දක් හොයා ගත්ත පුංචි ගෑණු ළමයගේ නෑදෑ කෙනෙක් වෙන්ට ඇති "

dileep

ඈන් මෝඩ හිනාවක් පෑවා ය. " ඔයා මාව ලැජ්ජ කරනවා " ඕ සිනා මුවින් ම වැඩි දුරටත් කීවා ය. "ඇත්තට ම සර් එයා එහෙම කීවනෙ. එයා තමයි පරණ දුම්රිය ස්ටේසමේ මුර කාරයා. දැං නම් එතන පාවිච්චි කරන් නෑ. එයා කීවා භූත කෝච්චි එන වෙලාවට එයා ලාම්පුව නිවලා ඇඳ යට හැංගෙනවා ලු. ඒ නිසා ලු භූත කෝච්චිවලට අල්ලගන්න බැරි විදිහට බේරිලා ඉන්නෙ. "

" පව් අහිංසක මනුස්සයා. මම හිතන්නෙ එයාගෙ කතා වලට ඔයා බය වෙන්ඩ නැතුවැති නේද ?"

" පොඩ්ඩක් විතර බය නම් හිතුනා ඉතිං. ඒ විතරක් යැ. එයා ගල් අඟුරු කෑල්ලකින් ඩික්ගේ ඔලුවටත් ගැහුවනෙ. අපි හෙට ගිහින් ගොවිපලේ කොල්ලගෙනුත් අහන්නයි හිතන් ඉන්නෙ හොල්මන් කෝච්චි ගැන අහල තියෙද කියල. අපිට වයසක

එඩේරෙකුත් හම්බුනා එන අතරෙදි. එයා කීවා එයාටත් ඇහුණ ලු හොල්මන් කෝච්චිවල ශද්දෙ.හැබැයි ඉතින් දැක්කෙ නම් නෑ ලු "

ලුෆී උන්නැහේ තරමක් වේලා කල්පනා කළේ ය. ඊ ළඟට ඔහු වඩාත් කතා කරේ කුඩ දැරියගේ නැතිගැණුන සිත අස්වසන වුවමනාවෙනි.

" ටිකක් ගුප්ත වුනත් ආස හිතෙන කතන්දරයක් නේද. මේ වගේ ගම් පළාත් වල ඔය වගේ අභූත භූත කතා නිතර ම අහන්ට හම්බෙනවා. ඕව මිනිස්සුන්ගෙ මනස් ගාත. ඉතින් ඉතින් ඔයා ආස නැද්ද මමාද හොයා ගත්තෙ මොනවද කියල දැන ගන්න. මට දුර්ලභ වර්ගයේ කුරු මිනියෙක් හම්බුනා"

එසේ සඳහන් කරමින් ම ලුෆී මහතා සාක්කුවෙන් පිටතට ගත් සමචතුරාකාර ටින් එකක් විවර කොට ඈන්ට පෙන් වූවේ ය. කොල පැහැති දිලිසෙන කුරුමිනියෙකු ඈට ඒ තුලින් දැක ගත හැකි විය. රතු පුල්ලි කිහිපයක් ද උගේ පසු පස කොටසේ තිබෙන අයුරු ඈට පෙනේ.

" ඉතිං භූත කෝච්චි ගැන කට කතාවලට වඩා මට මේක ට ආස හිතෙනවා ළමයෝ " ඈන්ගේ ප්‍රීතිමත් දෑස දැක සතුටෙන් ලුෆී මහතා කියා සිටියේ ය. " මම හොල්මන් කෝච්චි ගැන හිත හිත රෑ දෙගොඩ හරියක් වෙනකන් ඇහැරල ඉන්න එකක් නැතිවෙයි. ඒත් මේ පුංචි අමුතු කුරුමිනිය ගැන හිත හිතා නම් මං අද නෙමේ හෙට රෑටත් ඇහැ පියා ගන්න එකක්නැතිවෙයි. "

" මම කුරුමිනියන්ට නම් එච්චර කැමති නෑ. හැබැයි සර් මෙයා නම් අපූරුයි. හරිම ලස්සනයි. ඇත්තට ම සර් ඔයා දවස තිස්සෙ ම මේ වගේ පුංචි කෘමීන් අල්ල අල්ල ඉන්න ආසයිද ?"

dileep

" ඔව්.. මම ඊට වඩා කැමති වෙනත් දෙයක් නෑ. අහ්.. අන්න කොල්ලො ටික එනවා වතුරත් අරගෙන. දැං අපි කේක් ටික හැමෝමත් එක්ක බෙදා ගනිමු. ආ කෝ මේ ජෝර්ජ්. ආ අර බලන්නකෝ. එයා මේස් එක මාරු කරලා."

කකුලේ ඇටිජි වූ කුඩා පැල්මක් හේතු කොටගෙන ජෝර්ජ් ප්ලාස්ටර් කැබැල්ලක් අලවා ගෙන සිටියා ය. පිරිමි ළමුන් හා ඈ පැමිණි විට වෘතයක පරිද්දෙන් ඇදි ගත් ඔවුහු කේක් කැබැලි බෙදා හදා ගනිමින් කල් තබාම සප්පායම් වීමේ කටයුතු පටං ගත්තෝ ය. ඒ වන විටත් සූර්යා තවත් දිනයක නිමාව සනිටු හන් කරමින් බටහිර ක්ෂිතිජය දිශාභිමුඛව බැස යමින් තුබුණෙන් අහස වසා මද රත් පැහැයක් පැතිරෙමින් පැවතියේ ය.

dileep

" හෙටත් අද වගේ ම අපූරු දවසක් තියෙයි. හෙට අපි මොක ද කරන්නේ... " කේක් කැබැල්ලක් හපමින් ජූලියන් ඇසී ය.

" අපිහෙටත් ෆාර්ම් එකට යමු." යි ඩික් පිළිතුරු දිනි. " ගොවිපළේ නෝනා මතක ද කීව උදේ ම ආවොත් අලුත්ම අලුත් පාන් වගයක් දෙන්ට පුලුවන් කියල. අපි බිත්තර ටිකකුත් ගමු.මොකද අදත් අපි බිත්තර අටක් ගත්තු නිසා තව ඉතුරු ඇත්තෙ දෙකයි. අනික් එක්ක තක්කලි ටික ඔක්කොම කවුද කාල. කවුද ඒ ?"

" උඹලා ටික තමයි." ඈන් පිළිතුරු දුන්නා ය. " උඹලා තමයි තක්කලි සේර ම කාපු උඟරු පැටව් තුන් දෙනා "

" මමත් ඒ උඟරන්ගෙන් එක්කෙනෙක්" යි ලුූී උන්නැහේ කියන්නේ අමනාපයෙන් නම් නො වේ. ළමුන් සේම

හාස්‍යජනක සිනාවක් ද මුහුණේ පුරෝ ගෙන ය. " ඔයා අද මට තක්කලි හයක් ම ගිල්ලෙව්වනෙ ඈන්..."

" අනේ අනේ සර්.. ඒ ගැන නම් හිතන්න එපා. ඔයා කෑවෙ හයනෙ ඉතින්.. අනිත් එව්වා ගැනනෙ මං කීවෙ. හරි හරී. කෝකටත් අපි හෙටත් තව ටිකක් ගේමුකෝ"

සැබැවින් ම මෙපරිද්දෙන් කතා බහේ නියැලෙමින් , කෑම මේසයේ තලු නො ගැසීම, මුනිවත රැකීම , සිනා වීමෙන් වැලකීම ආදී සිරිත් විරිත් බැහැර කරමින් හිතූ මනාපේආහාර අතුරු දන් කොට දොඩම් යුෂ පානය කිරීම කාට කාටත් ගෙනැ දුන්නේ වචනයෙන් කිව නොහැකි තරමේ ප්‍රීතියකි.සතුටකි. නිදහසකි. කවුරු කවුරුත් දිනය මුලුල්ලේ වන අබතුරේ සක්මන් කිරීමෙන් දැඩි සේ වෙහෙසට පත්ව සිටියෙන් සියලු දෙනාට ම ඊ ළගට අවශ්‍ය වූවේ දිගු නින්දකි. ආරක්ෂක සේවයේ නියැලුනු ටිමී පවා විශාල ඈණුමක් යවා උගේ සබ්බ සකලමනා දන්ත කල්‍යාණය ම ප්‍රදර්ශනයකොට කියා පෑවේ දැන් නම් ඩිංගක් ඇහැ පියා ගත යුතුවැ ඇති බව ය

" ටිමී උඹ අපටත් ඈනුම් යවෝනවා" චෝදනා මුඛයෙන් ටිමී දෙස බලා ජෝර්ජ් ඈණුමක් යැවුවා ය.

" මාත් එහෙනම් දැං ගියොත් හොදයි ළමයි. මටත් නිදි මතයි. ගුඩ් නයිට් හැමෝට ම. හෙට කරන්නේමොනව ද කියලා උදේට ප්ලෑන් කරමු. ඔයාල කැමැති නම් හෙට උදේ බ්‍රෙක්ෆස්ට් මගේ ගානෙ. මං ගාව සාර්ඩින් ටින් වගයකුත් තියෙනවා"

ලූෆී උන්නැහේද කියා සිටියේ හුන් තැනින් නැගිටිමින් විසල් ඈණුමක් අවකාසයට මුදා හරිමිනි.

" අනේ තැන්ක්‍යු සර්.." ඈන් කීවා ය. " පළතුරු කේක් එකෙනුත් සෑහෙන්ට ඉතුරුයි. ඒවත් කමු උදේට. ම්.. ඔයා මොකුත් හිතන් නෑ නේද සර් අහසට පොලොව වගේ සාර්ඩිනුයි පළතුරු කේකුයි කන එක ගැන ?"

" අපෝ නෑ. නියම බුද්දිමත් කෑමක්නෙ. " ලූෆී මහතා කෑ ගසා කීවේ කන්දපහළට යන අතර ය. ඇත්ත වශයෙන් ම ඔහු ද ළමයින්ට ම ගැලපෙන ළමා සිත් හොඳින් හඳුනන ළමා මනස වටහා ගැනීමේ නිරහංහාර ඇවතුම් පැවැතුම් ඇති පුද්ගලයෙකැයි නො කියාම බැරි ය. " ගුඩ් නයිී.....ට්"

" යමු අපිත් නිදා ගමු" ජූලියන් කීවේ ය. " දෙයියන්ගෙ පිහිටෙන් ටිමී නම් රෑට අපේ කූඩාරමට එන්ට එපා. ඊයෙත් වැනි වැනී මහ රෑ සවාරියක් ගහපු එකේ අදවත් පොඩ්ඩක් ඇහැ කණ පියාගෙන නිදා ගනින්. ගුඩ් නයිට් කෙල්ලනේ. ලොකු රෑයක් ගත කරන්ට වෙන හැඩයි. "

ළමයි ඔවුනොවුන්ගේ කූඩාරම් කරා දෙපා මෙහෙයවා තම තමන්ගේ නිදන බෑග් තුළ බැස ගත්තෝ ය. එක්වර ම ඈන්ට නම් පොලොව යටින් දෙදිරීමක් , තිගැස්මක් සෙලවීමක් දැනෙන්නට විය. ඒ වූ කලී ගිනි කන්දක් නො ව උමං දුම්රියක ගමනක් බැව් දැං ඈ වටහාගෙන සිටින බැවින් ඈ බිදක් වත් කලබල නො වූවා ය. එහෙත් හොස් හොස් හඬක් හෝ ගුරු ගුරු හඬක් හෝ ඈට ඇසුණේ නැත. ඇය නො බෝ වේලාවකින් ම නිදි දෙව්දුවගේ සලුවක එතී ගත්තා ය.

පිරිමි ළමුන් දෙදෙනාට නම් එවන් වාසනා මහිමයක් උදා වූවේ නැත. පොලොව සෙලවෙන හඬ ඇසීමෙන් ඔවුනට වහා සිහියට නැගුනේ දිවා කළ අතැර දමූ පැරණි කෝච්චි පොළේ දී සිදු වූ සිදවීම් දාමයත් භූත කෝච්චි සම්බන්ද කට කතාත් ය.

dileep

" භූත කෝච්චි. හුහ්. මල විකාර මේ මිනිස්සුන්ගෙ. අනිවාරෙන් ඔය භූත කෝච්චි අට කතාව ඇතුළෙ මොනව හරි දෙයක් නැති වෙන්ඩ බෑ"නිදි මත පෙරෙන හඬකින් ජූලියන් සිතට ආ සියල්ල කියා දැම්මේ ඩික්ට ඇසෙන ලෙසට ය.

" මොන වගේ දේවල් ද? කොයිකටත් හෙට අපි සේර ම ගොවිපළට යනවනෙ. ගොවිපලේ කොල්ලා මේව ගැන මොකුත් නො දැන ඉන්ට හැටියක් නෑ. මිනිහ උපන් දා ඉදන් ම මෙහේ හැදිච්ච වැඩිච්ච එකේ මේ දේවල් වල ඇත්ත නැත්ත එයාගෙන්ම දැන ගන්ට පිලිවන්"

" ඇත්ත ම ඇත්ත තමයි අර ඇස් පේන් නැති ලී කකුල් සෑම් ලොක්කා මිනිහට හිතෙන බහුබූත ඔහේ කියෝනව.අපිට හම්බුනු ගොපල්ලා අමුතු කතාවක් ඇහුණොත් එක හත කරලා විශ්වාස කරනවා. ඔන්න ඕකයි ඩිකෝ ඇත්ත ම ඇත්ත"

dileep

" ඔයා හරි. දෙයියෝ සාක්කි. ඒ මොකද්ද බං"

අඳුරු ඡායාවක් එක්වර ම ඔවුන්ගේ කූඩාරමට කඩා පාත් වී පත බෑවී ගත්තේ ඩික් තිගැස්මට ලක් කරමිනි.

" අප්පේ මේ ටිමියනෙ. උබත් නිකන් හොල්මං කෝච්චියක් වගේ මේ දෙගොඩ හරි ජාමේ කඩා පාත් වුනේ මොන උලව්වකට ද යකෝ.." ඩික්සුසුමක් පිට කරමින් කීවේ ය. " අනික ඔහොම මගේ පපුව උඩින් අතක් තියා ගන්ඩ එපා. මං බය වුනා. එක පාරට ම කන්දෙ ඉදන් මිනී කන කොටියෙක් කඩා පාත් වුනා වගේනෙ. පලයන් පලයන් ටිමී.. දුහ්"

ටිමී නම් යන්නට සූදානම් නැත. උඟ ජූලියන්ගේ පපුව මත පය්ක් තබා ඇණ තබා ගත්තේ ය.

" ජෝර්ජ්.... උඹේ බල්ලට කතා කර ගනින්කෝ" ජුලියන් මොර දුන්නේ ය. "

එහෙත් ජෝර්ජ් නිහඩ ය. ඇත්ත වශයෙන් ම ඇගෙන් කිසිදු හාවක් හූවක් නැත. එහෙත් ජුලියන්ලා තමා මග හරින බවක් ටිමී ඉබේට ම තේරුම් කොට ගත්තේ ය. මේ පිරිමි ළමුන් මාර ය. දවල්ට ටිමී යැයි කියා ගත් ගමන් ය. බදා ගත් ගමන් ය. රෑට පළ නොකියා පලා බෙදීමක් හෝ නො කර කෙළින් ම පළ කියති.ටිමියා වහා කොල්ලන්ගේ කූඩාරමෙන් පිට වී හැමදාමත් නො වෙනස් ජෝර්ජ් කරා පැමිණි යා ය. ඇගේ දෙපා මත ගුලි වී නාසය දෙපා මත තබා උඹ නිදන්නට සූදානම් වූවේ ය.

" භූත ටිමී.. " යළිත් නිදා ගැනීමට සැරසෙමින් ජුලියන් තෙපලී ය. " ටිමී භූතයා.මොකක්.. මාත් නිදි මර ගාතේ මොන විකාරකියවනව ද මං දන් නෑ "

dileep

" කට වහපං යකෝ" යි ඩික් කෑ ගෑවේ ය." උඹයි ටිමියි දෙන්නම භූතයෝ. මට නිදා ගන්ට දීල භූත ලෝකෙට පළයව්"

කෙසේ වෙතත් .. මේ ආකාරයේ අටෝරාශියක් ජරමර කරදර අස්සේ ම ඩික් අවසානයේ නින්දට වැටුණේ ය. ඒ හාත් සමග ම කඳවුරු භූමිය පුරා ම දැඩි නිහඬතාවයක් අරක් ගත්තේ ය. මැදියම් රෑ භූත කෝච්චිය ද සුපුරුදු ගමන ගිය අතර එයින් නැගුනා වූ ගුරු ගුරු හඬ , පොළොව දෙදරවන සෙළවෙන හඬ කාටවත් වගේ වගක් නො වී ය. අඩු ම තරමේ ටිමී නම් වූ ආරක්ෂක නිළදාරියාට පවා ඒ වග වගේ වගක් තිබුණේ නැත

dileep

# 06 ගොවිපොලේ දවසක්

ඉක්බිති දින උදෑසන ළමුන් සේ ම ලුෆී උන්නැහේද කල් වේලා ඇතිව අවදි වූහ. එබැවින් බල්ලා ද ඇතුලුව සය දෙනා ම උදා ආහාරය ගත්තේ එකට ම ය. ලුෆී මහතා සතුව කඳුකරයේ විශාල සිතියමක් තිබුණේ ය. කඳුකරයේ ම සෑම ගෙයක් දොරක් ම අස්සක් මුල්ලක් ම එහි සලකුණු කොට තිබුණි. උදා ආහාරයෙන් පසු ඔහු කළේ එය දිග හැරගෙන හොඳින් අධ්‍යනය කිරීමයි.

dileep

" මම හිතන්නෙ අද මට මුලු දවස ම කඳවුරෙන් පිතට ගත කරන්ට වෙයි වගේ " තමා අසලින් ම වාඩිගෙන සිටින ජුලියන් දෙසට හැරෙමින් ඔහු කියන්නට විය. " මෙතන මාර්ක් කරල තියෙන පුංචි මිටියාවත ඔයාට පේනව ද - ක්‍රොව්ලෙග් මිටියාවත කියල තියෙන්නෙ. මම අහල තියෙන විදිහට බ්‍රිතාන්‍යේ ඉතා ම ඉතා ම දුර්ලබ ගණයේ කුරුල්ලො උරුමිණියෝ වර්ගයක් ඔය මිටියාවතේ ඉන්නවා. මම මගේ ආම්පන්නත් අරන් ඔය පැත්තේ කරක් ගහල පොඩියක් විපරම් කරන්ටයි හිතන් ඉන්නෙ. ඉතිං ඔය හතර දෙනා අද මොකෝ කරන්නේ ?"

" හතර දෙනා කියන්නේ. පස් දෙනෙක් ම ඉන්නවනෙ ඉතිං. ඔයාට ටිමී අමතක වුනා!" බොරුවට මවා ගත් අමනාප සහගත මුහුණක් ද සහිතව ජෝර්ජ් එක් වර ම කීවා ය.

"   අනේ අනේ මට නිච්චි නැති වුනානේ.. සමා වෙයන් බලු කොල්ලෝ..  ඉතින් පස් දෙනා අද කොහෙද යන්ඩ හිතාගෙන ඉන්නෙ ?"

ගෞරවණීය හඬකින් ළමුන්ගේ මුහුණු වලට සිනා රැල්ලක් එක් කරමින් ලුෆී උන්නැහේ කීවේ ටිමීගේ අතකින් ද අල්ලා ගනිමිනි.

" අපි ෆාර්ම් එකට යන්ටනෙ තීරණය කළේ " යි ජුලියන් තුන් වෙනි වරටත් එතුමාට මතක් කොට දුන්නේ ය. " කෑම බඩු ටිකක් ගන්ඩත් ඕනි. අර භූත කෝච්චි කතාව ගැන ගොවිපලේ කොල්ලගෙන් අහල බලන්නයටත් ඕනි.ටිකක් ගොවිපලේ ඇවිදලා කරලා බලන්ටත් ආසයි. එහේ සත්තු ඇති. හරක්, එලුවො බැටලුවෝ වගේ සත්තු. මං කොහොමත් ආසයි ගොවිපලවල් වලට "

dileep

" හරි. " ලුෆී උන්නැහේ පයිප්පය දල්වා ගත්තේ ය. " මම එන්ට රෑ බෝ වුනොත් ඔය ළමයි මා ගැන බය වෙන්ට එහෙම එපා. මං කුරුම්ණි දඩයමේ ගියා ම මට වෙලාව කලාව ගාණක් නැති වෙනවා"

" ඔයාට විශ්වාසයි නේද සර් පාර එහෙම වරදින් නෑ කියලා ?" මේ අපූරු මනුස්සයා වල්මත් වී හසරක් නො දැන අතරමං වේ යැයි බියක් ඈන්ට තිබේ. එහෙත් ලුෆී මහතා තමා ගැන බලා කියා ගත නො හැකි අත දරුවෙකු වැනි මිනිසෙකු යැයි කියා ද ඈට නො සිතෙයි.ලුෆී උන්නැහේ ඈන් දෙස බලා කුඩා විහිලුවක් කිරීමට සිතා ගත්තෙන් ,

" මම එහෙම අතර මං වෙන් නෑ ඉතිං.. බැරි වෙලා හරි ඔන්න පාර වැරදීගෙන වගේ එනව නම් මගෙ දකුණු කන මට ඒක

දැණුම් දෙනවා. මෙන්න මේ වගේ ගොඩාක් හයියෙන් ඒක හෙල්ලෙන්ඩ පටං ගන්නවා"

ලූෆී මහතා දකුණු කණ මදක් සොලවා ඈන් සිනා ගන්වා සතුටු වූවේ ය. හිනාව අවසර දුන්නු පමණින් ම ඈන් ද යමක් කියන්නට පටන් ගත්තා ය." අනේ මටත් පුලුවන් වුනා නම් ඔයා කරනව වගේ ඔහොම කන නටවන්න. ඔයා දන්නවා ඒක කරන හැටි. මටත් කියා දෙන්නකෝ ලූෆී සර්.. අනේ... එතකොට මට පුලුවන් ඉස්කෝලෙ ගිහින් පන්තියේ කෙල්ලන්ව පුදුම කරවන්න. උන් ඉරිසියාවෙ පැලෙයි.."

" හාපෝ මං යනව ළමයි. නැත්තම් මේ ළමයා මා ලව්වා මගේ කන නැටවීමේ රහස හොරකම් කරනවා. ඊට කළින් මං යනෝ..."

dileep

සිනා පිරි මුවින් එසේ පවසමින් ලූෆී මහතා ස්වකීය කූඩාරම දෙසට පල්ලම් බැස්සේ ය. ඔහු නො පෙනී ගිය පසු ගැහැණු ළමුන් දෙදෙනා වලන් පිගන් සේදීමේ කටයුතු ආරම්බ කළ අතර පිරිමි ළමෝ දෙදෙන බුරුලු වී ඇති කූඩාරම් කඹ ශක්තිමත්ව ඇද බැද තැබීම සඳහා පිට ව ගියහ...

" මං මේ කල්පනා කරේ මේ දේවල් මෙහෙම බලිය වාගෙ ඇරල දාල අපි සේරම ගියා ම හරිද කියල. " ඈන් කල්පනාකාරී හඬින් කීවා ය.

" ඇයි බං අපි ඊයෙත් ගියෙ. මේ වගේ කාත් කවුරුත් නැති කැලේක තියෙන කූඩාරමකින් මොනවත් හොරකන් කරන්ඩ කවුරුවත් එන් නෑ. අනික අපි ගාව හතර මහ නිදානෙ තියේ කියලයැ. අහ්.. උඹ හිතන්නෙ අර මළ සමයං භූත කෝච්චි ඇවිත් අපේ බඩුමුට්ටු ටික උස්සන් යයි කියලවත් ද ?"

ඩික් කීවේ ඇත් සිනා ගන්වමිනි. සැබැවින් ම ඒ මොහොතේනම් භූත කෝච්චී ප්‍රකාශනය ඇටාඇති කළේ බියක් නො ව හාස්‍යයකි.

" මෝඩ කතා කියන්ඩෙපා මැච්ටෝ. අපි ටිමීට මුර කරන ජොබ් එක බාර දීලා ගියොත් මොකද ?"

එවර නම් ජෝර්ජ් තත්පරයකටවත් දත කට පියා ගෙන නො සිටියා ය.
" මගුලක් කතා නොකර හිටිං ඈන් හරිදැ. ටිමියව දාල යන්න උඹට මොළේ අවුල් වී ගෙන එනව ද යකෝ. අපි යන්නෙ කොතන ද ටිමීත් එතන. "

" හරි හරි ඉතිං. ඕකට ඔච්චර පුප්පන්න ඕනි නෑ. මං නිකමට කටට ආවට කීවෙ. ඒවැයින් කාරි නෑ. ජූලියන් ඔයා මේ බාස්කට් එක ගන්නකො. මං අනික ගන්නම්.නැත්තම් කෑම ජාති නිකන් අතේ එල්ලන් එන්ට බෑනෙ. හරිද එහෙහෙනම් අපි දැං යමු ද ?"

ළමුන් පිරිස තවත් කතාවෙන් ගමන ප්‍රමාද වන්නට ඉඩ හැරියේ නැත. ඔවුන් ගමන් ගත්තේ උස් ව වැවුනු හෙදර සහ නේක විද පඳුරු පැලෑටි අතරිනි. ළමුන්ගේ දණහිස් මලින් බර පඳුරු මත ගැටුණෙන් ඒ තුළ සැඟව ගත් නො යෙක් මාදිලියේ කෘමී සතුන් පඳුරු හැර දමා ඉගිල යනු ඔවුන් විසින් දක්නා ලදී. කාට කාටත් දැනෙන්නේ සතුටකි. එය නම් ඇවිදින්නට යන්නට කියාපු අපූරු දවසකි.

අවසානයේ හොඳින් පිළියෙල කොට තිබූ ගොවිපළට ඔවුහු සැපත් වූහ. ඒ තරම් අද්දැකීම් නැති , අකායීක්ෂම මිනිසෙකු වැඩෙහි යෙදී සිටුනු ප්‍රථමයෙන් ඔවුන් විසින් දක්නා ලදී. ජූලියන් නම් වැඩිමනත් පරික්ෂාකාරී වූවේ ගොවිපළේ කොල්ලා සොයා ගැනීම කෙරෙහි ය.

dileep

එක්වන ම ගොවිපොලේ කොල්ලා ගොවිපළෙන් පිතටට පැමිණියේ ය. සිවුරුහන් කරමින් , ප්‍රීතියෙන් ගීයක් ගයමින් හුන් හෙතෙම ළමුන් දැක උස් හඬින් මුර ගාන්නට වූවේ ය.

" හලෝ.....ඔයාලට තවත් බිත්තර හරි මොනව හරි ඕනි වුනා ද ? මම ඔයාලට ම කියල මහ ගොඩක් එකතු කරා"
එක් වරම පිරිමි ළමයාගේ අවදානය යොමු වූවේ ඈන් දෙසට ය. " අහා. ඔයා ඊයෙ මෙහේ ආවෙ නෑ නේද ? මොකක් ද නම ?"

" මගෙ නම ඈන්. ඔයාගෙ.."

" ජොක්.. " කොලුවා පිළිතුරු දිනි. ඇත්ත වශයෙන් ම ඔහු අපූරු අයෙකි. ප්‍රියමනාප ගුණ යහපත් කොලුවෙකැයි ඈන්ට සිතුණේ බැලූ බැල්මට ම ය. ඉත්තෑකූරු වන් කොණ්ඩයත් නිල්පැහැති දෑසත් රතු වූ මුහුණත් ඇගේ සිතතුළ කොලුවා කෙරෙහි ප්‍රසාදයක් මනාපයක් ඇති කරලීම සඳහා හේතුන් විය.

" අම්ම කෝ ජොක්. ?" ජුලියන් ඇසුවේ ය. " අපිට තව පාන් ටිකකුයි කෑම ජාති ටිකකුයි ගන්න පුලුවන් වෙයිද දන් නෑ. ඊයෙ අපේ කට්ටිය සේරම කෑම ජාති ගිලලනෙ. ආපහු අපේ කෑම ස්ටොක් එක ෆුල් කරවා ගන්ට ඕනි"

" අම්ම දැන් නම් කිරිහලේ ඇත්තෙ. ටිකක් බිසී ඇති හැබැයි. ඔයාලට හදිස්සියක් නැනෙ. එන්ඩකො මගෙ අලුත් බලු පැටව් ටික බලන්ඩ"

එය සිත් ගත් යෝජනාවක් වූවෙන් ඔවුහු ජොක් පෙරටු කොට ගනිමින් ගොවිපළේ වූ කුඩා මඩුවක් තුළට ගියහ. පිදුරු අතුරන ලද විශාල පෙට්ටියක් එතුළ විය.එහි වැතිර ගත් බැල්ලක

පැටවුන් පස් දෙනෙකුට කිරි දෙමින් සිටියා ය. ඈ ටිමී දැක සැර දමන්නට වූවෙන් ටිමී කිසිදු හඬක් නො නගා එලියට පිවිසියේ බලූ අම්මාට පාඩුවේ ඉන්නට දීම යෙහෙකැයි සිතූ නිසා විය යුතු ය.



ළමුන් බලූ පැටවුන් එකිනෙකා හොඳින් නිරීක්ෂනය කරන්නට වූ අතර ඈන් එක් පැටවෙකු දෝතින් ම ගෙන තුරුලු කොට

ගත්තා ය. අමුතු විදිහේ කෙඳිරියක් නැගූ පැටවා ඇගේ උණුසුමට වඩාත් තුරුලු වී ගුලි ගැසුණෙන්,

" අනේ මූ මගෙ වුනා නම් " යි ඈන් ආදරයෙන් කීවා ය. "මං මූට කියන්නේ හුරතලා කියල. බලන්නකො මූ හුරතල් වෙන තරමක්"
" ඇයියා. බල්ලෙක්ට කියනවද බං ඒ වගේ නමක් " ජෝර්ජ් කීවේ බල්ලෙක්ට ටිකක් දැඩි නමක් තිබිය යුතුයැයි සිතූ නිසාවෙනි. " කෝ මගේ අතටත් දෙනවකො ටිකක්. මේ සේරම ඔයාගෙද ජෝක්?"

" ඔව්.." ජෝක් කීවේ ගෞරව සම්ප්‍රයුක්ත අභිමානී ස්වරයෙනි. " මේ ඉන්න බලු අම්ම මගේ. එයාගෙ නම බිඩී.."

බිඩී බලු අම්මා කණක් උස්සා දිදුලන දෑස් ජෝක් දෙස පා ඉඟියක් පළ කැර සිටියා ය. ජෝක් ද ඇගේ සිනිඳු හිස පිරිමැද ආදරය පළ කොට සිටියේ ය.

dileep

" අවුරුදු හතරක් විතර තිස්සේ උං මං ගාව හිටියෙ. ඒකාලෙ අපි හිටියෙ ඔච්ල් කියල ෆාර්ම් එකක. බරෝ කියලා ගොවියෙක් තමා මේකි මට ගෙනත් දුන්නෙ. සති අටක විතර පැටියෙක් මෙයා ඒ කාලෙ.!"

" ඕ.. ඒ කියන්නේ මේ ෆාර්ම් එක ඇරුණාම තවත් ගොවිපළවල් මෙහේ තියෙනව ද ? ඔයා මුලු ජීවිත කාලෙ ම හිටියේ ගොවිපළවල්වල ද? ඔයා මාර ලකීනෙ"

" මම ඉඳල තියෙන්නෙ ෆාර්ම් දෙකක විතරයි ඉතින් " ජෝක් ඈන්ගේ පැනයට පිළිතුරු වශයෙන් කීවේ ය. " තාත්ත නැති වුනාට පස්සෙ අම්මයි මායි ඔච්ල් ෆාම් එකෙන් ගියා. ගිහින් ටවුමෙ ටික කාලයක් ජීවත් වුනා. ඒත් මං එච්චර ආස නෑ

නාගරික ජීවිතේට.ආපහු ගොවිපළක ඉන්න හම්බුනු එක හොඳයි"

" මට තේරෙන් නෑ. මම හිතුවෙ ඔයාගෙ තාත්තත් මෙහෙ ඉන්නව කියල" ඩික් කීය.

" අපෝ නෑ ඒ මගෙ කුඩප්පා. අනික එයා ෆාර්මර් කෙනෙකුත් නෙමෙයි . බාප්ප කොහොමවත් ඔය වගා කටයුතු ගැන උනන්දුවක් නෑ. අම්ම තමයි මිනිස්සුන්ට වුනත් කරන්න ඕන දේවල් කියලා මේක නඩත්තු කරන වැඩ කටයුතු කරන්නේ. හැබැයි බාප්පා අපිට ඇති වෙන්ට සල්ලි බාගේ දෙනවා.මේ මැශින් එහෙම ගෙනල්ලා මේක දියුණු කරේ බාප්ප දෙන ස්ල්ලිවලින් තමයි. බලන්නකො කිරිහල දිහා. ඒක වුනත් ඔය විදිහට සාර්ථකව තියෙන්නේ බාප්පගෙ සල්ලිවලට පින් සිද්ද වෙන්න තමයි. අම්ම හරිම සතුටුයි ඒකෙ වැඩ කරන්න ."

dileep

ළමයි ජෝක් කී දෙස වහා හැරී බැලුවෝ ය. ඔවුනට දක්නට ලැබුණේ ඉතා සාර්ථක කිරිහලකි. ජෝක්ගේ මව සේවිකාවන් තිදෙනෙකු හා ගැහැණු ළමයෙකු හා එක්ව එහි කටයුතු කරමින් සිටියා ය. ඈ ළමුන් දැක කිරි හල අසලට පැමිණෙන මෙන් හිසින් සන් කලා ය.

" ගුඩ් මෝර්නින් ළමයිනේ. මොකෝ කුකුලත් තින් අරගෙන . කට්ටියට බඩගිනි වුනා ද ? මම මෙතන වැඩ ටික ඉවර වුනු ගමන් ම කෑම ජාති ගොඩාක් ඔයාලට පැක් කරලා දෙන්නම් කෝ. එතකන් චුට්ටක් වෙලා ඉන්ඩ...ම්ම්.. ඔයාලා කැමති වෙයි පොඩ්ඩක් නැවතිලා ජොක් එක්ක කයියක් ගහලා මොනවා හරි කාලා බීල ම යන්න. මගෙකොල්ල ඉතිං මෙහෙ තට්ට තනියම නේ වෙනදට ඉන්නේ. එයාට ආස්සරය කරන්න කවුරුවත් මේ පැත්ත පලාතෙම නෑ."

" අනේ ඔවු... අපි ජෝක්ට හරිම කැමතියි " එසේ කීවේ ඈන් ය. " ජුලියන් අපි තව ටික වෙලාවක් ඉමුද කියන්නකෝ. ඉමු නේද ?'

" ඔව්.. බොහෝම ස්තූතියි... මිසිස් ... අර් අර් මිසිස් ..."

ජුලියන් එක්වර ම කරගෙන ආ ස්තූති ප්‍රකාශය තර මග හිර කර ගත්තේ ඇගේ නම නො දත් නිසා ය.

" මම ඇන්ඩෲව්ස් " ජොක්ගේ මව සිනා මුවින් කීවා ය. " ඒ උනාට ජොක් ඇන්ඩෲව්ස් නෙමේ. එයා ජෝක් රොබින්ස්. මගේ කලින් මහත්තයා ගොවියෙක්. ජෝක් ඉතිං එයාගෙ දරුවෙක්. ඉතිං ඔයාලා අපිත් එක්ක කෑමට ඉන්නකෝ. මම කඳවුරට අරන් යන්නත් කෑම මොනව හරි ඔතලා දෙන්නම්."

dileep

හදිසියේ කඩාපාත් වූ වාසනාව සම්බන්දයෙන් ළමුන්ට සේම ටිමියාට ද උද්දාමයක් දැණුනෙන් උඟද වල්ගය වනා කැමැත්ත පළ කර සිටියේ ය. ඇත්ත වශයෙන් ම ඇන්ඩෲව්ස් නෝනා කාරුණික තැනැත්තියකැයි උඟ ද අවිවාදයෙන් පිළිගෙන තිබේ.

" කමෝන්.. අම්මා කෑම ලැහැස්ති කරනකන්මාත් එක්ක ගොවිපොළේ ඇවිදින්ට යමු. මම ඔයාලට මේකෙ හැම අස්සක් මුල්ලක් නෑරම පෙන්වන්නම්. අපේෆාර්ම් එක වැඩිය ලොකු නම් නෑ. ඒත් මේ ඉසව්වේ තියෙන හොදම ෆාම් එක අපේ එක තමයි. ආයි මේකට ගහන්න තවත් ෆාම් එකක් මේ කදුකරයේ නෑ. මගේ බාප්පා ෆාම් ගැන මෙලෝ හසරක් දන්නේ නෑ . ඒ නිසා වැඩ ගැන ඒ හැටි උනන්දුවක් නෑ. ඒ වුනාට එයා අම්මට ඕනි දේවල් ගන්න ඕන තරම් සල්ලි දෙනවා. ඉතිං අපේ ෆාම් එක ගොඩක් දියුණු එකක්..."

ජෝක් පුරාජේරු කී සැටියෙන් ම ගොවි පොල නිරන්තරයෙන් අලුත් වෙන යන්ත්‍ර සූත්‍ර හා ගොවි උපකරණයන්ගෙන් ද සමංචිත නවීන තත්වයේ එකක් බැව් ළමුන්ට අවබෝද වූවේ ගොවි පොල පුරා සක්මන් කරන්නට පටන් ගත් පසු ය. විටෙක ධාන්‍යා ගාරය පුරා ඇ විදිමින් ද ගඩොලින් බැදි කුටි ගවේශනය කරමින් ද සතුන් අතර හැසිරෙමින් ද ඔවුහු ඇති තාක විනෝද වූ හ. එපමණක්ද නොව රතු පැහැයෙන් වර්ණ ගැන්වූ වැගන් රථ කිහිපයකට ද ගොඩ වීමට ඔවුහු අමතක නො කළහ. මෝටර් ට්‍රැක්ටර් දෙකක් තිබෙනු දුටු ළමුන් ඒවාට ද නැග "අනේ පොඩ්ඩක් එලෝගෙන ගිහින් වටයක් ගහලා එන්ට තිබ්බ නම් " කියා ද සිතුවෝ ය.

" ඔයාලගෙ ෆාම් එකේ වැඩට ගොඩක් කට්ටිය ඉන්නවනේ " ගොවිපළ පුරා ඇවිදින අතර ජූලියන් ජෝක්ට කීවේ ය." ඒත් මේ පොඩි ගොවිපළේ වැඩ වලට මොකට ද එච්චර කට්ටියක් ?"

'' ඒ කවුරුවත් වැඩිය දක්ෂ කඩිසර අය නෙමෙයි " ජෝක් නලල රැළි ගන්වා කල්පනාකාරී හඬින් පිළිතුරු දිනි. " අම්ම හැම තිස්සෙම එයාලට කෑ ගහනවා. කවුරුවත් හරියට වැඩක් පොලක් කරන්ට දන්නෙ නෑ. බාප්පා අම්මට ඕනි තරම් සේවකයො නම් ගෙනල්ල දෙනවා ඒත් ඉතින් වැඩ්ක් පොලක් කරන්ට පුලුවන් මිනිහෙක් හොයා ගන්ට නම් එයාට බෑ. එයා ගෙනල්ල දෙන මිනිස්සු මේව ඉගන ගන්ට කැමති බවක් වත් ගොවිපොලේ වැඩ වලට අසාවක් තියෙන බවක් වත් පේන්ට නෑ. පුලුවන් හැම වෙලේ ම කරන්නේ ටවුන් එකට දුවන එක තමයි. හැබැයි එක හොද කෙනෙක් ඉන්නවා. ටිකක් වයසයි තමයි. හැබැයි මේකෙ ඉන්න තරුණ එච්චොන්ට වඩා මනුස්සය හොදයි. අර ඉන්නෙ. එයාගෙ නම විල් "

dileep

“ ඔව් එයා නම් ගොවිපලක වැඩ කරන කෙනෙක් බව පේනවා “ ජුලියන් කීවේ තලතුනා විලසිනි.” අනික් අය නම් නිකන් උපන් තේකට ගොවිපලකට ගිහින් නෑ වගේ. උදැල්ලක් අතින් අල්ලලා නෑ වගේ “

“ අනික් එක තමයි විල් අනික් ඒයොත් එක්ක පයිරු පාසානමක් පවත්වන්ට යන්නෙත් නෑ. ඔහේ පාඩුවේ තමන්ගේ වැඩක් කරගෙන ඉන්නව. “

ඊ ළගට ඔවුහු මහලු විල් හමුවූහ. ප්‍රතමයෙන් ම ඩික් ඔහු හා කතාවට වැටුණේ ය.

“ ගුඩ් මෝනින් .ඔයා සෑහෙන්ට බිසී වගේ “

මහලු මිනිසා සිය නිල් පැහැති දෑස් ඩික් දෙසට යොමුකළේ ය. “ මිනිස්සු කොච්චර හිටියත් කර ගහන මිනිහටනෙ කර ගහන්න වෙන්නේ දරුවෝ “ ඔහු කියන්නට පටන් ගත්තේ “

dileep

dileep

" අන්න දැක්ක ද මං ඔයාලට කිව්වෙ ? " කියමින් ජොක් සිනා සෙන්නට පටන් ගත්තේ ය. " එය නිතර ම අර ඇලි මැලි අයට කියන්නෙ එහෙම . ඉතිං අපිට හැම තිස්සෙ ම එයාව අනික් අයගෙන් ටිකක් ඈත් කරල තියන්න සිද්ද වෙලා තියෙනවා. එක පැත්තකින් එයා කියන කතාවෙ ඇත්තකුත් තියෙනවා . මේකෙ ඉන්න ගොඩක් අය ගොවිතැන ගැන මෙලෝ සසරක් දන්නෙ නෑ. අඩුගානෙ ඉගන ගන්න ට්‍රයි කරන්නෙත් නෑ. ඉස්සර නම් හිටියා හොද සේවකයො ටිකක්. එක එක හේතු හින්ද බාප්ප එයාලව අයින් කරල මෙයාල ව ගත්ත. නිකන් අටුව කඩල පුටුව හැදුවා වගේ "

dileep

" දැන් ඉතින් කෝ ඔයාගෙ බාප්පා ?" ජුලියන් ඇසුවේ උවමනාවෙනි. මෙවන් දුස්කර හිම ගත ගම්මානයක වැඩි ලාභයක් අපේක්ෂා කළ නොහැකි ඉසව්වක , ජේන තෙක් මානයක මිනිස් පුලුටක් පෙනෙන්නට නො මැති ඉමක ගොවි පලක් වෙනුවෙන් මේ සා පිරිවරක් දැරීමට හැකියාව ඇති ව්‍යාපාරිකයා කවුදැයි දැන ගැනීමේ වුවමනාවක් කුතුහලයක් ජුලියන්ට තිබෙන්නේ ය. හැරත් නො සුදුසු සේවකයන් රැසක් බඳවා ගැනීමට තරම් හේතුවද ඔහුට වටහා ගත නො හැක්කක්වැ තිබේ.

" එයා දවසම ඉන්නෙ ගොවිපලෙන් පිටත . ගොවිප්වල්ව් ප්වෙත්තෙ එන්නේ කලා තුරකින්. ඒකත් වෙලාව.නැත්ත, මළ ජූලියයි "

" ඇයි ජෝක්. ඔයා වැඩිය එයාට කැමති නෑ වගේනෙ " ඒ ඩික් ය.

" එයාගෙ වැරැද්දකුත් නෑ ඉතිං . ඒත් එයා ෆාමර් කෙනෙක් නෙවේනේ  ෆාම් එකක් පවත්වන් ගියාට. එයා කිසිම අවබෝදෙකින් නෙමේ වැඩ කටයුතු කරන්නෙ. හැම දෙයක් ම එයාට ඕනි විදිහට. අනික් එක එයා මට එච්චර කැමති නෑ. මමත් එච්චර ආස නෑ ඉතිං. අපි නිකන් නයාට අදු කොල ගානයි. අම්ම හින්ද මම එයාට කැමති වෙන්න ට්‍රයි කරනවා. ඒත් ඒත් ඒත් ඉතිං.. කොහොම වුනත් එයා ගොවිපලේ නැත්තම් මං ගොඩක් කැමත්යි."

dileep

" ඔයාගෙ අම්ම නම් ගොඩාක් හොද කෙනෙක්" ජෝර්ජ් කීවා ය.

" ඒක ඇත්ත . අම්ම නම් ඇත්තට ම මාර හොදයි. අනික් එක අම්ම සෑහෙන්න සතුටෙන් ඉන්නෙ ආයෙත් එයාට ෆාම් එකක් ලැබුණු එක්ක. අනික අපිට බාප්ප නැත්තම් යන්තමට ෆාම් එකක් අටව ගත්තත් මේ වගේ මැෂින් ගන්න එක හීනයක් තමයි '

කතාව අතරේ ම ඔවුන් පැමිණ සිටියේ අනෙක් ගබඩා කුටි වලට වඩා බෙහෙවින් ම විශාල මඩුවක් වෙත ය. එය ඉතා හොදින් අගුලු ලා තිබුණේ ඇතුළට ප්‍රවිෂ්ට විය නොහැකි යුරෙනි.

" ඔයාල දන්නව ද මේක ඇතුළෙ තියෙන්නෙ මොනව ද කියලා . මේකෙ ඇතුළෙ තියෙන්නෙ ලොරි.අන්න අතන තියෙන හිලෙන් ඇහැ දාල බලන්නකෝ.මෙච්චර ලොරි ගොඩක් මොන මල උලව්වට ද කියල මං වත් දන්නෙ නෑ. ඒත් බාප්පා ගන්නෙ ඒව හරි ලාබෙට. එයා කියන්නේ ගොවිපොලක් වුනා ම ලොරි වගේ දේවල් කොච්චර තිබුණත් පාඩුවක් නෑ කියල . ඒව ආයෝජන ලු. පස්සෙ කාලෙක දෙගුණයක් ලාබ තියාගෙන විකුණන්න පුලුවන් ලු "

'' ආ ඔයා අපිට ඔය ගැන ඊයෙත් කීවෙ " ජෝක් තේරුම් බේරුම් කර දුන් පසු ඩික් කියන්නට විය. " වැගන් ගොඩකුත් තියෙන්වා නේ ද ?"

කෙසේ වෙතත් ගොවිපලේ තත්වය ළමුන්ට ගෙන ආවේ පුදුමය මුසු උනනදුවකි. ඇන්ඩෲ මහතා සැබැන්වි ම පුදුමාකර මිනිසෙකු විය යුතු යැයි ඔවුනට සිතේ. ඔහු දැක බලා ගැනීමේ කැමැත්ත වඩාත් ප්‍රබල ලෙස ඔවුනට දැනෙන්නට වූවේ හෙයිනි. ඈන් ඇන්ඩෲ මහතාගේ ස්වරූපය සිත්හි මවා ගන්නට උත්සාහ කලා ය.

" නපුරු බැල්මක් තියෙන උස මහත කලු පාට් මිනිහෙක් වෙන්ටැති " යි ඈ සිතන්නට පටන් ගත්තා ය. " මිනිහා හොස්ස අගින් මැස්ස යන්ඩ බැරි කුකුල් කේන්ති කාරයෙක් වෙ න්ට ඇති. කොරොස් කටෙත් අත දා ගන්ඩ බැරි තරම් කලබල කාර ළමයින් ව දැහින් ඇහැකට වත්පේන්ඩ බැරි තාලෙ මනුස්සයෙක් වෙන්ට ඇති "

උදේ වරුව සැබැවින්ම ප්‍රීතිමත් එකක් වූ අතර ළමයි යළිත් වතාවක්බිඩී අම්මාත් හුරතලා පුතාත් බැහැ දැකීම සඳහා ගියෝ ය. වල්ගය පහත හෙලා ගත් ටිමී නම් මඩුවට පිටතින්

dileep

ඇන තබා ගත්තා විනා ආඩම්බරකාර අම්මණ්ඩී බලන්නට ගියේ නැත. ඊටත් ජෝර්ජ් තමා හැර වෙනත් බල්ලන් කෙරේ ඇගෑලුකම් දක්වන විට උඟට ඇති වන්නේ ඉවසා දරා ගත හැකි ගතියක් , උපේක්ක්ශාවෙන් බකන් නිලා සිටිය හැකි හැකි හැගුම් සමුදායක් නො වේ.

එක්වර ම සීනුවක් මහ හඬින් නාද වෙන්නට වූයෙන් , " ඇති යන්තම් කෑම ලෑස්තියි " යි ජෝක් කීවේ ය. '' ඔයාලට බඩගිනි ඇති. අම්ම හොද කෑමක් දෙයි ඔයාලට. ඔක්කොට ම කලින් අපි ටිකක් මූණ අතපය හෝදගෙන කරගෙන ඉමු. "

" මටත් හොදටෝම බඩගිනියි තමයි " ඈන් කීවා ය " උදේට කලා අවුරුදු ගාණක් ගියා වගෙයි දැනෙන්නේ "

කාට කාටත් දැණුනේ හැගුණේ එබන්දකි. ගොවිගෙදරට ඇතුළු වී පුංචි අපූරු නාන කාමරය දුටු විට නම් එහි අපූර්වත්වය විසින් ළමුන්ගේ දෑස් උඩ ඉන්දවන ලදී. තුවායකින් යමක් පිරිසිදු කරමින් සිටින ඇන්ඩෲ මැතිණියද එතුළ සිටියා ය.

" පුංචි වුනාට අපූරු බාත් රූම් පොඩ්ඩක් නේද ? " ඈ කීවේ ළමුන්ගේ සිත් අවබෝද කලාක් මෙනි. " මගේ මහත්තයා තමයි ඒක හැදුවෙ. මගේ වුවමනාවලට. මමත් ජීවිතේට ම පවිච්චි කරපු හොදම බාත් රූම් එක "

කුස්සියෙන් පිතට එන කෑම පිසෙන සුවද කුස ගින්න දෙගුණ තෙගුණ කරවයි. කාගෙ කාගෙත් බඩ ගෙඩි සිගන්නන් බවට පත් වෙයි. ළමුන් ඉතා ඉක්මනින් අත පය සෝදා ගැනීමට පටන් ගත්තේ ය. පිරිසිදු කිරීමේ ක්‍රියවලිය ප්‍රමාද කොට ගනිමින් කෑම වලට මේසය මතට වී තැක් ගැසීමට ඉඩ දීමට කිසිවෙකුත් සූදානම් නැති ලෙසකි.

dileep

dileep

# 07 ඇන්ඩෘව්ස් මහතා ගෙදර එයි

ළමුන් වාඩි වී සිටියේ ඉතා ම සාරවත් කෑම මේසයකට ය. විශාල මීට් පායි එකක් , සීත කල හැම්, අල , ගෙදර සාදා ගත් අච්චාරු වැනි බොහොමයක් ආහාර පාන ඔවුන් ඉදිරියේ තිබුණි. මේ සා ආහර ගබඩාවක් තිබෙන විටක ඊළගට කන්නේ මොකක් දැයි තීරණය කිරී ම නම් ලෙහෙසි පහසු කටයුත්තක් නො වේ.

මුලින් මීට් පායි එකෙන් පටන් ගන්ට " ඈන්ඩෘව්ස් නෝනගේ කාරුණික කට හඩ ඇසෙන්නට විය . ''ඊ ළගට හැම් වලට යන්න. ඏම් එකක ජීවත් වෙන එකේ තියෙන ලොකුම හොදේ කන්න ඕන තරම් කෑම ජාති තියෙන එක "

" මගෙ ජීවිතේට වත් මේ තරම් මරු කෑම මේසයකට වාඩි වෙලා නෑ " යි අතුරු පස භුක්ති විදිමින් ඈන් කීවා ය. " මට තව මොනව හරි කන්න පුලුවන් කමක් තිබ්බ නම් කියල හිතෙනවා . ඒත් දැන්බඩේ ඇගිල්ලක් ගහන්න වත් ඉඩක් නෑ."

" ඇත්තට ම මරු.. " ඩික් ද කීවේ ය. මේ නිවාඩුව තුළ දී ඩික්ගේ වචන සැට් එකට අලුතෙන් ම එක් වූ වචනය මරු විය. ඔහු මරු නේ යි කියන විට කවුරු කවුරුත් ඔහු දෙස බලන්නේ ඒ නිසා ය.

" වුෆ්" යි ටිම් ද කීවේ ආහාරය ප්‍රණීත එකක් බව හගවමිනි. උෟ ඉදිරියේ මස් කටු පිර වූ පිගානක් තිබෙන බව ද සදහන් කල යුතු ය. එමෙන් ම ළමුන්ගේ කෑම වලින් ද බිදෙන් බිද නො නවත්වා පතිත වෙයි. බල්ලාගේ බඩ සම්පූර්ණයෙන් ම පිරී ඇති බැවින් දැන් උෟ තුළ තිබෙන්නේ හිරු එලියේ පහස විදිමින් පොඩි නින්දක් දෙමීමේ වුවමනාවකි.

ළමුන්ට ද එකී අවශ්‍යතාවය වඩාත් තදින් දැනේ. ඒ අතර ඇන්ඩෘව්ස් මැතිණිය ළමුන් අතරේ චොක්ලට් ද බෙදා දුන්නා ය.

" දැන් ඔයාලා ගිහින් පොඩ්ඩක් රෙස්ට් කරන්න ළමයි " යි ඈ කීවා ය. " ජෝක්ට කතා කරන්නකෝ. එයාට මේ පැත්තේ ආශ්‍රය කරන්න කවුරුවත් ම නෑ. ඉතිං දැන් කට්ටිය හොඳ' යාලුවොනේ. ආ ඔයාල කැමති නම් තේ වෙලාව වෙනකන් ඉන්න. මම ලැහැස්ති කරන්නම් හොඳ තේ මේසයක් "

" අනේ බොහෝ ම ස්තූතියි නැන්දේ " ළමෝ එක් හඬින් කීවෝ ය . ඒත් තවත් නම් බිස්කට් එකකටවත් බඩ ඉඩ නැති ලෙසක් ඔවුනට දැනේ.එහෙත් ගොවිපළේ ගත කරන සෑම තත්පරයක් ම අපූරු යැයි ද ඔවුනට සිතේ. හැකි උපරිම වෙලාවක් එහි ම රැඳී සිටිය යුතු යැයි ඔවුන් තීරණය කරන ලද්දේ එබැවිනි.

dileep

" අපිට බිඩීගෙ පැටියෙක් යන කොට අරන් යන්න පුලුවන් වෙයි ද ?"  එක් වර ම කුඩා ඈන් ඇසුවා ය.

" තාම පොඩියිනේ දරුවෝ. අම්මගෙන් පැටව් වෙන් කරන්න අමාරුයි. කිරි බොන වයසනේ. අනික ටිමී රංචු කරන්නත් පටන් ගනී ." ඇන්ඩෘ මැතිණිය කීවේ ඇගේ සිත නො තැලෙන නොරිද්දෙන අයුරෙනි.

" ටිමී පොඩි එවුන් එක්ක රංචුවට යන්නෑ " යි ජෝර්ජ් වහා හරස් වූවා ය. " ඈන් බය නැතිව පැටියෙන් අරන් වරෙන්. හොදට ඉර එලිය වැටෙන තැනක් අපිහොයා ග්ටමු. වැඩි දුරකට වත් වැඩි වෙලාවකට වත් අපි බිඩීගෙන් පැටව් වෙන් කරන් නෑනේ ."

බිඩී ඒ හැටි කැමැත්තක් දක්වන බවක් නො පෙන් වූවත් ඈන් දිව ගොස් කුඩා බලු පැට වෙක් අරෙගෙන ආවා ය. ඈන් ඌ තුරුලු කොට ගත්තේ උතුරා හැලෙන ආදරයෙනි. ළමෝ ඈන් බලු පැටව් අම්මා ද සමග පල්ලම් බසින්නට පටන් ගත්තේ උතුරා හැලෙන සතුටිපිදුරු ඇතිරූ අපූරු ස්ථානයක් පිරිමි ළමුන් තිදෙනා විසින්සොයා ගන්නා ලද අතර උණුසුම් හිරු එළිය විදිමින් ඔවුහු එහි වැතිර ගත්තෝ ය.

“ ඔයාලගෙ සේවකයො ටික කෑමට ගිහින්ලා වගේ ” යි ජුලියන් කීවේ ඈතත් මෑතත් පිරික්ෂා වැඩෙහි නිරතවන කිසිවෙකුත් දක්නට නො ලැබුණ බැවිනි.

ජෝර්ජ් නාසයෙන් සුසුමක් ඉහළට ඇද අප්‍රාසාදය මුසු හඬක් නැගුවේ ය.


“ කට්ට කම්මැලි මිනිස්සු ” යි ඔහු වැඩි දුරටත් කියන්නට විය “ මම බාප්පා වුනා නම් මං දන්නව හදල ගන්න හැටි. අම්මත් හැමදාම කියනව මේ මිනිස්සු අතක් පයක් හොල්ලලා වැඩක් කරන ජතියෙ නෙමෙයි කියලා . ඒත් බාප්පා කනට වත් ගනන් ගන් නෑනෙ. ”

dileep

“ දැන් වත් ජොක්ගෙන් අහමු භූත කෝච්චි ගැන ” ජෝර්ජ් ටිමියගේ කණක් දිග හරිමින් පුල පුලා උන් ප්‍රශ්නය මතු කලා ය. “ ඒව ගැන කතා කරන එකත් ජොලියක් වෙයි ”

“ භූත මොකක් ? භූත කෝච්මමම මගෙ ජීවිතේට ම එහෙම කෝච්චි ජතියක් ඇහුව ම යි ” යි ජෝක් කීවේ අන්දුන් කුන්දුන් වී ළමුන්ටත් වඩා පුදුමයට පත් හඬිණි.

" ඇත්තට ම අහල නෑ ? " ඩික් බලා පොරොත්තු විරහිත හඬින් යළිත් ජෝක් දෙස බැලුවේ ය. " ජෝක් උඹ ඉන්නේ ඔය කියන ජාතියෙ කෝච්චි යන එන තැන කිට්ටුව ම වෙලත් උඹ මෙලෝ හසරක් දන් නැද්ද ?



" නෑඉතිං. ඔය මං ඇහුව ම යි. භූත කෝච්චි. අඩේ මට කියනවකෝ ඒ ගැන ටිකක් "

" හරි අපි අපි දන්න දේවල් ඔයාට කියන්නම්. ඒත් ඇත්තට ම අපි නම් හිතන් හිටියෙ ඔයාගෙන් මේ ගැන තොරතුරු ටිකක් දැන ගන්න ලැබෙයි කියල "

එසේ පවසමින් ජූලියන් ඔවුන් දන්නා හා ත් දුටු සියල්ල ජෝක් හමුවේ තබන්නට විය . ලී කකුල් සෑම් ගැන පාලුවට ගිය දුම්රිය පොළ පිළිබඳව පවා ජෝක් අසා සිටියේ දෑස් උඩ ඉන්දවාගෙන

පුදුමයෙන් උනන්දුවෙන් හා කුතුහලය මුසු උද්දාමයෙන් ද යුතුව ය .

" අයියෝමාත් ඔයාලා එක්ක නැවතිලා හිටිය නම් " කතාව අවසානයේ පුදුමයට පත් ජෝක් කියන්නට විය ." එහෙම වුනා නම් අපිට එකට ම ගිහින් පොඩ්ඩක් විපරම් කරලා බලන්ට තිබුණා. මේක නිකන් අර ඔය ගොල්ලෝ කලිනුත් කරල තියෙන වීර ක්‍රියාවක් වගේ දේකට පොටක් පෑදෙනවා වගේ. මම මගෙ ජීවිතේට ම අබිරහසක් විසදලා නැති එකේ මටත් ඔයාලා එක්ක ඉදලා ඒ වගේ දේකට පොටක් පෑදෙනවා නම් නියමයි. ඔයාලා මොකද කියන්නේ ?"

ළමු තිදෙනා එකිනෙකාගේ මුහුනු දෙස බලා ගත් පරිද්දෙන් ම ටිමියා ද ගැස්සී තිගැස්සී ඔවුන්ගේ මුහුණු දෙස බැලුවේ ය. අබිරහස් ... ඒ උඟ හොදින් දන්නා හදුනන වචනයකි. මීට පෙර ජුලියන් ඩික් ඈන් ජෝර්ජ් හා එක් ව උඟ ද අබිරහස් හයකට ම මුහුණ දී පළපුරුද්දක් ලබා තිබෙන්නේ ය. ( කිරින් දූපතේ අබිරහස , සැගවුනු උමගේ අබිරහස , ස්ටික් පවුලේ අබිරහස , හොර බඩු කන්දේ අබිරහස , " }

" ඔව් ඔව් ඉතිං අපි අබිරහස් කීපයක් නම් සාර්ථක ව විසදුවා තමා . ඇත්තම අබිරහස්. නියම අබිරහස් " ඩික් කියා සිටියේ ය ." අපි උමංවලට බැහැල තියෙනවා. රහස් උමං මාර්ග දිගේ ඇවිදගෙන ගිහින් තියෙනවා. නිධන් පස්සේ එලෝලා තියෙනවා. ඇත්තට ම අපි කරල තියෙන දේවල් , ලබලා තියෙන ත්‍රාසජනක අද්දැකීම් කියන්ට ගියොත් දවස් ගානක් වුනත් කතා කරන්ට දේවල් තියෙනවා "

dileep

" ඉතිං කියන්න. මට ඕන තරම් වෙලාවක් අහන්න පුලුවන්. ඔයාල ඔක්කොම මේ අබිරහස් විසදන වැඩ වලට සම්බන්ද වුනා ද ? පුංචි ඇන් පවා ?"

" ඔව්. අපි සේර ම අබිරහස් විසදනවා කියන තඩ මාරුවලට ඇති පදම් අහු වෙලා තියෙනවා " ජෝර්ජ් ද කතාවට මැදිහත් වූවා ය ." ඇයි ටිමී. මූ මෙහෙම හිටියට අපි ව සෑහෙන්න අණතුරු ප්‍රමානයකින් බේරලා තියෙනවා. නේ ද ටිම් ?"

" ඇත්ත ඇත්ත " යි කියන්නාක් මෙන් වල්ගය වනා පිදුරු ගොඩේ ගසා බසා දමා ටිමියා වුෆ් දෙකක් පිටකළේ ය.

ඉතිං එතැන් සිට අබිරහස් විසදා පළපුරුද්දක් ඇති රහස් පරීක්ෂකයෝ ජෝක් වට කොට ගනිමින් ඔවුන් ලත් අද්දැකීම් , තඩමාරුන්, අනූ නවයෙන් දිවි ගලව ගත් සිදුවීම් කියා දෙන්නට පටන් ගත්තෝ ය. ලොමු දැහැ ගැන් වෙන සිරුරින් , නළල මත හිදුවා ගත් දෑසින් මීයට පිම්බාක් වැනි නිහැඬියාවෙන් ජෝක් ඒ සියල්ල ම අස සිටියේ ය.

"බුදු අම්මේ ...මගෙ ජීවිතේටවත් උබලා වගේ උන් ටිකක් ගැන මං අහල නෑ .බලා ගෙන ගියා ම උඹලා හරි වාසනාවන්තයි. මොකද ඔය වගේ වික්‍රමයක් කරන්න අවස්තාවක් අපේ වයසේ කාටවත් හීනෙන් වත් ලැබෙන් නෑ . උබලට ගිය ගිය තැන් වල අබිරහස්. මේ නිවාඩුවෙත් අබිරහසක් හම්බවෙලා කියලයි මට නම් හිතෙන්නේ. අනිවාරෙන් අබිරහසක් හම්බ වෙන්නත් එපා යැ, හා නැද්ද ?"

කොලුවාගේ උද්දාමය දුටු ජුලියන්ගේ මුහුනේ සිනා රැල්ලක් ඇදී ගියේ යි " මං හිතන්නේ නෑ ජෝක්. මේ පාලු කදුකරයේ කොයින් ද අබිරහස්. හැරත් අවුදු තුනකට කිට්ටු වෙන්ඩ උඹ

dileep

මෙහේ ජීවත් වෙලත් පොඩි වත් ත්‍රාසජනක වැඩකට අත ගහන්න නොලැබිච්ච කොට පහු ගිය නිවාඩුවලදි වගේ මේ පාර අපිටත් අබිරහසක් හම්බවේය හිතන්ට බෑ."

ජෝක් ගැඹුරු සුසුමක් නැගුවේ බලා පොරොත්තුන් බිඳී ගිය සෙයියාවෙනි." ඒකත් ඇත්ත. මට නම් එකක් වත් හම්බුන් නෑ."

ඒත් ඒ හා සමගම යමක් සිහියට නැගීම හේතු කොටගෙන කොලුවාගේ ඇස් දිලුම් දෙන්නට පටන් ගත්තේ ය. හේ වැඩිමනත් මෙසේ ද කීවේ ය.

" උබලා මගෙන් අහන්ට බලාගෙන ආව භූත කෝච්චි කතාව ගැන මොකද ? මට නම් නිකන් නිකමට වගේ හිතෙනවා ඔයාලට හම්බෙන්ට යන ඊ ළග අබිරහසේ පෙර නිමිත්තක් වත් ද කියලා "

dileep

" අනේ මට නම් ඔය මළ උලව් අබිරහස් නැතුවට කාරියක් නෑ " තැති ගැණුනු හඩින් ඈන් කලබලයෙන් කීවා ය ." භූත කෝච්චි කියන නම කියද්දිත් මගෙ පපුව ඩිග් ඩිග් ගානවා . උබලා මේ ඒකෙත් අබිරහස් විසදන්න හදනවා "

ජෝක් කිසිත් ගණනට ගත්තේ නැත. ළමුන් සිව්දෙනා හා බල්ලා හා එක්ව අබිර්හසකට මැදිහත් වීමේ ඔහුට තිබෙන්නේ නො මද ආසාවකි.

" මට මාර ආසාවක් තියෙන්නේ ඔයාලා එක්ක ඔය කෝච්චිපොළට ගිහින් බලන්ට.. අබිරහසක් නැති වුනත් මට නම් ඒක ම වීර ක්‍රියවක් . අර වගේ අමුතු කතා කියන , ගල් අගුරුවලින් ගහන මිනිහෙක්ව හම්බවෙන එක ත්‍රාසජනක

නැද්ද ?ආයෙත් උබලා කෝච්චි පොල පැත්තේ කරක් ගහන වෙලාවක මටත් කතා කරන්ට අමතක කරන්න නම් එපා "

" හරි ජෝක්. ඒත් අපි දැනට නම් ආපහු කෝච්චිපොල දිහාවට යනවද නැද්ද කියලා හරියට ම තීරණය කරලා නෑ. අර මිනිහගෙ මනස් ගාත හැරුනම ඇත්තට ම එතනහොයා බලන්ට තරම් අමුතු දෙයක් සිද්දවෙනවා ඇති කියලා මම නම් හිතන් නෑ. මිනිස් පුලුටක්වත් දකින්න නැතුව තට්ට තනියම කෝච්චිපොලේ ඉන්න හින්දා නාකි මුරකාරයට එක එක ඒව හිතෙනවා ඇති. "

ජුලියන් එසේ කියා සිටියත් ජෝක්ට නම් අබිරහසක් ඕනෑ ම වී තිබේ. ඔහු වෙනත් කරුණක් මතු කරන්නට පටන් ගත්තේ ය

" ඒත් අපිට අමතක කරන්න බෑ මගදි හම්බුණ එඬේර ගැනත් නේද ? එයත් සැම්ගෙ කතාව ම කීව නොවැ"ජෝක් කීවේ ය " මේ බලන්ඩ . අපි කට්ටිය දවසක රෑ කෝච්චි පොලට යමු. ගිහින් ඔය කියන භූත කෝච්චි මොනවද කියල බලමු"

" පිස්සු ද ? " භීතියට පත් ඈන් එක්වරම විරෝදය පෑවා ය. මේ කොල්ලන්ට නම් අබිරහස් වලින් තොර ලොවක් නැති ලෙසකි. සාමකාමී නිවාඩුවක්, ගර්ජන තර්ජනවලි , තඩ මාරුවලින් තොර සාමකාමී එකම එක නිවාඩුවක් ගත කරන්නට මුන්ට බැරි හැටි .

' ඔයා එන්න ඕන නෑ ඉතිං " ජෝක් වැඩි දුරටත් ඈන්ට කීවා ය ." අපි කොල්ලො තුන්දෙනා විතරක් යන්නම්කෝ"

ජෝක් කට වරද්දා ගත් ලෙසකි. ජෝර්ජ් වහා හරස් වූවා ය ." අනේ මේ .මාත් එනවා . ටිමිත් එනවා "

" අනේ අනේ අපි මේ කතාව නවත්තමු. උබලා ඔය හදන්නේ අහක තියෙන නයි රෙද්ද අස්සේ දා ගන්න "

ඇත් කුමක් කීවත් කවුරුත් ඇගේ කතා ගණනකටවත් ගත්තේ නැත . ජුලියන් උද්දාමයට පත් ජෝක්ගේ මුහුන දෙස හොදින් බැලුවේ
" හරි හරි ජෝක්. අපි ආයෙත් ඒ පැත්තට යනවා නම් උබවත් එක්ක යන්නම්. "

ජෝක් ජුලියන් දෙසට හෙලුවේ ආදරය උතුරන බැල්මකි. ඔහු වහා නැගිට බදා වැලද ගනීවී යැයි සෙස්සන්ට සිතුණි.

" නියමයි ජුලියන් නියමයි. උබ නම් දෙයියෙක් නෙවේ දේවාලයක් " ජෝක් කීවා නොව ජෝක්ට කියවුනේ ය. " තැන්ක්ස් අ ලොට්. භූත කෝච්චි. මේ බලන්ඩ.අපිට එකක් ඇත්තට ම බලා කියා ගැනීමේ වාසනාව උදා උනොත් අපිටහොයා ගන්ට පුලුවන් වෙයි කවුද ඒවා ඩ්‍රයිව් කරන්නේ කියලා. අපිටහොයා ගන්න පුලුවන් වෙයි කොහේ ඉදන් ද ඒවා එන්නේ කියල ''

" ලී කකුල් සෑමා කීව හැටියට නම් ඒවා එන්නේ උමන් දුම්රිය මාර්ගයට පිටත ඉදන්. එන්නේ මහ රෑට . කිසිම සද්දයක් නැතිව. ගිනි මද්දහනේ ඒවා මතු වෙන්නේ නෑ. අපි ඒ වෙලාවට එතන හිටියොත් මිසක් භූත කෝච්චියක් අපේ ඇහැ ගැහෙන්න හැටියක් නෑ. "

ඇත්ත වශයෙන් ම කිව හොත් අප මිතුරන්ට සේ ම මේ භූත කෝච්චි කතා බහ ජෝක්ට ද ඇති කලේ වචනයෙන් විස්තර කල නොහැකිව් ඉදිහේ උද්දාමයකි. ලොමු දැහැ ගැන් වී උගුර

dileep

කට වියලී යන සුලු තිගැස්මකි. එබැවින් කවුරු කවුරුත් එදින සංදයාව ගෙවා දැම්මේ උද්දාමයෙන් උද්දාමයට පත්වය. ඒත් ඈන් නම් මල කෝලම් බහු භූත කෝච්චීන් ස්ම්බන්ද කතා බහට ඒතරම් මනාපයක් නො දැක් වූ බව කිව යුතු ය. ඈන්ගේ අලුත් පැටවා වඩාත් තුරෙලු කරගෙන සිටියා ය. මේ සියල්ල ම නවතා දමා ටිමියා ද කැටුව කොහේ හෝ ඇවිදින්නට යන්නට තිබුනා නම් මැනැවැයි ඈ නේක වර සිතුවා ය. ටිමීගෙන් පවා පල් වූවේ එවන් බැල්මකි. උඉ මද නින්දක වැටී සිටියේ ය. එහෙත් උන් හිටි ගමන් සීනුවක් නාද වෙන හඩක් ඇසුණෙන් ළමුන් කවුරු කවුරුත් පුදුමයට පත් වූවේ ය. ඒවූ කලී තේ වේලාව පැමිණි බව හගවන සීනු නාදය යි.

" තේ වෙලාව " ජෝක් කීවේ පුදුමයෙනි." අද වේල පහින් ම . ඔයාලා භූත කෝච්චි බලන්ඩ යනවා නම් මාවත් අනිවාරෙන් ම එක්ක යන්ට. මට මීට කලින් ඔයාලට වගේ කිසිම ත්‍රාසජනක වැඩක් කරන්ට ලැබිලා නැති එකේ මේ අවස්තාව නම් මග හැර ගන්ට මට බෑමම දැන් ගොඩාක් සතුටෙන් ඉන්නේ "

ළමයි වහා තේ පානය සදහා ඉත සිතින් සූදානම් ව ගොවි පොල දෙසට ඇවිද යන්නට වූවෝ ය. ඈන් කුඩා පැටිය බිඩී කරා ගෙන ගියා ය. ඒ අතර තුර ද කුඩා පැටියා ඈ ලොවමින් ආදරය පල කරන්නට අමතකකළේ නැත.

මෙ තරම් කල් වේලා තිබියදීත් තමාට බඩ ගින්නක් දැනෙන්නට වී මෙන් ජුලියන් පුදුමයට පත් වූවේ ය. තෙ මේසය තුළ වාඩි ගත් හේ කතාව පටන් ගත්තේ ය.

" මට නම් සතියකින් කාල නෑ වගේ දැනෙන්නේ " ඔහු කී ය. " ෂා තේ මේසෙ දැක්ක ම බඩ පිරෙනවා. මිසිස් ඇන්ඩෘස් . ජෝක්

නම් හැම තිස්සෙ ම මේ අගේ කෑම කනවා ඇති. එයා නම් හරි ම වාසනාවන්තයි "

නිවසේ හදන ලද පැණි ද බටර් තවරන ලද පාන් පෙති ද ඔහුට පෙනෙන්නේ ය. අලුතෙන් සකසන ලද ක්‍රීම් චීස් ද දුඹුරු පැහැ ගත් ජින්ජර බියර් ද විශාල පලතුරු කේක් ගෙඩියක් ද ළමුන්ගේ කුස ගින්න නිවීම පිණිස පිළිවෙත් පෙර දැරි ව සැදී පැහැදී මේසය මත වැඩ හිඳින්නේ ය.

" ඒත් මේ හැම එකකට ම මම කැමතියි. ඒත් මට මේ එකක් වත් කන්න බැරිවෙයි කියලයි බය. මගේ බඩ හොදට ම පිරිලනේ "

කුඩා ඈන් එසේ කියද්දී ඇන්ඩෘස් මැතිණිය සිනාවක් පුද කොට කතාව පටන් ගත්තා ය.

dileep

" පුලුවන් තරමක් කන්නකෝ. කන්න බැරි වුනොත් කූඩාරමට යන කොට මම අරන් යන්න ඔතලා දෙන්න ම්" ඈ කීවා ය

" බොහොම ස්තූතියි" ජුලියන් ඇයට කීවේ ය ."ඔයා ඉවුම් පිහුම් වලට හරි ම දක්ෂ කෙනෙක්. මමත් ඔයාගෙ ෆාම් එකේ හිටිය නම්"

ගොවිපලට කාර් එකක් සේන්දු වූවේ ඔවුන් මෙපරිද්දෙන් කෑම කතාවේ නියලී සිටින අ තරතුර ය.
" අහ්. ඇන්ඩෘස් ඇවිල්ලා " ඇන්ඩෘස් නෝනා කීවා ය. " ඔයාල අහල ඇතිනෙ. ඒ තමා මගේ හස්බන්ඩ්. ජෝක්ගෙ බාප්පා "

ඇගේ බැල්ම ඒ තරම් ප්‍රීතිමත් එකක් නො වෙතැයි ජුලියන්ට සිතෙන්නේ ය. සමහරක් විට ඇන්ඩෘස් මහතා ළමයින්ට ඒ තරම් කැමැත්තක් දක්වන අයෙකු නො වෙනු ඇතැයි ද ඔහුට සිතෙන්නේ ය. එසේ නම් ඔහු නිවසට එන විට ළමුන් ර්ංචුවක් ම කෑම මේසය වටා රැස්ව සිටිනු දැකීම ඔහු නො රිස්සනු ඇත.

" අපි යන්න ඕනද ?" ජුලියන් කෙලින් ම එහෙත් ඇන්ඩෘස් මැතිනියගේ සිත නො තැලෙන පරිද්දෙන් ඇසුවේ ය. " සමහර විට ඇන්ඩෘස් මහත්තය කැමති වෙයි පාඩුවෙ තේ ටිකක් බොන්ට. මෙතන ගොඩක් අය ඉන්න නිසා...."

ජෝක්ගේ අම්මා ඔහුට කතාව සම්පූර්ණ කරන්නට ඉඩ දුන්නේ නැත. ඇය හිස වනා " නෑ නෑ ඔයාල ඉන්න '' යි කීවා ය. " එයාට ඕන නම් මං වෙන කාමරේක එයාට තේ බොන්න ලැහැස්ති කරන්නම්කො '

dileep

කලු ජාතිකයෙකුගේ බදු පෙනුමක් තිබූ කුඩා මිනිසෙක් කාමරයට ඇතුලු වූවේ ය.වචනයේ පරිසමාප්තියෙන්ම ඔහුට තිබුණේ ඒ තරම් සිත් ගන්නා සුලු පෙනුමක් නො වේ. කුඩා ඈන්ට පවා ඔහු සම්බන්දයෙන් දැනුනේ අකමැත්තකි.මිනිසගේ මුහුණ මලාණික ය. නහය ලොකු වැඩි ය. කෝපවත් බැල්මකින් යුතු බැල්ම කියා පෑවේ හොස්ස අගින් මැස්සා යාමත් දරා ගත නො හැකි බවකි.

" හලෝ ' ඇන්ඩෘස් මැතිණිය කෝපවත් බැල්මෙන් ළමුන් දෙස බලා සිටින ඇන්ඩෘස්ගේ මුහුණ තමා දෙසට හරවා ගන්නට උත්සුක වෙමින් කීවා ය. " ජොක්ගේ යාලුවෝ ඇවිල්ලා. ම් ඉතිං ඔයා කැමති නම් මං ඔයාගෙ කාමරේට ම තේ එක අරං එන්නම් . "

" හොදයි " ඇන්ඩෘස් කියා දැම්මේ දියාරු සිනවක් නගා ගෙන ය. " අද මහ එපා කරපු දවසක්. ඒක තවත් අවුල් කර ගන්ට ඕන නෑ. වැඩිය කන්න බෑ. ඉක්මනට තේ ලෑස්ති කරන්න "

" හරි ඔයා මූණ කට ටිකක් හෝදගෙන එන්න "

මෝඩ පෙණුමක් තිබූ කුඩා මිනිසා දෙස ඈන් බලා සිටිද්දී ඔහු නාන කාමරය දෙසට ඇ විද ගියේ ය. මුදල් වෙනුවෙන් ම සැදී පැහැදී ජීවිතය මුදල් සේවී ම කර ගත් මිනිසෙකු ඇයට ඇන්ඩෘස්ගෙන් පිළිබිඹු වෙයි.

ඇන්ඩෘස් මැතිණිය අහාර පුරවා ගත් ට්‍රේ එකක් දෝතින් රැගෙන ආ අතර නාන කාමරයට වැදුනු ඇන්ඩෘඋස් මහතා මුහුණ කට සෝදන හඩ ළමුන්ට ඇසිණි. තවත් නො බෝ වේලාවකින් කුඩා මිනිසා ඉන් පිතටට පැමිණි අතර හිස දොරෙන් පිතට දැමූ හේ ජොක්ට කතා කරන්නට පටන් ගත්තේ ය.

dileep

" මගේ කෑම ලෑස්ති ද ? ඉතිං ජොක් කොල්ලා. අද හොද දවසක් ද ?"

" ඔව් තෑන්ක්ස් " ජෝක්ද වහා කියා දැම්මේ ඕනෑවට නො ව එපාවට යැයි ළමුන්ට සිතුණි.ජොක්ගේ අම්මා ගෙන ආ ආහාර පිරි ට්‍රේ එක ඩැහැගත් බාප්පා උඩු මහළට යාමට සූදානම් වූවේ ය.

" අද මොක ද කළේ ?" යි බාප්පා ද නිකමට මෙන් ඇසී ය.

" අපි ටිකක් මේ පැත්තේ ඇවිද්දා .ඊට පස්සේ අපි හැන්දෑ වෙනකම්ම කතා බහ කර කර හිටියා . ආ මට ඔයාගෙන්

දෙයක් අහන්ට තියෙනවා . බාප්පා භූත කෝච්චි කියල ජාතියක් ගැන අහලා තියෙනව ද ? එහෙම දෙයක් ගැන මොනවා හරි දන්නව ද ?"

dileep



ඇන්ඩෘස් මහතා කාමරයෙන් පිටවන්නට දොර දෙසට ගියා පමණි. ජොක් එසේ කියනවාත් සමගම ඔහු ආපසු හැරුණේ ය.

" භූත කෝච්චි ? මොනව ද මේ දොඩවන්නේ ?"

" හරි මං කියන්නම් " යි ජොක් කතාව පටන් ගති." ජුලියන් කිව්වා එයාල ඇවිදිද්දි අතෑරල දාපු කෝච්චි පොළක් දක්නට ලැබුණ ලු. එයාලට අහන්න ලැබිල තියෙනව රෑට ඒකෙ උමං දිගේ ගමන් කරන අද්භූත කෝච්චි ගැන කතාවක්. ඔයත් අහල තියෙද ?"

ඇන්ඩෘස් නැවතී ගත්තේ ඉද්ද ගැසුවාක් මෙනි. ඇත්ත වශයෙන් ම ඔහු හිටි පියෙන් නතර වූවේ ය. මිනිසාගේ මුහුණ වඩාත් සුදු මැලි පැහැයට හැරී තිබේ. විවර කොට තිබූ දොරට පා පහරක් එල්ල කොට වසා දැමූ හේ ආපසු ඔවුන් සිටි කුටිය තුළට පැමිණියේ දුම්මල ගසා වත්පන්නා දැමිය නො හැකි අයුරෙනි.

dileep

" අපි ටිකක් කතා කරමු " හේ කියන්නට විය " හොදයි එහෙනම් ඔය ළමයින්ට භූත කෝච්චි ගැන අහන්ට ලැබිල ඇති හැඩයි. මටත් ඕව ගැන ආරංචි වුනා. ඒත් මං කිව්වෙ නෑ. ජොක්ගෙ අම්ම චුට්ට ඇත්නම් බය වෙනවනේ. ඒ නිසා "

" ඇත්තට ම ඔබ තුම හිතන්නෙ ඇත්තට ම එහෙම දෙයක් තියෙනවා කියල ද ?" යි ඩික් විචාලේ ය. " හැබැයි ඇත්තට ම එහෙම දෙයක් වෙන්ට බෑ නේද ?"

" මුලින් මට ඔයාල දන්න සේරම කියන්න.කොහොමද ඔයාලට මේ ගැන හන්ට ලැබුණෙ කියල.'' ඇන්ඩෘස් කීවේ අසුනක් මත පත බෑ වෙමිනි. " පුංචි දෙයක් වත් මග අරින් නැතුව සේර ම දේවල් කියන්න. අකුරක් නෑර මට දැන ගන්ට ඕනෑ "

ජුලියන් නම් මේ මනුස්සයාට සියල්ල කියන්නට ඒ තරම් මනාපයක් දැක්වූවේ නැත . ඔහු අදි මදිකලේ ය .

" අයියෝ සර් ඒක එච්චර දෙයක් නෙවේ " යි ඔහු කීවේ ය." නිකන් විකාර කතා ."

" දන්න දේවල් කියනවා මනුස්සයෝ " එක් වර ම ජුලියන්ගේ ප්‍රකාශය නො රිස්සූ ඇන්ඩෘස් වෘකයෙකු පරිද්දෙන් කඩා පැන්නේ ජුලියන් පමණක් නො ව ළමුන් පස් දෙනා ම තිගැස්මට ලක් කරමිණි. ඒ හාත් සමග ම සංසුන් වූ හෙතෙම ,

" ඔයාල දන්න දේවල් කියන්නකෝ. මං එතකොට ඔයාලටත් කාරණා ටිකක් කියන්නම් . ඒ අගේ ම තමයි. මං ඔයාලට කියන්නේ. ආයෙ එහෙම අම්ම මුත්ත කීවත් ඔය කෝච්චි පොළ තියෙන පැත්ත පළාතකවත් යන්ට නම් එප. තේරුණා ද ?"

dileep

dileep

# 08 අලසකර සැඳෑවක්

ළමුන් පස් දෙනා පමණක් නො ව ඇන්ඩෘස් නෝනා පවා ඇන්ඩෘස් මහතා දෙස පුදුමයෙන් බලා සිටියෝ ය. ඔහු යළි යළිත් ඔහුගේ ,

" දන්න දේවල් සේරම කියන්න. අකුරක් නෑර සේර ම " යන ප්‍රාථ්‍ය පුනරුච්චාරනයකළේ ය.

ජුලියන් සිදු වූ සියල්ල කෙටියෙන් කියා දැමීමට තීරණයකළේ ය. ලී කකුල් සෑම් කල කී සියල්ලත් අතැර දමන ලද දුම්රිය පොළේදී ලත් අද්දැකීම් සියල්ලත් ජූලියන් කියා දැම්මේ ය. ඇන්ඩෘස් මහතා සියල්ල ඉතා වුවමනාවෙන් අසා සිටියේ ය. ඔහුගේ දෑස් තත්පරයකට හෝ ජුලියන් ගේ මුහුණින් ඉවතට යොමු නොවුනු තරම් ය.

වේදිකා නාටයක ජවනිකාවක් පරිද්දෙන් පුටුවේ පසු පසට වී වාඩිගත් ඇන්ඩෘස් සම්පූර්ණ කෝපි කෝප්පයක් එක හුස්මට බී ඉවරකළේ ය. ළමුන් බලා සිටියේ ඔහු කියන්නට තතනන්නේ කුමක් දැයි දැන ගැනීමේ නො ඉවසිල්ලෙනි.

" දැන් මේ අහනවලා " ගාම්භීර කට හඬක් නගා ගැනීමට රැල් බුරුල් හල හේ කතාව පටන් ගත්තේ ය. " මං කියන දේ හොඳින් අහගන්නවලා. මින් පස්සෙ කිසි ම දවසක වැරදිලාවත් ඔය පැත්තේ යනව එහෙම නොවෙයි. ඒක මහ අද්භූත තැනක් "

" ඒ කියන්නේ ? " ජුලියන් විචාළෙ ය. " මොකද්ද අද්භූත තැනක් කියන එකේ තේරුම ?'

" අද්භූත තැනක් කියන්නේ අද්භූත තැනක් කියන එකට " පෙරටත් වැඩි ගැහුරු හඬක් ආයාසයෙන් එකතු කොට

නිර්මාණය කරගත් ගුප්ත ස්වරයෙකින් යුතුව ඇන්ඩෘස් යලි කීවේ ය."අවෘදු ගාණකට කලින් මහ නරක දේවල් වගයක් සිද්ද වුනා. හදිසි අණතුරු වගයක්. ඒවත් එක්ක ම කෝච්චි පොළ වහල දාන්න තීරනය කෙරුණා. ආයෙ කිසි ම දවසක උමං දුම්රිය මාර්ගය භාවිතයට ගත්තේ නෑ. කාටවත් කෝච්චි පොළට යන්න ඉඩ දුන්නේ නෑ. ඊටත්මොළේ තිබ්බ මිනිස්සු ඒ පැත්තටවත් ගියෙත් නෑ. මොකද කවුරුත් හිටියෙ බයෙන්. අද්භූත දේවල් සිද්ද වෙන අද්භූත තැනකට නොයා ඉන්න කාට්වත් අමුතුවෙන් කියල දෙන්ට වුවමනා නෑ නොවැ."

මිනිසාගේ කතාව ඈන්ට ගෙනාවේ බියකි. සැබැවින් ම සියොලගග කිළි පොලා යනු දැන් දැන් ඇයට දැනෙමින් තිබෙන්නේ ය.එහෙත්.. එහෙත් රතු පැහැ ගත් මුහුණින්ද වෙව්ලන ස්වරයෙන් ද ඈ තම හඬ අවදි කලා ය.

" " ඒත් මිස්ට ඇන්ඩෘ ඇත්තට ම එතන තියෙන්නේ හොල්මන් කෝච්චි කියලා ඔයා හිතන් නෑ නේ ද ?"

තොල පෙරලා විරූපි මුහුණ තවත් ගාම්භීර කොට ගත් ඇන්ඩෘව්ස් යළි කතාව පටන් ගත්තේ ය.

" මම මෙච්චර වෙලා කියපු දේ තේරුන් නැද්ද ? භූත කෝච්චි එනවා යනවා . කවුරුවත් දන්නෙ නෑ මොන මගුලකට එනව ද මොන ලෝකෙකෙට යනවද කියලා . ඒත් භූත කෝච්චියක් මූනට මුණ ගැහුනොත් මොනවයින් මොනව වෙයිද කියල දෙයියො තමයි දන්නෙ. කවුරු හරි ඒ වෙලාවට එතන හිටියොත් ඉකන් වාශ්ප වෙලා වගේ යාවි. කොහේ යයි ද මොන්වා වෙයිද කියලා කාටවත් කියන්න බෑ "

dileep

ජුලියන් මහ හඬින් සිනාවක් පෑවේය. මේකාට නම් පිස්සුද කොහෙද ? මූ හොඳයි පොඩි ළමයි බය කරවන්න නම් " යි වැනි සිතුවිල්ලක් ඔහුගෙ සිතට පැමිණියත් ඔහු එවැන්නක් නම් ප්‍රකාශ කරන්නට ගියේ ම නැත. ඇන්ඩෘව්ස්ගේ සිත ද නො තැලෙන පරිද්දෙන් ,

" ඔය කියන තරම් නම් නරක තැනකට වෙන්න බෑ නේද සර් අනික් එක ඔයා නිකන් අපේ ඈන් ව බය කරනවා. ඔය කතාවලට එයා එච්චර කැමති නෑ. අපි වෙන දෙයක් ගැන කතා කරමු. ඊටත් මං නම් කොහොමවත් ඔය බහු බූත විශ්වාස කරන්නේ නෑ "

එහෙත් ඇන්ඩෘස්ට නම් කතාව නැවැත්වීමේ වුවමනාවක් ඇත්තේ ම නැත. ඔහු දිගින් දිගට ම කතාකලේ භූත කෝච්චීන් පිළිබඳව ම ය " ලී කකුල් සෑම වුනත් මෙච්චර කල් පණ පිටින් ඉන්නෙ භූත කෝච්චි මතුවෙන වෙලාවට එලි පහලියෙ ඉන්නෙ නැතුව හැන්ගෙන නිසා. මට හිතා ගන්න බෑ මේ වගේ අද්භූත තැනක් බලා කියා ගන්න තරම් හයියක් මිනිහට කොහෙන් ආවද කියලා . අදුරුම අදුරු බිම්ගේ දිගේ භූත කෝච්චි කොයි වෙලේ මතු වෙයිද , ඒකකට අහු උනොත් මොනවයින් මොනවා වෙයි ද කියල කාටවත් කියන්ට බෑ "

ජුලියන් ට නම් මේ මිනිසා කියන සියල්ල ම නිකම් ම නිකන් හිස් සම්ප්‍රප්පලාප සමූහයක් පමණෙකි. ඔහු ඒවා බැහැර කොට දැම්මේ අසුරු සැණිනි. එහෙත් ඇන්ගෙන් නම් පළවෙන්නේ අතිශයින් ම බිය පත් පෙණුමකි. දිගින් දිගට ම කතාව එදී ගිය හොත් තම කුඩා නංගී සිහිණෙන් පවා බිය විය හැකි යැයි ද ඔහුට සිතේ.

dileep

" ඉතිං අපිට අපූරු කෑම වේලක් දුන්නට ඔයාට ගොඩාක් ස්තූතියි ඇන්ඩෘස් නෝනා " කූඩාරම් කරා යාමට යළි සැරසෙන බවක් හගවමින් ඔහු කීවේ ය. " අපි දැන් යන්ට ඕනි. එන්න ඇන්. දැං හොදට ම හවස් වෙලා . අපි යමු."

" විනාඩියක් ඉන්නවා. මම ඔහේලගෙ හොදට කියන්නේ. තමුන් කිසි ම වෙලාවක ඔය අද්භූත කෝච්චි පොළ පැත්තේ යනව එහෙම නො වෙයි. කියන දේ නාහ ගියොත් මොන විදිහේ වෙඉන්නැහියක් වෙයිද කියල දෙයියො තමයි දන්නෙ. ජෝක්. මං කරන්නේ ජෝක් එකක් එහෙම නෙවෙයි. තමනුත් ඔය පැත්තේ කරක් ගහන්ට යනව නම් අයෙ ගෙදර එන්ට තියෙන අසව අමතක කරලා යනව හොදයි. ලී කකුල් සෑම්ට පිස්සු හෝ නැතෑ හෝ මහ රෑට ඔය භූත කෝච්චි කෝච්චිපොළට එනව. එතන මහ බයානක අද්භූත තැනක්. කොටින් ම ඒ පැත්ත බලාගෙන බත්වත් කන්න එපා "

dileep

" හරි උපදෙස් වලට බොහොම ස්තූතියි " ජූලියන් කීවේ උපහාසාත්මක ස්වරයක් සගවා ගත් මවාගත් ගෞරවණීය හඩකිනි. කුඩා සිරුරැති ලොකු නහයා සම්බන්දයෙන් පෙර නො වූ තරමේ අප්‍රාසදයක් පිළිකුලක් ද කොලුවාට දැනෙමින් හැගෙමින් තිබෙන්නේ ය. " " අපි යනව එහෙනම්. ගුඩ් බායි මිසිස් ඇන්ඩෘස්. ගුඩ් බායි ජෝක්. හෙට ඒ පැත්තේ එනව ද ? අපි කට්ටිය පික් නික් එකක් යමු "

" අම්මට සිරි. නියමයිනෙ. ආ ඒක නෙමෙයි . ඔයාල හදන්නෙ හිස් අතින් ම ආපහු යන්න ද ? උදේ ආවම නම් කීවෙ කෑම බඩු ටිකක් ගන්ටත් එක්ක ආව කියල නේද ?"

බහු භූත භත කෝච්චි කතාව කරණකොටගෙන අන්දභූත වැ හුන් බැවින් දෝ උදෑසන ගොවි පොළට පැමිණි කාරණය පිළිබඳ හාන්කවිසියක් වත් මේ මොහොතේ ළමුන්ට මතක තිබුණේ නැත. ඇන්ඩෘස් මහතාගේත් ළමුන්ගේත් කතාවට සවන් දෙමින් වාඩි වී හුන් ඇන්ඩෘස් නෝනා එක් වර ම පුදුමයට පත් මුහුණින් යුතුව පුටුවෙන් නැගිට්ටා ය.

" ආ ඔව් ඔව්.." යි ඇ කීවා ය." එන්න"

ඈ කෑම කාමරයෙන් පිට ව බඩු භාණ්ඩ ගබඩා කොට තිබූ කුඩා කුස්සිය දෙසට ඇවිද යන්නට වූ තර උදාසන ගෙනෙන ලද බාස්කට් දෙකද රැගත් ජූලියන් ඈ පසු පසින් ඇදුනෙ ය.

" ආ මං ටිකක් වැඩි පුරත් එක්ක මේ පාර ඔයාලට කෑම බඩු දෙන්නම්කෝ " බටර් චීස් ආදී නානා මාදිලියේ කෑම වර්ග ජුලියන් රැගෙන ආ බදුන් තුළ තැම්පත් කරමින් ඈ කීවා ය ." මම දන්නවනේ පොඩි ළමයින්ගේ බඩ ගෙඩි වලට බඩගිනි වෙන තරම. දැං ජුලියන් පුතේ මගේ මහත්තයා කියපු බහු භූත ඒ හැටි ඔලුවට ගන්ට ඕන නෑ. මං දැක්ක අර පුංචි ඈන් කෙල්ල් ගොඩාක් බය වුනා.මමත් මේ පලාතට ඇවිල්ල දැන් අවුරුදු තුනකට වැඩියි. හැබැයි ඔහොම භූත කෝච්චි කතාවක් මමත් මේ ඇහුවමයි. ඒ නිසා මගේ මහත්තය කීව දේවල් වැඩිය ඔලුවට ගන්න ඕන නෑ. කොයිකටත් ඔය දරුවො ඔය කියන පැත්තට නො ගොඉහින් ඉන්නකෝ. නිකන් මොකට ද අහක තියෙන කරදර පටලව ගන්නෙ "

ජුලියන් වචනයක් වත් කියන්නට ගියේ නැත. ඇන්ඩෘස් මහතා ඕනෑ ම බහුබූත කට කතාවක් ඉස් මුදුනින් පිලි ගන්නා එඬේරා හා සමාන හාදයෙක් බව දැනටමත් ඔහුට පැහැදිලි ය . " මේ වගේ මෝඩයෙක් කසාද බැද ගත්තේ මොන මල උලව්වට

දැයි ඔහුට සිතුණත් ඔහු එය ඇන්ඩෲස් මැතිණියගෙන් අසන්නට ගියේ ද නැත .

“ ගුඩ් බායි සර් “ පෙරලා කුස්සියෙන් පිත්තට බට ජූලියන් කී වේ ඇන්ඩ්‍රුස්ට ඇසෙන්නට ය.” අපි යනව “

“ ගුඩ් බායි . මම කීව දෙවල් හොදට මතක තියා ගත්තොත් කාගෙ කාගෙත් ඇගට ගුණයි . භූත කෝච්චි ගේන්නේ අවාසනාව විතරයි. ඒක මතක තියාගන්න. ඔයාලා ඒවගෙන් ඈත් වෙලා ඉන්න. “

ජූලියන් ආචාරශීලී සිනාවක් පෑවා පමණි. අන්දයාට විද්‍යාව කියා දීමේ තේරුමක්නැති බවක් ඔහු හොදාකාරව ම දනී. මෙ වන විටත් සූයීා බැස යමින් තිබේ. යා යුතු බෝ දුරක් ද තිබේ. කරුවල වැටෙන්නට ප්‍රතම කූඩාරම් කරා යාමේ අරමුණෙන් ඔහු සෙස්සන් හා එක් වූවේ යි. ජෝක් ද ඒ වන විටත් එතන සිටියේ ය.

“ මම උබලා එක්ක ටික දුරක් යනකම් එන්නම් “ යි ජෝක් කීවේ ය. “ මේ භූත කෝච්චි කතාවලට මගේ බාප්පා බය වෙලා කියලයි මට හිතෙන්නේ. උඹලාට එහෙම හිතෙන් නැද්ද ?”

“ එයා අපිට ඒ විදිහට අණතුරු අගවද්දිමාත් හොදට ම බය වුනා “ පුංචි ඈන් ඈත්ත ම කීවා ය. “ මම නම් ආයෙ කොහොමටත් ඔය කෝච්චි පොල පැත්තේ යන්නෙ නෑ. ඔයත් යන්නෙ නෑ නේද ජෝර්ජ් ?”

“ අනේ අනේ උඹට බැරි නම් මාව අල ගන්ට එපා “ ජෝර්ජ් එක් වර ම කීවා ය .” කොල්ලො ටික යනව නම් මමත් යනවා “”

dileep

“ ඔයාල ආපහු කෝච්චිපොළට යනව ද ?” එසේ ඇසුවේ අලුත් රහස් ප්‍රීක්ෂකයා ය. “මාත් කැමතියි භූත කෝච්චි බලන්ට යන්ට. ඒක නිය ම ත්‍රාසජනක වැඩක් වෙයි. අනික මම චුට්ටක් වත් බය නෑ “

“ සමහරවිට යන්න පුලුවන් ජෝක් “ යි ජූලියන පිළිතුරු දිනි. “ අපි යනව නම් උඹවත් එක්කන් යන්නම්. ඒත් කෙල්ලො දෙන්නා එන්න ඕන් නෑ “

“ මගෙන් අහ ගන් නැතුව ඉදපං ජුලියන් “ යි ජෝර්ජ් කෝපයෙන් කෑ ගැවා ය. ‘’ මාව දාල යන්ට ද කල්පනාව ? යකෝ මමත් ඔය උලව් බහු බූත කෝච්චි වලට බය නෑ. කියපන්. මීට කලින් වත් කවද හරි මං බයේ මුලු ගැන්විලා ඉදල තියෙනව ද ? කොල්ලො වගේ ම තමයි .මාත් බය නෑ “

dileep

“ මටු තේරෙනව ජෝර්ජ්. මම දන්නවා උබ ව එහෙම ලේසියෙන් බය ගන්වන්ඩ බෑ කියල. ඔයත් යමු. ඔය හොල්මන් කතාව බොරු කට කතාවක් විතරයි කියල අපිහොයා ගත්ත ගමන් ම උඹත් යමු “

“ බහුභූත නම් කියවන්ට එපා ජුලියන්. උබ ඔය හදන්නෙ මාව ගොනාට අන්දලා හොරෙන් ම කෝච්චිපොලට යන්න. උබලා යන්නේ කොයි වෙලේද්මාත් අන්න ඒව් එලාවෙ ම එනවා . මාව දාල යන්න නම් ලැහැස්ති වෙන්න එපා. එහෙම ගිහින් තිබ්බොත් මගෙ ජීවිතේට මම උඹලා එක්ක කතා කරන්නෙ නෑ “

ජෝර්ජ් කියන්නේ කෝපයෙනි. ඇගේ හොස්ස ගින් මැස්සා යා නො කැකි ස්වරූපය දැං දැං මතු වෙමින් තිබෙයි. ඊටත් තමාට කෙල්ලෙකු වශයෙන් සලකා භූත කෝච්චි අබිරහසට

තමා මැදිහත් නො කර ගැනීම ඇට ඉවසා දරා ගත නො හැකි කාරණාවකි. කෝපයෙන් පුපුරණ ගිනි කන්ද දෙස ජෝක් හැරී බැලුවේ පුදුමයෙනි. ජෝර්ජ්ගේ කෝපවත් ගති ගුණ මීට පෙර දැන හඳුනා ගෙන නො තිබුණෙන් ජෝක් තක්කු මුක්කු වී යාම පුදුමයක් නො වේ.

" ඇත්තට ම ඇයි අපිට ජෝර්ජ් ව එක්ක යන්ට බැරි ?මම නම් හිතන්නේ එයත් කොල්ලෙක් වගේ ම බය යි කියල නාමයක් වත් නොදන්න කෙනෙක් කියලයි. අනික ජෝර්ජ් කොල්ලෙක් වගේමනේ. මුලින් දැකපු දවසේ මම හිතුවෙ ම මෙයත් කොල්ලෙක් කියලයි "

ජෝර්ජ් වහා හැරී ජෝක් දෙස බැලුවා ය. නපුරු බැල්ම මුලුවනින් පහ කොට දමා ආකර්ශනීය සිනාවකින් ඔහුට සංගරහ කළා ය. එහෙත් කවුරු මොනවා කීවත් ජුලියන් නම් අදහස වෙනස් කොට ගන්නා පාටක් " හරි හරි ජෝර්ජ් ඔයත් යමු"යි කියන බවක් පෙනෙන්නට නැත.

dileep

" මම එහෙම කීවේ ඇයි කියලත් තේරුම් කරන්නම් එහෙනම්. අපි සේරම ගියොත් ඈන්ට කුඩරමේ ඉන්න වෙන්නේ තට්ට තනියම. මොකද එයා ගොඩක් බය වෙලා ඉන්නෙ.භූත කෝච්චි එලවන්න යන්න එයා ආස නෑ කියල මං දන්නවා. ජෝර්ජ් ගියොත් එයාට කවුරුවත් නෑ. "

" ඇයි මනුස්සයෝ එයාගෙ ආදරණීය ලූෆී උන්නැහෙ ඉන්නවා කියලා අමතක වුනාද ?" ජෝර්ජ් යළිත් බුම්මා ගත් මුහුණක් ආරූඩ කොට ගත්තා ය.

" මෝඩ්. අපිට පුලුවන් ද කටක් ඇරලා ලූෆී උන්නැහේට කියින්න සර් අපි භූත කෝච්චි ගැන ටිකක් පරීක්ශා කරන්න

යනවා. එනකන් අපේ ඈන් ව පොඩියක් බලා ගන්න කියලා . මිනිහට ඕක කීව ගමන් ම අපිට කොක්ක දාලා එලියට වත් බහින්ඩ දෙන එකක් නෑ. ඊටත් අපිව ගහල පන්න ගත්ත ලී කකුල් සෑමා ගැන කීව ම . උඅබ දන්නව ලොකු මිනිස්සු අපි වගේ ළමයි ගැන හිතන කියන පිළිවෙල. එක්කො අපිට යන්ට දෙන එකක් නෑ. නැත්තම් එයත් එයි අපි එක්ක කෝච්චි පොළට "

" අම්මේ ඔව්. ආව්ත් හැබැයි එයා කෝච්චිපොළේ ඉන්න හැම මදුරුවෙක් මැස්සෙක් ගැන ම වග බලා ගනී. ඒත් ඇගේ හැප්පුණත් කෝච්චියක් නම් දකින එක්ක් නෑ " ඩික් උපහාසයක් කොට කීවේ ය.

' හරි හරි මං දැං යන්නම්" අවසානයේ ජෝක් කීවේ ළමුන් අතර වන ගැටලුව නිරාකරනය වන පාටක් නොපෙනී යන විට ය ." ඔයාල ආව එකෙන් අද දවසම ගොඩාක් සතුටු වුනා. මම එන්නම් හෙට ඒ පැත්තෙ එහෙනම් පික්නික් යන්න බලාගෙන . ගුඩ් බායි."

dileep

තවත් නොබෝ වේලාවකට පසු ළමුන් තම තමන්ගෙ කූඩාරම් පිහිටි කදවුරු භූමිය කරා සම්ප්‍රාප්ත වූ අතර යළිත් කූඩාරම් දකින්නට ලැබීම ගෙදර ගියාක් බදු සතුටක් විය. සුළං පහරට කූඩාරම් රෙදි යන්තම් එහා මෙහා වී තිබුණත් සොරෙක් සතුරෙක් පැමිණි බවට සලකුණකුදු නො වන බව කූඩාරම් තුළට වැදුනු වහා ඈන් අවබෝද කොට ගත්තා ය .

කූඩාරම් තුල පවත්න්නේ උණුසුම් වාතාවරණයක් බැවින් රැගෙනා ආ පළතුරු ගෝර්ස් පදුඅර තුල සැගවිය යුතු යසෙයි ඈන් තීරණය කළා ය. ඈ මෙවන් බාරදූර කටයුතු හා සමග

කායී බහුල වෙද්දී පිරිමි ලමුන් ලූෆී උන්නැහේ පැමිණ සිටීදැයි දැන ගනු පිණිස ඔහුගේ කූඩාරම දෙසට ගිය නමුදු ලූෆී මහතා ඒ වන විටත් පැමින තිබුණේ නැත.

“ ඇන් අපි දිය පහරට යනව නාන්න “ නියමා කොල්ලන් දෙදෙනා ද කොලු වෙස් ගත් කොල්ලා ද කෑ ගාන්නට වූහ “ එනවද ?”

“ මට බැරියෝ .. කර්න්න වැඩ ගොඩක් තියෙනවා .”

ළමෝ එකිනෙකා දෙස බලා සිනා සුනහ. ඈන් වඩාත් කැමැත්තක් දක්වන්නේ සෙල්ලම් ගෙවල් කුස්සි අම්මාගේ චරිතය වීමට බව ඔවුහු හොදින් දැන සිටියහ. ඉතිං පුංචි කෙල්ලට ඕනෑදෙයක් කර ගන්නට දී රිසි සේ විනෝද වන්නට ඉඩ හැර දිය පාර කරා ගිය ඔවුහු වහ වහා හැද සිටි ඇදුම් උනා දමා සීතලෙන් පිරි දිය දහරට පැන්නෝ ය.

dileep

ඇතත වශයෙන් ම එය කළ යුතු යැයි කිව යුතු කටයුත්තක් නො වූ සාම කාමී අලසකර සැදෑ වරුවක් විය. නා කියා ගැනීමේ කටයුතු ඉවර කොට ඔවුන් යළි කූඩාරම් කරා පැමිණේන විටත් කෘමී විද්‍යාඥයා පෙනෙන්නට සිටියේ නැත . චීස් තවරන ඉඟුරු පාන් ප්‍රදාන කොට ගත් රස බර රාත්‍රී ආහාර වේලක් ද ඈන් නම් කුස්සි අම්මා සූදානම් කොට තිබුණා ය. ඊට වැඩියමක් ආහාරයට ගැනීමේ හැකියාවක් ඇත්ත වශයෙන් ම කාටවත් තිබුණේ නැත. අහර කිස නිම වීමෙන් ඉක්බිතිව සහන දායී ලෙස හෙදර පදුරු ගොල්ලේ වැතිර ගත් ඔවුහු නිදහසේ අල්ලාප සල්ලාපයේ නියැලුණහ.

" මම ආස මෙන්න මේ මේ ජාතියේ නිවාඩුවලට තමයි " යි කියමින් කතාව පටන් ගත්තේ ඩික් ය .

"මාත් ඒම තමයි. හැබැයි ඉතිං මට බය හිතෙන අර භූත කෝච්චි නැත්තන් තවත් හොදයි "

" මෝඩියෙක් වෙන්ට එපා ඈන් " ඒ ජෝර්ජ් ය. " ඒක නිකන් මෝඩ කට කතාවක් විතරයි මොට්ටියෙ. හොදයි හිතමු ඇත්තට ම භූත කෝච්චි කියල ජාතියක් යනව එනවා කියලා . අන්න එහෙම නම් එත්න තියෙනවා පිට විසදන්න අබිරහසක් ච්

ජෝජ් එසේ කියන්නා හ ම් ළමුන් තුළ මද වේක්ලාවක් ගත වන් තුරු නිහැඬ්ඩියාවක් හට ගත්තේ ය. කවුරු ක්වුරුත් තම තමන්ගේ ඉතිවිලි වල ගිලී සිටියා මිසෙක කතාකළේ නැත . අවසානයේ නිහැඩියාව බිද හෙළන ලද්දේ ඩික් විසිනි .

dileep

" එහෙනම් අපි ඇත්තට ම ආයෙ කෝච්චිපොළට යනවද ?" යි ඔහු විචාලේ ය.

" ඔව් . අපි යමු '' ජුලියන් කීවේ ය . " ඈන්ඩෘස් තත්ත කීව මගුල් වලින් හිත කරදර කර ගන්ට ඕන නෑ. අපි යමු "

"අපිට ඕන් භූත කෝච්චියක් බලන්ට නිසා අපි රෑක යමු " ඒ ඩික් ගේ ම යෝජනාවකි .

"මාත් එනව ගමණට "

"නෑ ජෝර්ජ් ඔයා ඉන්ට ඈන් තනියම නිසා . "

ජෝර්ජ් කිසිත් කියන්නට ගියේ නැත ඈන් ගේ තනිය මකාලීම පිණිස තමා නවත්වා යාම කොයිතරම් අසාදාරණදැයි ඈ සිතින් මැසිවිලි නගුවත් කරබාගෙන සිටියා විනා කිස්ත් කියන්නට ගියේ නැත.

" අපි ,එ ගැන ලූෆී සර්ට කියනව ද නැද්ද ?" යි ඩික් ඇසී ය.

" කීවොත්  වෙන දේ අමුතුවෙන් කියන්නට ඕන නෑනේ ? " ජූලියන් අනික් අතට ප්‍රශ්නකළේ ය. ඒ හා සමග ම ඔහුට ඈනුමක් ද ගියේ ය .

" මට නම් නිදිත් මතයි. හොදට ම හවස් වෙලා . කෝ අනෙ ලූෆී සර් තවම ඇවිල්ල නෑ අගෙ . මේ මිනුස්සයා කොහෙ ගියා ද මං දන් නෑ "

dileep

" අපි ගිහින් බලමු ද ? එයාට බඩගිනිත් ඇති දැන් නම් " ඈන් කීවා ය .

" නෑ . එහෙම කරන්න ඕන නෑ. . එහෙම වුනොත් මහ රෑ වෙන්කන් එයාගෙ කෘමියො ගැන දේශන අහන්ට වෙන්නේ . එය ගාවත් කෑම ටිකක් තියෙනවානෙ. ඒ නිසා මිනිහා බඩගින්නෙ ඉන්න එකක්  නෑ. ඩික් යමු ද  නිදා ගන්න . ?"

ඩික් ද ජූලියන්ට එකගත්වය පළ කළෙන් පිරිමි ළමයි දෙදෙනා වහ වහා තම ත්මන්ගේ නිදන බෑග් වෙත වැදුණහ . රාත්‍රී අදුරත් සමගින් ස්වකීය කැදලි කරා යන සතුන්ගෙ මුනු මුනු හ්ඩ අසමින් ගැහැණු ළමුන් දෙදෙනා නම් හෙදර් යායට වී

තවත් බොහෝ වේලාවක් ගත්කළේ ය. ඊ ළඟට ඔවුන් දෙදෙනා ද ඔවුන්ගේ කූඩාරම් කරා ගියේ ය .

" අපි ජෝක් එක්ක දවල් වෙලාවක කෝච්චි පොළට යමු ද ?" ජූලියන් ඇසුවේ නින්දත් නොනින්දත් තර දෝලනය වෙමිණි " එහෙම නැත්තම් මේ වගේ වෙලාවක් යම ද භූත කෝච්චි බලන්නත් එක්ක ?"

" මම නම් කියන්නේ රෑක යමු කියල " ඩික් හෙවත් ඔහුගේ මලයා පිළිතුරු දිනි " අපිට දවල්ට ගිහින් හොල්මන් කෝච්චි බලන්ට බෑ නොවැ. හැබැයි ලී කකුල් සෑම් මට ගල් අගුරු වලින් ගැහුවත් මට මිනිහ ව ආයෙත් දකින්ඩත් ආසාවක් තීයෙනවා "

" හරි. ජෝක් හෙට උදේ ආවම තීරණයක් ගමු. මිනිහටත් ගොඩක් වුවමනාව තියෙනව කෝච්චි පොළ පැත්තේ රවුමක් ග්හලා ටිකක් විපරම් කරලා බලන්න . අපිට රෑටත් යන්න පුලුවන්. බලමුකෝ මොනව හරි ''

"" හරි එහෙනම් . ජෝක්ගෙනුත් අහලා තීරණයක් ගමු.


එතැන් සිට බොහෝ වේලාවක් ගත වෙන තුරු ළමුන්ගේ කතා බහට භූත කෝච්චී බදුන් වූ අතර අවසානයේ නිදිමත වඩාත් දැනෙන්නට වූයෙන් කතාව සහ මුලින් ම නැවතී ගියේ ය. එක් වරම හෙද්ර් පදුරු චලනය වන හඬක් ද කිසිවෙකු පැමිණෙන හඬක් ද ඩික්ට ඇසුණේන් හේ තිගැස්සී ගියේ ය. ඒ සමග ම කූඩාරම් රෙද්ද අතුරින් මුහුණක් ඇතුළට එබුණේ ය .

" ඒයි උඹ අදත් ආවොත් මං උඹේ හොම්බට හැටක් අනිනවා " යි ඩික් කීවේ ඒ ටිමියා විය යුතු යැයි සිතූ බැවිනි. රාත්‍රියට ළමුන්

dileep

නින්දට ගිය පසු මුර සංචරයේ ගොස් ඔවුන් හොඳින් දැයිසොයා බැලීම ටිමියාගේ සිරිත ය .

" උඹට ඕන මගේ බඩ උඩට නගින්න . බූරුවා . පිස්සු නටන්න තියා ගන් නැතුව පළයන්කෝ "



එක්වර ම කූඩාරමට එබෙනට ගිය හිස යළිත් ආපස්සට ගියේ ය . එහෙත් ඒ තත්පරයකින් පංගුවකට පමණි. ඊ ළඟට එය යළිත් එබෙන්නට උත්සහ කළෙන් ඩික් යළි කෑ ගාන්නට විය .

" එක් අතක් හරි දාපන් බලන්ඩ ඇතුළට . අල්ල විසික් කරනවා කන්දෙන් පල්ලෙහාට
මම දවල්ට උබට කොච්චර කැමති උනත් රෑට නම් මට උබව පෙන්ඩ බෑ. ඊටත් මං නිදන බෑග් එකක් එතුළෙ බැහැලා ඉන්න කොට . මෝඩ බල්ලා "

එහෙත් හිස පසු බට වූ බවෙක් පෙන්නෙන්නට තිබුණේ නැත . එය ඇතුළට ම එබුනේ ය. වූෆ් යැයි කියා බලු බාශාවෙන් කතා බහ කරණු එනුවට තේරෙන සිංහලෙන් කතා කරන්ට ද පටන් ගත්තේ ය .

" අර්.. ඔයාලා තම නිදි නෑ නේද ? මේ අහන්න . හැමෝ ම හොදින් ද ? ගැහැණු ළමයි දෙන්නට කොහොමද ? මම මේ දැන් ආවෙ "

" අපොයි දෙයියනේ මේ ලුෆී සර්නේ . අනේ සොරි සර් මම හිතුවේ ටිමී කියල. සමා වෙන්ට සර් "

" අහ් මගෙ හොබට හැටක් අනින්ට නම් එපා " ලුෆී උන්නැහේ සුපුරුදු විනෝදකාමී ස්වරයෙන් සිනාවක් පළ කළෙ ය ." ඒක දැන් වැඩිය හිතන්ට එප. ඔයාල හොදින් ඉන්නවනේ . අපි හෙට හම්බෙමු "

dileep

dileep

## 09 රාත්‍රියේ ආ අමුත්තා

පසු දින උදෑසන බොහෝ වේලාවක් ගත වෙන තුරුද ලූෂී උන්නැහේ නම් අවදි වූයේ නැත.මහ දවල් වෙන තුරු මර නින්දකට ඇද වැටී සිටියත් ඔහුගේ නින්දට බාදා කරන්නට ළමුන් කල්පනාකළේ නැත.ඩික් රාත්‍රියේ ලූෂී මහතා කූඩාරමට

එබෙද්දී ඔහුට ඇමතූ හැටි කියන විට නම් ගැහැණු ළමුන් දෙදෙනා බෙරිහන් දුන් බව සැබෑ ය. එහෙත් මර නින්දක වැටී , උස්සාගෙන ගියත් නො දන්නා ලීලාවෙන් පත බැවී හුන් ලූෆී මහතාට නම් මීක් හඬකුදු නෑසුණේ ය.

" ඒ වුනාට එයා හරි හොදයි.වචනයක් වත් කීවෙ නෑ " ඩික් කියන්නේ අභිමානය මුසු හැඟීමෙනි. " කොහොමහරි දැන් නම් උන්නැහේ හොදට ම නිදි ඇති. තාමත් එලි වෙලා නැතුව ඇති කියලත් හිතාගෙන ඉන්නව ද දන් නෑ "

කලින් දා ඇන්ඩෲස් මැතිණිය විසින් ලබා දෙන ආහාර ද්‍රව්‍යයන් ද උපයෝගීකොට ගත් ළමෝ ඉතා ප්‍රණීත උදා අහාරයක් පිළියෙල කොට ගත්හ. ළමුන්ගෙන් බිදෙන් බිද ලැබෙන ආහාර බිදු ඩැහැ ගැනීමේ අභිලාශයෙන් ටිමී ද සැදී පැහැදී සිටියේ ය.

dileep

" ජෝක් ඉක්මනට ආවොත් හොදයි. එහෙම වුනොත් අපිට පුලුවන් කදුකරයේ පොඩි රවුමක් ගහන්න .පික්නික් එකක් යන්න. අනික ජෝක් මේ පැත්තෙ ඇවිදින්ඩ එහෙම හොද තැන් ගොඩක් දන්නවා ඇති "

ජෝර්ජ් කියා සිටියේ ඔවුන් මෙසේ ආහාර ගනිමින් සප්පායම් වීමේ කටයුතු වල ඇලී ගැලී සිටින අතර තුර ය.

" සහතික ඇත්ත ජෝර්ජ් " යි ඈන් එකග වූවා ය. " කොයිකටත් අපි ඉක්මනට මේ ටික අස්පස් කරලා පිළිවෙලක් කරමු. ජෝක් ආව ම එයාට නඩේ ගුරා වෙන්ට කියලා ටිකක් ඇවිදින්ට යමු.අම්මෝ ටිමී. උබ නම් යකෙක් බං. කතාව අස්සෙ මූ මගේ අතේ තිබ්බ ක්‍රීම් චීස් කෑල්ලට විදලා නො වැ "

" ඉතිං බං උඹ මොකට ද ඌට පේන්ට ඕක වන වනා හිටියේ. ඌ හිතන්ට ඇති උඹ ඒක ඌට දෙන්ඩ හදනවා කියලා " බල්ලා වෙනුවෙන් ඉදිරිපත් වූවේ ජෝර්ජ් ය.

" හරි හරි.ඒකෙන් වැඩක් නෑ. අපි හුගක් කෑවානෙ. දැං පොඩ්ඩක් පල්ලෙහාට ගිහින් වතුර ටිකක් අරන් එමු ද ?"

" ජෝක් එන කොට තව කෑම ජාති ටිකක් එහෙමත් උස්සන් එයි " ඩික් කියන්නට පටන් ගත්තේ ය. " මිනිහ බුද්දිමත් කොල්ලෙක්. උඹලා දැක්ක ද ජෝක්ගෙ අම්මගෙ කෑම බීම එකතුවෙ තරම ? පිස්සු හැදෙනවා . මුලු ගබඩා කාමරේ ම එක ම කෑම ලෝකයක්. ජෝක් ඔහොම බතල කොටේ වගේ ඉන්න එකේ පුදුම වෙන්ට හේතුවක් නෑ "

" උඹලාට ඇහෙනව ද උරුවම් බාන හඩක් ?" යි එක්වර ම ඈන් ඇසුවා ය." ඒ ජෝක් ද කොහෙද "

dileep

එහෙත් ඒ නම් ජෝක්ගේ විසිල් හඩක් නො ව කිරල් ගායකයෙකු නැගූ හඩකි. " ජෝක් මෙච්චර උදෙන් එන එකක් නෑ " යි පවසමින් ජූලියන් ද කතාවට එක් වූවේ ය. " මේ ටික සුද්ද බුද්ද කරන්න අපෙනුත් උදව්වක් ඕන ද ඈන් ?"

" නැතුවට කාරියක් නෑ. හැරත් මේ ජෝර්ජ්ගෙයි මගෙයි ජොබ් එක . ඔය දෙන්නා ගිහින් ලුෆී සර්ට කතා කරලා බලන්න . එයා කැමති නම් තක්කලි එක්ක හැම් වගයක් තියෙනවා කියලත් කියන්න "

පිරිමි ළමුන් දෙදෙනා ලුෆී උන්නැහේගේ කූඩාරම දෙසට පැමිණියෝ ය. ඒ වන විට නම් උන්නැහේ අවදි වී සිටි අතර උදා

ආහාරය ද ගනිමින් සිටියේ ය .සැන්ඩ් විචස් කිහිපයක් අතට ගත් ඔහු ළමුන් දෙසට දිගු කරේ ය.

" මට ටිකක් නින්ද ගියා කොල්ලනේ . මම ඊයෙ සෑහෙන දුරක් ඇවිද්දා. අනේ ඩික්. ඊයෙ රෑ උබ ව එක පාරට ම කුද්දන්න සිද්ද වෙච්ච එකට නම් මට දුකයි "

" මොකට දුක් වෙනව ද සර්. හැරත් මං නිදන් හිටියෙත් නෑ. ඉතිං කොහොම ද ඊයෙ දවස "

නිරහංකාර මිනිසාගේ ප්‍රකාශය හේතු කොටගෙන සතුටත් පෙර දින රෑයේ උන්නැහේ ටිමියා ලෙස සලකා නැවූ නාඩගම හේතු කොට ගෙන උපන් ලැජ්ජාවත් රැදි මුහුණින් ඩික් විචාලේ ය .

dileep

" හිතුව තරම් ම සාර්තක වුනේ නෑ .අල්ල ගන්න හිතන් ගිය සේර ම කෘමීන් අල්ල ගන්න හම්බුනේ නෑ. ඉතිං මොනව ද ඔයාලගෙ විස්තර ?"

ඩික් ලුෆී උන්නැහේට ඇසෙන සේ ඔවුන්ගේ දවස ගත වූ අන්දම අකුරක් නැර විස්තරකළේ ය. එතුමා සියල්ල ම අසා සිටියේ ඉතා උනන්දුවෙනි. කෝච්චිපොළ සම්බන්දයෙන් ඇන්ඩෘස් දැරූ මතය පවා උන්නැහේ හොදින් අසා සිටියේ ය.

" මෝඩ මනුස්සයෙක්නෙ. ඒත් ඒත් මම නම් හිතන්නේ කොයිකටත් ඔය ළමයි ඔය කියන කෝච්චි පොළෙන් ඈත් වෙලා හිටියොත් හොදයි කියලයි. මම ඔයල වුනා නම් කරන්නෙ එහෙමයි. ගින්නක් ඇතිව දුමක් නගින්නෙත් නෑනෙ "

" මොනවා සර්... ඔයත් අර මනස්ගාත විස්වාස කරනව ද ? ඇත්තට ම හිතනව ද භූත කෝච්චි ඇති කියලා ?"

" බුදු අම්මේ නෑ. ඒත් භූත නො වෙන කෝච්චි මොනව හරි නම් ඇති. මම කියන්නේ මේකයි. මොක්ක් හරි තැනක් තියෙනව නම් ඒ තරම් හොද නමක් නැති , අපි ඒ වගේ තැන් වලින් පුලුවන් තරම් ඈත් වෙලා ඉන්න එක අපේ ඇගට හොදයි. ආයෙ මොකට ද කොහේවත්යි යන නයි රෙද්ද අස්සේ දා ගන්නේ "

" අපි එහෙම කරන්නම් " යි ජුලියන් හා ඩික් එක්ව එක වන්වැ උත්තර දුන්නෝ ය. මාර්තෘකාව වහා වෙනස් කළ යුතු යැයි ඔවුහු තීරණය කොට ගත්තෝ ය. ඇන්ඩෘස් මෙන් ම ලූෆී මහතා ද කෝච්චිපොළට යාම තහනම් කළහොත් යන බිය ළමුන් දෙදෙනාට තිබේ. කිසිවෙකු යමක් තහනම් කල විට එතැනට යාමේ ආසාවක් ද ළමුන්ට දරුණු ලෙස තිබේ.

" අපි ආපහු යමු " යි ඩික් කීවේ ය."ෆාර්ම් එකේ කොල්ලා ජෝක් එනවා කිව්වනේ. ඉතිං සර් අපි හිතන් ඉන්නේ එයත් එක්ක පික්නික් යන්න. ඔයත් කොහෙ හරි යනව ද සර් ?"

" අද නම් බෑ වගේ. ඊයෙ ඇවිදලා ඇවිදලා අද නම් මගේ කකුල් දෙක හොල්ලන්ඩ බෑ වගේ. මට යන්නත් ඕනි. ම්ම්ම්.. ආ ඔයාල්ගෙ යලුවා ... මොකක්ද නම කීවෙ ? ජෝක් නේද ?මාත් එන්නම්කො එයාව පොඩ්ඩක් දැන හදුනා ගන්ට "

" හරි සර්. ජෝක් ආව හැටියෙම අපි මිනිහ ව මෙහාට එක්කන් එන්නම්. ඊට පස්සෙ අපි කෑමත් අරන් පොඩියක් ඇවිදින්ඩ ගියා ම සර්ට පුලුවන්නේ අපේ සද්ද බද්ද නැතුව නිවී සැනසිල්ලේ අද දවස ගෙවා ගන්න "

ජුලියන් එසේ කීවත් ඇත්තට ම එදින ජෝක් නම් ඔවුන් හමුවීමට පැමිණියේ නැත. උදෑසන කාලය පුරා ම ළමෝ බලා සිටියත් ඔහු ආවේ නැත. දිවා ආහාරය ද සාදාගෙන ජෝක් එන මග බලා සිටියත් ජෝක් ආවේ නැත. ජෝක් නො පැමිණුන ද බඩ ගින්න දැනෙන්නට වූවෙන් ළමෝ දිවා අහාරයට නම් වග කියා දැම්මෝ ය.

" මාරයි. ඊයෙ අපි පාර කියපු හැටියට නම් ජෝක්ට මෙතනට එන පාර වරදින්ට විදිහක් නෑ. ඊටත් අපිත් එක්ක බාගයක් දුර ආවනෙ. සමහර විට හැන්දෑ වෙලා එයා එන්ට පුළුවන් "

ජුලියන් එසේ කීවත් එදින සවස ද ජෝක් නම් පැමිණියේ නැත.

තේ වේලාව වන විට නම් ජුලියන් ට දැණුනේ ජෝක් නො පැමිණීමට හේතුවසොයා බැලීමට ගොවිපලට යාමට පවා වුවමනාවකි. එහෙත් ජෝක් නො පැමිණෙන්නට සාදාරණ හේතුවක් ඔහුගේ පැත්තෙන් තිබිය හැකි ය. ඊටත් දිනපතා ම ගොවිපලට ගොස් ඇන්ඩෘස් මැතිණියට කරදරයක් වීමට ද නො හැක.

ඒ අනුව එදින ළමුන් කාටත් යහපත් දිනයක් වූවා යැයි සදහන් කළ හැකි නොහේ. සැබැවින් ම ජෝක්ද සමග ඇවිදීමට තුබූ බලා පොරොත්තුව හේතුවෙන් දවස මුළුල්ලේ ම ළමුන්ට සිදු වූවේ කූඩාරමට වී බකන් නිලා සිටීමට ය.

" එයා හෙට එයි ළමයි " වැඩ කටයුතු අතර කාර්‍ය්‍ය බහුලව සිටිය ද බෙරි වී ගිය ළමුන්ගේ මුහුණු දුටු ලූසී මහතා ඔවුන් අස්වසනා ලීලාවෙන් කීවේ ය. " ඔයාලට ඇති වෙන්ඩ කෑම

dileep

තියෙනව ද ? අඩුවක් පාඩුවක් තියේ නම් මට කියන්න ඕන. මං ගාව කෑම ගොඩාක් තියෙනවා "

" එහෙම ප්‍රශ්නයක් නම් නෑ සර්. බොහොම ස්තූතියි. අපි කාඩ් අතක් සෙල්ලම් කරන්න හදන්නේ. ඔයත් එනව නම් අපි බොහොම සතුටුයි "

" ඔව් ඔව්මාත් එනවා " ලූෆි උන්නැහේ ජූලියන් ගේ යෝජනාව පිළි ගත්තේ ඉත සිතිනි. දහසකුත් වැඩ අස්සේ වුව ද තමාගේ සිත් ගත් ළමුන් ප්‍රීතිමත් කරවන යමක් කරන්නට උන්නැහේ කිසි විටකත් මැලි නො වෙන ලෙසකි. " රමී ප්ලේ කරන්න දන්නව ද ?"

" අයෙත් අහලා "

dileep

කෙසේ වෙතත් ලූෆි මහතා කාඩ් ක්‍රීඩාවේ දක්ශයෙකු බවක් නම් පෙනෙන්නට තිබුනේ නැත. ඔහු සෑම විටක ම පරාජය වූ බව නම් කිව යුතුව තිබේ. එහෙත් ඔහු ළමුන් සමග ක්‍රීඩා කිරීමට ලැබීමෙන් අතිශයින් ම විනෝද වන බවක් ද පෙනෙන්නට තිබේ.

" ටිමී මට කියන්න හදන්නේ මට වඩා හොදට උඟ මේ සෙල්ලම කරන්න දන්නවා කියල වෙන්ඩැති.මම වැරදි කාඩ් එකක් දාන හැම වෙලේ ම උඟ මගේ බෙල්ල ලොව්නවා . නිකන් ඕක නෙමේ අරක දාන්න කියනවා වගේ "

කවුරු කවුරුත් මහ හඩින් සිනා වූ හ.සැබැවින් ම අවස්තාවක් ලැබෙන්නේ නම් ටිමියා ලූෆි උන්නැහේට නම් වඩා හොදින් ක්‍රීඩා කරනු ඇතැයි ජෝර්ජ් නම් පෞද්ගලිකව සිතුවා ය.

කෙසේ වෙතත් ළමුන් බලාපොරොත්තුවෙන් හුන් ජෝක්ගේ පැමිනීම නම් සිදු වූවේ නැත. තවත් සුලු වේලාවකින් ඉක්බිති ලුෆී මහතා ද නිදා ගැනීම සදහා පිටව ගියෙන් ළමුන් සිව් දෙනා ද කාඩ් සියල්ල අකුලා දමා නිදන බෑග් තුළට වැදුණාහ. ඒ වන විටත් අන්දකාරය විසින් පරිසරය ආක්‍රමණය කිරීමේ රාජකාරිය සිදු කරමින් පැවතිණ .

" ගුඩ් නයිට් ජූ " ඩික් විශල් ඈණුමක් යවා නිදි මරගාතේ තෙපලන්නට විය. " උබ නිදිද ?"

එහෙත් ඩික්ට පිළිතුරු ලැබුණේ ගැහැණු ළමුන්ගේ කූඩාරමේ ගුරු ගුරු හඩ නගන ටිමියාගෙන් පමණෙකි. ඒ වනවිටත් ජුලියන් සිටියේ නිදි ලොව අතරමන්ව ය. ටිමියාගේ ගුරු ගුරු ගෙරවිල්ලෙන් ගැහැණු ළමෝ තරමක් තිගැස්සී ගියහ. එකත් එකට ම කොල්ලන් දෙදෙනා තවමත් අවදියෙන් පසු එනු ඇතැයි ඔවුහු සිතූහ.

ටිමියා හිස ඔසවා බලා යලිත් කුඩා ගෙරවුමක් .. ගුරු ගුරු ගොර ගොරයක් පිට කර සිටියේ ය. දෙකන් ඔසවා ගත්තේ ය. මුර කිරීමේ රාජකාරියේ වගකීම අකුරට ම බාර ගනිමින් අවදානය වැඩි කොට ගත්තේ ය..ඊ ළගට නැගිට්ටේ ය. ජෝර්ජ් පවා හැර දමා අසුරු සැණින් කූඩාරමෙන් පිතටට පැන්නේ ය. කුමක් දෝ අමුතු හඩක් පිටස්තරයෙකුගේ සම්ප්‍රාප්තියක් ටිමියාට ඇසෙන්නේ ය. දැනෙන්නේ ය. එහෙත් ඒ වූ කලී වහා පැන කූඩාරම් දෙකම දෙවනක් කොට පැමිණෙන්නාගේ උගුරු දණ්ඩ දිශාබිමුඛව පියෑඹීමට තරම් එකක් නම් නො බව ටිමියාට හැගෙන්නේ ය.

කුමක් හෝ යමක් කූඩාරමේ ඇතිල්ලෙන බවක් ඩික්ටද එක්වරම ඇසෙන්නට වූවේ ඇහැ පියැ එන්නට ඔන්න මෙන්න තිබිය දී ය. වහා නැගිට හිද ගත් හෙතෙම කූඩාරමේ ඇරුණු තැනින් අවට විපරම් කරන්නට පටන් ගත්තේ ය. ඒ සමග පැමිණි සෙවනැල්ලක් කූඩාරම තුලට එබුණේ ය.

“ ඩික් ජුලියන් . මේ මම ජෝක්. ආ ටිමියට නම් මාව කලින් ම අහු උනා “

“ ජෝක් “ ඩික් කීවේ පුදුමයෙනි. “ යක්කු ගස් නගින වෙලාවෙද එන්ට මතක් වුනේ ?”

“ සමා වෙන්ට ඕන . දවල් එන්ට බැරි වුනා නොවැ “ යි කියමින් ජෝක් කූඩාරම් රෙද්ද මෑත් කොට ඇතුළට රිංගා ගත්තේ ය.

dileep

“ ජුලියන් .. නැගිටිනවා. මෙන්න ජෝක් ඇවිත්. ටිමියත් ඉන්නවා “ යො ඩික් තම සොයුර වදි කරන්නට යත්න දැරී ය.” ජෝක් සීතක්ලයි අගේ නම් මගෙ නිදන බෑග් එකට රිංග ගනින්. ටිමී පලයන් එහාට. “

“ ස්තූතියි ඩික් “ යි ජොක් කීවේ ඩික්ගේ නිදන බෑගයට අපහසුවෙන් රිංගා ගනිමිනි. “ සාහ්.මේක ඇතුළෙ නියමයි බං.උනුහුමයි. අඩේ මට සමා වෙන්ඩ අෑ. මට දවල් එන්ඩ බැරි වුනානේ. මගේ බාප්පට අද දවසම මං එයාට පෙන්න ඉන්න ඕන වුනා. මට හිතා ගන්න බෑ මොන පිස්සුවක් ද ඒ කියල “

“ මට නම් හිතා ගන්ට පුලුවන් “ යි ජුලියන් කීවේ ය.” අද උබ අපිත් එක්ක පික්නික් යන්ට හිටිය බව එයා දන්නවා. ඒක වලකන්ටයි එහෙම කරන්ට ඇත්තෙ. ඒක නෙවේ. වැදගත් මොනව හරිහොයා ගන්ට ලැබුණද ?”

'' කිසි දෙයක්හොයා ගන්ට ලැබුන් නෑ. බාප්පා මාව මෙහෙන් හැතැම්ම හතලිහක් විතර ඈතින් තියෙන ගොවිපොලකට එක්ක ගියා. මාව ඒ කිට්ටුවට ඉතරයි එක්කන් ගියෙත්. ඒ කිට්ටුව තියෙන මහජන පුස්තකාලයක් ගාව නවත්තලා එයා ගියා . හවස් වෙනකන් ම මම එතන බකන් නිලාගෙන තට්ට තනියම."

" ඕක ඔච්චර හිතන්ට එපා. පික්නික් යන්ට හෙටත් පුලුවන් නොවැ ' ඒ ඩික් ය.

" ඒත් මට එන්ට වෙන් ඈ. බාප්පා හෙට මට යාලුවෙක්ගෙ පුතෙක් මුන ගස්වන්ට හදනව. සිසිල් ඩියර්ලව් කියලා. මාර නමක් නේද ආ.. ඉතින් මයිට හෙට දවස ම මල ඉලව ලව් කාරයා එක්ක ඉන්න වෙනවා. තරක ම දේ අම්මත් කැමතියි උං එන එකට . අම්ම නිතර ම කියව කිය ව හිටියේ මගේ බාප්පා වැඩිය මං ගැනසොයා බලන් නෑ කියලා. දැං ඩිඅර් ලව් කාරයා එන එකට එයා කැමතියි. මගෙ පාලුව දුරු වෙන්ව ලුනෙ. කෙහෙම්මල "

" ඒ කියන්නේ උබට හෙටත් එන්ඩ වෙන් නෑ නේහ් .." ජුලියන් ගොතලෑවේ ය." හරි අනිද්දට මොක ද /"

'' අනිද්දට නම් අවුලක් නැති වෙයි. ඒත් දෙයියනේ මං ඉතිං හෙට ඉදන් අර සිස්ල් දයාබරාදරයාට ගොවිපලේ සත්තු පෙන්න පෙන්න ඉන්න එපායැ "

" කරුමෙ බං "

" හ්ම්ම්.. ඒක යි මං රෑ කියල හිත හිතා ඉන්නෙ නැතුව ඔයාලට කියල යන්න ආවෙ. මට හිතෙනවා මෙතන මොකක් හරි අබිරහසක් ඇති කියල. ඊටත් ඔය කෝච්චිපොළට යන එක ම හෙන ත්‍රාස ජනක වැඩක් වෙයි.මට ඔයලත් එක්ක යන්ට ආසයි. මම මෙ අවෙ හිතන් හිටියෙ අද ඔයාලත් එක්ක කෝච්චි පොල පැත්තෙ රවුමක් ගහන්න යන්න."

" හරි ඔයාට අනිද්ද එන්න පුලුවන් නම් අපි අනිද්දට යමු. " ඩික් කීවේ ය. ඒ හාත් සමග ම තවත් අදහසක් ඔහුට පහල වූවේ ය. එය නම් හද ගැස්ම ඇති කරන ත්‍රාසජනක අදහසක් බැව් නො කියා ම බැරි ය.

" මොකද කියන්නේ අපි රෑක යමු ද ? ජෝක් උබට පුලුවන් නම් හෙට මේ වෙලාවට වරෙන්. අපිට එතකොට රෑ වෙලා යන්න පුලුවන්නේ.. කෙල්ලො දෙන්නට මේව දැන ගන්න තියන්න ඕන නෑ. කොල්ලො තුන් දෙනා හිටියා ම ඇති නොවැ "

ජෝක්ගේ සියොලගග හිරි වැටී ගියේ උද්දාමය නිසා ය. දහසකුත් දෑ කතා කරන්නට තිබුනත් උගුර කට වියළී ගොස් වචනයක් වත් පිතටට ද ගත නො හැකි ගතියක් ඔහුට දැනෙන්නට විය. අපහසුවෙන් හුස්මක් ඉහළට ඇද ගන්නා ජෝක් දකින විට ඩික් මහ හඬින් සිනාවක් පිටකළේ ය.

" හරි හරි ඉතිං උබ ඕකට ඕනවට වඩා ඇවිස්සෙන්න ඕන නෑ.ටෝර්ච් එකක් තියෙනව නම් අරන් එන්ට. සමහර විට මේ ගමණින් කිසිම පල ප්‍රයෝජනයක් නැති වෙන්ටත් පුලුවන් තමයි. උබ හෙට රෑට මේ කුඩරමට ඇවිත් මට පයින් එකක් ගහපං. අපි ඇහැරල ඉන්නෙ. අනික් එක මේ ගැන කෙළ බිදක් වත් බිම හෙලනවා එහෙම නෙවේ "

" මම කාටවත් කියන් නෑ " යි ජොක් අවසානයේ කට හඩසොයා ගත්තේ ය. කොයිකටත් මං දැං යන්නම්. හදත් නැති එකේ පාර පේන්නෙත් නෑ. ඒ නිසා හෙමීට ගොලුබෙලි ගමනින්නේ යන්න වෙන්නෙත්. තරු කොච්චර පායල තිබ්බත් කිසි තේරුමක් නෑ. ආ , මං බඩු වගයක් ගෙනාවා. ටිමියා වැඩේ දෙන්න කලින් ඒ ටික කොහෙන් හරි අඩුක් කර ගත්තොත් හොදයි "

" හරි .. බොහොම ස්තූතියි ජෝක් " ජුලියන් කීවේ ය. ඩික් ගේ නිදන බෑගයෙන් පිතටට බට ජෝක් කූඩාරමේ පසුපසට ඇවිදගෙන ගියේ රැගෙන ආ ආහාර ද්‍රව්‍ය ළමුන්ට ලබා දෙනු පිණිස ය. ඒ වන විටත් ඒවා රැදි මල්ල පිරික්ශමින් ටිමී පෙර මග බලා ගෙන සිටියේ ය. ජුලියන් ආහාර මල්ල ගෙන කූඩාරම තුළට ගත්තේ ය.

dileep

" ගුඩ් නයිට් එහෙනම් " යි ජෝක් කියා සිටියේ පිටව යාමට සැරසෙමිණි. ඒ හාත් සමගම කදවුර අසල වූ හෙදර් යායේ පැටළෙමින් පෙරළෙමින් ඔහු ගමන් ගන්නා හඩ කොල්ලන් දෙදෙනාට ඇසෙන්නට විය. නිසාචර මිතුරා පෙරලා ගොවි පොල කරා රැගෙන යාමේ බාරදූර කට යුත්ත අනාරාදිතව ම බාර ගත්තේ ටිමී ය. බල්ලා තමා සමග පැමිණීම ජෝක්ගේ ඉමහත් ප්‍රීතියට හේතුවක් වූවා සේ ම හදිසියේ ම රෑ මැදියමේ දෙපා හිරි ඇර ගැනීමට ලැබීමේ අවස්ථාව සම්බන්දයෙන් ටිමී ද පසු වූවේ ප්‍රීතිමත් සිතිනි. ගොවිපොලේ සිට පෙරලා කදවුර කරා එන ගමණේ දී හා ඉවක් හසු වුව ද ටිමියා ඒ පසු පස ගියේ නැත. හැකි ඉක්මණින් තමස්වාමි දුව අසලට යා යුතු බවක් උඟ වටහා ගෙන සිටි බැවිනි.

ගෝර්ස් පදුරු යට ආහාර ගබඩා කුටියේ තුබූ ආහාර පාන තොගය දැකීමෙන් පසු හා උදාසන ඈන් පුදුමයට පත් වූවා ය.

" මේ බලන්ඩලාකෝ " ඈ පුදුමයෙන් බෙරිහන් දුන්න ය ." මීට පයිස්... තක්කාලි ... බිත්තර ... මේවා කොහෙන්ද මේකට "

" හොල්මන් කෝච්චි ගෙනත් දාලනේ.." ඩික් සිනා රැල්ලක් මුවගට නගා ගනිමින් කියා සිටියේ ජුලියන් දෙසට ඇසක් ද ඉගි මරමිණි.

" නෑ නෑ.. ගිනි කන්දක් පුපුරලා ගිහින් කෑම විසික් වුනා " ඒ ලූෆී මහතා ය.

" අනේ අනේ විහිලු නැතුව කියන්ඩකො .. කොහෙන් ද මේවා ... මම අද උදේට මොනව ද හදන්නෙ කියල කල්පනා කර කර හිටියෙ. ජෝර්ජ් ඔයා දන්නව ද ?"

dileep

ජෝර්ජ් පවා ආහාර පහළවීමේ ක්‍රියාවලිය සම්බන්දයෙන් අන්දෝ සංසාරයක් දැන සිටියේ නැත. එහෙත් කොල්ලන් දෙදෙනාගේ හක හක ය දකින විට නම් ඇයට යමක් අනුමාන කිරීමට හැකියා ව නැතුවා නො වේ...

" ඊයෙ රෑ එකත් එකට ම ජෝක් ඇවිල්ලා යන්න ඇති .. නැද්ද ?" ඈ අසුවා ය..

" හරි එහෙනම් ... උඹලා කොල්ලො ටික හොරෙන් ම හම්බෙනවා... මට හිතා ගන්න පුලුවන් උබලගේ ඔලු ගෙඩිවල තියෙන්නේ මොනව ද කියලා.. කච්චිය හදන්නේ මටත් හොරෙන් භූත කෝච්චි අබිරහස විසදන්න යන්නයි.. හ හා.. ඒව කොහෙදමාත් එක්ක. දැන් ඉදන් මං ඉන්නේ උබලා දිහා ඇහැ

ගහගෙන. උබලා යන්නේ කොහෙදමාත් අනිවාරෙන් ම එනව “
වැඩි දුරටත් ඇ තනි හිතට හිතා ගත්තා ය..

dileep

## 10 භූත කෝච්චි දඩයමේ ....

දිනය ගෙවී ගියේ පෙර දිනය මෙන් එපා  කරපු අන්දමින් නම් නො වේ. එය සැබැවින් ම ප්‍රීතිමත් දිනයක් විය. ලූෆී මහතා ළමුන් සිව් දෙනා ද බල්ල ද කැඳවා ගෙන කන්ද මුදුනට වෙන්නට පිහිටි ජලාශයක් වෙත රැගන ගියේ ය. ජලාශයේ දිය තද කොළ පැහැයෙන් යුක්ත වූවෙන් එය හැඳින් වූවේ ද කොළ පැහැති ජලාශය නමිනි. භූ ගත ව පවත්නා අහිත කර නො  වන විවිද රසායනයන්හි බල පැවැත්මෙන් දිය මේ තරම් කොළ පැහැති වන බවක් ලූෆී උන්නැහේ ළමුන් සිව් දෙනාට තේරුම් බේරුම් කොට දුන්නේ ය.

dileep

" නාල ගොඩ එන කොට අපිත් කොළ පාට වෙලා තියේ ද දන් ඈ නේ ද ? " නාන ඇඳුම් ඇද ගන්නා අතර ඩික් විහිලුවක්කළේ ය. " ලූෆී සර්.. ඔයත් නානව නේ ද ?"


ලූෆී උන්නැහේ ද ළමුන් හා එක්ව දියට බැස්සේ ය. ජල ක්‍රීඩාවන්හීදී ලූෆී මහතා තවුස් දම් රකිනු ඇතැයි ළමෝ සිතා සිටියහ. එහෙත් එහෙත් දියට බැස මද වේලාවක් ගත වෙද්දී

නම් ලූෆී මහතා සාන්ත දාන්ත තීන්ත කූඩුවක් නො වන බවකාට කාටත් අවබෝද වූවේ ය. ඔහු පිහිනන්නට පටන් ගත්තේ ය. කිමිදෙන්නට පටන් ගත්තේ ය. දගලන්නට පටන් ගත්තෙ ය. අවුරුදු පණහකින් තරුණ වූවේ ය. සැබැවින් ම ලූෆී උන්නැහේ ළමුන්ගේ වේගවත් ම පිහිණුම් කාරයා වූ ජුලියන් ද පරාජය කරමින් වේගයෙන් පිහිණා ගියේ ය.

තවත් සුලු වේලාවක් දියේ ගත කළ ඔවුහු සීතලෙන් හා වෙහෙසෙන් මැඩී තටාකයෙන් පිතටට පැමින සූයී තාපයේ උණුසුමෙන් නා ගැනීමේ අපේක්ෂාවෙන් තණ පදුරු මත වැතිර ගත්තෝ ය. කදු කරයේ සිට ගමන් ගන්නා ප්‍රදාන පාර විහිද තිබෙන්නේ ඔවුන් මේ රැදී ඉටින පොකුන අසලිනි. එක් වර ම වාහන කිහිපයක හඩ ඔවුන්ට ඇසෙන්නට පටන් ගත්තේ ඒ අතර ය. වේගයෙන් ගමන් ගන්නා කාර් රත දෙකක් ද ඊට පසු පසින් පැමිණෙන පැරණි පන්නයේ හමුදා ට්‍රක් රථයක් ද එක් වර ම ඔවුනට දර්ශනය විය. කාර රථ දෙකට පසු පසින් පැමිණි ට්‍රක් රථයේ රියදුරා අසලින් වාඩිගෙන සිටි කවුදෝ කොල්ලෙකු ළමුන්ට පෙනෙන සේ අත වනන්නට වූවෙන් ඔවුහු පුදුමයට පත්ව ඒ දෙස බලා සිටියාහ.

“ කවුද ඒ... මිනිහ නම් අපි ව හොදට දන්න හැඩයි “

dileep



" කවුද ඉතිං ජෝක් මිසක්. හොදට බලන්නකෝ. අර අලුත් ම කාර් එකෙන් එන්නේ එයාගෙ බාප්පා "

ජෝර්ජ් කීව ය. ඔවුන් අතුරින් වඩාත් ම තියුණු දෑසක් ඇත්තේ ඈට බව කවුරු කවුරුත් දැන සිටියහ. ඈ කීවාක් මෙන් ලොරි රථයට පසු පසින් අලුත් මාදිලියේ කාර් රථයක් පැමිනි අතර එහි හුන් ජෝක්ගේ බාප්පා නම් ළමුන් නො දැක්කාක් මෙන් පිඹගෙන යන්නට ගියේ ය.

"මාකට් එකට යනව ඇති" යි කියමින් ඩික් යලි වැතිර ගත්තේ ය. " මොනව ද දන්නැ අරං යන්නෙ "

" අනේ මංද .. මේ වගේ අලුත් කාර් එකක් ගන්නත් , අර වගේ මැශින් ගන්නත් මිනිහට ඔච්චර සල්ලි කොහෙන් ද කියල මට හිතා ගන්ට බෑ . සමහර විට අසාදාරණ ඉහළ මිළකට විකුණනව ඇති " යි ලූෆී මහතා ද කියා සිටියේ කල්පනාකාරී හඬිනි.

dileep

ලූෆී උන්නැහේ ඉතාමත් ම හොද මිනිසෙකැයි යළි යළිත් ළමුන්ට ප්‍රත්‍යක්ෂ කරමින් ඔහු විහිලු කිහිපයක් ම ළමුන්ට කරමින් දවස ඉතාමත්ම ප්‍රීතිම්නත් එකක් බවට පත්කළේ ය. තේ වේලාව ආසන්න වන විට නම් ඔවුන් පෙරලා කූඩාරම් තිබූ දෙසට සේන්දු වී තිබිණ. ඈන් හනි හනික තෙ සූදානම් කොට දුන්නා ය. ලූෆී මහතාගෙ කූඩාරම ඉදිරිපිට වැතිරී කවුරු කවුරුත් බඩ කට පුරා සප්පායම් වූවෝ ය. තවත් දිනයක නිමාව සනිටු හන් කරමින් සූයීා ක්‍රමයෙන් බැස යමින් තිබිණ . රාත්‍රිය නුදුරු බව හැගෙන විට මේ යැයි කිව නො හැකි උද්දාමයකින් පිරිමි ළමුන් දෙදෙනා පිරී ඉතිරී ගියේ ය. දවස මුලුල්ලේ ම භූත කෝච්චි සම්බන්දයෙන් එක අ වචනයක් හෝ කතා බහ කරන්නට ඔවුනට අවකාශ නො ලැබුණ බව සැබෑ ය. එහෙත් රාත්‍රිය උදා වෙමින් තිබේ. ඇතැම් විට ලොමු දැහැ ගන්වන ත්‍රාස ජනක යමක් මේ රාත්‍රියේ ඔවුන් දෙදෙනාටසොයා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

තාරකා වසාගෙන පැවති වලකුල් වියන හේතු කොටගෙන රාත්‍රී අහස වෙනදාට වඩා අඳුරු බවක් පෙන්නුම් කළේ ය. ගැහැණුම් ළමුන් දෙදෙනාට සුබ රාත්‍රියක් පැතූ කොල්ලෝ නිදන බෑග් තුළට වැද හොරගල් අහුලන්නට පටන් ගත්තෝ ය.

දැන් දැන් තාරකා වසා ගත් ගන වලා වියන ක්‍රමයෙන් තුනී වෙමින් තිබෙයි. සෙමින් සෙමින් එකා දෙන්නා බෑගින් තාරකා දරුවෝද අහස් කුසින් එබී කූඩාරම් දෙස බලන්නට පටන් ගත්තෝ ය. තවත් මද වෙලාවකින් තරු එළියෙන් මුලු මහත් භූමි සීමාව ම නැහැවී ගියේ ය.

" ජුලියන් ඩික්... මම ආවා ..උඹලා වැඩේට ලෑහැස්ති ද ?"

එය ජෝක්ගේ ක්ට හඬ වූවෙන් ඔවුහු නව තව්ත් උද්දාමයෙන් පිරී ගියෝ ය. ඩික් වහා තම මහපට ඇඟිල්ලෙන් විදුලි පන්දම දැල්වූ අතර උද්දාමයෙන් රතු ව ගිය මුහුණින් යුතුව කූඩාරමට එබෙන ජෝක් එහි ආලෝකයෙන් ඔහුට දැක ගත හැකි විය. ඩික් ඒ සැනිනි ම විදුලි පන්දම නිවා දැම්මේ ය.

" හලෝ .. ජෝක්. එහෙනම් උඹ ආවා ... අද උදේ ලොරියක නැගලා කොල පාට ජලාගෙ පැත්තෙන් ගියා අපි දැක්කා "

" ඔව්ව්.. මට ලොරිය නවත්තලා උබල එක්ක කතා කරන්නත් ඕනි වුනා. කොහෙද .. ලොරිය එලෙව්වෙ හොස්ස ගින් මැස්ස යන්ඩ ඇරි මිනිහෙක්නෙ. මගේ බාප්පා කීවොත් ඒ මිනිහට ළිදේ පැනපන් කියලා උඟ ඒකත් කරනවා. අපිට පස්සෙන් ආව අලුත් ම කාර් එකේ හිටියේ මගේ බප්පා... ඔයාල දැක්ක ද ?'

" ඔව් .ඔව්. කොහෙද ගියේ .. මාර්කට් එකට ද ?"

" මම හිතන්නේ ලොරිය අම් ගියේ වෙන කොහේට හරි. මොකද ඒකෙ මොකවත් තිබ්බෙ නෑ. බාප්පයි මායි කාර් එකෙන් නැගලා ආපහු ආව. ලොරිය ආවෙ හැන්දෑ වෙලා . "

" කොහොමද සිසිල් ඩියර්ලව් එක්ක ජීවිතේ ?" ඩික් මාතෘකාව වෙනස්කළේ ය. සිසිල් ඩියර් ලව් නම කියන විටත් ඔහුගේ මුග්හුණට නැගුණේ සිනා රැල්ලකි.

" කතා කරන්ට එපා...නමේ හැටියට ම තමා වැඩ. දයාබර ආදරනීය තොත්ත බබෙක්. උගට හැම තිස්සෙ ම මගෙත් එක්ක සොල්දාදුවෝ සෙල්ලම කරන්න ඕන. හෙටත් උග ඉන්නවනෙ. මගෙ තවත් දවසක් නිරපරාදෙ නාස්ති වෙනවා. ඇත්තට ම නැද්ද මේ වාත කරුමෙන් ගැලවෙන්න කරන්න දෙයක් එහෙම ?"

dileep

" උඟරු කොටුවට තල්ලු කරල දැම්ම නම් ඉවරනේ " ඩික් කල්පනා කාරී සෙයියාවක් මවා පාමින් ඇගට පතට නො දැනී කියා දැම්මේ ය." නැත්තම් බිඩීගෙ පැටව් එක්ක නිදා ගන්ඩ දාන්න. සොල්දාදු සෙල්ලම කරන්න කියන්න බිඩීගෙ පැටව් එක්ක '

ජෝක් සිනාසෙන්නට විය. ඩික් ඇත්තට ම හොද විහිලු කාරයෙකි. සිසිල් ඩියර් ලව්පන්නා දමා සංචාරක ළමුන් සිව් දෙනා හා එක්ව කාලය ගත කිරීමට ඇත්නම් යැයි ජෝක්ට වඩ වඩාත් තදින් සිතේ.

" මට පුලුවන් වුනා නම් නො කර ඉන්නෙ නෑ. බාප්ප කියන්නේ සිසිල් කාරයා ගෙනාවෙ මගෙ තනිකම නැති කරන්න කියලනෙ. ඉතින් එපා ම කරපු දේ සිසිල් කොල්ලට අම්මත්

හරිම හොඳින් සලකනවා. හරි හරි. ඒකෙන් වැඩක් නෑ අපි දැං යමු ද එහෙනම් ?"

" ඔව් " යි ජුලියන් එකගත්වය පෑවේ හඬක් නො නැගෙන ලෙසින් තම ගමන් බෑගය පිතටට ගනිමිනි. " අපි සද්ද කරන්න හොද නෑකෙල්ලො ටික ඇහැරුණොත් වෙන්නෙ මළ ජංජාලයක්. අපි කීවෙ නෑ එයාලට. අෑං හරිම බයයිනෙ මේ වගේ වැඩ වලට. ඒකට ජොර්ජ් . ඒකිට එන්න ම ඕනි. ජෝර්ජ් ආවොත් අෑන් තනියමනෙ. අපි මෙතනින් එලියට යන්න ඕන කිසිම සද්දයක් ඇහෙන් නැති වෙන්න "

ජුලියන් ජෝක්ගේ අතින් අල්ලා ගත්තේ ය. මන්ද යත් ජෝක් කෝච්චිපොළ කරා යන ගමන් මග දැන නො සිටි බැවිනි. ගන අන්දකාරය තුළ මග වරද්දා ගැනීමෙන් ජෝක් අතරමන් වන්නට ඉඩ හළ නො හැක. කදු කරය රාත්‍රියට දවල්ට වැඩියෙන් වෙනස් ය. දිවා කාලයේ නො තිබෙන අන්තරායක් රාත්‍රී කාලයේ කදුකරයේ තිබිය හැක.

දිවා කාලයේ ගමන් ගත්තාට වැඩි දුර බැහැර ගමනක් ලෙසින් කෝච්චිපොල දක්වා යන ගමන් ජුලියන්ට හා ඩික්ට දැනෙමින් තිබේ. විටක පැටලවී ඇද වැටෙමින් ගස් මුල්වල හැපෙමින් ගමන් ගැනීමට ඔවුනට සිදු වී තිබුණි.

' මෙන්න මෙතනදි තමයි අපිට නාකි එඬේරා මුන ගැහුණෙ " ඩික් පහත් හඬින් කියා සිටියේ ය. ඇත්ත වශයෙන් ම රහසක් කියන්නාක් මෙන් කතාකළේ මන්දැයි ඩික් දැන සිටියේ නැත. එහෙත් වැඩි හඬක් නො ගිය යුතු බවෙක් ඔහුට දැණුනි." අපි දැන් සෑහෙන දුරක් ඇවිත් වගේ "


අතුරුමගකට හැරුණු ඔවුහු එතැන් සිට ගමන් ගත්තේ ක්‍රමයෙන් උස් ව නැගෙන බිම් තීරුවක ය. එක්වර ම ජුලියන් විසින් ඩික්ගේ අතින් ඇද ඔහු නවතන ලදී.

“ බලන්න “ යි ඔහු කීවේ ය.” පල්ලෙහා බලන්න. අර පල්ලෙහා ඈතින් pee න්නෙ කෝච්චි පොල .ඒක මෙතනට් පේනවා “

සැබැවින් ම ඔවුන් සිටියේ කෝච්චි පොළ පෙනෙන හෙදර් පදුරින් ගහන කඳු ගැටය මත ය. එක එල්ලේ මද වේලාවක් බලා සිටියාට පසුව යන්තමින් එහි හැඩරුව ළමුන්ගේ දෑස් මත ගෝචර විය.

“ ජුලියන් අර බලන්න .එලියක් පේනව එතන. හොදට බලන්නම්. යන්ත්මට පේන්නේ “

dileep



ජෝක් ජුලියන්ගේ කමිස අතින් අල්ලා කියා සිටියේ ය. කහ පාට මද ආලෝකයක් ඒ ඔස්සේ බලන ජුලියන්ට හා ඩික්ට ද දැක ගත හැකි විය.

" ඔය පේන්නේ මුරකාරයාගෙ පැලේ එලියක් " ඩික් අන්තිමට කියාස් සිටියේ මද වේලාවක් සිතා බැලීමෙන් අනතුරුව ය." ලී කකුල් සෑම්ගේ ඉටි පන්මදම් එලිය. ජුලියන් මොකද හිතන්නේ ?"

" ඔව් ඔව් ඒක තමා "යි ජුලියන් එකග වී ය." අපි මෙතනින් බහිමු. බඩගාගෙන තමයි බහින්න වෙන්නෙ. හැබැයි එතකොට අපිට පුලුවන් ලී කකුල් සෑම්ගෙ මඩුවට ඇහැ දාල බලන්න. මිනිහ අවදියෙන් නම් අපි කොහේ හරි හැංගිලා බලමු හොල්මං කෝච්චි එනකන් "

එතැන සිට ඔවුන් ඉදිරියට ගමන් ගත්තේ හතර ගාතයෙනි. කදු බෑවුම මත දිගා වී ගත් ලමෝ සෙමෙන් සෙමෙන් පහළට රූටන්නට වූහ. තාරකා එළිය ඔවුනට ලබා දුන්නේ නො මද සහයෝගයකි. දායකත්වයකි. කදු පාමුල රූටා දෙපා පොලව මත තබනවාත් සමග ම ළමුන්ගේ පාවහන් ගල් අගුරු මත ගැටී ඇති වූ ගෝෂාවෙන් උහු තිගැස්සී ගියෝ ය.

" මේ වගේ සද්දෙ එන විදිහට අඩි තිය වුනොත් කාට හරි අපිව ඇහෙන්නට පුලුවන්" අන්තරාය අවබෝද කොට ගත් ජූලියන් වහා කියා සිටියේ ය.

"කාට ද ?" යි ඩික් ද පෙරළා ඇසී ය. " හට් එකේ ඉන්න සෑම් ලොක්කා හැරුණා ම මොන මළ යකෙක්වත් මේ අහලක නෑ බං "

dileep

"කාට ද හරියට ම ඒක කියන්ට පුලුවන් ? දෙයියන්ගෙ නාමෙට ජෝක් ඔච්චර සද්දෙන් ඇ විදින්ඩ එපා. "

හිටි වන ම ගල් ගැසී ගත් ළමෝ ඊ ළගට කළ යුත්තේ කුමක්දැයි මද වේලාවක් කල්පනා කළහ. " අපි දකුණු පැත්තට ඇවිදගෙන යමු. අයිනෙන් " යි අවසානයේ ජුලියන් යෝජනාකළේ ය. " මට මතක විදිහට රේල් පීළි වලට අයිනෙන් තණකොළ හොදට වැවිල තිබුණා. අපි ඒ හරියෙන් ගියොත්කාට වත් අපේ ශද්දෙ ඇහෙන් නැති වෙයි"

සෙස්සන් ද එය නො වහලහා පිළි ගත්තෙන් එතැන් සිට ඔවුන් ඇවිද්දේ රේල් පීළි වළට අයිනෙන් තණ පදුරු මත පියවර තබමිණි. දුම්රිය පොළ පුරා පැවති මීයට පිම්බාක් බදු නිහැඩියාවට එතැන් සිට ඔවුන්ගේ ආගමනයෙන් බාදා සිදු වූවේ නැත . ඔවුන් ගමන් ගත්තේ ලී කකුල් සෑම්ගේ ඉටි පන්දම් එළිය දෙසට ය.

dileep

මුර කුටියේ ජනේල පිහිටා තිබුණේ ඔවුන්ගේ හිස් වලට ද ඉහළිනි. හැරත් ඒ ජනේල ඉතා කුඩා ඒවා බවද ලමුන්ට පෙනේ. කුතු හලයෙන් මඩින ලද ලමෝ සිදුවන්නකට මුහුණ දෙන අදහසින් ආයාසයෙන් ඉස්සී කුඩා ජනෙල් අතුරින් මුර කුටියට බැල්ම දැම්මෝය.

සෝපාවක දිගෑදී පුවත් පතක් කියවමින් සිටින ලී කකුල් සෑම් ඒ තුළින් ළමයින්ට පෙනේ. බිදුනු කණ්ණාඩි යුවල තවමත් අලුත් වැඩියා කොට ගැනීමට ඔහුට නො හැකි වී ඇති ලෙසකි. මහල්ලාගේ ලී කකුල පාදයෙන් ගලවා දැන් තිබෙන්නේ හිද සිටි පුටුවට හේත්තු කොට ය.

" මිනිහා අද රෑට නම් භූත කෝච්චි එයි කියලා බලා පොරොත්තු නො වෙන හැඩයි .නැත්නම් බොරු කකුල ගලවන් නැනෙ "ඩික් මුමුණා කියා සිටියෙ කල්පනා කාරී හඬිනි.

කුඩ මුර කුටියි තුල ඉටි පන්දම් ආලෝකය නංවන්නේ තැති ගැන්මත් ගුප්ත බවත් ඇති කරන මාදිලියේ සෙවණැලි ය . දුහුවිලි බැදී එකී දැව බඩු දැවමය කුටියේ අපිරිසිදු බව වඩ වඩාත් වර්දනයකළේ ය. මේසය මත පීරිසියකින් තොර ව තැබූ අණ්ඩ බිදී ගිය කෝප්පයකි. ඒ අතර කුටියේ ලිප උඩ තිබූ කේතලකින් ජලය උතුරන්න හඬක් නැගුණේ ය

සෑම් ලොකු උන්නැහේ කෙතලය උතුරන හඬින් පියවි ලොවට පැමිනියේ ය . කණ්නාඩි කුට්ටම ගලවා දමා දෑස පිසදමා ගත්තේ ය. ඉන් පසුව මොනාදෝ මුමුණන්නට පටන් ගත්තේ ය. ඔහු කියන අණ්ඩර දෙමලයක් ළමුන්ට නෑසුණු නමුදු ඒ වූ කලී කැඩුණු උපැස් යුවල සම්බන්ද අදෝනාවකැයි ඔවුහු එක හිතට සිතා ගත්තෝ ය.

" මේ රේල් පාර යන්නේ කොහාට වෙන්න පුලුවන් ද ?" ජෝක් මිමිණී ය. මහලු සෑම්ගේ රංගනය බලා සිටීම ඔහුට දැන් නම් එපා වී ඇත .

" හැතැම්මක් දෙකක් ඈතට උමං දුම්රිය ඇති කියලයි මං නම් හිතන්නේ " ජුලියන් කීවේ ය. ගොඩාක් ඉස්සර මේ කෝච්චි පොල සෑහෙන්ට භාවිතා වුනු තැනක් වෙන්ට ඇති "

" අපි රේල් පාර දිගේ බිම් ගේ දිහාට යමු " ජෝක් යෝජනාකළේ ය." කමෝන් ජුලියන් ඩික්. මෙතන නිකන් තැක් ගැහි ගැහී ඉදලා තේරුමක් නෑ "

dileep

" හරිඅපි යමු. හැබැයි ඉතින් බිම් ගේ දිහාවට ගියා කියලත් අමුතු යමක් නම් දකින්ට ලැබේය හිතන්නට බෑ. භූත කෝච්චි කියන්නේ මේ නාකි මනුස්සයාගේ හිතේ පහල වෙච්ච සුරංගනා කතාවක් විතරයි"

මහලු සෑම්ගේ කුටියත් ඉටි පන්දම් ආලෝකයත් හැර දා ළමුන් සිව් දෙනා රේල් පීල්ලක් ඔස්සේ බිම් ගේ දෙසට ගමන් කරන්නට පටන් ගත්තේ පහත් හඬින් කතා බහේ ද නියැලෙමිනි.

සිදුවීම් සියල්ල ඇරඹුනේ එතැන් සිට ය. යන්ත්‍රයක ගුරු ගුරු හඬ යන්තමින් ඇසෙන්නට පටන් ගත්තේ ය. අදුරින් වැසුණු බිම් ගෙය දෙසින් නැගෙන ඒ හඬ ප්‍රථමයෙන් ම තිගස්සවා ලූවේ ජූලියන් ය.

" අහනවා.. උඹලට ඇහෙන් නැද්ද ඒ සද්දෙ ?"

dileep

වහා අවදානයෙන් සවන් යොමන සෙසු ලමුන් දෙදෙනාට ද ගුරු ගුරු හඬක් ඇසෙන්නට පටන් ගත්තේ ය. ඒ අතර ඩික් අදහසක් ඉදිරිපත්කළේ ය.

" කෝච්චියක් යන සද්දෙ නේද ? උමගෙ වැදිලා කෝච්චියෙ ශබ්දෙ දෝන්කාර දෙනවා|"



" යන සද්දෙ නෙමෙයි මනුස්සයෝ ඒ ඇහෙන්නේ එන සද්දෙ " එවර නම් ජුලියන්ට කෑ ගැසුණේ ය. ශබ්දය ක්‍රමයෙන් තීව්‍ර වූවෙන් ළමෝ කවුරුත් සැබැවින් ම බියට පත් වූහ. නිර්භීත කම් සියල්ල මොහොතකටකාට කාටත් අමතක වැ ගියේ ය. භූත හෝ භූත නො වෙනා කෝච්චියක් උමගය ඔස්සේ පිතටට එමින් තිබේ. එය එන්නේ රේල් පාරේ ය. ඔවුන් දැන් සිටින්නේ ද රේල් පාරේ ය.හුස්ම ගැනීමට වුව මොහොතකදු පමා නො වූ ඔවුහු නුදුරෙහි වන අන්තරාය සැණින් අවබෝද කොට ගත්තෙන් වහ වහා රේල් පීල්ලෙන් පිතටට පනිනු වස් දුවන්නට තබා ගත්තෝ ය.

යක්ශයෙකුගේ මුහුනකැයි සිතෙන පෙනුමින් යුතු දුම්රිය මුහුනක් බිම් ගෙයි දොර අබියසින් මතු විය. භීතියෙන් බිරන් තට්ටුව බලා ඉටින ළමුන් දෙස බලා සිටින්නාක් මෙන් බලා සිටියා මිස ඒ මුහුණ එතනින් ඔබ්බට පැමිණියේ නම් නැත. සැබැවින් ම එය භූත කෝච්චියක් විය හැකි දැයිකාට කාටත් සිතුණත් අද්භූත පෙනුමකින් යුතු එය කිසිවක් කියා සිටියේ ද නැත. දුම්රියේ හඩ වඩ වඩාත් ළං ව ඇසෙන්නට පටන් ගත්තේ ය. එහි හඩ දෝංකාර දෙන්නේ භූත කෝච්චි දඩයක්කාර වීරයින්ගේ ඇගේ ලේ වතුරකරවමින් බව ද අකමැත්තෙන් වුව ද සදහන් කල යුතු ය. කෝච්චිය එළියට එන්නෙත් නෑ. ඒත් සද්දෙ නිකන් පිටිපස්සෙන් කෝච්චිය තියෙනවා වගේ " ජුලියන් ගැහෙන හද ගැස්ම අතුරින් තමාට ම මුමුණා ගත්තෙ ය.

භූත කෝච්චිය නැවිත් සිටියෙ තවත් සුලු මොහොතකට පමණි. කාල වර්න උමගයෙන් කළු පැහැති භූත කෝච්චිය ළමුන් පසු කරගෙන ගියේ හදට යන රොකට්ටුවක් බදු වේගයෙකිනි. එය එක් වරම නො පෙනී ගියේ ය. දුම්රියේ හඩ හේතු කොටස්ගෙන දෙසවන් බිහිරි වූවාක් මෙන් ඔවුනට දැණින. මොහොතකට පෙර ළමුන් බියෙන් බිරන් තට්ටු කළ අද්භූත භූත කෝච්චිය දැන් මුලුවනින් ම නො පෙනී ගොස් තිබෙන්නේ ය. දුම්රියක හූ හඩත් පොලොව සසැලෙන හඩත් හැරුනු විට දැන් නම් භූත කෝච්චියක සේයාවකුදු දක්නට නො මැතර්

dileep

## 11 ජෝක්ගේ විත්ති.

පිරිමි ළමුන් තිදෙනා එකිනෙකාගේ ඇගේ ඇතිල්ලෙන තරමේ කිට්ටුවෙන් සිටගෙන සිටියේ ය.අන්ධකාරය තුළින් එකිනෙක නො පෙනුනද තමා තනි වී හුදෙකලා වී නො මැති බව සිරුරට හෝ දැනීම ඔවුනට ගෙනාවේ සහනයකි. නො මද අස්වැසිල්ලකි. දුම්රියේ මතු වීමත් , කිසිම දුම්රියක නැති ලෙසින් ඇසෙන්නට වූ බිහිසුණු හඬත් ඔවුන් තුළ ඇති කළෙ නැති ගැන්මකි. මුල් නැති ගැන් ම පහව ගිය ඉක්බිති එ සියල්ල ම සැකයක් බවට පරිවර්තනය වෙමින් තිබිණි.

dileep

" මගෙ කකුළ පෙරලුනේ කරුමෙට " යි ඩික් කියා සිටියේ සිත් තැවුලෙනි." එහෙම නො වුනා නම් අපිට කෝච්චිය පස්සෙන් යාඩ් එකට යන්ට තිබුණා නොවැ. හොද ම වෙලාවෙ මම සේරම කාබාසිනියා කරා ''

" කියවන් නැතුව ඉන්නවා. මොකෝ හිතා මතා කකුල පෙරළා ගත්තා නෙවේනෙ. කොහොම වුනත් අපිත් ඔන්න භූත කෝච්චිය දැක්කා. මට නම් භූත කෝච්චිය ඇත්තම භූත

බලයකින් වැඩ කරන එකක් කියලා සත පහකට විශ්වාස කරන්න බෑ. ඩ්‍රයිවර් කෙනෙක් නො පෙනුනාට කෝච්චිය ගියේ ඉබේට ම නම් වෙන්න බෑ. අනික් එක ඔක ඇත්ත ම කෝච්චියක් නො වී තියෙන්ට විදිහකුත් නෑ."

" ඒකෙ සද්දෙ තමා ඉතිං භූත ගතිය ඇති කරන්නේ " යි ජුලියන් කියන්නට විය. " ඇයි දුම. කොහොම වුනත් ඒ කෝච්චියෙ පොඩි ගතියකුත් තියෙනව නේද ?"

" අපි දැන් ගිහින්ලා බලමු ලී කකුල් සෑම් ලොක්කට මොකද වෙලා තියෙන්නේ කියලා. එකත් එකට ම බය ගුල්ලා ඇද යට රිංගන් ඇති කංචෑයෙක් වගේ "

ඩික්ගේ යෝජනාව ඉත සිතින් පිළිගත් ඔවුහු දුම්රිය අංගනයේ පිහිටි සෑම්ගේ මුර කුටිය දෙසට යළිත් ගමන් කරන්නට වූහ. පයක් අද්දවමින් ඩික් ගමන් කරන්නේ ඉතා අපහසුවෙන් කොර ගසමින් බැවින් ඔවුනට ගමන් කරන්නට සිදු වූවේ ඉබි ගමන් ලතාවෙනි. සෑම්ගේ කුටිය මුළුවනින් ම අඳුරේ ගිලී පැවති අතර තව දුරටත් කිසිදු ආලෝකයක් එතුළින් දක්නට නො වී ය.

" එයා ලම්පුව නිවලා ඇද යට රිංග ගන්ට ඇති. එක අතකට පව් අහිංසකය. තට්ට තනියම අහලක පහලක මිනිස් පුලුටක් වත් නැතිව ඉන්න නිසා ඇත්තට ම සෑම් ලොක්කට බය හිතෙන එක සාදාරණයි "

ඩික් කීවේ හද පිරි සංවේගයෙනි. ගල් අඟුරු කැබැල්ලකින් නළලටත් ගසා,අම්මා මුත්තා පවා සිහි කොට දෝශාරෝපනය කොට කෝච්චි පොලින්පන්නා දැමීම සම්බන්දයෙන් සෑම්

කෙරෙහි වන කෝන්තරයකවෛරයක සේයාවකුදු ඕක් තුළින් දක්නට ලැබුණේ නැත.

මුර කුටිය පෙර කීවාක් මෙන් කුට්ටි කැපිය හැකි අඳුරේ ම ගිලී තිබෙයි.වඩ වඩාත් ඒ සමීපයට ගමන් කළ ඔවුහු දෑස් රිදුම් දෙන තරමට විවර කොට ගනිමින් විපරම් කර්නනට වූවෝ ය. එක් වර ම අලෝකයක් දැල් වුනේ ය. එකී ආලෝකය කුටියේ මද්‍යස්ථ්හ මට්ටමෙන් ඇති වූවාක් නො ව බිම් මට්ටමෙන්, පොළොව සමීපයෙන් ඇති වූ ආලෝකයකි.

" සෑම් ගිනි කූරක් පත්තු කළා " ජුලියන් මිමිණීය. " බලන්න. අන්න මිනිහා එද යටින් එබිල බලනවා. මිනිහා හොදට ම බය වෙලයි ඉන්නෙ. මේ අපි ජනේලෙට තට්ටු කරලා පොඩ්ඩක් කතා කරමු. උන්නැහේ හොදින් ද කියල අහල බලමු "

dileep

එහෙත් එය නො කළ යුත්තක් බවත් , අමනමරී මෝඩ ඔලමොට්ටල කට යුත්තෙක් බවත්කාට කාටත් අවබෝද වෙන විට පමා වැඩි ය. ජුලියන් ජනෙලයට තට්ටු කරන්නාත් සමග ම මහ හඩින් බෙරිහන් දුන් සෑම් අවතාරයක් දෑසට මුන ගැසුනාක් මෙන් යලිත් ඇද යට රිංගා ගත්තේ ය. සැලෙන අතින් මෙතෙක් දලවා ගෙන හුන් ගිනි කූර ද සැනෙන් නිමී ගියේ ය.

" මාව ගෙනියන්න ඒක එනවා " ඔහු ගොතලනු ළමුන්ට ඇසුණි.ගොරහැඩි හඩින් බියපත් ලෙසින් ඔහු එසේ කියන විටත් කුටිය තුළ දෝංකාර දෙන්නේ ගුප්ත හඩකි.." මව ගෙනියන්න ඒක එනවා. මායි මගේ අසරණ ලී කකුලයි ගෙනියන්න ඒක එනවා"

" අපි යමු. අපි නිකන් එයාව තවත් බය කරනවා විතරයි. "

තවත් ස්වල්ප වේලාවක් දුම්රිය අංගනය පිරික්ශමින් කෝච්චිපොල වටා හක්කලම් කළ ද කෝච්චියක ගුරු ගුරු හඬක් හෝ දුම්රියක සලකුණු ලමුන්ට සොයා ගත හැකි වූවේ නැත. භූත කෝච්චීන් ස්වකීය ආගමය පෙන්වා විශ්වයෙන් ම අතුරුදන් වැ ගොස් තිබුණි.]

" තවත් මෙතන තැක් ගැහිලා තේරුමක් නෑ. අපි ආපහු කදවුරට යමු. භූත කෝච්චි නම් මාරයි ඇත්තටම ම . තාමත් මගේ ඇගේ මයිල් කෙලින් වුනු ගානයි. ඇත්තට ම හිටි හැටියෙ මතු වෙලා අතුරුදන් වන මේවයේ තේරුම මොකක්ද කියලා මට නම් හිතා ගන්ට බෑ "

ජුලියන් අවසානයේ කීවේ ය. ළමෝ යළිත් ගමන් ඇරඹූ අතර හෙදර් පදුරු ගොල්ල තරණය කොට කදවුරට පැමිණෙන්නට තවත් බොහෝ වේලාවක් ඔවුනට ගත විය. කොතරම් ගතට වෙහෙස දැනුනද ඔවුන් කවුරුත් සිටියේ උද්යෝගයෙනි.\

dileep

" අපි දැකපු දේවල් කෙල්ලන්ටත් කියනව ද ?" ඩික් විචාලේ ය.

" පිස්සු කතා කරන්ට එප " ජුලියන් විරුද්ද වීය " ඕක කීව ගමන් ඈන් හොදට ම බය වෙයි. ඒ විතරක් නම් මදෑ. ජෝර්ජ් යකා නටන්ට පටන් ගනී. ලුෆී සරට හරි කෙල්ලො දෙන්නට හරි ඒ ගැන කියන්ට කලින් අපි තව ටිකක් මේ ගැන හොයා බලන්ට ඕනා"

" ඒකත් ඇත්ත. උඹත් කට පරිස්සම් කරගන්නින් ජෝක් "

" කෙල බිදක් හෙලන් නෑ. හැරත් මංකාට කියන්න ද ? බප්පට ? මිනිහගෙ වචනෙට පිටින් අපි භූත කෝච්චි බලන්ට ගියා කියල දැන ගත්තොත් මාව හම ගහයි "

එක් වර ම ජෝක්ගේ දෙපයට උනුසුම් සහිත යමක් දැණුනේ ඔහු මෙසේ කියමින් සිටින අතර තුර ය

" මේ මොකක්ද ?අහකට වෙනවා

ඒත් සමග ම භූත බලවේගය ටිමී බවට පරිවර්තනය වූවෙන් ජෝක්ට හෙලුනේ සැනසුම් සහගත සුසුමකි." උඹලා මේ රෑ ජාමේ එලි මහනේ මොනවා කරනවද'යි විමසන්නට මෙන් බලු ගී වාදනයක් ද උඟ ළමුන් තිදෙනා දැකීමෙන් පසු පටන් ගත්තේ ය.

" ඩයල් එක කියන්නේ ඇයි උබලා මාව දාල ගියේ කියාල" ඩික් පැහැදිලි කරන්නට පටන් ගත්තේ ය." " සොරි බලු සබද. උබව එක්කන් යන්න අපිට විදිහක් තිවුන් නෑ. උබේස්වාමි දුවට නො කියා අපි උබවත් අරන් ගියා නම් ඒකි අපිට බ්‍රහ්ම දණ්ඩනය දානවා .හැබැයි කොල්ලෝ උබත් භූත කෝච්චි වලට කැමති වෙන්ට තිබුණා. ඒව එන වෙලාවට ,ගානට මුල්ලකට පැනලා වහං වෙන්ට උබටත් බැරි කමක් නෑනෙ ?"

dileep

" වුෆ්" ටිමී එකගත්වය පෑවේ ය.

" ගුඩ් බායි ජොක්. උඹට පුලුවන් නම් හෙටත් මේ පැත්තේ ඇවිල්ලා පලයන් . හෙට නම් සිසිල් කොල්ලා ඒ පැත්තෙ එන එකක් නෑ නේද ?'

" බලමු... ගුඩ් බායි" යි මුමුනා ජෝක් අදුර තුල අතුරුදන් වූවේ ය. ටිමියාද තවත් මැදියම් රෑ සවාරියක් ගැසීමේ අභිලාශයෙන් යුතුවැ ජෝක් ගොවි පොළට ඇරලීමේ වගකීම බාර ගත්තේ ය.

උණුසුම් කූඩාරමට වැඩියෙන් සිසිල් සුළගේ නැළැවෙමින් තරු එළියේ වටයක් ගැසීමට ටිමීගේ අකමැත්තක් නැත.

තවත් සුලු වේලාවකින් ටිමියා ද ජෝක් ද ඔලීගේ ගොවිපොළ අද්දරට සපැමිණියෝ ය. ගොවිපල පෙනෙන මානයේදී ටිමියා නතරවූවේ හිටි පියෙනි. උගේ රෝම සිංහ කේශර පරිද්දන් කෙලින් වී ගත්තේ අනතුරක සේයාවක් අන්තරායක හැඟීමක් සිතට එලඹියාක් මෙනි.

“ ඇයි ටිමී.. හොරු වත් පැනල ද ?” බල්ලා බදා ගනිමින් ජෝක් ඇසී ය.

කලු වලා කුලු පෙලක් විසින් තරු එළියි සගවා ගත්තෙන් පරිසයී මුලුවනින් ම අන්දකාරයේ ගිලී ගත්තේ ය. ටිමීගේ දෑස් කාන්තිය දැන් මනා කොට ජෝක් ට දැක ගැනීමේ හැකියාව ලැබී තිබෙන්නේ ය. ඈත ගබඩාව දෙසින් මලානික ආලෝකයක් දැකිය හැකි ය. ආලෝකය කුමක් දැයි බලනු රිසින් ජෝක් හොර බලල් සෙයියාවෙන් කිට්වු කරන්නට පටන් ගත්තේ ය. ආලෝකය චලනය වනු ගබඩා කාමරයට සමීප වෙන විට ජෝක්ට පෙනේ. ඊට මතර ව පිය ගැටෙන හඩක් ද කොලුවාට ඇසෙන්නේ ය. එක් වරම ගබඩා කුටියේ දොර අගුලු ලන හඩ ඔහුට ඇසුනේ ය.

dileep



ජෝක් යළිත් හොර බලල් සෙයියාව ආරූඪ කොට තවත් ඉදිරියට ගියේ ය. එක් වරම කිසිවෙකු පැමිණ ඔහුගේ අත ග්‍රහණයට ගත්තේ ජෝක් උඩ විසි වී ගොස් බිම වැටුණේ ය. ඊ ළඟට අද්භූත පුද්ගලය ඔහුගේ උරහිස ග්‍රහණයට ගත්තේ ය. සැරැති විදුලි පන්දම් එළියක් දෑසට එල්ල වූවේ බොහෝ වේලාවක් අදුරේ සිටි රහස් පරීක්ෂකයාගෙ නෙත ගිනි කණ වට්ටවාලමිනි.

“ මෙ උඹ නේද ජෝක් “ කෝපවත් සැර හඬක් කියන්නට වූවේ තක්කු මුක්කු වූ විලසිනි. “ මේ යක්කු ගස් නගින වෙලාවෙ උබ මොකද මෙතන කරන්නේ “

“ ඉතිං ඔහේ මොකද මෙතන මේ වෙලාවෙ කරන්නේ ?” ජෝක් පෙරළා ඇසුවේ ය. උරහිසත් අතත් දඬු අඬුවකට  අසු වූ

පරිද්දෙන් ඔහුට ලබා දෙන්නේ දැඩි වේදනාවකි. සාක්කුවට අත දමා ඉදුලි පන්දම පිතටට ගත් ඔහු තමා ග්‍රහණයට ගත් මිනිසා දෙසට එල්ලකළේ ය. ගොවිපොළේ සේවකයින්ගෙන් අයෙකු වූ පීටර්ස් බව ජෝක් වහා හඳුනා ගත්තේ ය. කළින් දිනයක රියදුරු අසුණට වී ඔහුත් සමගින් ලොරිය පදවාගෙන ගියේ ද පීටර්ස් ම ය .

" තමුසෙට කොහොමද ඒක අදාල වෙන්නේ .. වාහනේ කැඩුනා. ඒක හදාගෙන මම දැනුයි ආවේ. කොහොමත් මං දැං යන්ට ඕනි. අහ්.. උබ ඉන්නේ නිදන ඇදුම් ඇදගෙනත් නෙවෙයි . මේ රෑ තිස්සේ කොහේද ඇවිදින්ඩ ගියේ.?"

'' මං මොකටද ඒක ඔහේට කියන්නේ ?' ජෝක් අවිනීත හඩකින් කීවේ ය.

dileep

" මේ ඉන්නේ බිඩී ද ?" ඊ ළගට පීටර්ස් ඇසුවේ සූදානම් ශරීරයෙන් ගුගුරුමින් සිටින ටිමියා දෙසට නෙත් යොමු කරමිනි." ඒ කියන්නේ උබ මේ රෑ තනි පංගලමේ බිඩී එක්ක ඇවිදින්න ගියා ද ? කොහේ ද ගියේ කියනවා '

ටිමියා බිඩී යැයි වරදවා වටහා ගැනීම සම්බන්දයෙන් ජෝක් දහස් වතාවක් දෙවියන්ට ස්තූතිකළෙ ය. පීටර්ස්ට ඕනෑ දෙයක් සිතා ගන්නට ඉඩ දිය යුතු ය. ස්ව කැමැත්තෙන් නැටට පා ගා ගන්නට ඉඩ ලබා දිය යුතු ය. කැමැත්තෙන් ඇන්දෙන්න ඉඩ තැබිය යුතු ය . ජෝක් වචනයකුදු නො කියා ඉවත්වැ ගියේ එබැවිනි.

ජනේලය දක්වා වැඩී ඇති ගසක් දිගේ කාමරයට බට ජෝක් වහා ඇදට පැන ගත්තෙ ය.

කොතෙක් විඩාපත්ව සිටියත් නිදහසේ ඇහැ කන පියා ගැනීමේ අවස්ථාවක් ඔහුට නම් නො වී ය. කෙසේ වෙතත් ඉක්මනින් එලිය වැටෙන්නේ නම් මැනවැයි ජෝකට සිතුණේ ය. එහෙත් පාන්දර ජාමයේ නම් උස්සාගෙන ගියත් නො දන්නා ගානෙ ගැඹුරු නින්දක් ඔහුට ලැබුනේ ය.

" නැගිටිනවා ජෝක්... බලනවා වෙලාව කීයද කියලා. බ්‍රෙක්ෆස්ට් ගන්න වෙලාවත් පහු වෙලා '"

යි මොර දෙමින් ජෝක්ගේ මව ඔහු අවදි කරවන තුරු කිසිදු හාවක් හූවක් නො මැතිව ජෝක් නිදා ගත්තේ ය.

ජෝක්ගේ රත්‍රී සවාරිය සම්බන්දයෙන් පීටස් වචනයක් හෝ කී බවක් බාප්පා කෙරෙන් දක්නට ලැබුනේ නැත. නිදහසේ හුස්මක් කටක් ගනිමින් ආහාර ඇහෙන තොගයක් අතුරු දන් කිරීමට ජෝක් පටන් ගත්තේ ය.

dileep

" අම්මේ මම උදේ කෑමෙන් පස්සේ කෑම ටිකකුත් අරන් අර කූඩාරම් ගහගෙන ඉන්න ළමයි හතරදෙනා බලලා එන්ට ද ? එයාලගෙ කෑමත් සෑහෙන්ට ඉවර වෙලා ඇති දැන් "

" ඒකට නම් කමක් නෑ. ඒත් ඉතිං අද ඔයාගෙ යාලුවා එනවා. මොකක්ද එයාගෙ නම් කීවෙ.සිසිල් නේද ? ඔයාගෙ බාප්පත් යාට හරිම කැමතියි. ඔයත් කැමතියි නේද ? ඊයෙ ඔයාල දෙන්නා ගොඩාක් විනෝද වුනා නේද ?"

බාප්පා ජනේලය අද්දරට වී පුවත් පතක් කියවමින් නො සිටින්නට සිසිල් ගැන අපූරු කතා ගොන්නක් ද දෙමිතුරන්ගේ මිතුරු කමේ පරිමාවද දැන කියා ගැනීමට විසල් කතා ගොන්නක් ජෝක්ගේ මවට අසන්නට ලැබෙන්නට ඉඩ තිබිණ.

එහෙත් අකමැත්ත පෙන්නුම් කරන මුහුනක් මවා පා උරහිස ගස්සා බස්සා දමා මුනිවත රැක්කා විනා ජෝක් වැඩියමක් කියන්නට ගියේ නැත. ජෝක්ගේ මව කොලුවාගේ හැඟීම් අවබෝද කොට ගත්තාක් පරිද්දෙන් කතා කරන්නට වූවා ය.

" සිසිල් එන්නෙ කීයට ද ?" ඈ ඇසුවා ය." ඔයාට පුලුවන් වෙයි එයා එන්ට කළින් අර ළමයින්ගේ කඳවුරට දුවලා එන්න "

'' සිසිල් ඉක්මනට ඒවි " බාප්පා මැදිහත් වූවේ නො සිතූ ලෙසිනි." මම දන්නවනෙ ජෝක්ගේ තරම. මෙයා ගිය තැන පැළ වෙනවනෙ. අර කොල්ලො එක්ක කයිය ගගහා ඉදී. ආපහු එන්න අමතක වෙයි. සිසිල්ගෙ තාත්තා මගෙ හොද ම යාලුවෙක්. ඉතිං ජෝක් ඔයිට වඩා විනීත විදිහට ඒ ළමයට සලකන්න ඉගන ගන්න ඕන. ඒ ලමය එනකොට ඒ ළමයට කතා කරන්න මෙයා මෙහෙ ඉන්න ඕනි. ඒ නිසා අද ඔය උලව් කෑම්පෙක පැත්තේ නො ගියාට කාරි නෑ "

ජෝක් බුම්මා බුකවා ගත්තේ ය. මේ මොන වදයක් ද ? ඇයි මගේ දේවල්වලට කොහෙවත් යන තාත්තෙක් හරස් වෙන්නේ. එක පාර්ට ම මාව ටවුමට එක්ක ගිහින් සිසිලාව මුන ගැස්සුවා. දැං මං ඒ මොට්ට බබ එක්ක සෙල්ල්ලම් කරන්නත් ඕනි. මේ මොන කරුමයක් ද ? ඊටත් මට ආසා හිතෙන ළමයි ටිකක් ඇවිල්ලා මගේ පාලු ජීවිතේට මැදිහත් වුනා විතරයි. " යි ඔහුට කියන්නට වුවමනා වුවත් ඒ සියල්ල වචනින් පිට නොකර තමාට ම සිතා ගැනීමට ජෝක්ට සිදු වූවේ ය.

" එහෙනම් මම ම කෑම ටිකක් කදවුරට ගිහින් දෙන්නම්කෝ " ඔහුගේ මව කීවේ ජෝක්ගේ මුහුණ කියවා ගත්තාක් පරිද්දෙනි. " සමහරවිට ඒ ළමයි මේ පැත්තේ එන්ටත් පුලුවන් "

dileep

ජෝක් තවමත් සිටින්නේ බුම්මා බූකවා ගත් සෙයියාවෙනි. වත්ත පසුපසට ගමන් ගත් ඔහු බිඩී වෙත පිය නැගුවේ ය. ඇගේ පැටවුන් ඈ වටා කැර කැවෙමින් ක්‍රීඩාවෙහි නියැලෙමින් සිටිනු ජෝක් දුටුවේ ය. අම්මා කී ලෙසින් ළමයි සිවුදෙනා හා ටිමියා ගොවිපොළට පැමිනේ නම් මැනවැයි අන්තයේ ජෝක් සිතුවේ ය. එවිට වචනයක් දෙකක් හෝ ඔවුන් හා කතා බහ කිරීමේ හැකියා ව ඔහුට හිමි වෙන්නේ ය.

සිසිල්ගේ සම්ප්‍රාප්තිය සිදු වූවේ කාරයෙනි. ජෝක් සේම ඔහුද වයස අවුරුදු දොළහක කොලු ගැටයෙකු වුව ද වයසට සරිලන පෙනුමක් සිසිල්ට තිබුනේ නැත . කැරළි ගැසුනු දිගු කොංඩයක් ද සිසිල්ට තිබෙන්නේ ය. අලු පැහැති කමිසයක් ඉතා ක්‍රමානුකූල අන්දමින් හැද පැලදගෙන සිටින සිසිල් දකින විට ජෝක්ගේ ගත හිරි වැටී ගියෙ අප්‍රසන්න කිසිවක් නෙත ගැටුනාක් මෙනි.

dileep

" හලෝ..." ඔහු ජෝක්ට කතාකළේ ය." ඔයයි මයි සොල්දාදුවෝ සෙල්ලම කරමුද ?"

" බෑ බං. අපි රතු ඉන්දියන් සෙල්ලම කරමු " ජෝක් යෝජනාකළේ හදිසියේ ම තම රතු ඉන්දියන් ඇදුමත් පිහාටු ගසන ලද රතු ඉන්දියන් හිස්වැස්මත් සිහි වූ බැවිනි. වහා ගෙතුලට දිව ගිය ජෝක් රතු ඉන්දියන් ඇදුමසොයා දුහුවිලි ගසා බසා දමා එය හැද පැලද ගත්තේ ය. ඊලගට හිස් වැස්ම දමා ගනිමින් රතු ඉන්දියානුවෙකු බවට පත් වූවේ ය. සායම් පෙට්ටියද ගෙන මුහුණේ ද බියකරු අන්දමින් වර්ණ ගන්වා ගත්තේ ය. කෙටේරියක් ද සොයා ගනිමින් ඔහු පහළට දිව ගියේ ය.



dileep

වේගයෙන් හෙලිකොප්ටරයක් පරිද්දෙන් තමා දෙසට දිව එන රතු ඉන්දියානුවා දුටු විට සිසිල්ට දෙවියන් සිහිවුනේ ය. ඔහු දුවන්නට පටන් ගත්තේ ය.ජෝක් සිසිල් පසු පස එලවන්නට තබා ගත්තේ ය. පැකිලෙමින් ඇද වැටෙමින් සැඟවෙන්නට තැනක් සොයන සිසිල් සමබන්දයෙන් මුදු මොලොක් සිතිවිල්ලක් නම් ජෝක්ට කිසි ලෙසකත් පහළ වූවේඑ නැත.

ටිමියාත් කදවුරු බැදි පිරිසත් හදිසියේ ම ගොවි පොළට සම්ප්‍රාප්ත වූවේ ඔවුන් මෙපරිද්දෙන් ක්‍රීඩාවේ නිර්ත වී ඉටින අතරතුර ය. බියෙන් බලියමින් මරහඬ තලමින් දිව යන සිසිල් ද මී හරකෙකු පරිද්දෙන් ඔහු පසුපස එලවන ජෝක් ද දැකීමෙන් පිරිස වහා නැවතී ගත්හ.

‘ අනේ දෙවියනේ ....” ඈන් කීවේ කදුලු ගලන තුරු සිනා සෙමිනි.” සිසිල් හොදට ම බය වෙලා. ජෝක්ගෙ උගුක්ලක්

වෙන්ඩ ඇති අර සොල්දාදුවා සෙල්ලමෙන් ගැලවෙන්න කරපු .අප්පොච්චියේ.. මේ යන විදිහට සිසිල් උෟරු කොටුවට පනින්නයි හදන්නේ "

කෙසේ වෙතත් අත දරුවෙකු ලෙසින් හඩමින් සිසිල් කුස්සියට දිව ගියේ ය. ඇන්ඩෘස් මැතින්ය ඔහු වැලැදගෙන අස්වසන්නට වූ තර ජෝක් යුදමය මුහුණින් ම ළමුන් අතරට පැමිණියේ ය.

" මම සිසිල් එක්ක පොඩ්ඩක් සෙල්ලම් කළා " යි ඔහු කීවේ බඩ අල්ලාගෙන සිනා සෙමිනි." උඹලා ආව එක නම් හොදයි. මං යන්න හිටියේ උදේම ඒ පැත්තේ. කොහෙද අපේ බාප්පා බාල්දිය දැම්මනෙ. එයා කීව මේ සිසිල් එක්ක සෙල්ලම් කරන්ටය කියලා . මම ඉතින් සිසිල්ට උණුසුම් වෙලා යන්ට අලුත් සෙල්ලමක් කියලා දුන්නා. මොකෝ කියන්නෙ. මිනිහා බය වුනා නේද ?"

dileep

" බුදු අම්මේ ඔව්.." කවුරුත් එක් හඩින්කෑ ගැවෝ ය.

" හැබැයි ජෝක් අම්මට නම් කේන්ති ගිහින් ඇති නේද සිසිල් ඒ ගානට බය කරපු එකට . කොයිකටත් අපි කෑම බඩු ගැන අද එයාගෙන් නො සා සිටියොත් හොදයි වගේ " එසේ කීවේ ජුලියන් ය.

" ටිකකින් අහන්ඩ. කොයි එකටත් දැන් ම එපා . හලෝ ටිමී... ඊයෙ රෑ උඹ වෙලාවට ගෙදර ගියා ද ?"

ජෝක් කට වරද්දා ගත් බව අවබෝද කොට ගත්තේ ඊට සුලු වේලාවකට පසුව ය. සැබැවින් ම භූත කෝච්චි සංචාරය ගැහැණු ලමුන් දෙදෙනා නො දන්නා බවක් මුලුවනින් ම ඔහුට අමතකවැ ගොස් තිබුනි. ඈන් සහ ජෝර්ජ් ක්න් අයා ගිල

දමන්නට මෙන් ඔහු දෙස බැලුවෝ ය. ජූලියන් අලල රැලි ගැන් වූවේ ය. ඩික් කාටවත් නො පෙනෙන්නට වැලමිටෙන් පහරක් ඔහුට දුන්නේ ය.

" මොකක් .. රෑ කිව්වා ... මොකක්ද රෑ වුනා කීවෙ ?" ජෝර්ජ් සැකය මිශ්‍රිත බැල්මක් හෙලා පටන් ගත්තේ ය.

+
"මම පොඩ්ඩක් රෑ වෙලා ඇවිදින්න ගියා.ටිමිත් ආව මා එක්ක
" ජෝක් තෙපර බෑවේ වරද නිවැරදි කරගන්නා වුවමනාවෙනි."
ඔයා දන් නැද්ද ටිමී මා එක්ක ආවා කියලා "

ජෝක් උගුරටහොරා බෙහෙත් ගිලින්නට සැරසෙන ලෙසක් ජෝර්ජ් වැටහේ. ඈටහොරා මැස්සෙක්ටවත් පියාඹා යාමට ඈ නම් ඉඩ තබන්නට සූදානම් නැත.

dileep

" උඹලා මගෙන් මොනවද හංගන්නෙ .තමුසෙලා කරේ මොකද්ද කියලා මට හිතා ගන්ට් බෑ කියලද හිතන් ඉන්නෙ. මම දන්නවා උඹලා තුන් දෙනා ඊයේ රෑ කෝච්චිපොළට ගිහින්."

ඔවුන් අතර හට ගත්තේ දැඩි නිහඬ බවකි. ජූලියන් කෝපවත් බැල්මක් ජෝක් දෙසට් හෙලුවේ ය. හැකියාවක් තිබුණේ නම් ඔහු ජෝක් බිම පෙරලවාගෙන රෙස්ලින් තරගයක් ආරම්බ කරනු ඇත. ජෝර්ජ් තවමත් සිටින්නේ රතු වැ ගිය මුහුනින් කෝපයෙන් පුපුරා හැලෙමිනි.

" කියපල්ලා ගල් ගිල්ල වගේ ඉන් නැතිව. උඹලා ගියා නේද ?. සත්තු. මට ඇහැරවන් නැතුව හොරෙන් ම ගිහින්ලා. "

' ඔයාල ඊයෙ ගිහින්ලා මොනවද දැක්කෙ ?" ඈන් ඇසුවේ පිරිමි ලමුන් තිදෙනාගේ මුහුණු එකින් එක මාරුවෙන් මාරුවට නිරික්ක්ෂනය කරමිනි. ඊයේ රත්‍රියේ පිරිමි ළමුන් තිදෙනාට ලොමු දැහැ ගැන්වෙන ත්‍රාස ජනක අද්දැකීමක් ලැබෙන්නට ඇතැයි ගැහැණු ළමුන් දෙදෙනාට සිතේ.

" හරි එහෙනම් " යි ජූලියන් සියල්ලක් කියන්නට අවසානයේ සිත හදා ගත්තේ ය. ඔහු කතාව අරම්බකළේ ය. එහෙත් හදිසියේ ම සිසිල් ඔවුන් අතරට මතු වූවෙන් කතාව මොහොතකට නැවතින. ඔහුගේ මුහුන රතු වී තිබුණු අතර ඒ නොනවත්වා හැඩීමේ ප්‍රතිඵලයකි.

" ඔයාගෙ තාත්තා ඔයාට කතා කරනවා " යි ඔහු ජෝක්ට කීවේ ය. " තමුසෙ මහ අවලන් මුරුගයෙක්. මම තව විනාඩියක් වත් මෙතන ඉන්නෙ නෑ. දැන් ම මම යනවා ගෙදර. තාත්තා කෑ ගහනවා ඇහුන් නැද්ද ජෝක් ? එයා තමුසෙට හොදට සලකයි.ලමයෙක්ට සලකන්න දන්නෙ නැති තමුසෙට හොද පාඩමක් උගන්වන්න ම ඕනි '

dileep

## 12 ජෝර්ජ් සංසුන් වෙයි

ගිල දැමීමට මෙන් සිසිල් දෙස බැලූ ජෝක් පිදුරු ගොඩ වටා ඇවිදිමින් නොපෙනී ගියේ ය. කවුරු කවුරුත් ජෝක්ගේ බෙරිහන් දීම් අසන්නට නිහඬව බලා සිටියහ. ජෝක් නො පෙනී ගොස් මද වේලාවක් ගත වුවද කිසිදු හඬක් සන්නට ලැබුණේ නැත.

" අර බූරුවා මාව හොඳට ම බය කළා. " සෙස්සන් අතරට වැදෙමින් සිසිල් ආඩපාලි කියන්නට පටන් ගත්තේ ය.

dileep

" පව් අහිංසක තොත්ත බබා " ඩික් එක්වරම කියා දැම්මේ ජෝක් සම්බන්දයෙන් වූ කෝපය ද සිසිල් පිට ම පවරමිනි.

" ඩාලින්ග් බබෝ බය හිතුන ද ?" ඒ ජෝර්ජ්ගේ කටුක ස්වරය යි.

" අම්මගෙ හුරතලාපව්ච්.... " ජුලියන් ද කියා දැම්මේ ජෝක්ට බාප්පා විසින් දෝශාරෝපණය කරනු ලබතැයි ඇති වූ සැකයෙන් උපන් කෝපය නිසා ම ය. ජෝක්ගේ වැරදි පවසා සහන ශීලී වචන මාලාවක් ඇසීමේ බලා පොරොත්තුවෙන් හුන් සිසිල්ගේ පපුව පිලිස්සී ගියේ ය. කතාව ලත් තැන ම ලොප් කොට දත කට හොඳින් පියා ගත්තේ ය. හැඬීමෙන් රතු වූ

මුහුණ තව තවත් රතු කොට ගත්තේ ය. සිසිල් වහා නැගිට ගත්තේ ය.

" මට මැනස් කියල ජාතියක් තියෙන නිසා හොඳයි. නැත්තම් මං උබලගෙ මූනු සේරට ම තඩි බානවා " යි පවසා හේ වහා පිතටට ඇවිද ගියේ ඔහුගේ තඩි බෑම කෙසේ වෙතත් ඔහුට නම් තඩි බෑමකට මුහුන දීමට සිදුවේ යැයි සිතුණු බැවිනි.

ළමෝ ගල් ගිල්ලාක් මෙන් නිහඬව වාඩිගෙන බලා සිටියෝ ය. ජෝක් සම්බන්දයෙන් ඔවුන්ගේ සිත් තුළට දැනෙන්නේ සුවිශාල කණගාටුවකි. තමා හැර දමා කෝච්චිපොළට යාම සම්බන්දයෙන් දැනුනු කෝපය පවා ජෝර්ජ්ට දැන් දැන් බාල වී ගෙන එන ලෙසකි. අනපේක්ශිත සිදු විම් සම්බන්දයෙන් ඈන්ට ද දැනෙන්නේ දරා ගත නො හැකි තරමේ සිත් තැවුලකි. අවුල් සහ ගත බවකි.

dileep

පුරවා ගත් ආහාර මල්ලක් ද සමගින් ජෝක්ගේ මව පිදුරු ගොඩ අසලින් මතු එන විට තවත් මිනිත්තු දහයක් පමණ ගෙවී ගොස් තිබුණි. ළමුන් ආචාර සීලී ලෙස හුන් තැනින් නැගිට ගත් අතර ජුලියන් එයට සුබ උදාසනක් පැතුවේ ය.

" මට දුකයි ළමයි. අද මට ඔයාලට කෑම ටිකක් කන්න ඉන්න කියන්න විදිහක් නෑ.. බලන්නකෝ අපෙ මේ ජෝක් හරිම මෝඩ විදිහටනේ වැඩ කටයුතු කරලා තියෙන්නෙ. මට බයයි ජෝක් අපි කාටවත්හොයා ගන්න බැරි විදිහට කොහේ හරි හැංගෙයි කියලා . ජෝක් එයාගෙ බාප්පටත් වැඩිය කැමති නෑ. ඒ නිසා ම එයා එයාට මේච්චල් නෑ. ඉතිං මං කොයිකටත් කියලා දවසම ඇදට යැව්වා. ඔයාලටත් අද නම් එයාව මුන ගැහෙන්න විදිහක් නෑ ඒ නිසා. මෙතන කෑම බඩු වගයක් තියෙනවා. අනේ

ළමයිමාත් එක්ක තර්හ වෙන්න එපා අද මේ වුනු දේවල් වලට . මට හිතා ගන්න බෑ ජෝක් මේ තරම් නරක් වුනේ කොහොමද කියලා. සාමාන්යෙන් එයා මෙහෙම හැසිරෙන්නේ නෑ "

සිසිල්ගේ මුහුන යළිත් පිදුරු ගොඩ අසලින් පාදූර්භූත වූවේ ය. ජූලියන්ට එක්වරම අපූරු අදහසක් පහල වූවෙන් හේ කතාව පටන් ගත්තේ ය.

" ජෝක් දවස ම කාමරේ ඉන්න නිසා අද සිසිල්ටත් ඉන්න වෙන්නේ තනියමනේ... ඔබ තුමී කැමති නම් අපි සිසිල් අපිත් එක්ක ටිකක් ඇවිදින්න එක්ක යන්නද ? අපි හෙදර් පදුරු උඩින් ඇවිදින්ඩත් පොඩි පොඩි කදු නගින්නත් දිය ඇලි උඩින් පැන පැන යන්නත් හිතාගෙන ඉන්නේ. සිසිල්ටත් අලුත් අද්දැකීමක් වෙයි"

dileep

සිසිල්ගේ උගුර කට උණුසුම් ව වියළී යනු සිසිල්ට දැණුනි. හෙ මුහුණ සගවා ගන්නට උත්සාහකළේ ය. ජූලියන්ගේ බලා පොරොත්තුව සම්බන්දයෙන් අබ මල් රේණුවක හෝ හැඟීමක් ජෝක්ගේ මවට තිබුණේ ද නැත. නො එසේ නම් ඈ වැඩිය ගනනකට නො ගත්තා ද විය හැකි ය.

" ආ.. ඒකට කමක් නෑ. ඔයාලා හරි ම කරුනාවන්ත ළමයිනේ. ඒත් ඉතින් එයා ටිකක් විතර කුලෑටි ලමයෙක්. ඔයාලට තේරෙනවනේ. එහෙනම් ඔයාලා සිසිල් එක්කන් ගිහින් පරිස්සමට ආපහු ගෙනත් ඇරලවන්න ඕනි. තේරුනා ද ? සිසිල්.... සිසිල්.... ඔයා කොහේද / මෙහාට ඇවිත් මේ යාලුවෝ ටික හදුනා ගන්න "

එහෙත් ඔවුන් හුන් පැත්ත පලාතට වත් ආවේ සිසිල් නො වේ. මේ මරුමුස් ලමුන් රංචුව හා එක් වීමට නම් සිසිල්ගේ

බලාපොරොත්තුවක් කොහෙත් ම නැත. පිළිතුරක් නො ළද විට ඇන්ඩෲස් මැතිනිය සිසිල් සොයා පිටව ගියා ය. එහෙත් ඇයට පවා සිසිල් නම්සොයා ගත නො හැකි විය .

සිසිල්ගේ අතුරුදන් වීම ළමුන් සිව් දෙනාට නම් පුදුමයක් නොවේ. ඈන් ජූලියන් දෙස බැලුවේ අභිමාණී හැඟීමකිනි. අයියගෙ මොළේ තමයි මොළේ යැයි ඈ සිතුවා ය. ඩික් ද මද සිනාවක් පෑවේ ය. එහෙත් ජෝර්ජ් නම් තවමත් රතු කොට ගත් බුම්මා බුකෝ ගත් මුහුණින් බලා සිටින්නී ය.

“ මට එයාව හොයා ගන්න බැරි වුනානේ “ යි යළි පැමිණෙමින් ඇන්ඩෲස් මැතිනිය කීවා ය.” එයා ගැන හිතන්න ඕන නෑ ළමයි. ඔය කොහෙට හරි වෙලා ඇති “

“ ඔව්... ඔන්න ඔහෙ කොහෙට හරි වෙලා පබලු මාලයක් වත් ගොතනව ද දන්නෙ නෑ “ ජූලියන් අචරශීලී ලෙස කීවේ ය. ඇන්ඩෲස් මැතිණිය පවා ඒ කතාවට සිනා වූවා ය.

“ මහ ජරා කොල්ලෙක් “ ඈ රහසිගත හඬකින් කියා ඇසක් ද ඉගි මැරුවා ය. “ මට දුක අහිංසක ජෝක් ගැන . ඉතින් සුබ ගමන් ළමයි. මම දැං මගෙ වැඩ පොල ටික කරන්න යනවා..”

ළමුන් පිදුරු ගොඩ අ සලට වී බලා සිටියදී ම ඈ කිරි හල දෙසට පිය නැගුවා ය. ඇන්ඩෲස් මහතා ද කාරයට නැග කොහේදෝ යන්නට ගියේ ය. වත්ත සිසාරා නෙත් හල ජූලියන් යළිත් වරක් නිහැඬියා ව බින්දේ ය.

“ අර බලන්න අර පෙයර්ස් ගහ දිහා. එතන තමයි ජෝක්ගේ කමරේ තියෙන්නේ. යන්න කළින් එයා එක්ක වචනයක් දෙකක් කතා කරන්න පුලුවන්ද බලමු :

dileep

ජෝර්ජ් හැර සෙස්සෝ පෙයර්ස් ගස දෙසට ඇවිද ගොස් ඒ යට සිට ගත්තෝ ය. ඈ තවමත් පිදුරු ගොඩ අසලට වී බුම්මා ගත් බැල්මෙන් බලා සිටින්නී ය. ජුලියන් පහත් හඬින් ජෝ යි හඬ ගෑවේ ය.

යුදමය පින්තරුවලින් සමංචිත රතු ඉන්දියානු මුහුනක් ජනේලයෙන් පිතටට එබුණේ ය.
" හලෝ " යි ජෝක කතා කළේය. " බප්පා මට ගහන්න හැදුවා. හැබැයි අම්මා ඒකට ඉඩ දුන්නේ නෑ. මට ලැජ්ජයි බං.මේ වගේ හොදට ඉරත් පායලා තියෙන දවසක එලි පහළියට බහින්ට නැති හැටියක්. ඒක නෙමේ කෝ සිසිල් ?'

" මං දන් ඈ. සමහර විට ගබඩ කාමරේක හැංගිලා ඇති. ජෝක්. දවලට තත්වෙ දරුණුයි නම් රෑට ඒ පැත්තෙ වරෙන්."

dileep

" හරි හරී. ඒක නෙමේ මාව පේන්න්නේ කොහොමද ? ඇත්තම රතු ඉන්දියන් කරයෙක් වගේද ?"

" දැක්ක ම බය හිතෙනවා " යි ජුලියන් පිළිතුරු දිනි." මට පුදුම ටිමියා උඹව අදුනා ගත්ත එක "

" කෝ ජෝර්ජ් ?"

' අර ඉන්නේ පිදුරු ගොඩ ගාවට වෙල බුකෝගෙන " ඩික් කීවේ ය. " අපිට අද එයත් එක්ක තියෙන්නේ ඒතරම් සුබ දවසක් නෙමේ. උබ බලලා මල්ලෙන් එලියට දැම්මනෙ "

" ඔව් අප්පා මං වැඩේ කෑවා " ජෝක් කීවේ ඇන්ට ද සිනා ගැන්වෙන ස්වරයෙනි " අඩේ ආං සිසිල්. උඹට කියපල්ලා පරිස්සම් වෙන්න කියලා . ගොනා අනින්න ඉඩ තියෙනවා"

" ගොනෙකුත් ඉන්නව ද ?"

" නෑ . ඒ උනාට එහෙම කියන්න මිනිහා ටිකක් බය වෙන්ටත් එක්ක . ඉතින් කච්චියට ම සුබ දවසක් එහෙනම් "

ළමෝ තිදෙන එතනින් ඉවත්ව පිදුරු ගොඩ දෙසට පැමිණියෝ ය. එක්වර ම සිසිල් ද එතනින් මතු වූවේ ය. ළමුන් තිදෙනා දැකීමෙන් හේ තිගැස්සී ගිය අතර ඇන්ඩෘස් මැතිනිය සිටින කිරිහළ දෙසට දිව යෑමට සූදනමින් දෙපා ලැහැස්ති කොට ගත්තේ ය.

dileep

ජුලියන් ඩික්ගේ අතකින් අල්ලා ගත්තේ ය. ඔහු සිසිල්ට ඇසෙන පරිද්දෙන් ඩික්ට කියන්නාක් මෙන් අපූරු රංගනයක් ඉදිරිපත්කළේ ය .


" ගොනා .. ඩික් ගොනගෙන් පරිස්සම් වෙලා හිට පං "

ඩික් ද රංගනය තව දුරටත් කරගෙන යනු කැමැත්තේ ,

" ගොනා ලෙහාගෙනා .. ගොන ගෙන් පරිස්සම් වෙන්ට"යි මුර ගෑවේ ය.

කරන්නේ විහිලුවක් බව දනිතත් කුඩා ඈන් එක්වර ම තැති ගත්තා ය. යටි ගිරියෙන් හඬක් නැගූ ඕ " ගොනා ..." යි කෑ ගැසුවා ය.

සිසිල්ට තවත් නම් වාවා ගත නො හැක. කොලුව කොල පාට වූවේ ය. දෙපා ගැහෙන්නාක් මෙන් ඔහුට දැණුනේ ය. " කො කො කො හෙහෙ ද ද ගොනා' යි හේ විචාලේ ය.



" තමුසෙගෙ පිටිපස්සේ " ජුලියන් කෑ ගැවෙන් වහා පසු පස හැරී බැලූසිසිල් මර හඩක් නගා ගෙන නතර වූවේ ජෝක්ගේ මව හුන් කිරිහලේ ය.

" බේර ගන්න බේර ගන්න මගේ පස්සෙන් ගොනෙක් පන්නවා " යි ඔහු හඩ තැලුවේ ය.

" ඒත් අපිට කොයින් ද ගොනෙක් ?'' පුදුමයත් කෝපයත් මුසු හඩින් ඇන්ඩෘස් මැතිනිය කීවා ය ." ඇත්තට ම සිසිල් උඟරෙක් ඔයා පස්සෙ පැන්නුවා වෙන්ට බැරි ද ?"

සිනාව නවතා ගැනීම කාටත් අසීරු කරුණක් බව අමුතුවෙන් කිව යුතු නැත. ඔවුහු යළිත් වරක් ජෝර්ජ් කරා ගමන් ගත්තෝ ය. ගොනෙක් මවා පා සිසිල් බිය කළ අන්දම ඇයට කියන්නට ජූලියන් සැරසුන ද මුරංඩු හිතුවක්කාර දගමල්ල මුහුන පසෙකට කර ගත්තා විනා වදනකුදු අසා සිටියේ නැත. ජූලියන් උරහිස් ගස්සා දැමුවේ එපා වී ගිය ලෙසිනි. ජෝජ් මේ ආකාරයෙන් පුපුරන ගුගුරන ගිනි කන්දක් වැ සිටින විට කළ යුතු වැ ඇත්තේ ඇගේ පාඩුවේ ඇට ඉන්නට හැරී ම බව ඔහු අවබෝද කොට ගත්තේ ය

ආහාර අඩංගු මල්ලද සමගින් ඔවුහු කදවුර දක්වා ගමන් කළෝය. ළමුන් අතර පවත්නා නො හොද නෝක්කාඩු ගතියෙන් වැඩි මනත් අසරන වූවේ ටිමී ය.ජෝර්ජ් සිටින්නේ සෙස්සන් ද සමගින් කුමක්දෝ ආරෝවක බව උෟට හැගේ. " එහෙත් මට ඔයාගෙපැත්ත අරන් අනික් අය එක්ක තරහ වෙන්නත් බැනේ " වැනි හැගීමක් මෝදු වූ මුහුණකින් උෟ ගමන් කරමින් සිටියේ ය. වල්ගය වෙනදා මෙන් නො නවත්වා දෙපසට වැනීමද උෟ අත හැර දැම්මේ ය. ජෝර්ජ් නම් වූ ගිනි කන්දේ උත්කෘෂ්ට ම පුපුරා යාම සිදු වූවේ ඔවුන් කදවුර කරා ස්ම්ප්‍රාප්ත වූවාට පසු ය.

" මට දුක මාවත් එක්ක යන්න කියලා කට කැඩෙනකන් කියල තියෙද්දිත් උඹලා මට මෙ වගේ කැත වැඩක් කරපු එකට . මට වඩා එහෙනම් අන්තිමේ උබලට අර ජෝක් ලොකු වුනා. ජරා සත්තු. මම කවදාවත් හිතුවෙ නෑ උබලා ඔය වගෙ බලු වැඩක් මට කරයි කියල ඩික්"

ජෝර්ජ් කියවාගෙන කියවාගෙන ගියා ය. ඇ භාවිතා කරන බාසාව දරා ගත නො හැකි තැන ජුලියන් කතාව පටන් ගත්තේ ය.

dileep

" මෝඩියෙක් වගේ හැසිරෙන්න එපා බං. මම් උඹට කිව්වා ඈන් එනව නම් උඹත් එක්ක යනවා කියල . ඉතින් ඈන් ආවෙ නෑ. අනික ඊයෙ ගියා කියලත් මහ ලොකු දෙයක් සිද්ද වුනේ නෑ . පොඩ්ඩක් තිගැස්ස්සුනා විතරයි "

" මොකක්... තිගැස්සුනා.... අනෙ මොකක්ද වුනේ කියන්නකෝ" පුංචි ඈන් ඇයද සිටියා ය. එහෙත් ජෝර්ජ් නම් කිසිත් කණකට ගත්තේ නැත. ජුලියන්ලාගේ අද්දැකීම් අසන්නට ඇයට කොහෙත් ම වුවමනාවක් නැත. ඇය හිස ගස්සා දැම්මා ය. ඉවත බලා ගත්තා ය.

රත්‍රියේ ලත් අද්දැකීම් සියල්ල ජුලියන් විස්තර කරන්නට පටන් ගත්තේ ය. ඈන් සියල්ල අසාස් සිටියේ හුස්ම ගැනීමට පවා අමතක වැ ගියා විලසිනි. ජුලියන්ගේ කතාවට කිසිඅවදානයක් නො දක්වන්නාක් මෙන් සිටියත් හද ගැස්ම ඇති කරවන හොල්මන් කෝච්චි කතාව නො අසා සිටීමේ හැකියාවක් ජෝර්ජ්ට තිබුණෙ නැත. සැබැවින් ම ඇය සිටියේ දැඩි කෝපයෙනි. එමෙන් ම වේදනාවෙනි.

dileep

" ඔන්න ඕකයි ඕකට මිනිස්සු භූත කෝච්චි කියන්නේ ' ජුලියන් කතාව හමාර කරමින් කීවේ ය." බොරු කියන්නේ මොකටද මමත් ටිකක් බය වුනා. සමාවෙන්න ජෝර්ජ්. ඔයත් අපි එක්ක ඉන්නයි තිබුණේ. ඔයා නැති අඩුව එවෙලෙත් සෑහෙන්ට දැණුනා. ඒත් මට ඈන් ව තනියම දාල යන්නත් බැනෙ."

කිසිදු සමාවට කරුණක් පිළිගන්නට නම් ජෝර්ජ් සූදානම් නැත. තාමත් ඇගේ මුහුණේ පළවෙන්නේ කෝපය යි.

" මම හිතන් හිටියේ ටිමීත් උඹලා එක්ක ගියා කියල " ඈ කීවා ය." මමත් වීර වැඩ වලට එන්ට සැදී පැහැදී ඉන්න බව දැන දැනත් උඟත් මටහොරා ගියා කියලයි මං හිතන් උන්නෙ "

" ඇත්තට ම පිස්සු හැදිලද ජෝර්ජ් ?" යි ඩික් කීවේ ය." උඹ නිකන් අපේ ප්‍රශ්නවලට හයක් හතරක් නො දන්න ටිමී ගාව ගන්ට වුවමනා නෑ. උඟ ඉන්නෙ සෑහෙන්ට අවුල් ගිහින්. අර බලපන්. ටිමී අපි එක්ක ආවෙ නෑ. උඟට අපි ව හම්බුනෙ අපි ආපිට ආවට පස්සෙ. ඊට පස්සෙ ජෝක් ව ෆාර්ම් එකට දාල එන්නයි උඟ යන්න ගියෙ "

" අයියෝ ...මං හිතුවෙ උඹ ගැනත් වැරදියටනෙ. අන්තිමට මට කියල ඉන්නෙ උඹ විතරයි ටිමී "

dileep

ජෝර්ජ් ඇගේ අතක් ටිමියා දෙසට දිගු කරා ය. ටිමී අතුටින් උඩ පනින්නට පටන් ගත්තේ ය.

ළමුන් අතර යළිත් වරක් හට ගත්තේ නිහඬ බවකි. මේ අඩම්බරකාර බෝම්බය නිශ්ක්‍රීය කොට ශාන්ත දාන්ත තීන්ත කූඩුවක් බවට පත් කරන්නේ කෙසේදැයි කාටත් පිළිතුරක් නැති පැනයෙකි. ඈට තනි වෙන්නට ඉඩ හැරීම යෙහෙකැයි ජුලියන්ට් සිතෙන්නේ ය. එවිට ඈය නිවී යනු ඇත. එහෙත් ඈ කදවුරේ තබා ඇවිදින්නට යාම ද නො කළ හැක්කකි.

ඈන් ජෝර්ජ්ගේ අතකින් අල්ලා ගත්තා ය. ඈය මෙවැනි අවස්ථවන්ට කැමැති නැත." ජෝර්ජ්..මාත් එක්ක තරහ ගන්න හේතුවක් නෑනෙ ජෝර්ජ්.මාත් ගියේ නෑනෙ "

" උඹ තමයි යකෝ සේරට ම මුල. තොත්ත බබෙක් වගේ හැසිරෙන්නෙ නැතිව හිටිය නම් අපි ඔක්කෝට ම යන්න තිබ්බා " අත වේගයෙන් ඉවතට අදිමින් කිසි ම හිතක් පපුවක් නැති විලසින් ජෝර්ජ් ගත් කටට ම කියා දැන්මා ය.

ජූලියන්ගේ ද යකා ඇවිස්සෙන්නට පටන් ගත්තේ එවිට ය. පුංචි ඇන්ගේ හඬන්නට සැරසෙන වේදනා බර මුහුණ දකින විට තව දුරටත් වාවා ගැනීමේ හැකියාවක් ඔහුට නැත.

" කට වහගනින් ජෝර්ජ්. තමුසෙ මහ ජරා කෙල්ලෙක්. මොනව ද මෙ කියන කට කැඩිච්ච කතා කියලා හෙමීට කල්පනාකරලා බැලුවොත් හොදයි. මට තමුසෙ ගැන පුදුමයි"

ජෝර්ජ්ගේ අභිමානය එක් වර ම සිදී ගියේ ය. ජූලියන්ගෙන් එවැන්නක් අසන්නට ලැබීම ඈ තුල ඇතිකළේ තමා ගැන ම ලැජ්ජාවකි. එහෙත් ඈ පරාදය භාර ගෙන පසෙකට වීමට ද සූදානමක් නැති බව නම් කිව යුතුව තිබේ.

dileep

" මට තමුසෙ ගැනත් පුදුමයි තමයි ජූලියන්. අනික් හැම වීර ක්‍රියාවක් ම අපිකළේ එකට. ඒත් මේකෙදි උඹලා මාව කපල දාන්න හදනවා. හරි හරි කමක් නෑ. ඊ ළඟ පාර මාවත් එක්ක යනව ද ?

ජූලියන්ට සිනාවක් ගියේ ය. නපුරු මුරංඩු සිතැත්තී වෙස් පෙරලා ගැනීමට සැරසෙනු ඔහුට පෙනේ.

" මොකක් ... අද හැසිරිච්ච විදිහත් එක්ක කීයට වත් බෑ. මේක ඩික්ගෙයි මගෙයි ජෝක්ගෙයි විතරක් වික්‍රමය. ඈන්වත් උඹ වත් මේකට ගාවගන්න මං කැමති නෑ "

ඩික් ද කැදවා ගනිමින් ඔහු කදු පහළට ගමන් කරන්නට පටන් ගත්තේ ය.ජෝර්ජ් බුම්මා ගත් මුහුණින් හෙදර් පදුරු ගොල්ලේ වාඩි ගත්තා ය. ඈන් මෙතෙක් උහුලා ගෙන හුන් කදුලු රහසේ ම පිට කොට හැරියා ය.විටින් විට ඇති වන මෙයා කාරයෙ නො හොද නෝක්කාඩු සම්බන්දයෙන් ඈ වැඩි මනාපයක් දක් වන්නේ නැත." සමහර විට හොද උදේ කෑමක් තිබ්බොත් සේරම ප්‍රශ්න විසදෙන්නත් පුලුවන් " යි තමාට ම කියා ගත් පුංචි ඈන් ආහාඅර පිළිවෙල කරන්නට පටන් ගත්තා ය.

කූඩාරමෙන් පිතටට පැමිණ හුන් ලුෆී උන්නැහේ ජුලියන් සහ ඩික් දැක්කේ ය. සිනා රැල්ලක් මුවේ ඈදා ගත් හේ ඔවුන්ට කතා කරන්නට වූවේ ය.

" මේ.. මාව බලන්ට එන ගමනක් ද ?"

dileep

" ඔව්" යි ජුලියන් පිළිතුරු දුන්නෙ එක් අර ම නව අදහසක් සිතට ඇති වූ බැවිනි ." සර් ඔයා ගාව තියෙනවා නේද කදුකරයේ ලොකු සිතියමක් . හැම අස්සක් මුල්ලක් ම සලකුණු කරපු එකක්. අපිට ඒක පොඩියක් බලන්න පුලුවන් වෙයි ද /"

" අපෝ පුලුවන්. කූඩාරමේ කොහේ හරි තැනක ඇති.හැබැයි දාපු තැන නම් මට මතක නෑ. චුට්ටක් හොයල බලන්නකෝ"

ලුෆී උන්නැහේ දිගින් දිගට ම පුවත් පත කියවමින් සිටිනා අතර ඩික් සහ ජූලියන් සිතියමසොයා ගත්තෝ ය.

" සර් ..මේ පොලොව යටින් උමං දුම්රිය මාර්ගයක් තියෙනවා නේද ?" ජුලියන් ඇසීය. ඔව් යැයි සං කිරීමට උන්නැහේ හිස වැනුවෙ ය.

‘ ඔව් ළමයා. තැනි තලාවෙන් තැනි තලාවට යන්න රේල් පාරවල් ගණනාවක් ම තියෙනවා . එක අතකට මේ කදු කරයේ උමං දුම්රිය මාර්ගයක් හදන එක ලේසියි පොලොව උඩින් කෝච්චි පාරක් ඉදි කරනවාට වඩා .සීත කාලෙට හිම අයින් කරන්න සිද්ද එනවා වගේ ප්‍රශ්නත් නෑනෙ”

විශල් සිතියම එලා ගත් ළමෝ තම තමන්ගේ හිස් එයට නැඹුරු කොට ගෙන සිතියම පීරන්නට පටන් ගත්තෝ ය. උමං දුම්රිය මාර්ගයන් එහි පෙන්වා තිබුනේ තිත් ඉරි පේළි වලිනි.

සුලු වේලාවකින් වුවමනා කරන දුම්රිය මාර්ගයසොයා ගැනීමේ හැකියාව ඔවුනට ලැබිණ. එය අවසන් වුවේ තැනිතලාවකිනි.

dileep

ජුලියන් ඩික් දෙස බැලුවේ ය. දත කට පියගෙන සිටියද ඔවුන්ගේ සිත් තුල දහසකුත් සිතුවිලි තෙරපෙන්නට විය. පාලු කෝච්චිපොළට භූත කෝච්චි සම්ප්‍රාප්ත වන්නේ කොතනින්දැයි දැන් ඔවුන්ට මනාව අවබෝද කොට ගත හැකි ය. එහෙත් දුම්රිය මාර්ග තැනි තලා ගනනාවක් හා සම්බන්ද වෙනු ද ඔවුනට දැක ගත හැකි වූ බව නම් කිව යුතු ය. ළමෝ එකිනෙකා දෙස බලා සිටියේ නිහඬ ව ය.

ළමුන්ට එකිනෙකා හා අදහස් හුවමාරු කරගැනීමේ හැකියා ව ලැබුණේ අහම්බෙනි. දිවාචර සලබයෙකු එක් වර ම ලූෆීගේ මුහුන අද්දරින් පියාඹා ගියෙන් ඔහු උඟ අල්ලා ගැනීම සදහා දිව ගියේ ලමුන් දෙදෙනා සිතියමද සමග තනි කරමිනි.

“ භූත කෝච්චි එක්කෝ එන්නේ මේ නිම්නයට පිටි පස්සෙන් තියෙන උමගය දිගේ වෙන්න පුලුවන්. එක්කො මෙන්න මේ

නැම්මෙන් හැරිලා වෙනින් නිම්නයකට යනවා වෙන්නත් පුලුවන් " යි ජුලියන් විස්තරකළේ ය." මම ඔයාට කියන්නම් අපි මොකක්ද කරන්න ඕන කියලා . අපි ලූෆී සරට කියමු අපි මේ කිට්ටුව ටවුමට යන්න ඕන කියලා . ඊට පස්සේ  අපි හිමින් සීරුවේ එහේ  ස්ටේශමට ගිහින් සෝදිස්සියක් දාමු. මේ උමං දුම්රිය මාර්ග දෙක ගැන  අපිට එතකොට  මොන මොනව හරිහොයා ගන්ට පුලුවන් "

" නියමම අදහස " යි ඩික් කීවේ ය.ඒ හාත් සමගම ලූෆී මහතා පෙර්ළා පැමිණියෙ ය. " සර් අද ඔයා ගොඩක් කාර්යී බහුල ද ? කෑමෙන් පස්සේ ඔයාට අපිව මේ ළග ම තියෙන ටවුන් එකට ගෙනිහින් ඇරලවන්න පුලුවන් ද ?"

" අපෝ පුලුවන් " ලූෆී උන්නැහේ කියා සිටියේ  දයාංචිත ස්වරයෙනි. කොල්ලන් ද්දෙනාගේ සතුට ඉහ වහා ගියේ ය. දැං භූත කෝච්චි සම්බන්දයෙන් මොන මොනවා හෝසොයා ගැනීමේ අවස්ථාව ඔවුනට උදා වී තිබේ. ඒත්... ඒත් ජෝර්ජ් ව රැගෙන යාමේ හැකියාවක් නම් ඔවුනට නැත. ජෝර්ජ්ගේ යකා නැටීම සම්බන්දයෙන් දඬුවමක් ලබා දිය යුතු ම ය.

dileep

dileep

## 13 උද්වේගකර සැලසුමක් ..

ඈන් කෑම සූදානම් බව හගවා කෑ ගාන්නට වූවා ය.

" හැමෝම එන්.න.. මම කෑම ලෑහැස්ති කරා... ලූෆි සර්වත් එක්කන් එන්ඩෝ ..."

ලූෆි මහතා ඈ දෙසට පිය මැන්නේ මුව පුරා එල්ලා ගත් සිනාවත් සමග ය. සැබැවින් ම ඈන් ඉතා හොද ගෘහන්iයකැයි එතුමාගේ සිත කියන්නේ ය. පොළව මත සුදු පැහැති ඇතිරිල්ලක් එලා ඒ මත ඈන් විසින් කෑම බීම අඩුක් කොට ඇති ආකාරය ඔහු බලා සිටියේ ප්‍රශංසනීය මුහුණිනි

" හ්ම්... සලාද... බාගෙට තැම්බුව බිත්තර ....හැම් පෙති.....ආනේ මේ මොනව ද... ඇපල් පායි එකක් නේද .... මගෙ දෙයියනේ... මේ ඔක්කෝ ම ඉව්වේ මේ පුංචි කෙලි පැටික්කි ද ?"

ඈන් සතුටින් සිනා වූවා ය. " මම හැදුවෙ ලෙමන් ජූස් විතරයි. වතුර දොලෙන්. ඉතුරුවා ෆාම් එකෙන් " ඈ අවංකව ම කීවා ය.

ජෝර්ජ් කෑම ගත්තේ වචනයක් හෝ නොකියා ය. සැබැවින් ම ජෝර්ජ් මේ වන විට සිටියේ ඇගේ කුකුල් කේන්තිය සම්බන්දයෙන් පසු තැවිලි වෙමිනි. ජෝර්ජ්ගේ මලානික මුහුන ලූෆී මහතාගෙන් සඟවා ලිය නො හැකි කරුණක් වූ අතර උන්නැහේ අන්තෝ ජටා උභ තෝට්කයකට මැදි වූවාක් පරිද්දෙන් කිහිප විටක් ම ඈ දෙස බැලුවේ ය.

" ඔයා මොකක් හරි අසනීපෙකින් ද දරුවෝ ?" යි ඔහු ජෝර්ජ් දෙස බැලුවේ ය.

dileep

ජොර්ජ් සිය මුහුන රතු කර ගත්තා ය." අනේ නෑ සර් " යි ඈ එක්වර ම පිලිතුරු හුන්නා ය. හැන් දැන් කෝපයෙන් පිපිරෙමින් තුබූ ඇගේ මුහුණ සිනා රැල්ලකින් සැරසෙමින් තිබේ. වැර වීරිය දරා එය සඟව ගැනීමේ උත්සහයක නියලුනද ඒ වූ කලී නිරර්ථක ප්‍රයත්නයක් ම වී ය. ලූෆී මහත වඩ වඩාත් පරීක්ෂා කාරී ව ඈ දෙස බලන්නට තබා ගත්තේ ඈ අසනීපයකින් පසුවේදැයි ඇක හැර දැන ගැනීමේ අභිලාශයෙනි. එහෙත් ඈද සෙස්සවුන් තරමට ම ගිල දමනු දුටු විට නම් උන්නැහේ තුළ වූ ජෝර්ජ් ලෙඩ වී තිබේ යන අදහස දුරු වී දුරින් භූත වී ගියේ ය. ළමුන් අතර කුමක් හෝ ආරවුලක් මත බේදයක් සිදු වී ඇතැයි ඊ ළඟට ඔහු අනුමානකළේ ය. එහෙත් එවැන්නක් වී නම් ඒවා ඔවුන්ට ම විසදා ගැනීමට ඉඩ දිය යුතු විනා ඒවාට ඇඟිලි ගැසීම

නො හොබිනා කටයුත්තකැයි ලුෆී මහතා තීරණය කොට ගත්තෙන් ඔහු නිහඬ වූවේ ය.

ලෙමන් ජූස් පානයෙන් ඉක්බිති ව දිවා ආහාරය නිමා කළ ඔවුහු පිගන් කෝප්ප සේදීමේ කටයුත්තෙහි මද වේලාවක්නිරත වූවෝ ය. එය ඉතා උනුසුම් දිනයක් වූවෙන්කාට කාටත් නිරන්තරයෙන් පිපාසය දැනෙන්නට පටන් ගත්තේ ය. ඈන් විසින් ටිමියාට ද දිය බීම සඳහා දිටය බඳුනක් වෙන් කොට ත්බන ලදී.

" හොදයි ළමයි " ලුෆී මහතා කතාව ආරම්භකළේ ඔහුගේ දුඹුරු පැහැ පයිප්පය පුරවා ගනිමිනි." ඉතින්කාට හරි ඕනි නම් අද හවස ටවුමට ගිහිල්ලා එන්න තව විනාඩි පහළොවක් යද්දි සූදානම් වෙලා ඉන්න ."

" මමත් එනවා" යි ඈන් එක් වර ම කීවා ය. " මේ වා හෝදන්න වැඩි වෙලා යන එකක් නෑ. ජෝර්ජ් ඔයත් එනව ද ?"

" මට බෑ ' යි ජෝර්ජ් එක්වර ම විරුද්ද වූවා ය එය ම පිරිමි ලමුන් දෙදෙනා තුළ ඇතිකළේ සැනසුමකි. සහනයකි. කියාවත් කර ගන්නට බැරි කටයුතෙක් ඉබේ ම සිදු වී තිබේ. ජෝර්ජ් ගවේශන කටයුතු සදහා ඈදා ගන්නට ඔවුන් දෙදෙනාට කිසිසේත් ම වුවමනාවක් නැත.

" මම ටිම් එක්ක ටිකක් ඇවිදින්න යනවා . " ජෝර්ජ් වැඩි දුරටත් කියා සිටියා ය.

" හරි එහෙනම් " යි ඈන් කීවා ය . සැර පරුශ ජෝර්ජ් නැති විට සහනශීලී සැදෑවක් ගත කළ හැකි අනු ඈතැයි ඈයට සිතුණි. " පස්සෙ හම්බෙමු එහෙනම් ජෝර්ජ් .ගුඩ් බායි "

ජෝර්ජ් හා ටිමී පිට ව ගිය ඉක්බිති ළමෝ ලුෆී ද පෙරටු කොට ගනිමින් කාරය නවතා තුබූ ඉසව්වට පිය නැගූහ.

" තාමත් ටේලර් එක එල්ලලනෙ " ජුලියන් කතා කරනට විය." සර් චුට්ටක් ඉන්න .අපි ටේලර් එක ගලොමු. නිකන් මොකට ද ඒකත් ඇදගෙන යන්නෙ "

" ඔන්න බලන්නකො ඒකෙත් හැටි. මට තාමත් ඕක ගලවන්න නිච්චියක් නැති වුනානෙ. ඇත්තට ම මම ඕකත් නිකරුනේ ඇදගෙන් ගමන් බිමන් කීයක් නම් ගියාද ?"

dileep

ජුලියන් සෙස්සන් දෙස බලා ඇසක් ඉගි මැරුවේ ලුෆි මහතට නො පෙන්නෙට ය. ආදර්ණීය මේ ලෝකේ නැති ලුෆී උන්නැහේ. ඔහු කවදවත් එහෙම ය. වැඩ කටයුතු කරන්නේ මෙලෝ සිහියකින් නම් නො වේ.

කාරය ටේලරය උනා දමා ගැස්සෙමින් පැද්දෙමින් වේගවත් ගමනක යෙදී කුඩ ටවුමකට සේන්දු විය. ටච්යිම මැද එය නවත්වන ලද අතර ලුෆී මහතා කතාව පටන් ගත්තේ ය.

" මට පුස්තකාලෙට යන්න ඕන ළමයි. පහට විතර අර ජේන හෝටලයට ඇවිත් ඉන්න . අපි ඒකෙන් තේ බීල ආපහු කූඩාරම් අලට යමු "

ලූෆී මහතාට රිසි සේ පුස්තකාලයට වැදෙන්නට ඉඩ දී ළමුන් ස්වේශම දෙසට ඇවිද යන්නට විය. ජෝර්ජ් ඔවුන් හා නොසිටීම සම්බන්දයෙන් නම් ඈන් තුල නම් ඒතරම් මනපයක් නො තිබි බව සදහන් කළ යුතුවැ තිබේ.

" අපිත් ජෝර්ජ් හිටිය නම් කැමතියි තමයි ඈන්. ඒත් නිකන් හිතන්නකෝ. එයා තේරුම් ගන්න ඕන ඒ වගේ හැසිරෙනවට අපි කැමති නෑ කියලා. අනික දැන් ම ඕව හද නො ගත්තොත් තව ටිකක් ලොකු මහත් වුනා ම එයා ලොකු අමාරුවක වැටෙන්නට පුලුවන් " ජුලියන් ඈන්ට කීවේ ය.

" ඒත් ජුලියන් ඔයා දන්නවනෙ ජෝර්ජ් අබිර්හස් විසදන්න මොන තරම් කැමතිද කියලා පව් කෙල්ල. මම අර උමග ඇතුලට යන්න බය නොවී හිටිය නම් ඔයා ජෝර්ජ්වත් එක්කන් යනවනෙ. සේරම උනේ මං නිසා. ඇත්තට ම ඒකි හරි. මං මහ තොත්ත බබෙක්."

" නෑ ඔයා එහෙම නෑ " යි ඩික් විරුද්ද වී ය." එහෙම බය හිතෙන එක ස්වාබාවිකයි.ඒක වැද්දක් නෙමේ. අනික අපිත් ඔයාගෙ වයසෙදි ඔය වගේ ම බය වුනා ඈන්. එහෙම වෙන්නෙ තොත්ත බබෙක් වගේ හැසිරෙන නිසා නෙමේ. ඔයාගෙ වයසෙදි ඔයා තරමට බය ඇති කෙල්ලෙක් මං දැකල ම නෑ "

" ඉතිං අපි මේ කොහාට ද යන්නෙ ?" යි ඈන් ඊ ළගට ඇසුවා ය. පිරිමි ලමුන් දෙදෙනා ඔවුන්ගේ අරමුණ ඈට කියූ පසු ව ඇගේ ඇස් සතුටින් දිලෙන්නට විය.

dileep

" නියමයිනෙ. ඒ කියන්නේ අපි යන්නේ භූත කෝච්චි එන්නෙ කොහෙන්ද කියලා හොයා ගන්න . සිතියමට අනුව ඒක එන්න පුලුවන් අර නිම්නයන් දෙකෙන් එකක ඉදල "

" ඔව්.. අනික් එක ඔය උමං දෙක ම ඒ තරම් දුරට විහිදෙන උමං නෙමේ. මම නම් හිතන්නේ හැතැම්මක් වත් දිග නැතුව ඇති. අපිට ස්ටේසමේදි කවුරු හරි හම්බුනොත් පරණ කෝච්චි පොල ගැන දන්න කියන අනිවාරෙන් මොනව හරි හෝඩුවාවක හොයා ගන්ට පුලුවන්. හැබැයි මතක තිය ගන්න. අපි භූත කෝච්චි ගැන නම් වචනයක් වත් කියන්න හොද නෑ එයාලට "

අවසනයේ ළමෝ නගරයේ කෝච්චි පොළ කරා පැමිණියහ. බඩු මලු රැසක් අදිමින් හුන් තරුන පෝටර්වරයෙකු දුටු ජූලියන් ඔහුට කතාකළේ ය.

dileep

" අහන්න. ඔයාට පුලුවන්ද අපිට උදව්වක් කරන්න. අපි කදවුරු ගහන් ඉන්නෙ කදුකරයෙ. අපි ඉන්න කිට්ටුව තියෙනව අතෑරල දාපු කෝච්චි පොලක්. ඇයි ඒ කෝච්චි පොළ දැන් අතෑරල දාල තියෙන්නෙ ?"

" මං නම් ඕව ගැන දන් නෑ ඉතින් " යි කොල්ලා ගත් කට ම කියා දැම්මේ ය." ඒත් ඔයාලට තොරතුරක් දැන ගන්න ඕන නම් ගිහින් නාකි ටකී හම්බෙන්න. එයා ඕව ගැන දන්නව නිකන් අල්ලෙ තියෙන රේකා වගේ. මොකද මිනිහාකොල්ලකාලෙ ඉදන් ම ඔය තැන් වල වැඩ කරල තියෙනවනෙ "

" බොහොම ස්තූතියි " ඩික් කියා සිටියේ ප්‍රීතියෙනි. අච්ච තපිමින් ඊ ළග කෝච්චිය පැමිණෙන තුරු විවේක ගනිමින් හුන් මහලු පෝටරවරයෙකු වෙත ඔවුහු පැමිණියෝ ය.

" එක්ස්කියුස් මී සර් " යි ජූලියන් ආචාරශීලී අයුරෙන් කියන්නට විය " අපිට කෙනෙක් කිව්ව මේ කදුකරයේ තියෙන සේරම උමං දුම්රිය පාරවල් ගැන එහෙම සර් තරම් දන්න කෙනෙක් මේ පළාතෙවත් නෑ කියල. අපි හරි ආසයි ඒ ගැන දැන ගන්න "

මහල්ලා ළමුන් දෙස බලුවේ සිනා පිරි මුහුණෙනි. පුරාජේරුවක් ගසන්නට කෙනෙකු හමු වීම සම්බන්දයෙන් ඔහු සැබැවින් ම ප්‍රීති වන්නට ඇත. අච්චට නිලන්කාර ව ගිය දෑස් පිසලා ගනිමින් හේ කතාව පටන් ගත්තේ ය.

dileep

" මගේ තාත්තයි සීයයි තමයි ඔය උමං නිර්මාණය කරේ . මම ඔය හැම තැනක ම හැම කෝච්චියක ම වගේ ගඩ් කෙනෙක් විදිහට ඉදල තියෙනව "

නම් රැසක් කියමින් උමං හදුන්වා දෙමින් ඔහු දිගින් දිගට ම කියැවූවත් කිසිදු අණඩර දෙමළයක් ඔවුන්ට නො වැටහුණු තරම් ය. ඒ කතා අවසන් වන තුරු ලමුන් බලා සිටියෙ සගවා ගත් නො ඉවසිල්ලෙනි .

" අපි කූඩාරම් ගහල තියෙන හරියෙත් තියෙනව කෝච්චිපොළක් " යි ජූලියන් අවසානයේ කතාවට බැස්සේ ය." අපේ කූඩාරම තියෙන්නේ ඔලීගෙ ෆාම් එක කිට්ටුව. ඉතින් ඒ හරියෙ තියෙන කෝච්චි පොළෙත් තියෙනව බිම් ගෙයක්. ඔයා දන්නව ද ඒක කොහාට ද යන්නෙ කියල "

" ආ.. ඔව් ඔව්... මොකෝ ළමයෝ මට බැරි .... ඒකත් පරන කෝච්චි පොලක්. පරණ උමගක්.. මං හිතන්නේ සෑහෙන කාලෙකින් පාවිච්චි කරලා නම් නෑ ඕක. ඉස්සර ඕක බොහොම කායී බහුල තැනක් වෙලා තිබ්බා. ඒත් අන්තිමට ආණ්ඩුවෙන් ඕක වහල දැම්මා. මං හිතන්නේ ඒ නිසා දැන් නම් ඔය උමං එහෙම කිසිම පල පොරෝජනයක් නැතුව ඇති "

ළමෝ එකිනෙකා දෙස රහසිගත බැලුම් හුවමාරු කොට ගත්හ.

" උමග තවත් උමගකට සම්බන්ද වෙනව ද ?"

පෝටර්වරයා ජුලියන් දෙස බැලුවේ බදා වැළද ගන්නට තරම් ආදරයෙනි. ඇත්ත වශයෙන ම ළමුන්ගේ ප්‍රශ්න කිරීම් ඔහු තුළ ඇතිකලේ නො මද සතුටකි. පසු පසින් පිහිටි කායීාලය කරා ඔවුන් කැදවා ගෙන ගිය හේ භාවිතා කිරීමෙන් ම දුර්වර්න ව ගිය පැරණි විශාල සිතියමක් පිත්ටට ගත්තේ ය. එය දෙදන මත එලා ගත් ඔහු කතාව පටන් ගත්තේ අගිල්ල සිතියම මත තබමින් කරුණු කාරණා වැඩිමනත් හොදින් ළමුන් තිදෙනාට තේරුම් කොට දෙමිනි.

" මේ තියෙන්නේ ඔයාල ඔය කියන ඔලීගේ කෝච්චි පොළ. ෆාම් එක ගොඩ නැගුවට පස්සෙ තමයි ඒක එ නමින් හදුන්වන්ට පටන් ගත්තෙ. මේ තියෙන්නෙ ඔය කියන බිම්ගේ. මෙන්න මේ හරියෙදි ඒක දකුණු පැත්ත්ට හැරෙනව. ,මේ උමග තියෙන්නේ කිල්ටි මිටියාවතට . මේ තියෙන්නේ ඒක .එතකොට මේ මෙතනින් වම් පැත්තට ගිහින් තියෙන අනික් උමග යන්නේ රෝකර්ස් මිටියවතට .ඒත් ඔය රෝකර්ස් මිටියාවතට යන උමග කාලෙකට ඉස්සර ගරා වැටුණා. මං හිතන්නේ මොකක් හරි හේතුවක් නිසා වහලෙ ම කඩා වැටෙන්න ඇති. "

ලමුන් අසා සිටියේ ඇහි පියන් පතක් හෝ නොහෙලා ඉමහත් උනන්දුවෙනි. ජුලියන් කාරණා කාරණා ඔහුගෙ මනසට ඒත්තු ගන්වන්නට වූවේ ය." එහෙනම් කිල්ටි මිටියවතේ ඉදන් තමයි භූත කෝච්චි එනව ඇත්තෙ. රෝකර්ස් මිටියවතට යන උමග කඩා වැටිල නිසා කීයට වත් ඒ පැත්තෙන් කෝච්චි එන්න විදිහක් නෑනෙ "

" ඒ කියන්නේ සර් ඔලීගෙ යාඩ් එකට කෝච්ච්චියක් එනව නම් එන්න පුලුවන් කිල්ටි යාඩ් එකෙන් විතරයි නේද් ?" ජුලියන්ට එක් වු ම ඇසුණේ උන්හිටි තැන් අමතක ව ගිය ලෙසිනි. එවර නම් මහල්ලා නාසයෙන් පිඹ කෝපයට පත් හඩක් නැගුවේ ය. අනික් අතට සංසුන් වූවාක් මෙන් කතා කරන්නට පටන් ගත්තේ ය

dileep

" ඇයි දැන් මං මෙච්චර වෙලා ඔයාලට කියපු දේ ඇහුණෙ නැද්ද? මොන ම හේතුවක් නිසා වත් ඔය කෝච්චි පොළ දැන් පවිච්චි කරන්නේ නෑ. ඒක වහල දාලයි තියෙන්නේ. මම තරුණකාලෙ ඉදන් ම ඒක එහෙම යි "

මහලා කි කරුනු සියල්ල අ ඔවුන් තුළ ඇතිකළෙ නො අද උද්යෝග්ගයක් බැව් අමුතුවෙන් කිව යුතු නො වේ. ඊට අමතර ව පෝටර්වරයා විසින් දෙන ලද පැරණි සිතියම ද ස්තූති පූර්වක ව බාර ගත් ඔවුහු යළිත් වතාවක් ඔහුට ස්තූති කොට එතනින් පිතටට පැමිණියෝ ය.

නගරයට පැමිණි පසු කුඩා උද්‍යානයක් දක්නට ලැබුණෙන් එහි ඇතුලු වී වාඩි ගත් ඔවුහු ටකී විසින් පවසන ලද දෑ යළි යලිත් සාඛච්ච කරන්නට වූහ.

" මාර අමුතුයි " යි ඩික් කීවේ ය " දැන් කෝච්චි යන්නෙ නැලු. අවුරුදු ගාණකින් පාවිච්චි කරල නැලු ..."

" ඒ වුනාට කෝච්චි එනව පේනව අතුරුදන් වෙනව "

"ඉතිං ඒව ඇත්තම හොල්මන් කෝච්චි වෙන්නත් පුළුවන් " බියෙන් ඇලලුණු මුහුණින් ඈන් කීවා ය " ජුලියන් ඔයා හිතන් නැද්ද ඒව ඇත්ත ම ඇත්ත ..."

" භූත කෝච්චි වගේ පේන බහුබූත කෝච්චි .. මටත් තේරෙන්aන් ඒ මෙතන තියෙන අබිර්හස මොකක් ද කියල '

" ජූ.. මං දන්නව කරන්න ඕන මොකක්ද කියල අපි රැක යාඩ් එකට යමු. ගිහින් භූත කෝච්චිය එනකන් බලන් ඉමු. අපෙන් කෙනෙක් ට පුලුවන් උමගෙන් නැතු ව අනික් පැත්තෙන් කිල්ටිගේ මිටියාවතට ගිහින් බලන් ඉන්න. ඕන හැතැම්මක් දුර ඇති. එතකොට අපිටහොයා ගන්න පුලුවන් භූත කෝච්චිය නටන භූත කෙළියෙ තේරුම මොකක් ද කියලා "

" නියමම අදහස ඩික්. ජොක් ආවොත් අද රෑට ම වැඩේ කරන්න පුළුවන්. මොකට ද නිකන් කල් යව යවා ඉන්නෙ . උගට එන්න බැරි වුනොත් උඹයි මයි යමු. හැබැයි ජෝර්ජ් නම් ඕන නෑ "

ලමුන් පෙරළා කදවුරට පැමිණෙන විටත් ජෝර්ජ් පැමිණ සිටියේ නැත. ඇගේ පැමිණීම අපේක්ෂාවෙන් බොහෝ වේලාවක් බලා ඉන්නට ඔවුනට සිදු විය . අන්තිමේ දී ටිමී ද සමගින් ඈ මතු වූ අතර ඔවුන්ගෙන් පළ වුනේ දැඩි එහෙසට පත් බවකි.

dileep

'' සොරි මං උදේ හැසිරුනෙ හරි ම ඔලමොට්ටල විදිහට " ඈ පැමිනි වහා ම ජුලියන් හමුවේ කියා සිටියා ය ." මම සෑහෙන දුරක් ඇවිද්දා. මගෙ කේන්තිය ටික ටික අඩු වෙද්දි මට කරපු බූරුකම තේරෙන්න පටන් ගත්තා "

" මොකාට ද ඒ පාර එන්න හදන්නේ ?" යි තමාට ම කියා ගත් ජුලියන් " දැන් ඒව සේරම හරි . ඕක අල්ලලා දාන්න " යි ද කීවේ ය .

ජෝර්ජ් තම කෝපය ආසා නාසි ගතිය නාහෙට නාහන කුකුල් කේන්ති සෙයියාව නැති කොට ගෙන තිබීම කා තුළත් එතිකළේ ප්‍රීතියකි. සතුටකි .එහෙත් ඔවුන්සොයා ගත් කිසිවක් ඈ සමග කියා භූත කෝච්චි අබිරහසට ඈ හවුල් කොට ගැනීමේ අදහසක් නම් කාටවත් තිබුණේ නැත.

dileep

රාත්‍රිය අලංකාරවත් එකක් විය. අහස පුර විසිරුණු තාරකා එලියෙන් මුලු භූමි බාගය ම එක සේ නැහැවෙමින් තිබිණ. රාත්‍රී දහය පමන වන තුරු අවදියෙන් සිටි ඔවුහු ලූෆී මහතාට සුබ රත්‍රියක් පතා අවසානයේ නිදන බෑග් තුලට වැදුනහ. මැදියම් රාත්‍රිය එලබෙන තුරු කෝච්චි පොළ කරා යාමේ අදහසක් ජුලියන් හා ඩික් තුල නො වූයෙන් ඔවුන් දෙදෙනා පමණක් අවදියෙන් සිටියහ.

කූඩාරමට පිටින් කිසිවෙකු චලනය වන හඬක් , සර සරයක් ඇසෙන විට රාත්‍රී එකොළහ පමණ වී තිබුණි. ඒ ජෝක් විය යුතු යැයි මුලදී ඔවුනට සිතුනත් ජෝක් කතා කරන හඬක් නැසුණෙන් ඒ ඔහු විය යුතුය යන අදහස බැහැර කොට

දමන්නට ඔවුනට සිදු විය.එසේ නම් මැදියම් රැයේ කදවුර අසල හොල්මන් කරන භූතයා කවුරුන් විය හැකි ද ?

තරු එළියේ පිහිටෙන් දන්නා හඳුනන හිස් ගෙඩියුඅක් ජූලියන් දැක ගත්තේ එවිට ය. ඒ අන් කිසිවෙකුත් නො ව ජෝර්ජ් ය. ඈ පිරිමි ළමුන්ගේ කූඩාරම අසලට වී යක්කු ගස්නගින්නට සැරසෙන මේ මොහොතේ කරමින් සිටින්නේ කුමක් ද /

හොර බලල් සෙයියාවෙන් මද වේලාවක් කූඩාරම අසල ගත කළ ජෝර්ජ් ඉන් පසුව නො පෙනී ගියේ ය. තවත් මද වෙලාවක් ගත වෙන්නට ඉඩ හැර ජූලියන් කූඩාරමෙන් පිතටට එබී බැලූ අතර ඈ කරමින් හුන් කටයුත්තද වහා අවබෝද කොට ගත්තේ ය.

dileep

" ජෝර්ජ් මරු වැඩක් කරලා ඩික්. ඒකි අපේ ටෙන්ට් එකේ දොර ගාවින් ලනු පොටක් ඇදලා.සුවර් එකට ම ඒකෙ අනික් කෙලවර ඕකිගෙ මහපොට ඇගිල්ලේ බැදගෙන ඇති. අපි ගියොත් අපි ලනුවෙ පැටලිලා ඒකිගෙ කකුල ගැස්සෙයි කියලා හිතන් ඇති. එතකොට අපේ පස්සෙන් එන්න පුලුවන්නේ "
\

" ජෝර්ජ්ට මොළේ තියෙනවා " යි ඩික් හිකි හිකි ය වලක්වා ගත්තේ අසීරුවෙනි " හැබැයි කොච්චර මොලෙ තිබ්බත් අවාසනාවත් ඒ ගානට ම තියෙනවා. අපි ඕකට යටින් රිංගලා යමු ගැවෙන්නේ වත් නැති ව "


ඉතින් ඒ මැදියම් රාත්‍රියේ මොන තරම් දේවල් සිදු වුනත් , කොල්ලන් දෙදෙනා මොන විදිහේ අද්දැකීමකට මුහුණ දුන්නත්

ආරම්භයේදී අම් ඔවුන් දෙදෙනා ජෝර්ජ්ගේ කඹ විජ්ජාව යන්තමින් හෝ බාදවක් කොට ගත්තේ නැත .

ඔවුන් දුම්රිය පොල කරා පැමිණෙන විටත් සෑම්ගේ මඩු ව තුල දැල්වෙන ඉටි පන්දම නිවී තිබුණේ නැත. ඒ අනුව භූත කෝච්චිය තවමත් නො පැමිණි බැව් ළමුන්ට සහතික ය.

කෝච්චි පොළට බසිනවාත් සමග ම කෝච්චියක් පැමිණෙන විට නැගෙන ගුරු ගුරු හඬ ළමුන්ට ඇසෙන්නට පටන් ගත්තෙන් ඔවුහු වහා සූදානම් ශරීරයෙන් සිත් දැඩි කොට ගත්හ. ඒ හාත් සමග ම කිසිදු ආලෝකයකින් තොර ව නලා වාදනයකින් තොර ව ගොර ගොර හඬ නගමින් භූත කෝච්චිය බිම් ගෙයින් පිතටට පැමිණෙමින් තිබෙනු ඔවුන් විසින් දර්ශනය කරන ලදී

dileep



" වැඩේ පටන් ගමු ඩික්... " යි ජූලියන් ගහෙන හඬින් කෑ ගාන්නට විය ." මම ඉක්මනට කිල්ටිගේ කෝච්චිපොළට දුවන්නම්. උබ මෙතන ඉදන් බලාගෙන හිටපං. අපි බලමු කොච්චියිට මොකක්ද වෙන්නේ කියලා. කොහොමද ඒක අතුරුදන් වෙන්නේ කියලා "

තවත් මොහොතකදු පමා නො වූ ජූලියන් මුවෙකු මෙන් වේගයෙන් කිල්ටිගෙ කෝච්චි පොළසොයා දුවන්නට විය .

dileep

## o14 ජෝක් කදවුරට පැමිණෙය

මාර්ගය සොයා ගැනීමේ අපහසුවක් ජූලියන්ට නො වූයෙන් ඔහු වේගයෙන් ගමන් කරන්නට පටන් ගත්තේ ය. මාර්ගය පාලුවට ගොස් තිබූ බැවින්දෝ කිසිවෙකු මුන ගැසේයැයි බියක් ද ඔහු තුළ තිබුනේ නැත. දෙපාරක් නොසිතා විදුලි පන්දම දල්වා ගත් ඔහු තන් තන්හි විසිරුණා වූ තණ පඳුරු හා ගස් මුල් සාර්ථකව බැහැර කරමින් ඉදිරියට ඉදිරියට ඉදිරියට ම ගමන් ගනිමින් සිටියේ ය

" එදා වගේම කෝච්චිය විනාඩි විස්සක් විතර යාඩ් එකේ නවත්තල තිබුණොත් මට හොඳට ම වෙලාව ඇති වෙයි " යි හතිලන අතර ඔහුට සිතිණි. " ඒක ආපහු එන්ඩ කළින් මට කිටීගෙ යාඩ් එකට යා ගන්ට ලබේවා"

එක් වර ම මඩු කිහිපයක් කොලුවාට දක්නට ලැබුණේ මෙ පරිද්දෙන් බොහෝ වේලාවක් ගමනේ යෙදුණාට පසුව ය. ඒ හා ම මහලු පෝටර්වරයා කී කරුණෙක් ඔහුගේ සිහියට නැගිණි. " කිල්ටිගෙ යාඩ් එක දැං පාවිච්චි කරන්නෙ වෙනත් කට යුත්තකට. සමහර විට රේල් පීලි පවා දැං ගලෝල දාල ඇති" කඳු පහලට රූටා යමින් තාරකා එළිය පස්චාත් භාග කොටගත් මඩු පෙළ අලුතෙන් ඉදි කරන ලද ගොඩ නැගිලි සමූහයක් බව ජූලියන් අවබෝද කොට ගත්තේ ය. ඇතැම් විට මේවා වැඩ පොළවල් විය හැකි යැයි ද ඔහුට සිතුණි. කාගේ හෝ ඇස ගැසීමක් සිදුවේ යැයි බියක් ඒ හා ම හිතට පිවිසියෙන් ඔහු විදුලි පන්දම වහා නිවා දැම්මේ ය. එහෙත් රේල් පීළි යුගලයක් තාරකා එළියේ උපකාරයෙන් දැක බලා ගැනීමට ඔහුට හැකියාව ලැබුණු බව නම් සඳහන් කළ යුත්තකි. මළ බැඳීමෙන් දුර්වර්ණව පැවති ඒ පරණ රේල් පීලි විහිදෙන්නේ බිම් ගෙයට බව අවබෝද කොට ගැනීමට නම් ඔහුට අපහසු වූවේ නැත.

රේල් පීලි ඔස්සේ මද වේලාවක් ගමන් ගත් ඉක්බිති කොළුවාට අඳුරින් වැසී ගිය බිම් ගෙයහි මුවදොර දක්නට ලැබුනේ ය. පණ

dileep

ඇති කිසිවෙකුගේ හඬක් අසන්නට නො ලැබුණෙන් විදුලි පන්දම දල්වා ගැනීමේ අභියෝගය ද ජූලියන් ඉත සිතින් බාර ගත්තේ ය.

බිම් ගෙයේ මුවදොර අඳුරින් පිරී ඇති විසල් විවරයකි. කුට්ටි කැපිය හැකි තරම් වන අඳුරේ අලියෙකු සිටිය ද නො පෙනෙන තරම් ය.  බිම් ගෙයි බිත්ති ඉදි කොට තිබුණේ ගඩොලිනි. බිත්තිය අද්දරින් වකුටු වී ගනිමින් පිට බිත්තියට තබාගෙන ඉදිරියට ගමන් කළ යුතු යැයි හේ තීරණය කොට ගති.එක් වර ම ගඩොළින් බඳින ලද කුඩා කුටියක් බඳු යමක් ජුලියන්ට දක්නට ලැබිණ. කුටියක් යැයි සඳහන් කළ ද එය කුටියක් ම නො වේ. කුඩා ගුලක් බඳු ඉඩකි. අතීතයේ දුම්රිය පැමිණෙන විට බිම් ගෙයි රාජකාරී කටයුතුවල නියලුනන් හට එයින් ඈත් වීම සඳහා ඉදි කරන ලද්දකි. හදිසියේ උපන් අදහසක් හේතු කොටගෙන ජුලියන් එකී කුටීරයට රිංගා ගත්තේ ය.හදිසියේ ම වේලාව පිරික්ශා බැලූ හේ තමා මිනිත්තු විස්සක් ගත කොට තිබෙන බවක් අවබෝද කොට ගත්තේ ය. මේ වන විටත් භූත කෝච්චිය පෙරළා පැමිණෙමින් තිබිය යුතු ය. ඩික් කෝච්චියේ බලා කියාගෙන  සිටිනු ඇත. ඇත්ත වශයෙන් ම මෙවන් අවස්ථාවක ඉවසිල්ලෙන් බලා සිටීම ලෙහෙසි පහසු කටයුත්තක් නො වන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නො වෙ.

dileep

ජූලියන් ගැහෙන හදින් බලා සිටියේ ය. ඇස් දල්වා බලා සිටියේ ය. එක් වර ම ඈතින් උමග ඔස්සේ කෝච්චියක් පැමිණෙන හඬ ශ්‍රවණය වන්නට වූවෙන් ඉහළට ගත් හුස්ම පහළ නො හෙළා ඔහු බලා සිටියේ ය. එහෙත් ඒ වූ කළී හුදු හිතලුවක් පමණක් බව අවබෝද කරලමින් භූත කෝච්චිය තබා නිකන් කෝච්චියකුදු නො පැමිණියේ ය. වේලාව ගත වෙමින් තිබෙන්නේ ය. දැං පැය භාගයක් ම ගෙවී ගොස් හමාර ය.

එහෙත් කෝච්චිය තවමත් නැත. සැබැවින් ම කෝච්චිය අතරමගදී වාශ්ප වී ගියාක් වැන්න.

" තව විනාඩි දහයක් බලමුකෝ. ආවෙ නැත්තම් මං යනව. එන් නැති කෝච්චියක් වෙනුවෙන් මේ කරුවලේ පාලු උමගක බකන් නිලා ඉන්ඩ බෑනෙ. සමහර විට අද රෑ කෝච්චිය ඔලීගෙ ස්ටේශමේ ම නවතිනව ද දන්නෙ නෑ." ජූලියන් තමාට ම කියා ගත්තේ ය.

මිනිත්තු දහය ද ගෙවී ගියේ ය. බලා සිටීමේ කටයුත්ත අතෑර දැමූ ජූලියන් කිල්ටිගේ දුම්රිය අංගනය වෙත පෙරළා පැමිණ ආ මග ඔස්සේ ආපසු යන්නට පටන් ගත්තේය. තම මලයණ්ඩිය මුණගැසීමේ වුවමනාව වඩාත් තදින් දැනෙන්නට වූවෙන් ජුලියන් වඩ වඩාත් පය ඉක්මන් කළේ ය.ජුලියන්ගේ පැමිණීම අපේක්ෂාවෙන් ඔහුද නො ඉවසිල්ලෙන් බලා සිටිනා බව ඔහුගේ සිතට දැණින.

dileep

ඇත්ත වශයෙන් ම ඩික් ද වෙහෙසින් ද නො ඉවසිල්ලෙන් ද ඇස් දල්වා බලා සිටියේ ය.එක් වර ම විදුලි පන්දම් එළියක් නෙත ගැටී කළබල වූ අතර ඒ ජුලියන් බව හඳුනා ගැනීමත් සමග ඔහුට ඇති වූ සතුට නිම් හිම් නැති එකක් විය.

" තමුසෙ ගිහින් සෑහෙන වෙලාවක් ගත්තනෙ.මොකද වුනේ. භූත කෝච්චිය ආපිට ගිහින් සෑහෙන වෙලාවක්. ඒක නැවතිලා තියෙන්නෙ මිනිත්තු විස්සක් විතරයි කියල අමතක ද?"

" කෝච්චිය ආපිට ගියා ? " ජුලියන් මවිත වීය. " ඔය ඇත්තම ද ? මම පැය ගාණක් තිස්සෙ බලං හිටියනෙ. කෝච්චිය ආවෙ නෑ බං. "

ඩික් ද අන්දුන් කුන්දුන් වී දෑස් ඉහ ඉන්දුවා ගත්තේ එවිට ය. කෝච්චියට සිදුවූවේ කුමක් දැයි අහස පොළව ගැටලමින් කල්පනා කරන්නට පටන් ගත්තේ ය.

" පොතේ හැටියට නම් කෝච්චිය ආපහු එන්ට ඕනි. ඒත් ඒත් ඉතින් ආවෙ නෑනෙ. එක්කෝ අර අනික් උමග පෝටර් කිව්ව විදිහට කඩා වැටිලා නැතුව ඇති. කෝච්චිය යන්න ඇත්තෙ ඔය කීව උමගෙන්"

" ඔව් ඔව් ඒම වෙන්න ඕන. හැබැයි ඉතිං කෝච්චිය ඇත්තට ම හොල්මන් එකක් නො වෙයි නම් " එවර නම් ඩික් කීවෙ තැති ගත් හඬිනි. ගින්නක් නැතිව දුමක් නගින්නේ නැතැයිදැන් දැං ඔහුට සිතෙන්නේ ය. අස්වාභාවික බොහොමයක් දෑලෝකයේ නොතිබිය හැකි යැයි සිකුරට ම කීමට දැං දැන් ඔහුට නො හැකි වීගෙන එන ලෙසකි. " කොයි කටත් අපි දැං උමග දිගේ ටිකක් ඇවිදලා බලමුකෝ. නෑ එක්කො දවල් වෙලාවක ඒ වැඩේ කරමු. අද රෑට මේ හොඳට ම ඇති බං"

ජුලියන්ට ද දැනෙන්නේ ඔහු කීවාක් මෙන් අදට මේ ඇති හැඟීමකි. එ බැවින් නිහඬ බව රැක ගනිමින් ම ඔවුහු පෙරළා කඩවුරට වැදුනහ.එහෙත් සිදු වූවේ අනපේක්ෂිත සිදුවීමකි. ජෝර්ජ් විසින් පයේ පටලවා ගත් කඹය මග හරින්නට නිච්චියක් නිනව්වක් ඔවුන් දෙදෙනාට තිබුණේ නැත. කොල්ලන් දෙදෙනා යළිත් නිදන බෑග් කරා එළඹිය ද ජෝර්ජ් උඩ විසිවී ගොස් අවදි වූවා ය. ටිමී සිටියේ කොහොමටත් අවදියෙනි. පිරිමි ළමුන් දෙදනා ආපසු පැමිණි බව අවබෝද කොට ගන්නට කබයක් පයේ ගැට ගසා ගැනීමේ අවශ්‍යතාවයක් උෟට නැත. උෟ ජෝර්ජ් ලෙව කා ගුඩ් නයිට් කීවේ ය. ජෝර්ජ් වහා අවදි වූවා ය.

නිදන ඇඳුමින් ම පිතටට බට ජෝර්ජ් පිරිමි ළමුන් දෙදෙනා අතට ම අල්ලා ගැනීමට කඩිනමින් සැරසී ගත්තා ය. දැං ඇයට ඔවුන් දෙදෙනා පසු පසින් යා හැකි ය. ඈ තනි හිතට සිතා ගත්තේ එහෙම ය.

dileep

එසේ වුවද පිරිමි ළමුන් දෙදනාගේ කූඩාරමින් කිසිදු හාවක් හූවක් නෑසුනෙන් ඈ හොර බළල් සෙයියාවෙන් ඔවුන්ගේ කූඩාරමට රිංගා බලන්නට විය. මැදියම් රෑ සවාරිය හේතු කොටගෙන පිරිමි ළමුන් දෙදෙනා සිටියේ ගැඹුරු නින්දක ය. ජුලියන් ඒ අතර ගොරවමින් ද සිටියි. ගැඹුරින් ආශ්වාස ප්‍රාශ්වාස කරන්නේ ඩික් ය. එහෙත් කඹය පය කඩා යන තරම් වේගයෙන් ඇදුනු බවට ඈට සැක නැත. ජෝර්ජ් ප්‍රහේලිකාවකට පත් වූවා ය.

කෙසේ වෙතත් ඉක්බිති දින උදෑසන කාට කාටත් දක්නට ලැබුණේ පුපුරන ජෝර්ජ් කෙනෙකි. දෙවෙනි වතාවටත් ජෝර්ජ් රැවටීමට ලැබීම සම්බන්දයෙන් , සහ මුලින් ම ගොගොනාට ඇන්දවීම සම්බන්දයෙන් ඩික් පස්වනක් ප්‍රීතියට පත් වැ සිටියේ ය.

dileep

" අනේ බං ජෝර්ජ්.. අපි උඹේ උප්පරවැට්ටි වලට අහු වෙන් නෑ. අපි අර කඹෙන් රිංගලා අපේ ගමන ගියා. ඒත් ඉතින් එද්දි නම් ඕක අමතක වුනා. අනිවාරෙන් ම උඹ කඹේ අනික් කෙරෝල කකුලෙ බැඳගෙන ඉන්න ඇති. පව් අප්පා. කකුල රිදුන ද?"

සමච්චල්කාරී හඬින් ඩික් කියා සිටියේ ජෝර්ජ් තව තවත් කෝප ගන්වමිනි. සියල්ල දෙවනත් කරමින් කෑම පිඟන් සීසීකඩ විසුරුවා උදා ආහාරය ගුවන් ගත කොට යකා නැටීමට පවා දැන් දැං ජෝර්ජ්ට සිතෙමින් තිබේ. මොකක්දෝ වාසනාවකට ජෝක් ඒ මොහොතේ පාදූර්භූත නො වෙන්නට එවැන්නක් සිදුවීම නැවතිය හැක්කක් නො වන්නට ඉඩ තිබූ බව නම් සඳහන් කළ යුතු ම ය.

" හලෝ ජෝක් " යි ජුලියන් ජෝක් දෙස බැලී ය" උඹත් ආවෙ නියම ම වෙලාවට. අපි කන්න පටන් ගත්තා විතරයි. අපිත් එක්ක ම කෑම ටිකක් කමු "

" මට වෙලාවක් නෑ ජුලියන්. මං ඉක්මනට ආපහු යන්න ඕනි. අහන්න. මට කියන්න දෙයක් තියෙනව. මම බාප්පගෙ සහෝදරියත් එක්ක සතියකට දෙකකට නවතින්න යනව. මං ආවෙ ඒක කියල යන්න . මම ආයෙ ආපිට එද්දි ඔයාලා ගිහින් තියේවි නේද ?"

" ඔව් ඉතින්. " ජුලියන් වහා පිළිතුරු දිනි. පුදුමයත් ශෝකයත් සම්මිශ්‍රිත හැඟීමක් ජුලියන්ට දැනේ. ජෝක් හොඳ කොල්ලෙකි. ඔහු ව මග හැර ගැනීමට ජුලියන් ද අකැමැති ය. " ඒත් ඇයි ඔයාට යන්න වුනේ. ගෙදර මොකක් හරි ප්‍රශ්නයක් වත් ද ?"

" නෑ එහෙම ප්‍රශ්නෙකුත් නෑ. ඒත් සේර ම වෙන්න පටන් ගත්තෙ අර සිසිල්ගෙ සිද්දියෙන් පස්සෙ. අම්මත් ගොඩක් කණගාටුවෙන් ඉන්නෙ නො කීවට. බාප්පට හොඳට ම මළ පැනලා. අම්ම කෙලින් ම කියන්නෙ නැති වුනාට මොකක් හරි හේතුවකට මිනිහට ඕනි කරනවා මාව මෙහෙන් පිට මං කරන්න. බාප්පගෙ ඔය කියන අක්කා මොන වගේ චරිතයක් ද කියල මාත් හරියට ම දන්නෙ නෑ. කොටින් ම මං ඒකිව දැකල තියෙන්නෙත් එක පාරයි . අක්කත් මල්ලි වගේ ම යි. කපාපු පළුව"

සැබැවින් ම ජෝක් පත්ව ඇති තත්වය කාට කාටත් ගෙනාවේ දැඩි කණගාටුවකි. එක්වර ම ජූලියන් ජෝක් දෙස බලා කීවේ මෙවැන්නකි.

" හරි. එයාලට උඹ ව වදයක් නම් අපි මෙහේ ඉන්න ටිකේ උඹ ඇවිත් අපි එක්ක නතර වියන් " ජුලියන් වැඩි දුරටත් ජෝකට කීවේ ය. "

අසරණ කොලුවාගේ මලානික සුදුමැලි මුහුණ වර්ණ ගැනි වී ගියේ ඉන්ද්‍රජාලයකින් මෙනි. ඔහුගේ දෑස් දිලෙන්නට විය.

" දෙයියනේ. අපූරු අදහසක් නොවැ" යි ඔහුට කියැවිණි.

" මරුනෙ" යි ඩික් වසරේ ප්‍රියතම වචනය දැම්මේ ය. " උඹ අපි එක්ක ඉන්නව නම් ඇත්තට ම අපි කැමතියි. අනික එයාලට ඕනි සති දෙකකට උඹෙන් ගැලවිලා ඉන්න නම් යන තැන අදාළ වෙන්නෙ නෑනෙ"

" ඒක ඇත්ත. හරි එහෙනම්. මං මෙහෙ එන්නම්. බාප්පට මේ ගැන කියන්ට ඕනි නෑ. අම්මට විතරක් කීව ම ඇති. එයා කොහොමත් උඹල කට්ටියට හරි කැමතියි. කිසි ම ප්‍රශ්නයක් වෙන්නෙ නෑ.ඇරත් නැන්දට අම්මාගෙ වැඩි මනාපයකුත් නෑ"

ජෝර්ජ් පවා ජෝක්ගේ පැමිණීම සම්බන්දයෙන් ඉත සිතින් තුටු වූ වා ය. ටිමී ඒ ප්‍රීතිය සැමරුවේ වල්ගය වනමිනි.

dileep

ළමුන් වළං පිඟන් සේදීමේ කටයුතු කරා යොමු වූ අතර අම්මාට කරුණු පහදා දෙනු වස් ජෝක් පියාඹා ගියේ ය. ජෝක් පිට ව යෑමත් සමගින් ම පෙර සිටි පුපුරණ උතුරන ජෝර්ජ් යළිත් වරක් දැක ගැනීමේ අවස්ථාව ළමයින්ට උදා විනි. ජූලියන් ඇ කූඩාරමේ දමා යෑමේ හේතුව අවබෝද කොට ගැනීමේ හැකියාවක් තාමත් ඇයට නැති ලෙසකි.

ජූලියන් මැදියම් රෑ සිදු වූ සිදුවීම කියන්නට පටන් ගත්තත් ජෝර්ජ් සිටියේ එය අසා සිටීමට හැකි මට්ටමක නොවේ.

" මට නම් ඕවයින් වැඩක් නෑ" යි ඇ කෙළින් ම කීවා ය. " උඹලගෙ මල උලව් භූත කෝච්චි අබිරහස ගැන මගෙ කිසි උනන්දුවක් නෑ. මාව නිකන් කොන් කරලනෙ තියෙන්නෙ. මටත් ඕකට සම්බන්ද වෙන්න වුවමනාවක් තිබ්බ. ඒත් උඹලා මාව

අතෑරල දැම්ම. ඉතින් උඹලගෙ භූත කෝච්චි උඹල ම තියා ගනිල්ලා"

ඊ ළඟට ඈ ටිමියාව අල්ලා ගත්තා ය. කොහේ යන්නේ දැයි වචනයකුදු නො කියා ඈ කඳවුරෙන් පිට ව ගියා ය.

" ඔහෙ ගියාවේ " යි ජුලියන් කීවේ ය. ඇත්තට ම ජෝර්ජ්ගේ හැසිරීම දැන් ඔහුට එපා වීගෙන එන ලෙසකි.

" අපි දවාලක යනව නම් ජෝර්ජ්ටත් පුලුවන්නෙ අපි එක්ක එන්න. ඇන් දවල්ට කූඩාරමේ තනියෙන් දාල ගියාට ප්‍රශ්නයක් නෑනෙ " ඩික් කීවේ ය.

" ඔව් අනිවාරෙන් ම" ජූලියන් එකඟ වී ය. " අර මෝඩ වාහෙට කතා කරලා ඕක කියපං."

dileep

එහෙත් ඒ වන විටත් ජෝර්ජ් කඳවුර පැවති සීමාවෙන් බොහෝ ඔබ්බට ගොස් සිටියා ය.

" අනේ මෝඩි. සැන්ඩ්විචස් ටිකකුත් අරගෙන ගිහින් තියෙන්නෙ. මං හිතන්නෙ දවස ම අපෙන් ඈත් වෙලා ඉන්න වගෙයි හදන්නෙ. මොකක් හරි ඔල මොට්ටල වැඩක් නොකරොත් මට ඒ ඇති " යි ඈන් කීවේ ඒ අතර ය.

කෑම ද්‍රව්‍යත් ඇඳුම් පැලඳුම් කිහිපයකුත් රැගත් ජෝක් තවත් නොබෝ වේලාවකින් කඳවුරට පැමිණියේ ය. " අම්මට තේරුම් බේරුම් කරන එක නම් ලේසි වුනේ නෑ" ඔහු ළමයින්ට කීවේ ය. " ඒත් අන්තිමට එයා කැමති වුනා මං ඔයාලත් එක්ක ඉන්න එන එක ගැන. කොයිකටත් මං බාප්පට නම් ඇහැ ගැහෙන්න ඉන්නෙ නෑ. අනික මේක සෙල්ලමක් නෙමේ. හෙහ් හෙහ්.. කවුද හිතුවේ මට උඹල එක්ක කූඩාරම් ගහන්න චාන්ස් එකක්

ලැබෙයි කියල. මේක නම් නියම අවස්ථාවක්. ජුලියන් කූඩාරමේ ඉඩ මදි නම් මට අර හෙදර් ගොල්ලෙ වුනත් නිදා ගන්ඩ බැරි කමක් න්ආ"

" අපෝ පිස්සුද බං. කූඩාරමේ උඹටත් ඉඩ තියෙනවා. ආ.. අන්න ලූෆී සර් මේ පැත්තට එනව. පුදුමයි අද නම් උදේ ම ඇහැරල"

ලූෆී උන්නැහේ සිනා රැලි ගත් මුහුණින් ළමුන් සිටි දෙසට පැමිංඉයේ ය. එක් වර ම ඔහුගේ අවදානය ජෝක් දෙසට යොමු විය.

" මෙයා ද ඔයාල අර කිව්ව ෆාර්ම් එකේ යාලුව. කොහොමද පුතා.. අපිත් එක්ක ටික දවසක් ඉන්න එන්න හිතුන ද ? "

" ඔව් සර්. ජෝක් මේ බඩු මුට්ටුත් අරන් ඇවිත් තියෙන්නෙ අපි එක්ක දවස් දෙක තුනක් ඉන්න හිතාගෙන. බලන්ඩකෝ මෙයා ගෙනත් තියෙන කෑම කන්දරාව"

" ඒක තමා. හරි. බොහොම ආදරෙන් පිළිගන්නව පුතා. මං දැං යන්න ඕන පොඩි පයෝක්ෂන කටයුත්තකට. ඉතිං ඔයාල අද මොනවද කරන්න හිතාගෙන ඉන්නෙ ?"

" මේව සුද්ද බුද්ද කරල දාල පොඩ්ඩක් ඇවිදින්න යන්න තමයි සර් " ජුලියන් කීවේ ය.

තවත් සුළු වේලාවක් ඔවුන් හා ගත කළ ලූෆී වහා ස්වකීය කූඩාරමට වැදී ඔහුගේ රාජ කාරීන් පටන් ගත්තේ ය. ඔහුගේ උරුවම් බාන හඬ ළමුන්ට ඇසින. ඒ අතර ජෝක් තැති ගත් ස්වරයෙන් එක් වර ම ඉද්ද ගැසුවාක් මෙන් නැගිට ගත්තේ ය.

dileep

" " මොකෝ ප්‍රශ්නෙ ?"

ඩික් ඇසී ය. ජෝක්ට ඇසුනේ කුමක් දැයි ඔවුහු කන් දී බැලූහ. ඊ ළඟ නිමේශයේ දී නලාවක් පිඹින හඬක් ඔවුනට ද ඇසෙන්නට වී ය.

" යකෝ ඒ මගෙ බාප්පගෙ විසිල් එකේ හඬ. මිනිහ ඔය විදිහට විසිල් කරන්නෙ මට. මාව ගෙන්ව ගන්න ඕනි වුනා ම. එක්කො අම්ම ඒ යකාට මං මෙහෙ ආව කියල කියල නැත්තම් දැකල"

" ඉක්මනට මෙන්න මෙතනින් හැංගෙනවා "යි ඈන් කෑගෑවා ය." එයා ඔයාව දැක්කොත් ආපහු එක්කන් යාවි. මෙතනින් හැංගෙන්ට. එයාට ඔයා හොයා ගන්ට බැරි වුනා ම හොයන වැඩේ අතෑරල යයි යන්ඩ"

dileep

ලමෝ කඳු පහළ වන හෙදර් පඳුරු ගොල්ලේ වහා සැඟවුම් ගත්තෝ ය. නලා පිඹීමේ කටයුතෙන් පළක් නො ලැබෙන බැව් වටහා ගත් බැවින්දෝ ඊ ළඟට ඇන්ඩෘස් මහතා කෝපවත් මුරගෑමක් පටන් ගත්තේ ය. එහෙත් ඔහුට කිසි පිළිතුරක් ලැබුණේ නැත. හොස්සා අගින් මැස්සා යාමත් නො රිස්සන තාලේ පුද්ගලයෙකු වූ ඔහු කඳවුරු කරා පැමිණෙන්නට තබා ගනිද්දී නම් ළමුන් කාගෙ කාගේත් ඇඟේ ලේ වතුර වී ගිය බව කිව යුතු ය. ඇන්ඩ්‍රූස් ප්‍රථමයෙන් ම ලුෆී මහතාගේ කූඩාරමට එබී බෙරිහන් දෙන්නට පටන් ගත්තේ ය. ඔහුගේ කෝපී මුරගෑමෙන් , අධ්‍යනය කිරීමේ කටයුත්තක නියැලී ශාන්ත දාන්තව දැහැන් ගත වැ හුන් ලුෆී මහතා උඩ ගොස් බිම වැටුනේ ය.

" කොහෙද ජෝක් ?" පිළිතුරක් අපේක්ෂාවෙන් ඇන්ඩෘස් බැන වැදුනේ ලුෆී මහතාට ය.

" මම දන්නෙ කොහොම ද ?" ලූෆී මහතා කීවේ කැත්තට පොල්ල මෙනි.

" උඹ එන්ඩ ඇත්තෙ මෙහෙට තමයි. මට මගෙ එකා අර ජරා කොල්ලො ටික එක්ක තියල යන්ඩ බෑ "

dileep



" මොකක්  කිව්වා ? ජරා කොල්ලො? මොකක් ද ඒ ළමයින්ගෙ තියෙන වැරැද්ද ? හරි අගේ ඇති දරුවො ටික. හරි ම මිත්‍රශීලී ළමයි ටික. හොඳ හැදියාවක් තියෙන ඒ වගේ පොඩි එවුන්

ටිකකට ඔහොම කට කැඩිච්ච කතාවක් කියන එක නම් ඒ තරම් හරි නෑ"

" මේ බලනවා " යි මහල්ලා සම්බන්දයෙන් ඉවසීමේ සීමාව රතු කට්ට කරා යමින් ඇන්ඩෲස් කියනු ළමයින්ට ඇසේ. " මට තමුසෙත් එක්ක මරා ගන්ඩ වුවමනාවක් නෑ. තමුන් එක්ක තඹ දොයිතුවක තරහකුත් නෑ. ඔහේ ඒ පොඩි එවුන්ගෙ යාලුවෙක් හරි කවුරු හරි වෙන්ට ඇති. ඒත් එකක් මතක තියා ගන්නවා. උන් මහා බයානක අනතුරකට අත වනමින් ඉන්නෙ. කරදරේ වැටෙන්නයි හදන්නෙ "

" මොකක් කීව ? අණතුරක්..?" අදහා ගත නො හැකිවාක් මෙන් ලූෆී උන්නැහේ ඇසී ය.

" ඔව්. මේ කඳුකරයේ ඕන තරම් බයානක තැන් තියෙනවා. අන්තිම දරුණු බයානක තැන්. මං හොඳට ම දන්නව ඒ ගැන. දැන් අර කෝච්චි පොළ ගන්නවකෝ. ඒක පොඩි එකෙක්ට නෙමේ වැඩි මහල් තලතුනා මිනිහෙක්ට වත් යන්ඩ හොඳ තැනක් නෙමේ. එතෙන්ට භූත කෝච්චි එනව. හොල්මන් තියෙනව කියල ඕනි තරම් මිනිස්සු කියනව. ඔහේගෙ අර හොඳ කොල්ලො කෙල්ලො ටික ඔය ගැන සෑහෙන්ට උනන්දුයි. මං කැමති නෑ මගෙ කොල්ලා ඒ වගේ ළමයි ටිකක් එක්ක මුහු වෙනව දකින්ඩ"

ලූෆී මහතා දෑස් විශාල කොට ගත්තේ ය. ඔහු ඇන්ඩෲස්ගේ මුහුණට මුහුණ ළං කළේ ය. දුම්රිය පොළ සම්බන්දයෙන් හෝඩුවාවක් වැඩි විස්තරයක් මේ කුකුල් කේන්තිකාරයාගේන් දැන කියා ගන්නට ලැබේ යැයි උන්නැහේ හිතුවාක් වැන්න

" ඔහේ ඔය කියන කෝච්චි පොළ ගැන මහගොඩක් දේ දන්නවා වගෙයි ?" ලූෆී මහතා ඇසුවේ ය.

dileep

" මම.. නැහැ" යි ඇන්ඩෲස් තිගැස්සිණි. " මම ඔය අලුගුත්තේරු තැන ගැන අහල තියෙනව විතරයි. කවදාවත් නිකන් තඩමාරුවක වැටෙන්න ඔය බයානක තැනට ගිහින් නෑ. ඊටත් මට හොල්මන් කෝච්චියක් දකින්ඩ කිසි වුවමනාවක් ආසාවක් ඇත්තෙත් නෑ. ආනික මට ජෝක්ව අණතුරේ දාන්ඩ වුවමනාවකුත් නෑ. ජෝක්මෙහාට ආවොත් තමුන් මිනිහට කියනවා ආපහු ෆාම් එකට එන්ටය කියල.

" හරි " යි ලූෆී මහතා එඟ වීය.

ගොරවා පුපුරා බැලීම් කිහිපයක් එල්ල කළ ඉක්බිති ව ඇන්ඩෲස් යළිත් පල්ලම් බසින්නට විය. ඔහු සෑහෙන දුරක් ගිය පසුව ලූෆී මහතා ළමුන්ට ඇසෙන සේ කෑ ගාන්නට වූවේ ඔවුන් සැඟව ගත්තේ කොහේදැයි හරියාකාරව දැන සිටියාක් මෙනි.

dileep

" " මිනිහා ගියා. ඔයාල පොඩ්ඩක් එන්ටකෝ. මට ජෝක් එක්ක ටිකක් කතා බහ කරන්ට ඕනි"

ළමුන් සිව් දෙනා සැඟව හුන් හෙදර් ගොල්ලෙන් පිතටට පැමිණියේ ගැහෙන සැසලෙන හදවතිනි. ලූෆී මහතා ජෝක්ට කියන්නට සැරසෙන්නේ කුමක් විය හැකි ද ? පළ නොකියා පළා බෙදීමක් ද ? නැතහොත් ආ පයින් ම ආපසු යවා හැරීමක් ද ?

" මට ඔයාට කියන්න ඕන ජෝක් මෙච්චරයි. මට දැං තේරෙනවා ඇයි ඔයා ඔයාගෙ බාප්පගෙන් වහන් වෙලා ඉන්ඩ හදන්නෙ කියල. මං ඔයා වුනා නම් මාත් ඕකමයි කරන්නෙ. කොයික වුනත් මේක මගේ ප්‍රශ්නයක් නෙමේ. ඒ වුනාට ඔයා පුලුවන් තරම් හැංගිලා ඉන්න. ඔය මිනිහාට මුලිච්චි වෙන පළාතක යන්නවත් එපා "

ජෝක් සැනසුම් සුසුම්ක් පිට කළේ ය. මහලු ලූෆී උන්නැහේ මොන තරම් අපූරු පුද්ගලයෙක් දැයි ජෝක්ට සිතෙන්නේ ය. වහා පැන බදා ගන්නට තරම් සිතක් ද ඔහුට ඇතිවීගෙන එමින් තිබෙන්නේ ය.

" ගොඩාක් .. ගොඩා.....ක් ස්තූතියි සර්.. මම හිතුවෙ ඔබ තුමා මාව ආපහු යවයි කියල. ඔබ තුමා හරි හොඳ කෙනෙක්.."

ඊ ළඟට ජෝක් පෙරළා ළමුන් සිටි දෙසට දිව ගියේ ය

" සේරම හරී..." ඔහු කෑ ගෑවේ ය. " මම උඹලා එක්ක නවතින්නයි යන්නේ.. යේ යේ යේ... අපි දවල්ට කාලා අර හොල්මන් බිම්ගේ උමග දිගේ යමූ.. ඊට පස්සෙ භූත කෝච්චිය කනෙන් ම අල්ලා ගමූ..."

" හොඳ අදහස.. " යි ජුලියන් කීවේ ය. " අපි එහෙම කරමු. පව් ජෝරජ් . කුකුල් කේන්ති කාරි වුනාට හිත හොඳ එකී. එයාවත් එක්ක යමු. "

එහෙත් ජෝර්ජ් ජුලියන් ඈ රැගෙන යන තුරු බකන් නිලා නොසිටි බව ජුලියන් දැන සිටියේ නම් මෙවන් යමක් කියනු ඇත්දැයි සැබැවින් ම සැක සහිත ය.

dileep

dileep

## 15 ජෝර්ජ්ගේ වීරක්‍රියා

ජෝර්ජ් මේ යමින් තිබෙන්නේ ඉබා ගාතේ යන ගමනක් නම් නො වන්නේ ම ය. ඇගේ සිත තුළ තෙරපි තෙරපී තිබෙන අදහසක් ක්‍රියාත්මක කිරීමේ අභිලාශයෙන් යනෙන ගමනකි. මේ අභිරහස් දුම්රිය උමං මාර්ගය සම්බන්දයෙන් සෙස්සන් නො දත් යමක් සොයා ගැනීමේ අදිටනක් ගැහැළු ළමයාගේ සිත තුළ තිබෙන්නේ ය. කිල්ටිගේ නිම්නයේ දුම්රිය අංගනය තුළින් යමක් සොයා ගත හැකි යැයි වැඩි දුරටත් ඈ සිතුවා ය.

ඔලීගේ කෝච්චි පොළ යැයි හැඳිනවෙන භූත කෝච්චිපොළට පැමිණෙන්නට ඇයට ගත වූවේ සුලු වේලාවකි. ලී කකුල් සෑම් ද කෝච්චි පොළ ද කඳු ගැටයට පහළින් ඇගේ නෙතට හසු වෙයි. ඇය ඔහු හා දොඩමලු වීමේ අදහසක් ඇති කොට ගත්තා ය. ඇගේ පියවර ගැටෙන හඬ ලී කකුල් සෑම්ට නෑසුනෙන් , ඈ ඔහුට කතා කළ විට සෑම් තිගැස්සී ගියේ ය. ඊ ළඟට බුරා ඇවිලීම ආරම්භ කළේ ය.

" මෙතනින් යනවා. මම කිව්ව නේද සැරයකුත් මේක ළමයින්ට ගැවසෙන්ඩ හොඳ තැනක් නෙමෙයි කියල. තමුසෙ හදන්නෙ මගෙ රස්සාව නැති කරන්න ද ?"

" කවුද ඔයාට කීවෙ අපට එන්ට දෙන්ට එපා කියල ?" අතැරන ලද කෝච්චි පොළ පාලනය කරන්නේ කවුදැයි දැන ගැනීමේ අදිටනින් ද යුතු වූ ජෝර්ජ් එක හෙලා ම අසා සිටියා ය.

" එයා තමා කීවෙ. මගෙ කණ්ණාඩි දෙක කැඩිලනෙ " යි මහල්ලා ඊ ළඟට ප්‍රකාශ කළේ රිදුම් දෙන දෑස් පිසදා ජෝර්ජ්ගේ මුහුණට නැඹුරු වෙමිනි.

" කවුද ඔය එයා ?"

එහෙත් මහලු ආරක්ෂකයා වැඩිමනත් යමක් කියන්නට ගියේ නැත. ඒ වෙනුවට යළිත් කෝපවත් පෙණුම මුහුණට ආරූඪ කොට ගත්තේ ය. ගල් අඟුරු කැබැල්ලක් වහා නැමී අතට ගත්තේ ය. ටිමී විසින් නගන ලද කෝපී මුරගෑමක් නො වන්නට කළින් දිනයක ඩික්ට ලැබුණාක් මෙන් ගල් අගුරු පහරක් ජෝර්ජ්ගේ නලලට ද එල්ල වීමට ඕනෑ තරම් ඉඩ කඩ තිබුණි. එහෙත් ටිමියාගේ සපා කෑමකට බිය වූ සෑම් වහා ගල් අගුරු කැබැල්ල අතැර දැමුවේ ය.

dileep

" තමුසෙ මෙතනින් යනවකො. මං වගේ අහින්සක නාකියෙක්ට වත් පාඩුවෙ ඉන්න දෙන්න බැරිද ? බලනව. තමුසෙ හොඳ කොල්ලෙක් වගේ පේන්නෙ. ඉතින් මේ අහිංසක ලී කකුල් සෑම් අමාරුවෙ දාන්න තරම් ඔයාට තියෙන වුවමනාව මොකක් ද ?"

ජෝර්ජ් යන්නට හැරුණේ සෑම් කොල්ලෙකු ලෙස තමා හඳුනා ගැනීමේ දයානුකම්පාව හේතු කොටගෙන ය. සෑම් සමගින් පැටලී සිටිනවාට වැඩියෙන් බිම්ගෙය ගවේශනය කිරීමේ වැදගත්කමක් ද ඇයට තිබේ. එහෙත් පාලු අඳුරු උමගයේ තට්ට තනියම ඇවිදීමේ මැලිකමක් ද ඈ තුල නැති වා

නො වේ. උමගය දිගේ යාම වෙනුවට බිම් ගෙයට ඉහළින් වන කිල්ටිගේ කෝච්චි පොළ කරා යන අඩිපාර ජෝර්ජ් තෝරා ගත්තා ය. පෙර දින රාත්‍රියේ ජූලියන් ගමන් ගත් මග ද එය ම ය. එහෙත් ඈ සම්පූර්ණ දුරම ගමන් කරන්නට මත්තෙන් හදිසියේ ම දක්නට ලැබුණු නෙරා ආ හෙදර් ගොල්ලක් දැක නතර වූවා ය.

ජෝර්ජ් එය හාරා පාදා ගැනීමේ ුත්සාහකය නියැලුනා ය. හෙදර් පඳුරුවලට යටින් කුමක් හෝ යමක් ඇතිබව ඈට හොඳා කාරව ම විශ්වාස ය. ඈ හෙදර් පඳුරු ගොල්ල හාදා පාදන්නට පටන් ගත්තා ය. ජෝර්ජ් බිම ඇණ තියාගෙන මේ කරන්නේ කුමක්දැයි ටිමීට ප්‍රශ්නයකි. ඈත් මේ තකහනියක් ම හැරහෙන්නේ හාවුන් ඇල්ලීමට යැයි උඟට සිතේ.. " එයා කොහොමද මාත් එක්ක හාවුන් කන්නයි මං ආවෙ කරන්නෙ ?" යි තමාට ම කියා ගත්තාක් පරිද්දෙන් ටිමියා වහා ගොඬැල්ල දෙසට පැන හැරීමේ කටයුත්ත පටං ගත්තේ ය. පුදුමයකි. ටිමියා තඩ මාරුවක දමමින් මහ පොලොව ගිලා බැස උඟ ඇසි පිය ගසන සැනින් ඇතුළට ගියේ ය. යළි හෙදර් පදුරු තිබූ ලෙස ම වල ආවර්ණය කොට දැමුවෙන් ජෝර්ජ්ට ඇසුණේ බිය පත් බලු හා දඩයක්කාරයාගේ මුර ගෑම පමණෙකි.

dileep



" ටිමී.. අයියෝ උඹ මොකක්ද මේ කර ගත්ත වින්නැහිය. උඹ කොහෙද දැං ඉන්නෙ ?"
ජෝර්ජ් කෑ ගැවේ බියෙන් ඇලලුණු හඬිනි.කියන්නට කරන්නට කිසිත් නැත. ටිමියා අතුරු දන් වී තිබේ. ජෝර්ජ් දිගින් දිගට ම ඌට කතා කළා ය. මහ පොළොව යටින් උගේ මුර ගෑම ඈට ඇසෙන්නට විය.

ජෝර්ජ් හැකි වෙර යොදා අදිමින් හෙදර් පදුරු උගුල්ලන්නට වූවා ය. එය වූ කළී දුම්රිය උමගට සම්බන්ද වන වා කවුලුවක් බැව් ඇයට පෙනෙයි. කෝච්චි ගමන් ගන්නා විටක ඉහළ නගින

දුම පිතටට පැමණෙන ගිනිකඳු සෙයින් හැඟෙන විවරයකි. දැං ඒවා හෙදර් පදුරින් වැසී ඇති බැවින් දුම් පිට වීම පිණිස දමන ලද යකඩ බට කාටවත් පෙනෙන්නේ නැත.

" අනේ උඹ පල්ලට වැටුණා නේද ටිමී. ටිකක් ඉවසලා ඉඳපන්කෝ. මං උඹව උඩට ගන්නකන්. අනික් අයත් ඉක්මනට මෙතනට එයි"

එහෙත් ජෝර්ජ්ගේ උපකාරයට කාත් කවුරුවත් ආවේ නැත. ඈ ටිමියා ගලවා ගැනීමේ කටයුත්ත පටන් ගත්තා ය.දිරා ගිය යකඩ පොලු මතින් පා තබා ඈ පහළට බසින්නට පටන් ගත්තා ය. අන්තිමේදී ඇට ටිමියා දක්නට ලැබුණි.

ජෝර්ජ් වාඩි වී හති ඇරියා ය. ඇයට බඩගිනිද දැනේ. එහෙත් ටිමියා ගලවා නොගෙන සැන්ඩ්විචස් එකක්වත් කන්නට ඇයට වුවමනාවක් නැත.

ඇය ය්ළිත් යකඩ ඉනිමග ඔස්සේ බසින්නට පටන් ගත්තා ය. යකඩ පොලු කඩාගෙන වැටේ යැයි තබන සෑම පියවරක් ගානේ ම ඈයට හිතුනත් ඒ තර මට ම ඈ අවාසනාවන්ත වූවේ නැත.

දැන් දැන් යකඩ පොලු සවි කොට තිබෙන්නේ උමං බිත්තියේ ය. එක්වර ම ටිමියාගේ මුදු මොලොක් සිරුරේ ඇගේ පය ගැටිණ. යකඩ පොලු කඩා වැටීමෙන් නිර්මාණය වූ පලංචියක් බඳු යමක ටිමියා පත බැවී වැද හොත්තේ ය.

ටිමියා ද කැටුව ආ මග ඔස්සේ පෙරළා ඉහල නැගීම උගහට බව අවබෝද කොට ගත් ජෝර්ජ් දිගින් දිගට ම පහළ බසින්නට පටන් ගත්තා ය. ඇය විදුලි පන්දමක් රැගෙන විත් තිබුණේ වාසනාවට ය. තවත් සුලු මොහොතකට පසු ඈ සිටියේ උමග තුළ ය. මහ පොළොව මත ය. ඒ හාත් සමග ම අනපේක්ෂිත යමක් නෙත ගැටී ඕ තැතිගත් මුර ගෑමක් නිකුත් කළා ය.

ඇය ඉදිරියෙන් තිබුණේ නවතා තබන ලද දුම්රියකි. ඇයට එහි එන්ජිම පවා අත පත ගෑමේ හැකියාවක් තිබේ. ජෝර්ජ්

වේගයෙන් හුස්ම ගනිමින් ඒ දෙස බලා සිටියා ය. ඇත්තට ම මැදියම් රැයේ පැමිණි හොල්මන් කරන භූත කෝච්චිය මෙය විය හැකිද ?

බැලූ බැල්මට ම එය ඉතාමත් ම පරණ දුම්රියකි. නිතර දැක පුරුදු කෝච්චි මෙන් දිගු වූවක් ද නො වේ. පෙට්ටි සේම එන්ජිමද කුඩා වූවකි. කුමක් කළ යුතු දැයි සිතා ගත නොහැකි මනසින් ද උද්දාමයෙන් සැසැලෙන හදවතින් ද ඇ ඇසිපිය පවා නො හෙළා කෝච්චිය දෙස බලා සිටියා ය.


අනිවාරෙන් ම භූත කෝච්චිය මෙය ම විය යුතු ය. පෙර දින රැයේ උමග ඔස්සේ ඔලීගේ දුම්රිය ස්ටේසමට මෙය පැමිණෙන්නට ඇත. ඉන් අනතුරුව පෙරළා මෙතැනට ද එන්නට ඇත. අනෙක් අතට කිල්ටිගේ කෝච්චි පොළ කරා කෝච්චිය ගමන් කරන්නේද නැතිවා විය හැකි ය. එය ගමන් අරඹන්නේ මෙතැන සිට විය හැකි ය. ජූලියන් ඊයේ රාත්‍රියේ කිල්ටිගේ ඉස්ටේසමේ මග රැකගෙන සිටියත් ඔහුට භූත කෝච්චිය හමු නො වූවේ ඒ හේතුවෙන් නිසා විය යුතු ය. එසේ නම් ඉන්තේරුවෙන් ම කෝච්චිය ගමන් අරඹන්නේත් කෝච්චිය ආපිට පැමිණෙන්නේත් අඳුරු උමගයේ මේ ඉසව්වේ සිට ය. අද රාත්‍රියටත් මේ ඉන්නා තැනින් ඇහැරී කෝච්චිභූතයා සුපුරුදු රාජකාරියේ නියැලෙනු ඇතැයි ද ජෝර්ජ් වඩ වඩාත් තේරුම් බේරුම් කොට ගත්තා ය.

dileep

ජෝර්ජ් ටිමී වැළඳ ගත්තා ය. වසර ගණනාවක් තිස්සේ එකතු වූ දූඹුලු ගොඩකට පත බැවී ගැනීමෙන් දෝ ටිමියා තුලින් දක්නට ලැබෙන්නේ පිරිසිදු බවක් නම් නො වේ. එහෙත් ජෝර්ජ්ගේ ආදරය බලවත් ය. ටිමියාගේ අපිරිසිදු තත්වය ඇට ගාණක් නැත. කෙසේ වෙතත් ටිමියා තවමත් පණපිටින් සිටී. ජෝර්ජ්ට එය ම ඇති.

ජෝර්ජ් මදක් කල්පනා කරන්නාට වූවා ය.යළිත් ට්‍රිමියාද කැටුව ඉනිමග දිගේ නැගීමේ හැකියාවක් නම් ඇයට නැත. කොහොමත් උඹට කළ හැක්කේ උමගය දිගේ ගමන් කිරීම පමණි. උමගය දිගේ ගමන් කිරීමේ බියක් සැකක් නැති ගැන් මක් ජෝර්ජ් තුළ ද පෙර පැවතියත් භූත කෝච්චිය මුන ගැසී දැන හඳුනා ගත්තාට පසු නම් මුලුවනින් ම දුරු වී දුරින් භූත වී තිබේ.

dileep



මේ අතර ටිමියාද බකන් නිලා සිටියේ නැත. උගේ රහස් පරීක්ෂන කටයුතු පටන් ගත්තේ ය. කෝච්චියේ රෝදත් එන්ජිමත් වහා ඉව අල්ලා පරික්ශා කොට දැමූ ශර්ලොක් හෝම්ස් බල්ලා ඊ ළඟට රියදුරු මැදිරියට පැන ගත්තේ ය. ටිමියාගේ ක්‍රියා මාර්ගය මෙතෙක් දුම්රියට පිවිසිසීම පිණිස ජෝර්ජ් තුළ බල පැවැතියාවූ තැති ගැන් ම බැහැර කරවීමෙහි ලා මනා පිටුවහළක් වී ය. ටිමීට උපද්‍රවයකින් අතුරු ආන්තරාවකින් තොරව ඒ තුළට පිවිසීමට හැකි නම් , ඈ ද බිය විය යුතු නැත.

ඒ අනුව එතැන් පටන් ජෝර්ජ් කෝච්චි පෙට්ටි පරික්ෂා කිරීමේ කටයුත්තට අත ගැසුවා ය. එහි පෙට්ටි හතරක් වී ය. ටිමියා පෙරටු කොට ගනිමින් විදුලි පන්දම් එළියේ දායකත්වයෙන් ඈ එකින් එක දුම්රිය පෙට්ටි පරික්ෂා කළා ය. කාට කාටත් අමතක ව ගිය අතෑර දමන ලද යල් පැන ගිය මුලුවනින් ම හිස් දුම්රිය පෙට්ටි සතරක් ඈ විසින් අපේක්ෂා කරනු ලැබුව ද එය එසේ නො වී ය.

එහෙත් කෝච්චි පෙට්ටි තුළ පෙට්ටි රැසක් අසුරා තිබෙනු ඇයට පෙනෙයි. හොල්මන් කෝච්චි පෙට්ටි රැසක් පුරවාගෙන ගමනේ යෙදෙන්නේ කවර හේතුවකටදැයි ඇයට සිතෙයි. ඇය එක් පෙට්ටියකට විදුලි පන්දම් එළිය යොමු කළා ය. පෙට්ටිය කඩා විවර කරන්නට ඔන්න මෙන්න කියා තිබියදී විදුලි පන්දම නිවා දමන්නට ඈට සිදු වූවේ ය.

උමග ඔස්සේ පිය නගන කිසිවෙකුගේ පිය ගැටෙන හඬක් ඈට ශ්‍රවණය වීම ඊට හේතුව යි. ටිමීගේ කොළරයෙන් අල්ලා ගත් ඈ වහා කෝච්චි පෙට්ටි පසු පස සැඟව ගත්තා ය. ටිමී ද සිදුවන්නකට මුහුණ දීමේ අදහසින් බලා සිටියේ ය. ගෙලවටා වන රෝම උලුප්පවාගනිමින් උගෙ සිටියේ සූදානම් ශරීරයෙනි.

එකිනෙක ගැටෙන හඬකට අමතර විසල් පිපුරුම් හඬක් ද ඇසුණේ ය.ඊ ළඟට ආලෝකයක් දැල්වුනේ , සූයීා උමග ඇතුළේ සිට පෑයුවක් මෙන් හාත්පස එළිය කරමිනි.ආලෝකය පැමිණෙන්නේ උමගේ ඈත අන්තයකින් වන විශාල ලාම්පුවකිනි. පෙට්ටියක විවර තැනකින් එබී බැලූ ඇයට රෝකර්ස් යාඩ් දක්වා විහිද ඇතැයි සිතිය හැකි උමගය දක්නට ලැබිණි. එකත් එකට ම ඔලීගේ උමගය කිල්ටිගේ කෝච්චි පොළ දක්වාත් අතර මගදී කඩා වැටී ඇහිරී ඇතැයි සිතූ රෝකර්ගේ දුම්රිය පොළ දක්වාත් බෙදා වෙන් කෙරෙන මං සංදිය ඇරඹෙන්නේ මැතැනිනැයි ඈ වහා වටහා ගාත්තා ය.

රෝකර්ස් යාඩ් දක්වා විහිදෙන උමග අවුරා ඇති තාප්පයක් ද ඇයට දැක ගත හැකි වූවේ ය.

dileep

" පෝටර් පුලියන්ට කිව්ව හරි එහෙනම්. ඒ උමග කඩා වැටිල නිසා වෙන්න ඇති බිත්තියක් බැඳල තියෙන්නෙ. "
තමාට ම කියා ගත් ඈ තව දුරටත් එදෙසට ම නෙත් යොමු කොට සිටියා ය. හදිසියේ ම නො සිතූවක් ම සිදු විය.
ඇගේ ඉදිරිපිට වන බිත්තියෙන් කොටසක් එක් වර ම විවර වූවේ ඈ ගල් ගිල්ලාක් මෙන් බලා සිටීමට ඉඩ ගෙන හරිමිණි. තාප්පයේ මැදින් කොටසක් පසු පසට යන්නට පටන් ගත්තේ ප්‍රාණය ලද පරිද්දෙනි. එයින් පෑදී ගත්තේ දුම්රියකට පමණ එහා මෙහා යා හැකි විවරයකි. ජෝර්ජ් ත්‍රාසයෙන් උපරිමයට පත් වූවා ය. " මොනවද දෙයියනේ මං මේ දකින්නේ ?" යි ඈ තමාට ම මුමුණා ගත්තේ ඒ නිසා ය.

විවරය තුළින් පිතටට බටුයේ මිනිසෙකි. ඒ මිනිසා කවදා හෝ කොහේදී දැක තිබෙන මොකක්දෝ පළපුරුදු ගතියක් දුටු සැණින් ම ගැහැණු ළමයාට දැණුනි. විවරයෙන් පිතටට පැමිණි හේ කිසිදු මැළි බවක් නො පෙන්වා රියදුරු කුටියට නැගුණේ ය.


ඊ ළඟට රියදුරු කුටියෙන් නැගුණු හඬින් කියා පෑවේ එන්ජිම පණ ගැන්වෙන බවකි. ජෝර්ජ් සැබෑ ලෙස ම බිය වූවා ය. පපුව යකාගේ කම්මල මෙන් යක් නැටුම් නටන්නේ ය. ටිමියා සහනදායි ලෙව කෑමක් ලබා දී බිය නො වී බලා සිටින්නාක් මෙන් ගොලු හඬින් කියා දුන්නේ ය.

දුම් පිටවෙන හඬක් ඊ ළඟට ජෝර්ජ්ට ඇසුණි. දැං කෝච්චිය සූදානම් වෙන්නේ ගමන් ඇරඹීමට ය. පෙට්ටියක සැඟවී ජෝර්ජ් සිටිනා බවෙක් මිනිසුන් දන්නේ නැත. හදිසියේ ම ජෝර්ජ්ට පහල වූ අදහසක් හේතු කොටගෙන අම්මා මුත්තා සිහිවෙන්නට පටන් ගත්තේ ය. කෝච්චිය අර විවරයෙන් ඇත්ළට ගමන් කළ හොත් ? ඉනික්බිති දොරටුව වැසී ගියහොත් ?නන්නාදුනන අඳුරු උමගක කෝච්චි පෙට්ටියක සිර කරුවෙකු බවට පත් වීමට ඇට එවිට සිදු වෙනු ඇත.

dileep

" මේක ඔකෙන් ඇතුළට යන්ඩ කලින් මං පැන ගන්ට ඕනි " උමතුවෙන් මෙන් ඈ කියා ගත්තේ දෙලෝ රත් වී සිටි නිසා ය. " මේ යක්කු මාව නො දැක්කොත් වාසනාව"

" චෝ..චෝ..." හඬක් නැගූ දුම්රිය ගමන් අරඹන්නට පටන් ගත්තේ ඈ එයින් පිතටට බැසීමට ඔන්න මෙන්න කියා තිබිය දී ය. මොකක්දෝ වාසනා මහිමයකට දුම්රිය බිත්ති කුහරය දෙසට නො ව ආ පස්සට ම ඇදෙන විට නම් ජෝර්ජ්ට සැණසුම් සුසුමක් හෙළිනි. එහෙත් ඒ තත්පර දෙක තුනකට නො අඩු සැනසිල්ලක් බව කිව යුතු ය. ඒ සමග ම දුම්රිය බිත්ති කුහරය දෙසට ඇදෙන්නට පටන් ගත්තේ ය.



ගමන් කරන දුම්රියකින් පිතටට පැණීමට තරම් දෛයීක් ගැහැණු ළමයාට තිබුණේ නැත. එසේ කළ හොත් සිදු වන්නේ අත පය හතර කඩා බිඳ ගැනීමට බව ඇ දනී. දුම්රිය ක්‍රමයෙන් ගමන වේගවත් කරගෙන තිබේ. එය බිත්ති විවරය තුළින් ඇතුළට ගමන්කරන්නට පටන් ගත්තේ ය.

දකුණු පැත්තට වන නැම්මක් වටා ගමන් කළ කෝච්චිය තවත් උමගයකට ප්‍රවිශ්ට වූවේ ය. ආලෝකය නැගුණේ එතනිනි. උමන් දුම්රිය මාර්ග ගණනාවක් ම තිබෙන එක ම වංගගිරියක් පෙට්ටියේ වන විවරයෙන් ඇය දුටුවා ය.ඒ අතර දිගා වී ගිමන් හැරීමේ නිරත වෙන මිනිසුන් සමූහයක් ද ගැහැණු ළමයාට දක්නට ලැබුණේ ය. " මේ මොන ලෝකෙ මිනිස්සු ද ? පරණ

කෝච්චියකුත් අල්ලාගෙන ඔවුන් නියැලෙන කටයුත්ත කුමක් ද ?"

කෝච්චිය පසු පසින් අඩක් නැගුණේ ය. ඒ ගඩොල් බිත්තිය එකිනෙක පිරිද්දී පෙරළා වැසෙන හඩ මිස අන් කිසිවකුදු නො වේ. ඉතිං දැං ජෝර්ජ් හට එළියට බහින්නටත් බැරි ය.කුටියෙන් පිටව යන්නටත් බැරි ය.

" මේක නිකන් අලිබබා සහ හොරු හතළිහෙ කතාවෙ ගුහාව වගේනෙ. සෙසමි කිව්ව ම ඇරෙයිද දන්නෙ නෑ.මම නිකන් අලිබබා වගේ. එලියට යන්නෙ කොහොමද කියල දන්නෙත් නෑ. දෙයියන්ට පින් සිද්ද වෙන්න ඕනි ටිමී වත් මං එක්ක ඉන්න එක ගැන"

කෝච්චිය අවසානයේ ගමන නවතා තිබේ. එයට පසු පසින් මෙන් ම ඉදිරිපසින්ද ගඩොල් බිත්තියක් ඇයට දැක ගත හැකි ය.

" අපි මේ දේවල් අනික් උන්ට කිව්ව ම උන්ගෙ මූණු මොන වගේ වෙයිද කියල බලන්ට ආසාවෙ බෑ" ජෝර්ජ් මිමිණී ය. " අපි දැං මොකද ටිමී කරන්නෙ ?"

ටිමී වල්ගය වනා සිටියා විනා කිසිත් කියන්නට ගියේ නැත.ජෝර්ජ් පැවසූ යමක් අවබෝද කොට නො ගත්තත් නිහඬ ව සිටීම ඇඟට ගුණ දායක බව නම් ඌ අවබෝද කොට ගත් ලෙසකි.

" අපි මේ මිනිස්සු මෙතනින් එහාට මෙහාට වෙනක්න් ටිකක් ඉවසමු ටිමී " ජෝර්ජ් යළිත් මුමුණන්නට වූවා ය. " ඊට පස්සෙ අපි මේකෙන් බැහැල දොර ඇර ගන්ට බලමු. සෙසමි කිව්ව ම ඇරුන් නැති වුනාට ඔය දොර අරින්ට මොනව හරි ක්‍රමයක්

dileep

තියෙන්ට එපායැ. ඊට පස්සෙ අපි ගිය ගමන් ලූෆී සර්ට මේ ගැන සේර ම අකුරක් නෑර කියමු"

dileep

# 16 යළිත් සැරයක් බිම් ගෙය දිගේ..

කඳවුරට පැමිණීමට ලැබීම ජෝක් තුළ ඇති කළේ දරා ගත නො හැකි සතුටකි. දිවා ආහාරය ද සෙස්සවුන් සමග ගන්නට ලැබෙද්දී ජෝක් තරම් ආහාර අතුරු දන් කළ අයෙකු තවත් නො වී ය. ලුෆී මහතා ආහාර ගත්තේ ඔවුන් සමග ය. එතුමා සැබෑ මිතුරැකයි ජෝක්ට සිතුණෙන් නිතර ම වාගේ සිනා සංග්‍රයක් ද ජෝක්ගෙන් ඔහුට ලැබුණේ ය.

dileep

" ජෝර්ජ් මොකද පේන්ට නැත්තේ ?" හදිසියේ ම උන්නැහේ අසා සිටියේ ය.

" තනියම ටිකක් ඇවිදින්ට ගියා සර්." පිළිතුරු දුන්නේ ජූලියන් ය.

" ආ මට පේන්නේ ආයෙමත් සැරයක් උඹලා ටික රංඩුවක් අල්ලලා වගේ"

" පොඩ්ඩක් ඉතිං. අපි ජෝර්ජ්ට ටිකක් තනියම ඉන්න ඕනි කිව්ව නිසා එයාට පොඩි ඉඩක් දුන්නා ඒකට"

පොඩ්ඩන්ගේ ගැටළු සම්බන්දයෙන් ඇඟිලි ගැසීමේ බලා පොරොත්තුවක් හෝ ඒවා විසඳා ගැනීමට උපකාර වීමක් ලුෆී මහතාගෙන් සිදු වූවේ නැත. ඔහු තමන්ගේ පාඩුවේ විශාල

තක්කාලි ගෙඩියක් නම් මුවට ඇතුළු කර ගැනීමේ උපකාරයක නියැලී සිටියේ ය. එහෙත් ජෝර්ජ් කොහේ ගියා දැයි එතුමාට කල්පනා නූවා ද නො වේ?.

" ඇත්තට ම ජෝර්ජ් කොහේ ගියාද දන්නෙ නෑ. දැං දවලට කන්න මොකුත් අතේ නැතුව ඇති නේද එයාගෙ ?"

" ආ නෑ සර් සැන්ඩ්විචස් ටිකජ් අරන් ගිහින් තිබ්බා" ඈන් පිළිතුරු දුන්නා ය. " කොහොම වුනත් මටත් හරි දුකයි ජෝර්ජ් නැති එක ගැන නම්. "

ලූෆි උන්නැහේ තුළින්ද පළ වූවේ බිය පත් පෙණුමකි. " මටත් ටිකක් හිතට හරි මදී වගේ" යි උන්නැහේ වැඩි දුරටත් සඳහන් කළේ ඒ නිසා ය. " කමක් නෑ ටිමිත් ඉන්නවනෙ. "

dileep

" සර් හිත කරදර කරගන්ට ඕනි නෑ" ජුලියන් ලූෆි මහතා අස්වසන හඬින් කීවේ ය." කාල ඉවර වෙලා අපිත් ටිකක් ඇවිදින්ට යනවනෙ. අපිට එතකොට ජෝර්ජ්ව හම්බවෙයිනෙ. ඔයා මොනවදකරන්න හිතාගෙන ඉන්නෙ?"

" විශේෂ වැඩක් නම් නෑ ඉතිං. මමත් එන්නම්කො ඔයාලත් එක්ක එහෙනම්. ජෝර්ජ් හොයා ගන්න"
ලූෆි මහතා එක් වර ම පවසා සිටියෙන් කාගෙ කාගේත් මුහුණු ඇඹුලල් වී යාම සඟවා ගත හැකි වූවේ නැත. ලූෆි මහතා ද ඔවුන් හා පැමිණෙතොත් උමං මග ගවේශනය කිරීමේ අවස්ථාව අහිමිව යෑම වළකාලිය නො හැකි ය. වහා ජුලියම්න් කතාව පටන් ගෙන උන්නැහේගේ සිත නො තැලෙන්නට ඔහුගේ පැමිණීම ප්‍රතික්ෂේප කරන්නට උත්සාහ ගත්තේ ය.

" අපි එක්ක ගිහින් සර්ට එපා වෙයි හැබැයි"

" සර් එක්ක ගිහින් අපිට එපා වෙයි" යැයි කෙළින් ම නොකීවත් ජුලියන්ගේ ප්‍රකාශය තුළ තිබෙන්නේ කුමක්දැයි ලූෆී මහතා අවබෝද්ද කොට ගත්තේ ය. එහෙත් එයින් හිත රිදවා ගත්තේ හෝ කෝපයට පත් වූවේ එතුමා නො වේ.
" හරී " යි උන්නැහේ කියා සිටියේ සිනා රැල්ලක් මුවගට නගා ගෙන ය. " මම ඔයාල එනකම් මෙහෙම ඉන්නම්. "

ළමුන් සිව් දෙනාට සැනසුම් සුසුමක් හෙලුනේ ඉබේට ම ය. ඈන් කුස්සි අම්මාගේ කටයුතු අකුරට ම ඉටු කරමින් පිරිසුදු කිරීමේ රාජකාරිය පටන් ගත්තා ය. ජෝක් ඇයට උපකාර කළේ ස්වේච්ඡාවෙනි. තේ පානය සඳහා ද කෑම බීම රැගත් ළමෝ නො බෝ වේලාවකින් ම දුම්රිය පොළ කරා පිටව ගියෝ ය.

ඔවුන් අතුරින් වැඩියෙන් ම උද්දාමයෙන් සිටියේ ජෝක් ය. කඳවුරේ ජීවිතය ඔහුට අලුත් ය. රාත්‍රියේ නිදන බෑග් නොමැතිව නිදා ගන්නේ කෙසේ දැයි ඔහු සිතමින් සිටියේ ය. ලූෆී මහතා තමන්ගේ පැත්ත ගත් ආකාරය ද දහස් වෙනි වතාවටත් ජෝක් මෙනෙහි කළේ ය. කෝච්චි පොළ කරා පැමිනි පසු ඔහු ළමුන් පස්සේ දුව පැන ඇවිදමින් අබිරහස විසඳීමේ උපරිම දායකත්වය ලබා දීමට නො මද උත්සාහයක් ගත්තේ ය.

ඒ වන විටත් සුපුරුදු පරිදි ලී කකුල් සෑම් නෙත් දල්වා කෝච්චි පොළ මුර කිරීමේ රාජකාරී කටයුත්තේ නියැලෙමින් සිටිනු ඔවුනට පෙනෙයි. ළමෝ ඔහුට අත වැනුවෝ ය. ඔහුද පෙරළා අතවනා " එන්න ළමයිනේ.. ආ ඇවිදින්න ආවාදැයි කියා නම් ඇසුවේ නැත. අත මිට මොලොවා උරුක් කරමින් ගැඹුරු බැරෑණ්ඩි කට හඩින් බැණ වදින්නට නම් පටන් ගත්තේ ය.

" පළයල්ලා මෙතනින්. කරදරකාරයෝ. උඹලා ආවොත් පල්ලට මං තොපි කම්බස්කරනවා"

" අල්ල ගනියි කියල තමා බය " යි ඩික් කියා සිටියේ අබමල් රේණුවක තරම් වත් ගණනකට නො ගෙනා සිනා සෙමිනි." අපි ව කම්බස් කරන්ඩ තියා ඔය මනුස්සයට හරියට ඇවිදගන්නවත් බෑ. අපි මෙතනින් පල්ලට බැහැල මඩුව පැත්තේ යන්නෙ නැතුව කෙළින් ම බිම්ගේ දිහාවට යමු. මොකෝ රේල් පාරෙ ඇවිද්දයි කියල පොලීසි යන්නයැ. "

ළමුන් වගේ වගක් නො මැති ව රේල් පාරේ ඇවිදිමින් ක්‍රමයෙන් විශල් වන අඳුරු බිම්ගෙයි මුව දොර දෙසට වේගයෙන් ඇවිදයන්නට වූයෙන් සෑම් යකා නටන්නට පටන් ගත්තේ ය. ගොලු බැරැණ්ඩි හඬින් බණිමින් අත පය උරුක් කොට දගලමින් ඔහු බොහෝ දෑ කියෙව්වත් ඒ සියල්ල ම ගඟට දැමූ ඉනි මෙන් විය.

" හරි අපි දැන් මේක දිගේ ඇතුළට යමු. දවසක් රෑ මේකෙන් තමයි භූත කෝච්චිය එළියට ආවෙත්.." ජුලියන් කීවේ ය. " හැබැයි ඊයෙ නම් කෝච්චිය අනික් පැත්තෙන් එළියට ආවෙ නෑ. මං හිතන්නේ ඒක මේ උමගේ මැද කොහේ හරි තියෙනවා ඇති "

dileep

ඈන් කවදත් අඳුරු උමං වලට දැක්වූවේ අකමැත්තකි . අකමැත්ත ක් මෙන් ම මර බියකි. ගුප්ත අද්භූත හැඟීම් අසූ හාරදහසක් ඇගේ සිත තුළ පෙරළි කරන්නේ ය. " ඒක ඇත්ත ම ඇත්ත හොල්මං කෝච්චියක් නම් අපිට පෙනෙන්නේ නැනෙ ඉතින්. " ඈ කීවේ එහෙයිනි.

" අනේ මෝඩියෙ" යි ඩික් හිකි හිකි ගෑවේ ය. " අපි වතාවක් නෙමෙයි දෙවතාවක් ම ඕක දැක්කා"

ඔවුන් ඉක්මනින් ම උමගය ඔස්සේ ඉදිරියට ඉදිරියට පා නගමින් සිටියේ ය. විදුලි පන්දම් එළියෙන් කණා මැදිරි

ආලෝකයෙන් පාර පෙනෙන්නාක් මෙන් යන්තමින් රේල් පාර දක්නට ලැබුනේ ය .ළමුන් කතා කරන හඬ දෝංකාර දීම තරම් ඇත් බිය පත් කරන තවත් කරුණක් නො වී ය.ඕ ඩික් අසලින් ම ගමන් ගත්තේ එහෙයිනි. තමා මේ ගමන නොපැමිණියේ නම් මැනවැයි ඈට සිතුනේ වරක් දෙවරක් නො වේ. එහෙත් ජෝර්ජ් කී ලෙස තොත්ත බබෙකු මෙන් ජීවත් වෙන්නට ද අකැමැති ය. බිය මුහුණින් සෙස්සන්ට හැඟේ යැයි සිතුනෙන් ද පුංචි ගැහැණු ළමයා ගමන් කරේ පහත් කොට ගත් හිසින් යුතුව ය.

දෝංකාර දීම කොතරම් බිහිසුණු වුව ද ජෝක්ට නම් දත කට පුරුද්දා ගමන් ගැනීමේ හැකියාවක් ද නො වී ය." මගෙ ජීවිතේට මේ වගේ ත්‍රාසජනක වැඩක් කරල නෑ. " යි ඔහු දොඩවන්නට පටන් ගත්තේය. " මම මේ වගේ එකකට තමයි නියම ම ඇඩ්වෙන්චර් එකක් කියල කියන්නෙ. නිකන් හිතන්න. හොල්මන් කෝච්චියක් හොයා යන ගමනක්. අඳුරු උමගයක් දිගේ. මරු.. මරේ මරු...මගේ ඇඟේ මයිල් කෙලින් වෙනව හිතෙනකොටත්.. මට හිතෙන්නේ මේ කොහෙර් හරි තිබිලා ඉක්මනින් ම අපිට කෝච්චිය හම්බෙයි"

එහෙත් කෝච්චියක් පිළිබඳ සලකුනකුදු දැක ගැනීමේ වාසනා මහිමයක් ගමන් අරඹා බොහෝ වේලාවක් ගත වුවද ළමුන්ට හිමි නො වූ බව නම් කිව යුතු ය. දුම්රිය මාර්ගය තුන් පැත්තකටබෙදෙන මං ංදිය කරා මේ වන විට ඔවුන් ළඟා වී තිබේ. රෝකර්'ස් නිම්නය ලෙසින් හැඳින් වූ දෙවෙනි දුම්රිය ගමන් මග අහුරා ඉදිව ඇති ගඩොල් බිත්තිය ද දැන් ඔවුන්ට දැක ගත හැක. ජුලියන් විදුලි පන්දම එදෙසටයොමු කළේ ය. " පෝටර් කීව හරි. මේක කඩා වැතිල ඇති. ඒකයි වහල තියෙන්නෙ. දැං ඉතින් අපිට ඉතුරු වෙලා තියෙන්නේ කිල්ටිගේ නිම්නය පාරෙ ම ඉස්සරහට යන්න තමයි"

dileep

භූත කෝච්චියේ පෙට්ටියක සැඟවී ජෝර්ජ් සහ ටිමී තඩ මාරුවක වැටී සිටින බවට අබමල් රේණුවක තරමින් හෝ නොදැන තාප්පය හැදා ඔවුහු ඉදිරියට ඉදිරියට ගමන් ගත්තෝ ය. දුම්රිය මාර්ගය ඔස්සේ කොතෙක් දුර ගෙවා ගමන් ගත්තද වැදගත් යැයි සැලකිය හැකි කිසිත් ඔවුනට දක්නට ලැබුණේ නැත.

එක්වර ම අඳුරු උමගට ආලෝකය වැටෙන කුහරයක් දැක ජුලියන් කතා කරන්නට පටන් ගත්තේ ය. " උමගේ අවසානේ. අර ඈතින් පේන්නෙ කිල්ටිගේ යාඩ් එක. එතනත් කෝච්චිය තිබුන් නැත්තම් ඇත්තට ම ඒක අතුරුදන් වෙලා කියල තමා හිතන්ට වෙන්නෙ"

උමගයේ ඉතිරි අර්දය නිහඬව මුනිවත රකිමින් ගමන් ගත් ළමුන්ට ඉතා ඉක්මනින් ම හමා යන නව වා රැල්ලක සුවය දැනෙන්නට වී ය.කිල්ටිගේ අංගනය පිරී තිබුණේ විවිද වැඩ පොළවල්වලිනි. බිම්ගෙයට පිවිසෙන අන්තය වල් පැලෑටීන්ගෙන් ගහන ව තිබූ අතර රේල් පීළි අතර පවා තණ පඳුරු වැවී තිබුණි.

dileep

" මේ වල් වැදිල තියෙන විදිහෙන් නම් පේන්නෙ අවුරුදු ගාණකින් මේ රේල් පීලිවල කෝච්චියක් ගිහින් නෑ කියන එක " ජුලියන් කියා සිටියේ ය. " කෝච්චියක් ගියා නම් මේ කැලෑ චප්ප වෙන්න එපායැ"

" මේක නම් පුදුමයක් " ඒ ඩික් ය. " අපි කෝච්චිය එළියට එනවත් දැක්කා.ඇතුළට යනවත් දැක්කා.ඉතින් ඒකට මොකද වුනේ ?"

" ඇත්තට ම ඇත්ත ම හොල්මන් කෝච්චියක් වගේ අතුරු දන් වෙලා" ජෝක් ද අදහසක් පළ කොට සිටියේ ය. සැබැවින් ම දැං

දැන් අද්භූත ගතියකින් ඔහුගේ සිත ද සලිතවීගෙන ඒ. කොලුවාගේ මුහුණ පවා රත් පැ ගෙන තිබෙන්නේ එබැවිනි. " සමහර විට ඇත්තට ම එහෙම ද දන්නෙත් නෑ. අපි වැරදි වෙලා සෑම් ලා හරි වෙන්නත් පුලුවන්. නිකන් හිතන්න. මහ රෑට එනවා. මහ රෑම අතුරුදන් වෙනවා. කෝච්චියක් ගිය බවට ලකුණක් වත් නෑ"

අෑන් උඩ විසි වී ගියා ය. ඇත්තට ම භූත කෝච්චියක් නම්... " අනේ ඒ වගේ ඒවා කියන්න එපා " යි අෑ කන් කෙදිරි ගෑවා ය. " මට බයයි"

" ආපු පාරෙන් ම අපි ආපහු යමු " ජෝක් යෝජනා කළේ අන් කළ යුත්තක් නො පෙනුනු හෙයිනි. " සමහර විට එනකොට මොකක් හරි හෝඩුවාවක් හම්බෙන්ඩ ප්ලුවන් කළින් අපිට හොයා ගන්න බැරි වුනු"

dileep

" අනේ මට නම් බෑ ආපහු ඔය බය හිතෙන උමග දිගේ ඇවිදින්න. මම මෙතනින් එළියට ගිහින් උමගට උඩින් එන්නම්. "

එබැවින් අනිත් ළමුන් තිදෙනා යළිත් උමගය ඔස්සේ පැමිණෙන අතර අෑන් හැකි ඉක්මනින් උමගයට ඉහළින් වල් වැදුනු අඩි පාර ඔස්සේ ඔලීගේ ස්ටේසම කරා දිව යන්නට පටන් ගත්තා ය. අනපේක්ෂිත යමක් ඇගේ නෙත ගැටුණේ ඔලීගේ අංගනය කරා පැමිණ සෙස්සන් පැමිණෙන තෙක් කඳුවැටිය මත වාඩිගෙන බිම්ගේ දෙස අෑ බලා සිටින අතර ය. ලී කකුල් සෑම්ගේ චායාවකුදු දක්නට නො වූ අතර ඔහු මඩුවේ සිටිනු ඇතැයැ අෑ අනුමාන කළා ය.

කිසිදු සිදුවීමකින් තොරව මිනිත්තු දෙකක් හෝ තුනක් නිහඬ ව ගෙවී ගියේ ය. එක්වර ම වේගයෙන් පැමිණි කාරයක්

සැම්ගේ මුර පොළ අසළ නවතනු ඇගේ නෙත ගැටුණේ ඊ ළඟට ය. ඇන් වහා නැගිට්ටා ය. නැතහොත් ඇට නැගිට්ටුනා ය. කවුදෝ මනුස්සයෙක් කාරයෙන් බැස්සේ ය. ඔව්.. ඒ නම් ජෝක්ගේ බාප්පා හෙවත් ඇන්ඩෲස් මහතා මිස අනෙකෙකු නො වන බව ඇට සහතික ය.

දොර වේගයෙන් ඇද විවර කරගත් ඇන්ඩෲස් මුර කුටිය තුළට පිවිසියේ කිසිදු පැකිලීමකින් තොර ව ය. කටහඬවල් කිහිපයක හඬ අනතුරු ව ඇට ඇසෙන්නට පටන් ගත්තේ ය. ඒ හාත් සමගම ලොරියක හඬක් ද ඇසෙන්නට වූ අතර ඊළඟට ලොරියක් ද පැමිණ මුර කුටිය අසල නවතනු ලැබී ය. ලොරියෙන් බැස්සේ ඈ මීට පෙර දැක පුරුදු මිනිසුන් තිදෙනෙකි.

" දෙවියනේ. ඒ ගොවිපලේ වැඩට අරන් තිබ්බ කම්මැලි සේවකයො තුන් දෙනෙක්නෙ " ඇන් තමාට ම මුමුණා ගත්තේ ඔවුන් කවුදැයි දැන හඳුනා ගත් හෙයිනි. " ඒත් මේ මිනිස්සු මෙතන මොකද කරන්නෙ ?"

සුලු වේලාවකින් කුටියෙන් පිතටට බට ඇන්ඩෲස් මිනිසුන් තිදෙනාට එකතු වූවේ ය. මද සාකච්චාවකින් ඉක්බිති ව ඔවුහු බිම්ගේ කරා විහිදෙන කෝච්චි පාර ඔස්සේ ඉදිරියට ඇදෙන්නට වූහ. ඇන්ගේ හදවත ඇන හිටියා ක් වැන්න. දෙවියනේ. ජූලියන් ඩික් ජෝර්ජ් තාමත් උමග තුළ ය. දැං ඉතින් ඔවුන් ඇන්ඩෲස්ලාට හමු වීම වලක්වාලිය හැකි වන්නේ නැත. ඊ ළඟට කුමක් සිදුවිය හැකි ද ?

" විනාශයි. මට ගිහින් කොල්ලො තුන්දෙනාට කියන්න වෙලාවකුත් නෑ. මුන් හතර දෙනා එයාලට හොදට ම තඩි බායිනෙ. මං මොකක් ද කරන්නෙ ?"

භීතියට පත් පුංචි ඇන් ද අනේ කල්පනා කරා ය. අහස පොළොව ගැටලූවා ය. එහෙත් අවසානයේ බකන් නිලා සිදු වෙන්නක් බලා සිටීම හැර කළ යුත්තක් නො වන බව ඕ පසක් කොට ගත්තා ය.

ඉතින් ඈ බලා සිටියා ය. බොහෝ වේලා බලා සිටියා ය. කෑම බීමත් ජූලියන් අයියා අනේ බැවින් ඈ බඩ ගින්නේ ම බලා සිටියා ය. කවුරුවත් උමගයෙන් එළියට ආවේ නැත. දුවන පොරකන හඬන පහර දෙන හඬක් ඇසුණේද නැත. පපුවට දැනෙන බිය අමතක කොට සෑම් ලොක්කා හමු වී ප්‍රශ්න කිහිපයක් ඇසිය යුතු යැයි ඇය අවසානයේ හිත හදා ගත්තා ය.

කොකෝවා වගයක් පානයේ නියැලෙමින් සෑම් සිටියේ මුර කුටිය තුළ ය. ඒ කොකෝවා නම් කට හරියේ තියන්නට බැරි තිත්ත ඒවා විය යුතු යැයි ඇන් තනි හිතට හිතා ගත්තේ මහල්ලා ගත සලිත කළ සැටියෙනි. ඇන්ගේ සෙවනැල්ල දැකීමත් සමගින් සෑම් දනි පනි ගා නැගී සිටියේ ය. අත මිට මොලොක් කොට උරුක් කර ගත් සෑම් ලොක්කා පුංචි ඇන්ට කඩා පැන්නේ ය.

dileep



" මොකක්. උඹලා ආයෙත් ආව ද ? එතකොට උබලා උමග ඇතුළට ගියේ නැද්ද. යක්ෂ පැටව්. මං ඇන්ඩෘස්ටත් කතා කළා

තොපි කුදලගන යන්න කියල. එතකොට උඹලා මිනිහගෙන් ගැලවෙලා උමගෙන් එළියට ආවෙ කොහොම ද ? කෝ අනික් එවුන් ආ. .?"

 දැං දැං ඈන්ට කරුණු කාරණා සියල්ලක් පැහැදිලි ය . එසේ නම් ඈන්ඩෘස්ගේ සම්ප්‍රාප්තිය සිදු ව ඇත්තේ සෑමාගේ දුරකතන ඇමතුමක් හේතුවෙනි.

 " වරෙන් කෙල්ලෙ ළඟට .. " සෑම් ගොරහඬ හඬින් යළිත් පවසා දෑත් විසල් කොට ඈන් දෙසට කඩා පැන්නේ ය. " අනික් උන් මක බෑවුනාවේ. මං අද තෝව අල්ල ගන්නව. "
 යටි ගිරියෙන් හඬක් නැගූ ඈන් පස්ස නො බලා දුවන්නට පටන් ගත්තා ය. සෑම් ඈ අල්ලා ගන්නට යාර කිහිපයක් ඈ පසු පසින් ආවත් ගැහැණු ළමයා අල්ලා ගැනීමේ හැකියාවක් ඔහුට තිබුණේ නැත. ගල් අඟුරු මිටක් අතට ගත් හෙතෙම ඈන් දෙස දමා ගැසුවත් එකදු ගල් අඟුරක් හෝ ඈන්ට ණො වැදුනේ ය. ඈන් හැල්මේ දුවන්නට පටන් ගත්තා ය.

dileep

 හඬමින් ද හතිලමින් ද හෙදර් කඳු වැටිය ඈන් තරණය කළේ , දිවයන වේගය යන්තමින් හෝ අඩු නො කර ගෙන ය. " අනේ ජූලියන්. ඩික.. ඔයාලට මොකද වුනේ.. අනේ ජෝර්ජ්.. ඉන්න තැනකින් එන්නකෝ.. " යි ඈ දිගින් දිගට ම කෑ ගැසුවා ය. " ජෝර්ජ් ඇවිල්ල හිටියොත් එයා නම් බය වෙන එකක් නෑ උමග දිගේ ආපිට යන්න. මං මේක ලූෆී මහත්තයට කියන්න ඕනි. එයා දන්නව කරන්න ඕනි දේ" වැඩි දුරටත් දුවන ගමන් ම පුංචි ඈන් සිතුවා ය

 හෙදර් පඳුරු මත පැටලී ඇද වැටී රිදුම් දෙන සීරීම් නහුතයක් ද සමගින් ඈන් ලූෆී උන්නැහේ සොයා දුවන්නට පටන් ගත්තා ය. පුංචි පැංචි මී පැටික්කියක් බඳු පුංචි ඈන් දැං සිතන්නේ එක ම එක දෙයක් ගැන පමණ ම ය. ඒ ලූෆී සර් හමු වී සෑම දෙයක් ම

මුල සිට අගටත් අග සිට මුලටත් කියා අයියලා තඩ මාරුවෙන් ගලවා ගැනීම මිස වෙනත් කිසිවක් නො වේ . ඇත්තට ම දැං වැඩිහිටි කාගේ හෝ උපකාරයක් ඈට නැතු ව ම බැරි ය.

" ලූෆී සර්.... ලූෆී සර්... ඔයා කොහෙදෝ.. අනේ ලූෆීසර්.. බේරගන්නකෝ..."

එහෙත් ලූෆී සර් නම් ඈට හමු වූවේ නැත. ගෝර්ස් පඳුරින් වැසුනු බිම් තීරයක් කරා ඈ අවසනයේ පැමිණියා ය. කඳවුර තිබෙන්නේ මේ ගෝර්ස් පඳුරු අසල යැයි ඇය සිතුවා ය. එහෙත් එහෙත් කඳවුරද මුලුවනින් ම අතුරු දන් වී ගොසිනි. ඇන් අවසානයේ මග වරද්දාගෙන තිබෙන බව වටහා ගත්තා ය. කොරේ පිටට මරේ යැයි කීවාක් සේ, ගහෙන් වැටුණු පසු ඇන්ට ගොනා ද ඇන තිබේ. ඇත්තට ම දැන් ඈ වල්මත් ව ඉබා ගාතේ ඇවිදිමින් සිටී.

dileep

" මට පාර වැරදිලා " කම්මුල ඔස්සේ ගලා යන කඳුලු පිස ගනිමින් ඕ තමන්ට ම කියා ගත්තා ය. " දෙයියනේ මං මේ ඉන්නෙ කොහෙද ? ලූෆී සර්... ලූෆී සර්....."

අහිංසක ඇන්. අන්තිමට මග ද වරද්දා ගෙන තිබේ. ඈ කඳවුර සොයා ගත යුතු ය. එහෙත් ඒ කරන්නේ කොහොමද ? පුංචි පැංචි මී පැටික්කී ඇන් ඉබා ගාතේ කඳ වුර සොයා හක්කලම් කරමින් හඬමින් මොර දෙමින් සිටින්නී ය. " අනේ ලූෆී සර්.. ඔයා කොහෙද ? මාව ඇහෙනව ද ? ලූෆී සර්....."

## 17 පුදුම හිතෙන සොයා ගැනීමක්..

මේ වන විට ළමුන් තිදෙනා සිටියේ දුම්රියේ සලකුණක් වේදැයි පිරික්ෂමින් උමගය ඔස්සේ ඔලීගේ කෝච්චි පොළ දෙසට ගමන් කරමිනි. නුදුරෙහි හට ගැනෙන සිදුවීම සම්බන්දයෙන් කිසිදු හැඟීමක් ඔවුන් තුළ තිබුණේ නැත. ඔවුන්ගේ ඒකායන පරමාර්ථය භූත කෝච්චිය සොයා ගැනීමයි.

dileep

මද දුරක් පැමිණි පසු විශේසිත යමක් සොයා ගැනීමට ජූලියන් සමත් වූවේ ය. " බලන්න " යි රේල් පාර දෙසට විදුලි පන්දම හොඳින් යොමු කරමින් ඔහු කීවේ ය. " අපිට මෙච්චර වෙලා දකින්න හම්බුනු රේල් පීලි මලකඩ කාල ගන්න ම දෙයක් නැති ඒවා. ඒත් මෙතන ඉදන් තියෙන්නේ එහෙම ඒව නෙමේ. රේල් පාරෙ මලකඩ බැදෙන් නැත්තෙ ඒක පාවිච්චි කරන නිසානෙ"

සැබැවින් ම ජූලියන් කීවා නිවැරදි ය. කිල්ටිගේ යාඩ් එක දෙසට විහිදුනු රේල් පීලි මළ බැඳී දුර්වර්ණ ව පැවතියද ඔලීගේ කෝච්චි පොළ දෙසට විහිදෙන රේල් පීලිවල එබන්දක් දක්නට නොමැත.

" මේක මහ පුදුම හිතෙනදෙයක්නෙ. කෝච්චිය ඔලීගෙ යාඩ් එකේ ඉඳන් මේ හරියට ඇවිත්ලා. ඒත් දැං කොහෙද . "

ඩික් ප්‍රශ්න කළේ ය. ජූලියන් ද ඩික් දෙස බලා තොල පෙරළුවේ ඩික්ගේ ගැටලුව ම ඔහුට ද තිබූ හෙයිනි.

" අපි මෙහෙම කරමු. මුලින් ම යමු ඔලීගෙ බිම්ගේ පටන් ගන්න තැනට. ඊට පස්සෙ එතන ඉඳන් පිළිවෙලකට රේල් පීලි දිහා බලාගෙන ආපිට එමු. "

කවුරුත් ජූලියන්ගේ යෝජනාව එකහෙලා අනුමත කළෙන් ළමෝ යළිත් ඔලීගේ බිම්ගෙය ඇරඹෙන ස්ථානය කරා ඇවිදින්නට පටන් ගත්හ. විදුලි පන්දම් එළි රේල් පීලි මත ම යොමුවැ තිබුණෙන් ඔවුන් ඉදිරියට පැමිණෙන මිනිසුන් සිව් දෙනා ළමුන් දැක්කේ නැත. එසේ වුව ද මිනිසුන් සිව් දෙනා නම් ළමුන් සිව් දෙනා ඕනෑවටත් වැඩි හොඳින් දර්ශනය කොට තිබුණි. උමගයේ නැම්මක සඟව ගත් ඔවුහු ළමුන් එතැනට පැමිණෙන තෙක් බලා සිටියහ.

" හරි. මං හිතන විදිහට .." යි කියමින් ජූලියන් යමක් කියන්නට පටන් ගත්තත් එය අවසන් කරන්නට ඔහුට හැකි වුනේ නැත. එක් වර ම හොල්මන් රැලක් පරිද්දෙන් කඩා පතිත ලද මහත දෙහෙතැති සිරුරු හතරක් විසින් කොල්ලන් තිදෙනා කුදලා අල්ලා ගත් හෙයිනි. මහ හඬින් මොර දෙමින් ජූලියන් දඟලන්නට පටන් ගත්තත් පලක් වූවේ නැත. පන්දම් බිම වැටිණි. කවුරු කවුරුත් විදුලිපන්දම් හැරදමා මිනිසුන් තිදෙනා හ සටන් කරන්නට පටන් ගත්තෝය. එහෙත් ඒ පහසුවෙන් ජය ගත හැකි සටනක් මෙන් පෙනුනේ නැත

dileep



තවත් තත්පර 20කින් පමන තිබිණි ඔවුන්ගේ අත් පසුපසට කොට අල්ලා ගන්නා ලදී. ඒ අතර ජූලියෙන් නොකඩවා පා පහර එල්ල කරන්නට පටන් ගත්තේයපා පහර හැරුණු විට අතින්ද පහර එල්ල කරන්නට පටන් ගත්තේ ය එහෙත් එය වැඩි වේලාවක් කරගෙන යෑමට ඔහුට හැකි වූයේ නැත ඔහු කුඩා ගත් තැනැත්තා ජුලියන්ගේ දෑත් අල්ලා තෙරපා ගත්තේ දරා ගත නො හැකි තරමේ වේදනාවක් කොලුවාට උරුම කර දෙමිනි.

" මේකෙ තේරුම මොකක්දැයි " ඩික් කෙඳිරි ගෑවේ ය. " තමුසෙලා කවුද ? මොනව කරනව කියල ද හිතන් ඉන්නෙ ? අපි මේ උමගෙ පොඩ්ඩක් ඇවිදලා බැලුවයි කියල අපි ව අල්ලගන්න මේක තමුසෙලෑ භූදලයක් ද ?"

" මුන්ව අරන් යනවා මෙතනින්"

හුරු පුරුදු කටහඬක් ගිගුරුවේ ය. " මිස්ටර් ඇන්ඩෲස් ඔහේ ? " යි ජුලියන් කටහඬ වහා හදුනා ගත්තේ ඇන්ඩෲස් දකින්නට ද පෙර ය. " අපිට යන්ට දෙන්ඩ කියන්න. ඔයා අපි ව දන්නවනෙ. අපි අර කඳවුරු බැඳපු ළමයි. මේ ජෝක්. එයත් අපි එක්ක ඉන්නව"

ඇන්ඩෲස් වචනයක් වත් කීවේ නැත. ඒ වෙනුවට ජෝක් වෙත පිය නැගූ හේ අත පුරවා කනේ පහරක් එල්ල කළෙන් ජෝක් බිම ඇද වැටුණේ ය.

අඳුරේ පැටලැවෙමින් සිරකරුවන් සිව් දෙනා මිනිසුන් විසින් උමගය තුන් පැත්තකට බෙදෙන සංදිස්ථානය කරා රැගෙන යන ලදී. එක් වර ම ඇන්ඩෲස් තාප්පය බැඳි දෙසට පිය නගනු

dileep

ජූලියන්ට ඇසුණත් විදුලි පන්දමක් නො තිබුණෙන් කිසිත් පෙණුනේ නැත. යමක් ඇරෙන වැහෙන හඬක් අනතුරුව ඇසුණේ ය.

භූත කෝච්චිය ගමන් ගත්තේ ද ඇන්ඩෲස් විසින් විවර කරන ලද තාප්පය තුළින් වග ජූලියන් දැන සිටියේ නැත. දැං ඔවුන් ගමන් ගනිමින් සිටින්නේද තාප්පයක් හරහා සකසන ලද කුහරයක් තුළින් වග කිසිවෙකුත් දැන සිටියේද නැත.

දෙපැත්ත ගඩොල් බැඳි බිත්තීන්ගෙන් වට වූ පුදුමාකාර ස්ථානයක දැන් ඔවුහු නැවතී සිටිති. ජෝර්ජ් විසින් සොයා ගත්තේද මෙම අපූරු ස්තානය මිස වෙනත් ස්තානයක් නො වේ. යථෝක්ත අබිරහස් කුටිය තුළ වන භූත කෝච්චි පෙට්ටියක සැඟවී ජෝර්ජ් සහ ටිමී සියල්ල අසා සිටින බැවුද ළමුන් හෝ ඇන්ඩෲස් දැන නොසිටි බවද සඳහන් කළ යුතු ය.

dileep

ඇන්ඩෲස් විදුලි පන්දමක් දල්වා ළමුන්ගේ මුහුණු එකිනෙක පිරික්ෂන්නට පටන් ගත්තේ ය. පුදුමය හැරුණු කොට ඒ මුහුණු තුලින් බිය පත් බවක් තැති ගැන්මක සේයාවක් , හෝ පළ නො වීම ඇන්ඩෲස්ගේ පුදුමයට හේතුවක් විය.

" මම උඹලට කළින් ම කීව බිම් ගෙට එන්ඩ එපා කියල. තොපිට කියලයි තිබුණෙ මෙතන බයානක තැනක් කියල. ඒත් උඹල මොකද කරේ. කියපු දෙයක් කණකටවත් ගත්තෙ නෑ. අලුගුත්තේරු හිතුවක්කාර හැත්ත. අපේ වැඩේ ඉවර වෙන දවසක් එනකන් උඹලව මේකෙ ම ගැට ගහල හිර කරල තියෙනව. මේක අපේ වරදක් ම නෙමේ. උඹලගෙ වැරදි. . සමහර විට දවස් තුනක් වෙන්නත් පුලුවන්. නැත්තම් සති තුනක් වෙන්නත් පුලුවන් "

" උඹල හිතාගෙන නම් ඇති," ජුලියන් බිය නැතිව කීවේ ය. " ඒත් කරන්න වෙන්නෙ නෑ. අපි අතුරුදන් වුනා ම අපි ව හොයාගෙන මිනිස්සු එයි"

" අනේ පළයන් ඇට කිච්චෝ.කාටවත් මේ තැන හොයා ගන්ට වෙන්නෙ නෑ" යි මිනිසෙක් කීවේ ය. " පීටර්ස්. මුන්ව ගැට ගහපං"

පීටර්ස් වශයෙන් හැඳින් වූ මිනිසා ළමුන්ගේ අත පය ගැට ගසා දැම්මේ ය. බිත්තියට හේත්තු කොට රහස් පයෝශකයින් තිදෙන පතබාවනු ලැබිණ.ජුලියන් යළිත් තම හඬ අවදි කළේ ය.

" උඹලට මනුස්සකමක් නැද්ද ? උඹල මේක ඇතුළෙ මොකක්ද කරන්නෙ ? අපි දන්නෙ නෑ උඹල මොනවද කරන්නෙ කියලවත් "

dileep

" ඒ කියල උඹලට යන්ඩ දෙන්ඩ අපිට බෑ " එවර කතා කළේ සුහදශීලී ඇන්ඩෘස් මහත්මයා ය. සතුරන් කාටත් නො වන තරමේ දැඩි හඬක් නායකත්වයට සුදුසු පෞර්ශයක් ඔහුට තිබිණ.

" අපි ව මෙතන තියා ගත්ත ම අම්මට මොකද වෙන්නෙ ?" යි ජෝක් ප්‍රශ්න කළේ ඉවසීමේ සීමාව බිඳී ගිය බැවිනි. " එයාගෙ පපුව පැලෙයි මං නැති කොට"

" ඉතින් පැලිච්චාවේ. මට පාං ද ?මේක උඹලගෙ වැරැද්දක් මිසක් අපේ වැරැද්දක් නෙමේ"

තවත් නොබෝ වේලාවකින් මිනිසුන් සිව් දෙනා පිට ව ගියේ තඩ මාරුවේ දැමුණු ළමුන් සිව් දෙනා කුටිය තුළ තනි කරමිනි.

පෙර ඇසුණු ඇරෙන වැහෙන ක්ලෑන්ග් හඬ යළිත් ඔවුනට ඇසුණත් ඒ කුමක් දැයි අවබෝදයක් ඔවුන් තුළ නො වූවේ කුටිය තුළ පැවතියා වූ ගණ අඳුර හේතු කොටගෙන මෙලෝ හසරක් ඔවුනට නො පෙණුන බැවිනි. දැඩි අවදානයෙන් දෙකන් ඇර සිටියෙන් මිනිසුන් පිට ව ගිය බැව් සක්සුදක් සේ ළමුන්ට පැහැදිලි වී ය . එතැන් සිට ඔවුන් තුළ හට ගත්තේ ගැඹුරු ගුප්ත නිහැඬියාවකි.

" මෘගයෝ. තිරිසන්නු. දැං උන් කොහෙටද ගියේ ?" ජුලියන් පහත් හඬින් ඇසුවේ එහාටත් මෙහාටත් ඇඹරෙමින් කඹය ලිහා ගැනීමේ උත්සහයක යෙදෙමිනි.

" කොහෙ හරි හොර උමගකට " යි ඩික් පිළිතුරු දිනි. " අම්මෝ. මේකුන් මගෙ කකුල් දෙක හොඳට ම හිර වෙන්න බැඳල. කඹේට කකුලත් කැපෙනව වගෙ"

dileep

" ඉතින් ඊ ළඟට මොකද වෙන්නෙ ?" හැඬෙන නො හඬෙන හඬකින් ජොක් ඇසී ය. දැන් නම් වීර වික්‍රමය ඒ තරම් සුබ වාදී බවක් , පෙර එයට තිබූ කැමැත්තක් ඔහුට නැති ලෙසකි.

"ෂ්... මට මොකක්ද ශද්දයක් ඇහෙනව. කවුරු හරි ඉන්නව ඇතුළෙ"

" ඒක නිකන් බල්ලෙක් කෑ ගහනව වගේ සද්දයක් " යි නිහඬව සවන් යොමු කළ ඩික් කීවේ ය.

සැබැවින් ම එය ටිමී නැමති ළමුන් හොඳින් දැන හඳුනා සිටි බල්ලෙකුගේ පිළිගැනීමේ ගීතිකා හඬ මිස වෙනත් කිසිවක් නො වේ. ඒ සිටින්නේ ජුලියන්ලා බව උඟ හඳුනා ගත්තේ ය. එහෙත් ජෝර්ජ් ටිමියාගෙ හඬ වලකන්නට යන්ත දැරුවේ

තවමත් මිනිසුන් කුටිය තුළ වී යැයි සැක සංකා උපදවාගෙන සිටි හෙයිනි.
කොල්ලෝ තිදෙන හොඳින් අසා සිටියහ. ජෝර්ජ් අවසානයේ උගේ කර පටිය අතැහැරියා ය. අඳුරේ වුව ටිමියා කොල්ලන් සිටි දෙසට පියාඹා ආවේ මිටින් හළ කුරුල්ලෙකු ලෙසිනි.මුහුණ තෙත් කරන සීත දිවක පහස ජුලියන්ට දැණුනේ ය. කුඩා බිරුමක් ද නැගූ ටිමියා ඔහුගේ ඇඟට පැන්නේ ආදරය උතුරා යමින් තිබූ බැවිනි.

" ටිමී.. මේ බලහන් ඩික්.. අපේ ටිමියා.. " යි ජුලියන් ප්‍රීතියෙන් බෙරිහන් දුන්නේ ය. නැත හොත් ජුලියන්ට කෑ ගැසණේ ය. " මෙයා මොන ලෝකෙන් ආවද මන්දා.. ටිමී පැටියෝ. මේ ඇත්තට ම උඹ නේද ?"

" වුෆ්.. " යි ටිමී එකඟ වීය. උං ඩික් සහ ජෝක් දෙදෙනාගේද රස බලා සිටියේ ය.

dileep

" එතකොට කෝ ජෝර්ජ් " යි ඩික් ඇසී ය.

" මං මෙහේ " යි ජෝක් කෝච්චි පෙට්ටියෙන් පිතටට බැස්සා ය. ඈ විදුලි පන්දම දල්වා කොල්ලන් තිදෙනා දෙසට ඇවිද ආවා ය. " මොකද වුනේ ? කොහොමද මේක ඇතුළට ආවේ ? කොහෙදිද උඹල ව අල්ල ගත්තෙ ?"

" ඊට කළින් ජෝර්ජ් උඹ කොහොමද මේක ඇතුළට ආවෙ කියල. මේක නම් හීනයක් වගේ "

" උඹලගෙ කඹ කපල ඉවර වෙලා වුනු දේ කියන්නම් " යි කියමින් ජෝර්ජ් කොල්ලන් තිදෙනා බැඳි කඹ කපන්නට වූවා ය. වාසනාවකට ඈ කුඩා පිහියක් ද රැගෙන විත් තිබුණි. ජෝර්ජ්ට

පින් සිද්ද වෙන්නට තවත් තත්පර කිහිපයකින් රිදුම් දෙන අත පය පිරිමැද ගනිමින් දෙපයින් නැගී සිටින්නට කොල්ලන්ට හැකි විය.

"ස්තූතියි ජෝර්ජ්. දැං තමයි ඇඟට ලේ ටිකක් ඉනුවෙ " ජුලියන් කීවේ ය. " ඉතින් අපි කොහෙද මේ ඉන්නෙ. උඹ කොහොමද මේක ඇතුළට ආවෙ "

" අපි ව ඉතින් ඔයාල වගෙ කැන්දගෙන එන්න කට්ටිය නෑනෙ " යි ඇසකින් ඉඟියක් ද මරා ජෝර්ජ් සිදුවූ සංහදිය කියන්නට පටන් ගත්තා ය. භූත කෝච්චිය සොයා ගත් අන්දමත් අලිබබාගේ ගුහා දොරටුවත් ඈ කියන විට කොල්ලන්ගේ ඇස් උඩ ගොස් තිබිණ.

" දැක්කද. මිනිස්සු අර දෙවෙනි උමග ඇතුළෙ කාමරයක් හදල තියෙන හැටි " යි වැඩි දුරටත් කී ඕ විදුලි පන්දම දල්වා ඔවුනට වටා පිටාව දැක බලා ගැනීමේ අවස්තාව ද උදා කොට දුන්නා ය " ඉතිං එහෙමයි කෝච්චිය භූත කෝච්චියක් කරේ. එක පැත්තකින් ඒ මිනිස්සු දක්ෂයි. නැද්ද ?"

" ඒක ඇත්ත " යි ජුලියන් එකඟ වී ය. " ඒත් මට තියෙන ප්‍රශ්නෙ ඇයි මේ මිනිස්සු මේ විදිහේ නඩගමක් නැටුවෙ කියලයි. මොකක්ද උන් මේක ඇතුළෙ කරන වැඩේ ?"

" ඒක තමයි අපි දැං හොයා ගන්න හදන්නෙ. ජුලියන් මේක තමයි අපේ වෙලාව. නිකන් හිතන්නකො දෙයක් හංගන්න මෙතන කොච්චර අපූරුද කියලා. ඒක නෙමේ කෝ බං ඈන් ?"

" ඈන් ඔලීගෙ යාඩ් එකට ගියා . එයා මුලින් අපි එක්ක මේක ඇතුළෙන් කිල්ටිගේ යාඩ් එකට ගියා. ඊට පස්සෙ ආපහු උමග

ඇතුළින් යන්න අකමැති නිසා පිට පාරෙන් ඔලීගෙ යාඩ් එකට ගියා. දැං නම් කෙල්ල හොඳටම බය වෙලා ඇති. මට බය බලන් ඉදල බැරි ම තැන එයත් මේක ඇතුළට එයි කියල. එහෙම වුනොත් අර මදාවින්ට ඒකිත් අහු වෙයි "

කාට කාටත් යළිත් බිය මුසු සිතුවිලි ගලා එන්නට පටන් ගත්තේ ය. ඈන් කොහොමටත් අඳුරු උමගයන්ට කැමැත්තක් නැත. එවන් අඳුරු උමගයක් තුළ මිනිසුන් සිව්දෙනෙකු හා තඩමාරුවක වැටුණහොත් ?

එතැන් සිට ඔවුහු වහ වහා කුටිය ගවශනය කිරීමේ කටයුත්ත ඇරඹූහ. ජෝර්ජ්ගේ විදුලි පන්දම් එළියෙන් ගඩොල් බිත්තිය මත පවතින ලීවරයක් බඳු යමක් ප්‍රථමයෙන් දර්ශනය කළේ ජෝක් ය. බොහෝ විට එය දොර අරින වහන ක්‍රමය විය යුතු යැයි ඔවුහු සිතූහ.

dileep

ජෝක් ලීවරය පහළට ඇද්දේ ය. එහෙත් අලිබබා දොරටුව හැරුණේ නැත. ඒ වෙනුවට සිදු වූවේ මහ දවල් බඳු ආලෝකයකින් ඔවුන් සිටි කුටිය පිරී යාමයි. හදිසි ආලෝකය හේතුවෙන් අන්ද ව ගියාක් මෙන් කාට කාටත් මොහොතකට දැණිනි.

'" හොඳ සොයා ගැනීමක් ජෝක් " යි ජූලියන් කී ය. " දෙයියන්ගෙ පිහිටෙන් දැං අපිට කරන දේ බලා ගන්ඩ පුලුවන්"

ඒ හා සමඟ ම ජූලියන්ට භූත කෝච්චිය දැකීමේ වාසනා මහිමය උදා වී ගියේ ය. සැබැවින් ම එය නම් මේ ශතවර්ශයට අයත් එකක් නො වෙතැයි ඔහුට සිතිණි.

" යකෝ මේක නම් තනිකර කෞතුක වස්තුවක්. එහෙනම් මේකයි භූත කෝච්චිය "

" මං හැංගිලා හිටියෙත් මෙන්න මේකෙ පෙට්ටියක තමයි. "

" හරි අපි දැං මේකවටේට තියෙන ගුහා වගේ ඒව පරික්ෂා කරල බලමු " ඩික් කීවේ නොයිවසිල්ලෙනි.

අසළ ම වූ ගුහාවකට ඔවුහු සම්ප්‍රාප්ත වූහ. විවිද මාදිලියේ පෙට්ටි රැසක් එය තුළ ගොඩ ගසා අසුරා තිබුනි. පෙට්ටියක් පිතට ඇදගත් ජුලියන් එය විවර කළේ ය.

dileep



" මගෙ දෙවියනේ. සේර ම හොර බඩු. මේ බලන්න. මේකෙ තේ. මේව විස්කි. මේව බ්‍රැන්ඩි. මේ සේරම කිසි ම අනුමැතියක් නැති හොර බඩු. කලු සල්ලි ආකර. අර පෙට්ටි වල තියෙන්නෙ මොනව ද දන්නෙ නෑ"

දහස් ගණනක් වටිනා හොර බඩු ඇසුරුම් ඔවුන් විසින් සොයා ගෙන තිබුණි.

" ඉතින් මේ හොරබඩු මේකෙ ගොඩ ගහගෙන උන් මොනවද කරන්නෙ ?" යි ඩික් විචාලේ ය. " එයාල මේව කොහොමද මෙහාට ගේන්නෙ සහ කොහොමද මේව විකුණන්නෙ? අහා.. කෝච්චියෙන් උන්මේව මේක ඇතුළට ගේනව ඇති. ඊට පස්සෙ මෙතන හංගනව ඇති. ඒත් මේව විකුණන්නට ක්‍රමයක් තියෙන්ඩ එපායැ"

" ගේන විදිහට ම තමයි. ඇයි බං. මේක ඇතුළෙදි අසුරනවා. ඊට පස්සෙ කෝච්චියෙන් ම එළියට අරන් යනව. ඊට පස්සෙ ලොරිවලින් එළියට ගෙනියනවා" යි ජුලියන් තේරුම් බේරුම් කොට දුන්නේ ය.

dileep

" නෑ " යි ඩික් විරුද්ද විය. "උන් ඒව කෙලින් ම ලොරි වලින් මාර්කට් එකට අරන් යනව කියල හිතන්න බෑ. වෙන ම තැනක් තියෙන්න ඕන තාවකාලිකව ගබඩා කර ගන්න "

" මගේ අම්මගෙ ගොවිපළ " යි ජෝක් බියපත් හඬින් කී ය. " මේ ඔක්කොම ලොරි එහේ ගබඩාවට යනව. ඒකට තමා එයාල ගබඩාව පාවිච්චි කරනව ඇත්තෙ. "

" ඔය තියෙන්නේ.. " ජුලියන් ඔල්වරසන් දුන්නේ ය. " තමුසෙ හරි ජෝක්. ඒක තමයි වෙන්නෙ. කපටි හැත්ත. අර අපූරු ගොවිපළත් පාවිච්චි කරානෙ උන්ගෙ ජහ ජරා වැඩ වලට. එතකොට අර අරං ඉන්න කමකට නැති සේවකයොත් මේකට ම සම්බන්ද උන්.උන් බලන් ඉන්නෙ රෑට ලොරිවලින් කෝච්චියෙ ගේන හොර බඩු තොගය අරන් එන්න"

" හැබැයි කොල්ලෝ උඹේ බාප්පට මේ ජාවාරමෙන් සෑහෙන ගානක් හම්බෙනව ඇති "

" ඔව් . ඒකනෙ අපේ පුංචි ගොවිපලට අච්චර සල්ලි කන්දරාවක් ගලා එන්ට හේතුව.පව් අම්ම. මේව දැන ගත්තොත් පපුව පැළෙයි.මොන විලි ලැජ්ජාවක් ද දෙයියනේ. කවුද හිතුවෙ මගෙ බාප්පා හොර බඩු ජාවාරම් කාරයෙක් කියල. ඊටත් ඒකෙ ලොක්කා කියල. "

" ඔව්. එයාගෙ පස්සෙන් තව කවුරු හරි ඇති. කොයිකටත් අපි ඉක්මන් කරමු. ඔක්කොට ම කළින් මේකෙන් එළියට යන්න බලමු. දැනට මත් තවත් හොර බඩු තොගයක් එක්ක කට්ටිය ආපහු එනව ඇති "

" ඔව් ඒක ඇත්ත " යි ජෝර්ජ් ද එකඟ වූවා ය. " අපිට තව තියෙන්නේ ගැලවීමේ මාර්ගය සොයා ගන්න විතරයි "

" යමු." යි ජුලියන් කීවේ විදුලි ආලෝකය නිමා දමමිනි. " ජෝර්ජ් ටෝර්ච් එක ගහන්න. අපි මෙන්න මේ ගුහාවෙ හැංගිලා ඉමු. ඇස් ඇරගෙන හොඳට බලන් ඉන්න.

dileep

# 18 පළා යාමේ මාර්ගය

dileep

ළමුන් සිව්දෙනා ටිමියාද සමඟ විශාල ගුහාවක් වෙත පිවිස පෙට්ටි ගොඩක් පසුපස සැඟව ගත්තේ පළා යාමේ කටයුත්ත සඳහා එඩි නගා ගත් සිත්වලිනි.

" මේව නම් මේ ස්වභාවිකව ම හැදිච්ච ගුහා " ජුලියන් කීවේ ය. " මට හිතෙන්නේ මේ ගුහාවල වහල එකට එකක් සම්බන්දයි

කියල. ඒ කියන්නෙ කොතනින් හරි ගුහාවක වහළයක් උඩට නගින්න පුලුවන් නම් අර තාප්පෙට උඩින් උමන් එකට එකක් සම්බන්ද වෙලා තියෙන නිසා මේ කාමරේට උඩින් ගිහින් උමගකට ගොඩ වෙන්න පුලුවන්. ඒත් ප්‍රශ්නෙ මේ වහළවල් උමගෙන් වැහිල ද දන්නෙ නෑ කිසි ම හිඩැසක් නැතුව "

" එහෙම වැහිල ඇති කියල හිතන්ට බෑ. " ඩික් කීවේ ය. " උඹ ඔය ඔය කියනව වගේ වැහිල බ්ලොක් වෙලා තියෙනව නම් මුං කොහොමද දෙපැත්තෙන් තාප්ප බඳින්නෙ ?"

" ඒකත් ඇත්ත. කවුරු හරි කෙනෙක් මුළදිම මේ විදිහේ ගුහා මේක ඇතුළෙ තියෙන බවක් දැනන් ඉන්ට ඇති. ඒ කෙනා බිම්ගෙට ආව දවසක මේක හොර බඩු හංගන්න අපූරු තැනක් කියල තේරුම් අරන් මේ වගේ වැඩක් කරන්ඩ ඇති. අනික් අතට මිනිහට පරණ කෝච්චියක් එහෙමත් හොයා ගන්ට ලැබෙන්ඩ ඇති නොවැ"

dileep

" ඔව් ඔව්. ඊට පස්සෙ ඒක අලුත්වැඩියා කරලා භූත කෝච්චි සෙල්ලම පටන් ගන්ට ඇති. බිත්ති දෙකක් බැඳල රහස් කුටියක් හදන්ටත් හිතෙන්ට ඇති. මාර මොළකාර අපරාදකාරයො සෙට් එකක්"

" සමහර විට එහෙමත් නැතුවැති බං .කවුද දන්නෙ යුද්ද කාලෙ හදපු එව්ව ද කියල. එක එක පරීක්ෂන පවත්වන්න ආයුද හං ගන්න යුද්ද කාලෙ මෙහෙම තැං හැදෙව්වා කියල මං අහල තියෙනව. ඊට පස්සේ හොර බඩු කාරයින්ට මේක හොයා ගන්ට ලැබිල උන් පාවිච්චියට ගත්තා වෙන්ටත් බැරි කමක් නැනේ "

අයියා මලෝ සංවාදය අතුරේ ම පස් දෙනා ම ගුහා එකින් එක ගවේශනය කරමින් උමගයේ කෙළවර කරා ඇවිදයන්නට වූහ.

සෑම කුටියකම පැවතියේ පෙට්ටි සහ පෙට්ටගම් මිස වෙනත් වැදගත් යමක් මේ මොහොතේ හොයා ගැනීමට ඔවුනට හැකි වූවේ නැත. අවසානයේ ඔවුන් පැමිණ සිටියේ පිළිවෙලකට අඩුක් කරන ලදුව ඉහළට ගොඩ ගසා තිබූ පෙට්ටි සමූහයක් ළඟට ය. එකිනෙක ඉහළට තබා පඩි පෙළක පරිද්දෙන් පිළිවෙලකට අසුරා තිබූ පෙට්ටි හුණු කැබැල්ලකින් අංකනය කොට තිබිණි. ජුලියන් මද වේලාවක් ඒ දෙස පරික්ෂාකාරී නෙතින් බලා සිට යමක් කියන්නට පටන් ගත්තේ ය.

" මේ පෙට්ටි නිකන් තියල තියෙන්නෙ කොහෙට හරි නගින්න හදපු පඩි පෙලක් වගේනෙ. හැම එක ම නම්බර් කරලත් තියෙනව. බලමුද උඩට නැග ගන්න පුලුවන්ද කියල. ගුහාවෙ පියස්සට නගින්ට පුලුවන් වුනොත් ගොඩේ ගොඩ"

ජෝර්ජ්ගේ විදුලි පන්දම රැගෙන පෙට්ටි ගොඩ මැනවින් පිරික්ෂා බැලූ ඔහු එක් වර ම සුවහසක් බලාපොරොත්තු දල්වා ගත් දේ සොයා ගත්තේ ය. ඔහුට හමු වූවේ පෙට්ටි ගොඩට ඉහළින් ගුහාවේ පියස්ස හා සම්බන්ද කොට තිබෙන ලී දොරකි. දෙපාරක් නොසිතා ළමෝ කවුරුත් ඊට නැගුණාහ.

dileep

" අපිට ඕනි වුනෙත් මේකනේ " ජුලියන් වැඩි දුරටත් සැනසුම් සුසුම් හෙලන'තර කියා සිටියේ ය. " මං හිතන්නේ මෙතනින් යන්න පුලුවන් වෙයි කඳුකරයේ කොහේට හරි වුනත්. ලොරි ඇවිල්ලා ගුහාවෙ බඩු පටව ගන්නව ඇත්තෙ මෙතනින්.මං කියන දේ තේරෙනවද ? මෙතනින් කඳුකරේට යන්න පාරක් ඇති. "

" මොන තරම් දක්ෂ සැලැස්මක් ද ?" යි ඩික් කී ය. " ලොරි ගොවිපළට මෙතනින් බඩු අරන් යනවා. කෝච්චි ඇවිල්ලා මෙතනට බඩු ගේනවා. මාරයි."

" මම කිව්වෙ දවසක් මං ගබඩා කාමරේක පීටර්ස් ඉන්නව දැක්ක කියල. ඒ කියන්නෙ මිනිහ ලොරිය පුරෝල හොරබඩු ප්‍රවාහනය කරන ගමනුයි ඉදල තියෙන්නෙ. "

" හරියට හරි. " යි ජුලියන් ලී දොර හැර ගැනීමට හැකි තරම් දහි දමමින් කී ය. " මට මේ දොර අගලක්වත් හොල්ලගන්න බැනෙ. ඒත් මට පේන්න මේකට හයි කරපු ලොක් එකකුත් නෑ"

කිසිදු ආරාධනයකින් තොරව ජුලියන්ගේ උපකාරයට එක් වූ සය දෑතක් දොර විවර කර ගැනීමේ අරගලයක යෙදුනේ ය. පැන යාමේ වාසනාව පෙනි පෙනී එය අහිමි කොට ගන්නට නම් කාටවත් බලා පොරොත්තුවක් නැත. එහෙත් එහෙත් දාඩිය දමන සිරුරක් එතැන් සිට ළමුන්ට උරුම වූවා මිස අතට ගත් වාසනාව කටේ දා ගැනීමේ භාග්‍යය නම් හිමි නො වූ බව කිව යුතු ය. ඔවුහු අවසානයේ දොර හැර ගැනීමේ පරමාර්ථය අතැර දැමූහ.

dileep

" ජුලියන් මට හිතෙන දේ උඹට හිතා ගන්නවත් බැරි වෙයි. " ඩික් කීවේ කල්පනාබර ව ය. " එළියෙන් දොර මොකක් හරි එකකින් හොදට බැදලා හරි හිර කරලා හරි තියෙන්නෙ. ඒකයි මේක මෙහෙන් අරින්ට බැරි "

" අම්මපා එහෙම වෙන්ටත් බැරි නෑ තමයි. අනික මේ දොර හඳින් හංගපු තැනක තියෙන එකක් වෙන්ටත් එපායැ උඩින් වැවුනු හෙදර් එහෙමත් සෑහෙන්ට තියෙන තැනක් වෙන්ඩ ඇති. "

" ඒ කියන්නෙ අන්තිමට අපිට පැනල යන්ඩ ක්‍රමයක් නැති වුනා කියන එක ද ?" ජෝර්ජ් හැඬෙන්නට ආසන්න මුහුණින් කීවා ය.

" එහෙම ම හිතන්ඩ එපා. " යි ජූලියන් කීවේ ඇගේ සිත අස්වසමිනි. එහෙත් ඔහුට ද හැඟෙන්නේ දැනෙන්නේ එබන්දකි. " මහන්සිද ළමයි? නැත්තම් බඩ ගිනිද ?"

" දෙක ම " ජෝර්ජ් පිළිතුරු දුන්නා ය.

" හරි එහෙනම් අපි මොනව හරි කාල බීල ම ඉමු " යි පත්ව ඇති තත්වය වගේ වගක් නැති ගාණට , නැව ගිලුනත් බෑන් චූන් සෙයයාවෙන් ජූලියන් තව දුරටත් කීවේ ය. " දවල්ට කෑවට පස්සෙ තේ වෙලාවටවත් මොකුත් කන්න බොන්නත් අපිට බැරි වුනානේ. මට මතකයි අප ව ගැට ගහපු වෙලාවේ මිනිහෙක් මොකක්දෝ මල්ලක් විසි කරා ඇතුළට. එකත් එකට ම මොනව හරි කෑම ජාතියක් වෙන්ට ඕනෑ අපිට දැන්ම මේ මරු කටින් පැන ගන්ට බැරි නම් නොකා නොබී ඉදල තේරුමක් නෑ. කාල ම වැඩේ පටන් ගමු "

dileep

ඩික් මල්ල විවර කරේ ය. සැන්ඩ්විචස් කේක් වැනි අහාර රැසක් එහි වූ අතර පෙට්ටගමක් මත වාඩි ගත් ඔවුහු වහ වහා ආහාර සියල්ල ගිල දමන්නට වූහ.ජූලියන්ට කෑම ගන්නා අතරෙත් මතක් වූවේ පුංචි ඈ ය

" ඈන් මතක් වෙද්දි පපුව පිච්චිලා යනව. ඒකි බලාගෙන ඉදල ඉදලා මොනව කර ගත්තද දන්නෙ නෑ. පාරවල් හරියට පුරුදුත් නැතුව කෑම්ප් එක හොයා ගන්න පුලුවන් වුනාද දන්නෙත් නෑ. කැලේ අතරමං වෙලා හාමතේ කොහේ හරි වැටිල ද දන්නෙත් නෑ. අනේ පව් දෙයියනේ පොඩි එකී. එක අතකින් කැලේ අතරමං වෙනවට වඩා අපිත් එක්ක මෙතන හිර වෙලා හිටිය නම් ඒක දෙයක් "

" බොරුවට හිත කරදර කර ගන් නැතිව ඉදපං ජූලියන් " ජෝක් කීවේ තවත් සැංඩ්විචස් බිදක හිමිකම ටිමියාට පවරමිනි." අඩෝ

ටිමියා නම් හරිම අපූරුයි. මට මූ හිටිය නම් කියලත් වෙලාවට හිතෙනව බං. මට ටිමීගෙ සද්දෙ ඇහෙද්දි හිතා ගන්න බැරි වුනා. ඊට පස්සෙ ඔයාව දකිද්දි මං හිතුවෙ මං හීනයක් දකිනව කියල"

තවත් ස්වල්ප වේලාවක් එපරිද්දෙන් ම ගෙවා දැමූ ඔවුහු යළිත් භූත කෝච්චිය තිබූ උමගය දෙසට ගමන් ගත්තෝ ය. " අපිට පුලුවන් නම් අලිබබා ඩ්ජොර අරින ස්විච් එක හොයා ගන්න වැඩි මහන්සියක් නැති ව ම යන අය්හක යන්න තිබ්බ. " ජූලියන් කීවේ ය. " අපි තව ටිකක් බිත්තිය පරික්ෂා කරල බලමු. ඒත් මට නම් හිතා ගන්න බෑ මේ පැත්තෙනුත් ඒක අරින අගුල තියේවි කියලා. "

ළමෝ කෝච්චිය ඇතුළේ ගමන් ගත් රේල් පීලි ඔස්සේම බිත්තිය දෙසට ඇවිද ගියහ. එය සාමාන්‍යය දුම්රිය ඇන්ජිමකි. සාමාන්‍යය රේල් පාරකි. භූත කෝච්චියක් වශයෙන් සලකා අනිවාරතේ බිය ගත්තේ කවර හේතුවකට දැයි දැන් නම් කාට කාටත් සිතෙමින් තිබේ.

dileep

බිත්තියේ ඇති ලීවරයක් මුලින් ම සොයා ගත්තේ ජෝර්ජ් ය. එය පහතට නැඹුරු වී තිබුණි. එය ඉහළට ඔසවන්නට හැකි වෙර යොදා උත්සාහ ගත්ත ද ඇයට ඒ කළ හැකි වූවේ නැත.

" ජූ.. මෙහෙට එන්ඩ " ඈ ජූලියන්ට කතා කළා ය. " " මේක පොඩ්ඩක් උස්සන්ට පුලුවන්ද බලන්ට. සමහරවිට දොර ඇරෙන්ට ඉඩ තියෙනව"

ජූලියන් වහා පැන ලීවරය ඉහළට තෙර පන්නට විය. එහෙත් දොර ඇර ගැනීමට ඔහුට ද හැකි වූවේ නැත . ඩික්ද වහා සහයෝගයක් දුන්නේ ය. " බෑන්ග්" යි අනුකරණයෙන් ශබ්දයක් නැගුණේ ය.ඒ හාත් සමගම යන්ත්‍රයක අනුසාරයෙන් මෙන්

බිත්තියේ කොටසක් ඉහළ යන්නට පටන් ගත්තේ ය. වෘතාකාර විවරයක් ඔවුන් අබිමුව නිරාවරණය වූවේ පළා යාමේ මං පෙත් විවර කරවා සිව් දෙනාගේ ඉහේ මල් පුබුදුවාලමිනි.

" ඇරෙන්න. සෙසමි.." විවරය මතු වෙනවාත් සමගම ඩික් කීවේ අලිබාබා හොරු හතළිහ කතාවසිහියට නගා ගෙනය. ( අරාබි නිසොල්ලාසයේ එන කතාවකි)

" ලයිට් එක නිමුවොත් හොඳයි වගේ. කවුරු හරි උමගෙ හිටියොත් දකින්ට පුලුවනි "

ළමෝ විදුලි එළිය දුන් ලීවරය වසා දැම්මෝ ය. දැන් කවුරුත් සිටින්නේ කළුවර කරුවලේ ය. ජෝර්ජ් උමග තුළට මලාණික එළියක් විහිදවමින් විදුලි පන්දම දැල්වූවේ ය.

dileep

" කමෝන්.. " යි ඩික් කෑගෑවේ කලබලයෙනි. කවුරුත් පාහේ තෙරුපි තෙරුපී කුහරය ඔස්සේ ඉදිරියට දුවන්නට වූහ. " අපි ඉක්මනට ඔළීගෙ යාඩ් එකට දුවමු "

එතැන් සිට ළමෝ දිවෙමින් මෙන් උමගය ඔස්සේ ඔළීගේ කෝච්චිපොල දෙසට ගමන් ගති. එක්වර ම ජුලියන් කෑ ගෑවේ ඔවුන් මෙසේ ගමන් ගනිමින් හිඳින අතර ය.

" අහපල්ලා. අපි වැඩිය ශද්ද බද්ද නැතුව යමු. අපි දන් නෑ අද මේ උමගෙ ඇතුළෙ මොන භූතයා ඉන්නව ද කියල. කවුරු හරි ආයෙත් අපිව අල්ල ගන්න ඕන නෑනෙ"



යළිත් වරක් ජූලියන් හදිසියේ ම ඔවුන් නවත්වන විට ඔවුන් ගමන් ගෙන තිබුණේ හැතැම්ම බාගයක් පමණ දුරක් පමණි.එකිනෙකා පස්සේ හැපෙමින් ළමා කෝච්චිය ද වහා නැවතී ගත්තේ ය. ටිමියා සිහින් හඬක් නැගුවේය. කවුදෝ අයෙක් උගේ පයක් පාගා තිබූ නිසා ද විය හැකි ය. ජෝර්ජ් වහා ටිමීගේ කරපටියෙන් අල්ලා ගත්තා ය.

ටිමියා පවා හුස්ම ගැනීමත් නවතා නිහඬව අසා සිටියේ ය. කවුදෝ ඔවුන් දෙසට පැමිණෙන හඬ ළං ළං ව ඇසෙන්නට වී ය. විදුලි පන්දමක ඉහල පහළ යන ආලෝකය ද දැන් දැන් ඔවුනට පෙනෙන්නේ ය.

" ඉක්මන් කරලා අනික් පාරෙන් යමං. " යි ජුලියන් යෝජනා කළෙන් නිහඬ මුනිවතින් ද නිහඬ පියවරින් ද කිල්ටිගේ කෝච්චි පොළ කරා යන උමගය ඔස්සේ එතැන් සිට ඔවුන් ගමන් ගන්නට විය.

එහෙත් ඊ ළග වතාවටත් ඔවුන්ගේ බලාපොරොත්තු සිදළමින් කිල්ටිගේ කෝච්චි පොළ කරා විහිදෙන උමගය තුළින් ද ලන්තෑරුම් එළියක් දක්නට ලැබුනේ ය. දැං ඒ පැත්තටයාමට ද ඔවුනට නො හැක. ඒ වූ කළී මග සිටියොත් අඹු නසී ගෙදර ගියොත් තෝ නසී මාදිලියේ ගැටළුවකි.

" ඒ ගොල්ලො බිත්තිය ඇරල තියෙන හැටි දකී. ඒකෙන් ම තේරුම් ගනී අපි පැනල ගිය විත්තිය " යි ඩික් ගැහෙන හදින් කී ය. " උන් අපි හොයන්න එයි. ඉස්සරහට යන්නත් බෑ. දෙවියනේ. අපි කවදාවත් නො වැටුණු විදිහේ තඩ මාරුවකයි මේ පාර නම් වැටිල තියෙන්නේ. අපි ආයෙත් අහුවුනා "

dileep

ඒ හා සමගම ටිමියා කිසියම් අමුතු හඬක් නැගුවේ කිසියම් දෙයක් මතක් කර දෙන්නට මෙනි. ඔව්. ජෝර්ජ්ට එය මතකයට නැගුණේ එවිට ය.

" ජුලියන් ඩික්. අර බලපන්. අතනින් තියෙන්නේ වා කවුළුවක්. අපිට පුලුවන් නම් ඒකෙන් උඩට නගින්න අපි බේරෙනවා.ටිමියා උදේ ඕකෙන් පල්ලට වැටුණත් එක්ක "

ජෝර්ජ් වා කවුලුව සොයා ගත්ත ද එයට නැගීම සම්බන්දයෙන් නම් ජුලියන් දෙතුන් විටක් නො ව සය සත්විටක් ම කල්පනා කළේ ය. කෙසේ වෙතත් ඔහු ප්‍රථමයෙන් ම ජෝර්ජ් අල්ලා ඒ තුළට රිංගවන්නට උත්සහා ගත්තේ ය. ඊළඟට ජෝක් ය.ජෝර්ජ්ගේ පාවහන් නාසයේ ගැටෙන නො ගැටෙන තරම්

සමීපයෙන් ජෝක් යකඩ ඉණිමග නගින්නට විය. ඊ ළඟ වාසනාවන්තයා ඩික් ය. අවසානයේ ජූලියන් ය. එහෙත් ජූලියන් නැගගන්නට පෙර අනපේක්ෂිත යමක් සිදු වූවේ ය.

කිසියම් අයෙකු විසින් විදුලි එළිය දැල් වූ බව සනාථ කරමින් උමං ජාලය එක් වර ම ආලෝකවත් වූවේ ය. උගුරෙන් ගිගුරුම් හඬක් නගා ටිමියා සෙවනැලි අතර සැගව ගත්තේ ය. එවිට ම කෑ ගැමක් ළමුන්ට ඇසිණ.

" කවුද යකෝ මේක ඇරියෙ. කියපල්ල... "

ඒ ඇසෙන්නේ ඇන්ඩෘස්ගේ මුර ගෑම බව ළමුන්ට සහතික ය.

" අර කොල්ලන්ට බෑ මේ ලීවරේ හොල්ලන්නවත්.කවුද යකෝ මේක ඇරියෙ"

dileep

මිනිසුන් තිදෙනෙකු කුහරය දෙසට පිය නගන්නට වූ අතර ජූලියන් බිය මෙන් ම සිනා මුසු මුහුණින් තවත් පඩියක් දෙකක් ඉහළට නගින්නට විය. එහෙත් ටිමියා පහළ සෙවනැලි අතර අතැර දමා එන්නට ඔවුනට සිදු වීම නම් වලකාලිය නො හෙන්නක් විය.

" උන් ගිහින්ලා. කඹත් කපාගෙන ම පැනල ගිහිල්ලා. ඒත් උන්ට පැනල යන්න නම් වෙලාවක් නෑ. ඕකුන් මේකෙම කොහෙ හරි ඉන්නවා. බලන් ඉන් නැතුව හොය පියව්"

ඔවුන් අසළම වා කවුලුවක එල්ලීගෙන වවුලන් රංචුවක් මෙන් ළමුන් සිටින බව යන්තමින් හෝ නො දැන ඔවුහු උමං තීරය පීරන්නට වූහ. විදුලි පන්දම් එළිය සමීප වන විට අයිනකට වී දිගාවෙමින් සැඟවෙන ටිමියා පවා දැක ගැනීමට ජාවාරම් කරුවන්ට හැකි නො වින.

ජෝර්ජ් වේගයෙන් ඉහළට ඉහළට නගින්නට පටන් ගත්තා ය. එහෙත් එක් වරම යමක් හිස ගැටුණෙන් ඈ වහා නැවතී ගත්තා ය. ඒ වූ කලී ටිමියාගේ උද්‍යසන හපන්කම් හේතු කොටගෙන කඩාගෙන වැටී එල්ලී තිබෙන යකඩ පොලු කිහිපයකි. දැං යළිත් වතාවක් අවාසනාව , බලාපොරොත්තු සුං වීම ජයග්‍රහණය පෙනි පෙනී ළමුන් සොයා පැමිණී තිබේ. තවත් ඉහළට නැගීමට දැං ඇයට නොහැක.

" මොකක්ද ජෝර්ජ් කරන්නෙ. නගිනවකෝ උඩට බලන් ඉන්නෙ " ජෝක් මිමිණුවේ නො ඉවසිලිවන්තව ය.

" ලක් එකේ හිලක් . උඩට යන්න බෑ. පොලු කඩා වැටිලා. "

" විනාශයි " යි ජූලියන් කියා ගත්තේ ය. " දැන් අපි මොකද කරන්නෙ ?"

dileep

ඇත්ත වශයෙන් ම කරන්නට යමක් තව දුරටත් ඔවුනට ඉතිරි වැතිබුණේ නැත.සද්දන්ත මිනිසුන් හා හයි අල්ලන්නට ද ඔවුනට නො හැක. සිදුවන්නක් සිදුවන්නට ඉඩ දී එල්ලී ගත් වවුලන් කැලක් මෙන් බකන් නිලා සිටීමට පමණක් අවසානයේ ළමුන්ට සිදු වී තිබේ.

" ඉතිං.. උඹ තාමත් ඇඩ්වෙන්චර් වලට කැමතිද ජෝක්. මං නම් හිතන්නේ දැං නම් උඹට හිතෙනව ඇති පාඩුවේ ගෙදරට වෙලා බුදිය ගත්ත නම් දාහෙන් සම්පතයි කියල " ඩික් කීවේ ය.

" ඉටි ගෙඩිය. මොන දෙයක් නිසා වත් මං මේක අතාරින් නෑ. මට තවත් ඕනි වීර ක්‍රියාවක්"

ජෝක් පිළිතුරු වශයෙන් කියා සිටියේ ය

dileep

dileep

# 19 වීර ක්‍රියාවේ අවසානය

ඈන්ට සිදුවූවේ කුමැක්දැයි දැං ඉතිංසොයා බැලිය යුතු ය. ගල් මුල්හි පැටලෙමින් ඇද වැටෙමින් හඬමින් , ලූෆී මහතාට හඬ තල්මින් පුංචි ගැහැණු ළමය බොහෝ වේළාවක් , බොහෝ ම වේලාවක් අනිවාරතේ සක්මන් කළා ය. තවුස් දම් රකින විලසින් සිදු වූ කිසිත් නො දැන ලූෆී මහතා සිටියේ ඔහුගේ කූඩාර ම ඉදිරිපිට වාඩිගෙන පුවත් පතකට හිස ඔබා ගෙන ය. අහස කඩා ගෙන හිස මත පතිත වූවත් ඔහුට නම් වගේ වගක් නැති

විලසකි. එහෙත් ක්‍රමයෙන් අඳුර වැටීගෙන එද්දී නම් උන්නැහේ තුළ පැවතියා වූ සාමකාමී බව තව දුරටත් පවත්වාගෙන යාමේ හැකියාවක් නො තිබුණේ ය. ළමුන් පස් දෙනාගෙන් කවුරුවත් තවමත් පැමිණ නැත. ඊටත් කෝපයෙන් හුන් ජෝර්ජ් දිවා කෑම වේලෙදී හෝ ඇහැ ගැහුණේ ද නැත . ඉතින් තව දුරටත් ලූෆී මහතාට පුවත් පත කියවමින් බක්න් නිලා සිටීමේ හැකියාවක් සිතේ සැනසිල්ලක් දැනුනේ ද නැත.

කළ යුත්තේ කවරේදැයි උන්නැහේ කල්පනා කරන්නට පටන් ගත්තේ ය. තනි මිනිහෙක්ට මේ විසල් කදු කරය තනියච්ච ම සෝදිසි කිරීමද පිදුරු ගොඩේ ඉදි කට්ටක් සෙවීමක් බදු කට යුත්තෙකි. අවසානයේ එතුමා තීරණය කොට ගත්තේ කාරයට නැගී ඔලීගේ ගොවිපොලට යාමට ය. එහිදී ළමුන්සොයා ගැනීම සඳහා මිනිසුන් කිහිප දෙනෙකුගේ උපකාර ලබා ගත හැකි එතැයි වැඩි දුරටත් ලූෆී මහතාඅ සිතා ගත්තේ ය..

dileep

එහෙත් ගොවිපළේ ද සිටියේ ඇන්ඩෘස් මැතිණිය හා කුඩා ගැහැණු ළමයෙකු පමණි. ලූෆී මහතා එහි යන විටත් ඈ සිටියේ අවුල් සහගත පෙණුමිනි.



" මොකක්ද වුනේ සර් .... මොනව හරි මුතු දෙයක් මෙහෙ සිද්ද වෙනවා. මේකෙ ඉන්න මිනිස්සු ඒරම වාහන වල නැගලා කොහේදෝ යන්න ගියා. මගේ හස්බන් තමයි එයාල ව එක්ක ගියේ. කවුරුවත් මට මොකවත් කීවෙ නෑ"

ළමුන්ගේ අතුරුදන් වීම සම්බන්දයෙන් කතා බතා කොට ඈ තවත් සිත් අවුලට පත් නො කිරීමට ලුෆී මහත සැණෙකින් තීරණය කොට ගත්තේ ය. තමා පැමිණියේ කිරි ටිකක් රැගෙන යාමට බවක් ලුෆී අහතා ඇඟ වූවේ ය. " ඩෝන්ට් වොරි. හෙට උදේ වෙද්දි සේරම හරියයි. මම හෙට උදෙත් එන්නම්කෝ. දැන් ඔයා හිත අවුල් කර ගන්න ඕන ඈ"

ඇගේ ඉත සනසවා ලූ හිත හොද දොස්තර මහත්තයා යළිත් මෝටර් රථ්හයට නැගුණේ ය. ඔලීගේ ගොවිපොළේ මෙන් ම ඔලීගේ කෝච්චිපොළේ ද අමුතු දෑ සිදු වෙන බවක් එතුමාට සිහිපත් විය. ළමුන් අණතුරු දායක යමක් සිදු කරන්නට නො යන්නට ඇතැයි වැඩි දුරටත් උන්නැහේ බලා පොරොත්තු වූවේ ය.

dileep

" මම කොයිකටත් පොලිසියට ගිහින් පැමිණිල්ලක් දැම්මොත් හොදයි වගේ. ශික්. මට මීට වඩා ළමයි ගැන අවදානෙන් ඉන්නයි තිබ්බේ "

පොලීසිය කරා පැමිණි ලුෆී මහතා පොලිස් ප්‍රදානියෙකු හමු වූවේ ය. බුද්දිමත් නිළදාරියෙකු වූ හෙතෙම ලුෆී මහතාගේ කතාව අසා සිටියේ දැඩි අවදානයෙනි.

" ඔය ඔලීගේ ෆාම් එකෙත් , කෝච්චි පොළෙත් අමුතු දේවල් මොනව හරි එනව කියල අපිටත් සැකයක් තිබුණා. ඒත් ඉතින් අත දාන්න අවස්ථ්හාවක් හේතුවක් අපිට තිබ්බේ නෑ. කොහොම හරි අපි මුලින් ම ළමයි ටිකහොයා ගමු "

ඒ අනු ව කදුකරය පීරීමේ මෙහෙයුමක් නො බෝ වේලාවකින් ම ඇරඹුණේ ය. පොලිස් ස්ථානයේ නිළදරින් සය දෙනා ම ඒ කටයුත්ත අදහා එක් වූවේය . මෙහෙයුම මුලුවණින් ම

සාර්ථක එකක් කරමින් ප්‍රථමයෙන් ම ඔවුන් විසින්සොයා ගත්තේ ඇන් ය.

" අනේ ලුෆී සර්. පිරිමි ළමයි ටික බේරා ගන්න " ඇන් ලුෆී මහතා දුටු විට ම ඉකි ගසා හඬා වැටුණා ය. " එයාල කෝච්චි පොළට ගියා. ඊට පස්සෙ බිම් ගෙට ඇතුළු වුනා. ඇන්ඩෲස් මහත්තයයි එයාගෙ මිනිස්සුයි එයාලව අල්ල ගන්න ඇතුළට ගියා. මම ගොඩාක් වෙලා බලාගෙන හිටියා. ඒත් එයාලට එලියට එන්න බැරි වුනා "

එතැන් සිට සියල්ල ම් සිදු වූවේ ඉතා ඉක්මණිනි. ලුෆී මහතා විසින් පොලිස් නිලදාරීන් හට ඇන් හදුන්වා දෙනු ලැබූ අතර ඔවුහු ඇගේ මග පෙන් වීම අනුව ඔලීගේ කෝච්චි පොළ කරා පැමිණියෝ ය. ලුෆී අහතා ඇන්ගේ අතකින් අල්ලා ගත්තේ ඉතාමත් ම ආදරයෙනි. ළමුන් විසින් ඇති කරන ලද කරදයී සම්බන්දයෙන් වචනයක් වත් උන්නැහේ නම් කීවේ නැත. පොලිස් නිළදාරීන් ලී කකුල් සෑම් ලොක්කා ගණනකට වත් ගත්තේ නැත. වහා බිම් ගෙය කරා පැමිනි ඔවුහු උමගය ඔස්සේ ඉදිරියට අමින් කළහ. ලුෆී මහතා ඒන්ගේ අතින් අල්ලා ගත් වන ම පොලිස් නිළදාරීන්ට පිටි පස්සෙන් උමගය ඔස්සේ ඉදිරියට ගියේ ය. උමගට නොයා පිතටට වී සිටීමේ කැමැත්තක් ඇන්ට නො තිබුණේ ය.

" මම බය නෑ. මම තොත්ත බබෙක් නෙමේ " ඇන් මගදිගට කියෙව්වා ය ." මට ඕන පිරිමි ලමයි ටික කොහොම හරි බේර ගන්න. අනේ ජෝර්ජ් වත් හිටිය නම්... සර් ජෝර්ජ් කෝ ?"

ලුෆී මහතාට ඈ මේ කියන අණ්ඩර දෙමලයක් නො වැටහේ. කෙසේ වෙතත් ඇන් සම්බන්ද පැහැදුනු සිතින් ලුෆී මහතා තව තවත් ඇගෙ අත තදින් අල්ලා ගත්තේ ය.

මේ වන විට ජුලියන් ඇතුලු පිරිස් සිටියේ වා කවුලුව තුර සිර වී ගෙන ය. තෙරුපි තෙරුපීගෙන ය. වෙහැසින් මැඩීගෙන ය. ඒ අතර මිනිසුන් පිරිස ළමුන්සොයා උමගයේ සෑම අස්සක් මුල්ලක් ම පිරික්ෂන්නට වූහ. ඔවුන් අතර හුන් එකෙකු ඉහළට විදුලි පන්දම යොමු කල අතර ජුලියන්ගේ කකුලක් දැක ගැනීමට ඔහුට හැකි විය.

" මේං උන් ඉන්නවා " යි එකෙක් කෑ ගෑවේ ය ." වා කවුලුවේ රිංගගෙන. වරෙල්ලා... උබලා හිතුවේ ඕක අස්සේ රිංගලා බේරෙන්න ද ? අවල්ම් කොල්ලෝ. පල්ලට එනව ද අපි ඇදලා ගන්න ද ?"

ජුලියන් ගල් ගිල්ලාක් මෙන් බලා සිටියා විනා කිසිවක්කළේ නැත. ජෝර්ජ් හිසට ඉහළින් කඩා වැටී එති යකඩ පොලු තල්ලු කර දමීමට උපරිම වෙහෙසක් ගත්තා ය. වා කවුලුව ඔස්සේ මිනිසෙක්නගින්නට පටන් ගත්තේ ඒ අතර ය. පඩි කිහිපයක් ඉහළට පැමිණි මිනිසා ජුලියන්ගේ කකුලකින් අදින්නට තබා ගත්තේ අසරණා කොලු ගැටයාගේ ඉහ මොළ රත් කරමිනි.

වැඩි වේලාවක් දෑතින් එල්ලී ඉවසා දරා සිටීමේ හැකියාවක් නම් ජුලියන්ට නො තිබුණේ ය. ජුලියන් පහළට ඇදී ආ අතර ඩික්ට ද උදා වූවේ ඊට නො වෙනස් වූ වාසනා මහිමයකි.

ඊ ළගට ජොක් ද ස්ව කැමැත්තෙන් ම පහළට ගැල වී ආවේ ය.

" තොපෙන් නම් තියෙන්නේ පුදුම වදයක්. ඇතුලට ආවා මදිවට අපිට හොයන්නත් සිද්ද වුනා . කවුද උබලාගේ කබ කැපුවෙ ?' ඇන්ඩෘස් කෝපයෙන් බෙරිහන් දුන්නේ ය.

" තව කවුරු හරි එකෙක් උඩ ඉන්නවා " යි තවත් එකෙකු ඒ අතර බලියන්නට තබා ගත්තේ ය." යකෝ අපි අල්ල ගත්තෙ කොල්ලො තුන් දෙනෙක් විතරනෙ . කවුද එතකොට මේ .. ?'

ඒ වූ කලී ජොර්ර්ජ් මිස වෙනත් කිසිවෙකු නො වේ. කොල්ලන් දෙදෙනා මකර කටෙහි ලා පැන ගැනීමේඑ අවකාශයක් හෝ වුවමනවක් ඇට නො තිබිණ. දැලි වලින් ඉයොළග සරසා ගනිමින් ඇද පහලට කඩා වැටුනා ය.

" අහා එහෙනම් තවත් කොල්ලෙක්... තෝ ආවෙ මොන ලෝකෙන් ද ?"

" තව එළුන් ඉන්නව ද කියපියව් " ඒ ඇන්ඩෘස්ගේ හඬ ය.

" ඉන්නව අම්හොයා ගනිව් " ජුලියන් කට මැත දොඩවන්නට උත්සහයක් ගති. එහෙත් එක් වර ම කණ පුරවා ලත් සංගරහයක් හේතු කොට ගෙන නිහඬ වන්නට ජුලියන්ට සිදු වූවේ ය.

dileep

" දැං ඉදන් මුංට සලකන්න ඕන බල්ලන්ට වගේ " බල්ලෙක් ද සිටින බව හාන් කවිසියක් හෝ නො දත් පීටර්ස් කී ය. " මුංට හොද පාඩමක් දෙකක් කියා දුන්නොත් හොදයි. "

තවත් ගැල වීමේ බලා පොරොත්තුවක් ළමුන්ට ඇති වූවේ නැත. කාගේ කාගේත් හදවත් දුම්රිය එන්ජිමක් පරිද්දෙන් ගැසෙන්නට පටන් ගත්තේ ය. ඔව්. දැං යළිත් ඔවුන් සිව් දෙනා සිරකරුවන් බවට පත් වී හමාර ය.

එහෙත් සියල්ල සිදු උඟවේ අනපේක්ෂිත ලෙසින් ය. සැබැවින් ම එවර වාසනාව පරහට හිටියේ ළමුන්ගේ නො ව මිනිසුන්ගේ ය.

උමගයේ ඈත අන්තය දෙසින් “ පොලීසියෙන්... දුවපලා “යි කිසිවෙකු හඩ තලනු ඇසෙන්නට විය.

ළමුන්ගේ ගරහණය මිදී ගියෙ මායා බලයකින් මෙනි. ඒ අතර මිසෙක් කදුලු වගුරවමින් ඔවුන් සිටි දෙසට දිව ආවේ ය.

“ මම උබලට කොච්චර කීව ද යකුනේ තොපි බීරි වෙලා ද හිටියෙ. අන්න පොලිසියෙන් බැහැලා මේකට . කවුරු හරි ඔත්තුවක් දීල තියෙනවා. දුවපල්ලා “

“ ක්ල්ටිගේ යාඩ් එකට යමල්ලා.. “ යි පීටර්ස් හඩ නැගී ය.” අපේ කාර් එතන තියෙනවා. ඒවයින් පැන ගමු “

ළමුන් දුර්මුඛ කරලමින් මිනිස්සු කිල්ටිගේ අංගනය දෙසට දුවන්නට පටන් ගත්තෝ ය. දැන් ඉතින් සියලු මහන්සිය වතුරේ යන සැටි බලා ගෙන සිටීමට ළමුන්ට සිදු වී තිබේ. ජෝර්ජ් තම හඩ අවදිකළේ මෙපරිද්දෙන් සියල්ල ගගට කැපූ ඉනි මෙන් අවසන් වන්නට ඔන්න මෙන්න කියා තිබෙන මොහොතක ය.

dileep

“ ටිමී... උන්ව අල්ලපන්....”

ටිමියා ද බලන් සිටියේ අවස්ථාවක් ලැබෙන තුර ය. සාවුන් එල්ලීම කෙසේ වෙතත් අපරාදකරුවන් අල්ලා මෙල්ල කොට ගැනීමේ පල පුරුද්දක් නම් උගට හොදින් අ පිහිටා තිබෙන්නේ ය. බිත්තියක් අයිනේ මෙතැක් සැග ව හුන් වීරයා දැවැන්ත සෙවනැල්ලක් පරිද්දෙන් ක්‍රියංවිතයට එලැබියේ ය. දිව ද පහළට එල්ලා ගනිමින් උඟ පණ එපා යැයි දිවෙන මැරයින් පසුපස පන්නට පටන් ගත්තේ ය.



එ අතර පොලීස් නිලදාරීහු වේගයෙන් ඔවුන් සිටි දෙසට පැමිණියෝ ය. නිළදරීන් පසු පස හැල්මේ දිව ආවේ ලුෆී මහතා සහ ඈන් ය.

" උන් පල්ලහාට දිව්වා " යි ජෝර්ජ් කෑ ගැවා ය." ටිමී පස්සෙන් පන්නනවා "

" ජෝර්ජ්...." ඈන් ප්‍රීතියෙන් කෑ ගාන්නට වූවේ දෑලි වලින් මුහුණ හැඩ කර ගත් ළමුන් ඇගේ නෙත ගැටුණෙනි." ජුලියන්.... අනේ ඔයාලට කරදරයක් නෑ නේද ? මට සමාවෙන්න මට පාර වැරදුනා. නැත්තම් මං මීට කලින් ලුෆී සර ව එක්කන් එනව"

" දුක් වෙන්ඩ හේතුවක් නෑ ඈන් " ලුෆී මහතා යළිත් කුඩා ගැහැණු ළමයා අල්ල ගනිමින් කීවේ ය." ඔයා හරි දක්ෂ කෙල්ලෙක්. සිංහයෙක් වගේ නිර්බීත පුංචි කෙල්ලෙක් "

dileep

කෙසේ වෙතත් මේ වන විට කිල්ටිගේ කෝච්චි පොළ දෙසින් ඇසෙන්නට වූවේ කලබල කාරී කෑකෝ ගැසීම් බෙරිහන් දීම් හා ශාප කොට ගැනීම් වැලකි. ටිමියා රාජකාරිය අකුරට ම ඉටු කර තිබුණේ ය. එලි මහනේ කාටත් හොදින් ජේන තැනකට උඟ මැරයින් සිව් දෙනා රැගෙන ගොස් තිබුණි. උගේ ආදරණීය ළමුන්ට කැටූ සියලු විනයන්හ්ගි පළිය , වාඩුව ගැනීමේ අවස්ථ්හාව උඟ උදා කරගෙන තිබුණි. සද්දන්ත හස්තියෙකු පරිද්දෙන් තමා පස්සේ ඇදෙන බල්ලාගෙන් දිවි ගලවා ගනු වස් මිනිසුන් නො දැරූ වෙහෙසක් නොමැති තරම් ය.

පොලීසිය පැමිණි විට පොලීසිය අසලට ම මිනිසුන් කැදවගෙන ඒමට පවා ටිමියාට හැකි වී තිබුණි. එබ්නැවින් අපරාදකරුවන් අල්ලා කුදලා මෙල්ල කර ගැනීමට නිළදාරීන්ට ගත වූවේ තවත් ස්වල්ප වේලාවක් පමණි.කෑකෝ ගසමින් පිස්සුවෙන් මෙන්

හැසිරුණේ ඇන්ඩෘස් පමණෙකි. සෙස්සන් මෙන් දත කට පියා නීතියට අවනත වීමේ පුරුද්දක් ඔහුට නම් නො වූ ලෙසකි. කෙසේ වෙතත් බාප්පාගේ මේ මොහොතේ හැසිරීම පවා ජෝක්ට නම් ගෙනාවේ මහ පොළොව දැබෑ කර ගෙන යමට සිතෙන තරමේ හතර විලි ලැජ්ජාවකි.

" කට වහපන් මිනිහෝ" යි මරු මුස් පෙනුමක් තිබූ පොලිස් නිළදාරියෙක් කෑ ගැවේ ය." අපි දන්නවා තොපි මෙතන මොනව ද කරන්නේ කියලා. සල්ලි කාරයෙක්ට මේ විදිහට බල්ලෙක් වගේ කීකරු sවෙලා අල්ලි හොයල දෙන්න විලි ලැජ්ජා නැද්ද මිනිහෝ "

" හරි හරි. මං මගෙ ජීවිතේට මේ වගේ කුණු තැවරුණු ළමයි ටිකක් දැකලා නෑ " සිනා මුසු මුහුණින් දැලි කුණු වැකුණු ළමුන් දෙස බලමින් ලූෆී ලොක්කා කියා සිටියේ ය. " මං නම් කියන්නේ අපි සේර ම මගේ කාර් එකට නැගලා ඔලීගේ කෝච්චි පොළෙන් ඔලීගේ ෆාම් එකට යමු. ගිහිල්ලා හොඳට නාලා මොන මොනවා හරි කාලා ඉමු"

එය මහගු යෝජනාවක් සේ පෙනී ගියෙන් කුසගින්නෙන් ද වෙහෙසින් ද දුවිලි හා අගුරු වලින් ද මඩනා ලද ඔවුහු දෙපාරක් නොසිතා ම ලූෆී මහතාට අවනත වූහ.

වචනයේ පරිසමාප්තයෙන් ම එය නම් එසේ මෙසේ රාත්‍රියක් නො වී ය. අම්මා මුත්තා කීවත් නිහඬ ව එක නිමේශයක් හෝ ගත කිරීමේ හැකියාවක් ළමුන්ට නො වී ය. සිදු උන සියල්ල අග සිට මුලටත් මුල සිට අගටත් දෙතුන් වතාවක් ම ඔවුහු ඇන්ට කීවෝ ය. ඇන් ද ඇගේ කතාව කියා දැම්මා ය.

dileep

ඇන්ඩෘස් මැතිණිය ළමුන්ට සැලකුවේ පුදුමාකාර කරුණාවකින් බවත් කිව යුතු ය. ඇගේ සැමියා පොලීසියට රැගෙන ගිය බව කියා සිටියත් , ඊට හේතු වූවේ ළමුන් බව දැන ගත්තත් ඔවුන් සම්බන්දයෙන් වන කිසිදු කහටක් ඈ තුල නො වින. ඈ ඔවුන් සදහා උණු වතුර සපයා දුන්නා ය. අනගි තත්වයේ කෑම වේලක් ද සූදානම් කොට දුන්නා ය.

“ මට ඔබ තුමී ගැන කණගාටුයි “ අවසානයේ ලුෆී මහතා කීවෙ ය.” ඒත් ඔයාගෙ හස්බන්ට හොද පාඩමක් දෙකක් ඇත්තට ම අවශ්‍ය යි. මේ වෙච්ච දෙයින් එයා හැදෙන්ටත් ඉඩ තියෙනවා. ඔයාගෙ ගොවි පොලට දැන් ඔයාට පුලුවන් ගොවිපොලක වැඩ දන්න හොද සේවකයො ටිකක්හොයා ගන්න. අනිත් එක බාප්පා නැති එක ගැන ජෝක් වුනත් හරියට සතුටු වෙයි “

“ ඔයා හරි ලුෆී මහත්තයා “ යි ඈ කීවේ කදුලු පිස ගනිමිනි.” මම මගේ ජොක් එක්ක මේක දියුණු කරනවා. ලස්සන තැනක් කරනවා. කොහොම හිතන්න ද දෙයියනේ මගේ මහත්තයා හොර බඩු ජාවාරම් කාරයෙක් කියලා. මේ ඔක්කොම විනෙ කෙටුවෙ ඇන්ඩෘස්ගේ යාලුවො තමයි. එයා දැන ගත්ත ජෝක් බිම්ගේ ගැන උනන්දුවෙන් ඉන්නෙ කියලා. ඊ ළගට එයා මොකක්දකළේ. කිසි ම හිතක් පපුවක් නැති ගානට මගෙ අසර්ණ කොල්ලා මෙහෙන් පිටමන් කරන්න හැදුවා. ඊ ළගට තව කොල්ලෙක් ගෙනල්ලා මගේ එකාට හුස්මක් කටක් ගන්න නිදහසක් නැති කලා “

“ ආ ඒක තමයි එහෙනම් ජෝක් කදවුරේ අපේ පොඩි සෙට් එක එක්ක ආස්සරය කරන එක නවත්තන්න ඔච්චර මහංසි ගත්තෙත් “

" කොහොම හිතන්න ද මේ මිනිස්සු පරණ කෝච්චි පොළ එයාලගෙ වැඩ වලට පාවිච්චි කරා කියලා. මෙහෙම මිනිහෙක් මගේ හස්බන් වුනානෙ දෙයියනේ. ඊටත් අර පරන කෝච්චියක් අල්ලන් භූත කෝච්චියක් හදලා කාටවත් පැත්ත පළාතට යන්න නොදී තියා ගත්තා කියලා. පුදුම කපටි කෛරාටික මිනිස්සු. මේ සේර ම නිකන් සුරංගනා කතාවක් වගේ සර්"

කෙසේ වෙතත් තවත් සිලු වේලාවක් ගත වෙන විට උනු වතුර සූදානම් වැ තිබුණි. ළමෝ එකා බැගින් ගොස් හොද හැටි නා කියා ගත්තෝ ය. දිය නා අවසානයේ ඔවුන්ට ලැබුණේ ටහෞද පහේ හෝටලකින් ලැබෙන තාලයෙ ආහාරයකි. කෑම ගැනීමෙන් ඉක්බිති ව පන් පසිදුවන් පිරිස ලුෆී මහතා ද සමගින් පෙරළා කදවුර කරා ගමන් ගත්තේ ජෝක්ද සමගිනි.

යලිත් නිදන බෑගයන් තුළට වැදීමට ලැබීම සම්බන්දයෙන්කාට කාටත් දැණුනේ දෙව් ලොව ගියාක් බදු සනීපයෙකි. ජෝර්ජ් කොල්ලාන් තිදෙනාට ඇසෙන පරිද්දෙන් කෑගසන්නට වූවා ය....

" කොල්ලනේ... උබලා අද රෑටත් මාව දාල භූත කෝච්චි බලන්ඩ යනවදෝ...පලයල්ලා බලන්න. කඩනව කකුල් හයම "

කවුරු කවුරුත් සිනා එන්නට වූ අතර ඩික් ද පෙරලා කෑ ගෑවේ ,

" වික්‍රමය ඉවරෝ....." යි කියමිනි. ඊ ළගට ඔහු ජෝක් දෙස හැරුණේ ය.

" කොහොමද ජෝක් වීර ක්‍රියාව. මොකද හිතන්නේ ඒ ගැන .. උඹ කැමතියි ද ?"

dileep

" කැමති ද කියලත් අහනවා .. " ජෝක් සුසුමක් පිටකළේ ය." සරලව කියන්න ද ?"

" කියාං බලන්න "

" ඒක නියමයිනෙ "

dileep නිමි

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න
2009.8.22

dileep

# ෆේ නයිට්ස් බලකොටුවේ අබිරහස

කැරවෑනයක් ගෙන නිවාඩුව ගත කිරීම සදහා යන ළමුන් ෆේ නයිට්ස් බලකොටුව පෙනෙන නො පෙනෙන මානයේ කදවුරු බදින්නේ අහම්බෙනි. පැරණි ගරා වැටුණු මංදිරයක් වන ෆේ නයිට්ස් තුළ සිදු වන්නේ කුමක් දැයි දැන ගනු රිසින් එයට ඇතුළු වන ඔවුන් මුහුණ පාන්නේ එසේ මෙසේ තඩ මාරුවකට නම් නො වේ. කෙසේ වෙතත් අබිරහස් විසදීම පසෙකලා පණ බේරා ගැනීමට වත් ඔවුනට හැකි වේදැයි සැක සහිත බව නම් කිව යුතු ය .

dileep